# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 දෙසැම්බර් 06 වන සිකුරාදා**

**2013 டிசெம்பர் 06 ஆந் திகதி வெள்ளிக் கிழமை**

Friday 06th December 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.16 ට පළාත් සභාව රැස් විය.**

மு.ப. 09.16 **க்கு சபை கூடியது**

*The Provincial Council met at 09.16 a.m.*

ගරු සභාපතිතුමා **[සුනිල් විජේරත්න මහතා]** මූලාසනාරූඪ විය.

*திரு தவிசாளர் .[ சுனில் விஜேரத்ன அவர்கள்] ] தலைமை வகித்தார்.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2014

# පූර්ණ කාරක සභාව

## ANNUAL FINANCIAL STATMENT - 2014

## COMMITTEE OF THE WHOLE COUNCIL

***2014 වාර්ෂික මුදල් ප්‍රකාශයේ ප්‍රදානයන් තවදුරටත් සලකා බැලීම සඳහා පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය.***

*The Provincial Council converted itself into a Committee of the Whole Council to consider further the grants in the Annual Financial Statement 2014.*

***ශීර්ෂ අංක 108,124 හා 125 යන ශීර්ෂයන්ගෙන් රුපියල් 10 ක සංකේත කපා හැරීමක් කළ යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය පිළිබඳ ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී. (2013.12.05 - අවිච්ඡින්නව)***

*The question on the amendment that a token cut of Rs. 10.00 from each vote Nos. of 108,124 & 125 moved by Hon. Chief Opposition Whip- U. George Perera was proposed again. - (Continuation: 05.12.2013)*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයේ 108, 124 හා 125 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය ආරම්භ කිරීමට මම ආණ්ඩු පක්ෂයේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනු ලබනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.19]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත්, මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන් ස්තූතිවන්ත වෙනවා. බොහෝදුරට අද දින පස්වැනි පළාත් සභාවේදී මා විසින් සිදු කරනු ලබන අවසන් කථාව වෙන්න පුළුවන්. අපේ ගරු ඇමැතිතුමා පිළිබඳව කිසිම විවාදයක් නැහැ.

මේ පළාත් සභාව පිළිබඳව විනාඩියක් කථා කරන්න ඕනෑ. ශ්‍රී ලංකා මාතාව ඉන්දියාව විසින් දූෂණය කරලා හදපු ළමයෙක් තමයි, මේ පළාත් සභාව. 1987 දී බලෙන් දූෂණය කරලා තමයි මෙය නිර්මාණය කළේ. අපි ප්‍රතිපත්තියක් වශයෙන් පළාත් සභාවට එදත්, අදත්, හෙටත් විරුද්ධයි. අපි ඉල්ලපු දෙයක් නොවෙයි. නමුත් මේ පළාත් සභාව අකාර්යක්ෂම පළාත් සභාවක්. අපට ගැළපෙන්නේ නැති දෙයක්. එය අපට ගැලපෙන දෙයක් බවට නිර්මාණය කිරීමේ කර්තව්‍යයේදී නිමල් ලන්සා ගරු ඇමැතිතුමා විශේෂ කාර්ය භාරයක් කරලා තිබෙනවා. පළාත් සභාවක අවශ්‍යතාවය මිනිස්සුන්ට දැනෙන්න ඕනෑ. ඒ දැනීම නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා ඇති කරලා තිබෙනවා. අපටත් මෙයට කැමැත්ත ප්‍රකාශ කරන්න, මේ පළාත් සභාව තිබිය යුතුයි කියන තැනට තල්ලු කරන්න සමත්වෙලා තිබෙන නිසා මගේ විශේෂ ගෞරවය එතුමාට පිරිනමන්න ඕනෑ. අද මාර්ග සංවර්ධනය දිහා බැලුවාම ඉතාමත් දැවැන්ත කාර්යයක් සිදු වෙලා තිබෙනවා. අපේ මහරගම ප්‍රදේශයේ පළාත් සභාවට අයිති සියලු පාරවල් කාපට් කරලා සංවර්ධනය කරලා තිබෙනවා. කාණු ටිකක් දාන්න සිදුවුණොත් සහ අතරමැද Repair එකක් ආවොත් ඇරෙන්න සියල්ල හදලා ඉවරයි. ඒ පිළිබඳව අපේ ගෞරවය ප්‍රණාමය ගරු ඇමැතිතුමාට පුද කරන්න ඕනෑ. එපමණක් නොවෙයි. සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු ඒ සියලු නිලධාරීන්ගේ කැපවීම, විශේෂයෙන්ම මොරටුවේ ඉංජිනේරුතුමිය ඇතුළු සියලු

[ ගරු සලෝචන ගමගේ ]

නිලධාරීන්ගේ කැපවීම අපි අගය කරන්න ඕනෑ. ඒ අය රෑ 12 වද, දෙකටද කියලා වේලාව බැලුවේ නැහැ. ඒ සියලු කටයුතු නොපිරිහෙලා ඉටු කර තිබෙනවා. මේ වසරේ පළාත් සභාවේ මිලියන 150 ක ලාභයක් වාර්තා කරලා තිබෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ලාභයි. අනික් සියල්ල පාඩුයි. ඒ පාඩු ලබන කොට මාර්ග සංවර්ධන අධිකාරිය මිලියන 150 ක ලාභයක් වාර්තා කිරීම මම හිතන්නේ, අපට ඉතාමත් සතුටු වෙන්න පුළුවන්. මේ පළාත් සභාවේ තිබෙන වැදගත්කම ඔප්පු කරලා තිබෙනවා. මේ මිලියන 150 ට වඩා වැඩි ලාභයක් පෙන්නලා හොඳ තත්ත්වයකට ඒ මාර්ග සංවර්ධනය පිළිබඳව අපට සතුටු වෙන්න පුළුවන්. මම හිතන්නේ, නොයෙක් ආකාරයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ රන් අරුණ වැඩ සටහන යටතේ මිලියන ගණන් මුදල් වියදම් කරලා, මුළු පළාත් සභාවේම බිලියන 42 ක් වන කොට, බිලියන 45 කට වැඩි මුදල් ප්‍රමාණයක්, පළාත් සභාව වැඩි මුදල් ප්‍රමාණයක් මේ මාර්ග සංවර්ධනය සඳහා පමණක් යොදවලා තිබෙනවා. වයඹ, සබරගමු පළාත් එක්ක. ඒ නිසා මම හිතන්නේ මේක ඉතාම දැවැන්ත ජයග්‍රහණයක්. මෙය සුළුකොට තකන්න පුළුවන්කමක් නැහැ. ලංකාවේ භාගයක් විතර පාරවල් මේ පළාත් සභාවෙන් නඩත්තු කරලා, සංවර්ධනය කරලා ලාභ ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම ඇබ්සෝල් හදන යන්ත්‍ර, කොන්ක්‍රීට් හදන යන්ත්‍ර සියල්ල ආනයනය කරලා බිලියන 100 කට වැඩිය, මිලියන 1000 කට වැඩිය ප්‍රමාණයක යන්ත්‍රෝපකරණ ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා මේ මාර්ග ක්ෂේත්‍රයේ සංවර්ධනයට ස්ථාවර අඩි තාලමක් දාලා තිබෙනවා.

සංචාරක ක්ෂේත්‍රය ගැනත් විනාඩියක් කථා කථා කරන්න ඕනෑ. අපි හැමිල්ටන් ඇළේ සිට මීගමුව දක්වා ගියා. ගරු ඇමැතිතුමා ඒ ප්‍රදේශය ඉතාමත් දැවැන්ත ලෙස සංවර්ධනය කරලා ඉතාමත් ආකර්ෂණීය තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. බේරුවල ප්‍රදේශයේ අපේ ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කළා. ඒ ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු කරලා ආකර්ෂණයක් ඇති කරලා තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ ගාලු මුවදොරින් පටන් අරගෙන මොරටුව මෝදර පාලම දක්වා සංචාරක ව්‍යාපාරය පිළිබඳව, ඒ වෙරළ තීරය පිළිබඳව අපට ප්‍රමාණවත් පරිදි සැහීමට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. අපි ගිය වාරයේත් ඔබතුමාගෙන් ඉල්ලා සිටියා. ඒ ප්‍රදේශයට කුමක් හෝ වෙන දෙයක් කරන්නය කියලා. ස්තුතිවන්ත වෙනවා. මොරටුවේ ලුණාව ප්‍රදේශයේ පදික මංතීරුවක් හදලා, Joggin track හදලා මිලියන ගණනක් වියදම් කරලා ඒ කටයුතු සිදු කරලා තිබෙනවා. එලෙසම Beach park එකක් හෝ දෙකක් හැදුවොත් මොරටුව, කොරලවැල්ල ආදී ප්‍රදේශවල පානදුර දක්වා යන ප්‍රදේශවලට එය හිතකරයි. ඒ දරුවන්ට සෙල්ලම් කරන්නවත් තැනක් නැහැ. ඒ සියලුදෙනා ගාලු පාර අයිනේ ක්‍රීඩා කරන්නේ. ඒ නිසා කොරලවැල්ලේ සහ දෙහිවල Beach park දෙකක් හදලා ඔබතුමාගේ කලාපය වාගේම අපේ මේ කලාපයත් හදන්න කියන ඉල්ලීම කරනවා.

අද සමහර අය කැසිනෝ ගැන කථා කළා. වෙනම කැසිනෝ හල් හදනවා කිව්වා. මෙය ගෙනාවේ අපේ ආණ්ඩුවෙන් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය කාලයේ ගෙනැල්ලා කැසිනෝ ස්ථාපිත කළේ. අද කැසිනෝ අලුතෙන් දානවාට විරුද්ධ වුණාට අද කැසිනෝ හල් හැම තැනම තිබෙනවා. මගේ මිත්‍රයෙක් ඉන්නවා, හාඩ්වෙයාර් ඉංජිනියර් කෙනෙක්. එයා තමයි මේ කැසිනෝ එකේ එක ආයතනයක Internet භාරව ඉන්නේ. උපාධිධාරියෙක්. එතුමා ප්‍රකාශ කරන්නේ, කැසිනෝ හලට ගිහිල්ලා කැසිනෝ ගහනවාට වඩා වැඩියෙන්ම කැසිනෝ සෙල්ලම් කරන්නේ Internet එකෙන් කියලා. මෙය නවත්වන්න අපි කාටවත් බැහැ. ලෝකයේ ඕනෑම ක්ලබ් එකකට ගිහිල්ලා ගෙදර සිට Internet එකෙන් කැසිනෝ ගහන්න පුළුවන්. එවැනි වාතාවරණයක රට නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා අපි අද අලුත් ක්‍රමවේදයන් ඔස්සේ ගමන් කරන්න ඕනෑ කාලය එළැඹිලා තිබෙනවා. නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාට මේ පිළිබඳව විශේෂ අත්දැකීමක් තිබෙන නිසා, අපි ඉල්ලා සිටින්නේ, තවත් මෙවැනි රැකියා අවස්ථාවන් - කැසිනෝ ව්‍යාපාරයෙන් දෙනවා කියනවා නොවෙයි. නමුත් මීට එහා ගිය රැකියා අවස්ථාවන් ලබා දීමට පුළුවන්කම තිබෙනවා කියනවා.

මගේ මිත්‍රයෙක් ඉන්නවා. මම හිතුවේ ඇත්තටම එයා අසාධාරණ ව්‍යාපාරයක් කරනවා කියලා. බැලුවාම එයාගේ ව්‍යාපාරය forex.com කියලා. Internet එකෙන් මුදල් මිලදී ගන්නවා සහ ඒක නැවත විකුණනවා. මේක තමයි එයාගේ ව්‍යාපාරය. මාසයකට ලක්ෂ 10 කට වැඩිය

ආදායමක් ලබනවා. ගෙදර සිට කරන්නේ. උදේට යනවා. හවසට යනවා. කාර්වල යනවා. මේ කරන ව්‍යාපාරය මොකක්ද කියලා මම බැලුවා. මාව එක්කගෙන ගිහිල්ලා පෙන්නුවා. Internet එකෙන් වාඩි වෙලා ලෝකය දිහා බලාගෙන ඉඳලා forex.com එකට ගිහිල්ලා දහස් ගණන් මුදල් සොයනවා. මෙවැනි අලුත් ක්‍රමවේද මිනිසුන් විසින් සොයාගෙන යනවා. අපේ සංචාරක අමාත්‍යාංශය හරහා මෙවැනි දේවල් දියුණු කරන්න පුළුවන්කම තිබෙනවා. අපි ඉල්ලා සිටිනවා, එවැනි ක්‍රමයකට අපේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නය කියලා.

එලෙසම අපේ ධීවර කර්මාන්තය දැන් දියුණු වෙමින් පවතිනවා. ගරු ඇමැතිතුමා දැල් දුන්නා. බෝට්ටු ආම්පන්න සියල්ල දීලා ඒ මිනිස්සුන්ට යම් සහනයක් ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. නමුත් වාරකන් කාලයේදී ඒ අයට ජීවත් වෙන්න පුළුවන් වන පරිදි ස්වයං රැකියා සඳහා එතුමා යොමු වෙලා තිබෙනවා. අපට පුළුවන්කම ලැබුණා, මොරටුව, මෝදර ආදී ප්‍රදේශවලට අපේ විමධ්‍යගත මුදලින් සහ ගරු ඇමැතිතුමාගේ සහයෝගයෙන් මහන මැෂින් 100 ක් විතර ලබා දීලා, ඒ පවුල් නඩත්තු කරන්න වාතාවරණය හදන්න පුළුවන් වුණා. ඒ නිසා අපි ගෞරවය කරනවා. එවැනි දේවල් හිතලා, ඒ අයට අත දීමේ වැඩ පිළිවෙළකට යොමුවීම ගැන. ඒ නිසා මීට වඩා වැඩියෙන් ඒ ක්‍රමය දියුණු කරලා ස්වයං රැකියා කරන, ධීවර කර්මාන්තයේ යෙදෙන අයගේ දරුවන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කරන්න, ළමා සංවර්ධන වැඩි දියුණු කරන්න ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් තව තවත් මුදල් ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම අපේ ධීවරයෝ ඉතාමත් අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපට බස්නාහිර පළාත් සභාව හරහා ඒ අයට රක්ෂණ ක්‍රමයක් හරි ලබා දීමේ ක්‍රමයක් තිබෙනවා නම් අපේ ගොවියන්ට ගොවි රක්ෂණ ක්‍රමය තිබෙනවා වාගේ ධීවර රක්ෂණ ක්‍රමයක් ඇති කරලා, මේ බස්නාහිර පළාත් සභාව තුළ මේ ධීවරයන්ගේ ජීවිත ස්ථාපිත කරන්න කියලා ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම අපට නිවාස ගැනත් කථා කරන්න උවමනාව තිබෙනවා. මේ නිවාස අමාත්‍යාංශය යටතේ අපි විශාල ඛේදවාචකයකට ලක් වෙලා තිබෙනවා. අපේ ගරු මහ ඇමැතිතුමාගේ අයවැය කථාවේ 20 වැනි පිටුවේ තිබෙනවා, එතුමා කියන්නේ නිවාස 10 ක් හදන්න ප්‍රතිපාදන ලබා දෙන්න යෝජනා කරලා තිබෙනවා කියලා. මම හිතන්නේ ඒක ප්‍රමාණවත් නැහැ. විසි දහස් ගණන් නිවාස හැදෙනවා. අඩුම ගණනේ එක ග්‍රාම සේවක කොට්ඨාශයකට එක නිවාසයක්වත් ලබන අවුරුද්දේ මේ පළාත් සභා මගින් ඉදි කළොත් එය අහිංසක ජනතාවට කරන විශාල කාර්යයක්. අපි ඔබතුමා යටතේ සෙවිලි තහඩු ලබා දුන්නා. සිමෙන්ති ලබා දුන්නා. ඒ දෙන මුදල ප්‍රමාණවත් නැහැ. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා, රුපියල් 40,000 යේ නිවාස ආධාරය රුපියල් 60,000 දක්වා වැඩි කරන්න කියලා යෝජනා කරලා තිබෙනවා. නමුත් මෙයත් ප්‍රමාණවත් නැහැ. අපි කියන්නේ මෙය ලක්ෂ 2 ත්, ලක්ෂ 2 ½ ක් දක්වා ඉහළට ගිහිල්ලා අඩුම ගණනේ එක නිවාසය ගණනේ ලබන වසරේදීවත් හදන්න පුළුවන්කම ලැබුණොත් ඒක මම හිතන්නේ ලොකු පිංකමක්.

පසුගිය කාලය තුළ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවලා දිනේෂ් ගුණවර්ධන ගරු ඇමැතිතුමාට පුළුවන්කම ලැබුණා, එක අවුරුද්දකට නිවාස 10,000 ක් ඉදි කරන්න. අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් මම එයට දායක වුණා. මල නොතලා රොන් ගන්නා ක්‍රමයකට තමයි මේ මුදල් ගත්තේ. වර්ග අඩි 5000 කට වඩා වැඩියෙන් ඉදි වන, 3000 කට වඩා වැඩියෙන් ඉදිවන ගෙවල්වලින් 1% ක බද්දක් අරගෙන තමයි මේ නිවාස හදන්න ඒ අරමුදල සකස් කළේ. බිලියන 100 කට වඩා ඉක්මවා ගිය මුදලක් එකතු වෙලා නිවාස 10,000 කට වඩා ප්‍රමාණයක් හදන්න පුළුවන්කම ලැබුණා. ආවසනාවකට අපේ විමල් වීරවංශ අමාත්‍යතුමා - මේ අමාත්‍යාංශය තිබුණේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ. එයාට තිබුණු එක, එතුමා ඉල්ලලාම සිටියා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒක භාර දුන්නා. හරියට හරකාගේ ඔළුව ඉල්ලුවාම ඔළුව දුන්නා වාගේ පිටුපස පැත්ත තියාගෙන. ඒකේ ආදායම එන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන්. නමුත් ඒ ආදායම දුන්නේ නැහැ. හරකාගේ පිටිපස්ස තියා ගත්තා වාගේ ගෝඨාභය මැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ඒක තිබුණා. ඒ මුදල් එසේ එකතු වුණා. පසුව ඒක තහනම් කර දැමුවා. අර නම විතරක් ඒ ආයතනය භාර ගත්තා. අරමුදලක් නැතිව -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අමාත්‍යාංශයක් නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ලේකම්තුමා නේ එතුමා.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ජනාධිපතිතුමා තමයි ඒ අමාත්‍යාංශයේ -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

එතුමාගේ ලේකම්තුමා. මම දැනුවත්ව මෙහි අතිගරු ජනාධිපතිතුමා තමයි ඉන්නේ. නමුත් එතුමා ඒ කර්තව්‍යයන් කරන්නේ නැහැ. සියල්ල කරන්නේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. එතුමා තමයි මේ සියලු කර්තව්‍යයන් කරන්නේ. එතුමාගේ අමාත්‍යාංශය අපේ ලේකම්තුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන අධිකාරියට තමයි මේ මුදල් ආවේ. ඒක අත්හිටවපු නිසා විශාල ඛේදවාචකයක්. අර ලොකු මිනිස්සුන්ගෙන් නිකන් එන ආදායම අහිමි වෙලා තියෙනවා. ඒ පනතත් අහෝසි වෙලා ගිහින් තිබෙනවා. ඒ නිසා මෙවැනි අලුත් පනතක් බස්නාහිර පළාත් සභාව තුළ - ලොකු මිනිස්සුන්ගෙන් මුදල් අරගෙන අහිංසක මිනිස්සුන්ගේ ගෙවල් හදන ක්‍රමයකට යන්න ඕනෑ. විශේෂයෙන්ම පසුගිය දවස්වල අපේ මහරගම ප්‍රදේශයේ, කෝට්ටේ, මිරිහානේ අහිංසක මිනිස්සුන්ගේ නිවාස සියල්ල කඩා ඉවත් කරනවා කියලා යෝජනා කරලා තිබෙනවා. ඒවාට නඩු පවරලා මුදල් එවලා තිබෙනවා. මම හිතන්නේ, මේ සියල්ල එසේ කරන්න පුළුවන්කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේ අහිංසක මිනිස්සු, රේල් පාරවල්වල ඉන්න දුගී දුප්පත් ජනතාවට තැනක් නොදී එහෙම කඩා දමනවා නම්, අපි එයට සම්පූර්ණයෙන් විරුද්ධ වෙමින් ඒ මිනිස්සු එක්ක පාරට බහින්නත් අපි ලැහැස්තියි කියන ප්‍රතිඥාව අපි මේ අයවැය කථාවේදී කියන්න ඕනෑ. නිවාස ඇමැතිතුමා වශයෙන් තමුන්නාන්සේ මෙයට මැදිහත් වෙන්නය කියන ඉල්ලීම කරනවා. තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ. විශේෂයෙන්ම ප්‍රථමයෙන්ම මෙම පළාත් සභාවට පත් වෙලා වසරක පහක කාලය තුළ අපට අතහිත දුන්න ප්‍රධාන ලේකම්තුමිය, අනිකුත් සියලු අමාත්‍යාංශවල ලේකම්වරුන්, ඒ වගේම සාමාන්‍යාධිකාරිතුමා, අපේ අමාත්‍යාංශයේ ලේකම් එස්. විජයබන්දු මැතිතුමා, ප්‍රදේශීය ඉංජිනේරුතුමා ඇතුළු සියලු නිලධාරීන්. අපේ රත්නායක මහත්මයා. බස්නායක මහත්මයා. රත්නායකයි, බස්නායකයි. අතිරේක ලේකම්තුමා රත්නායක මහත්මයා. විශේෂයෙන් ඒ දෙපළ ඕනෑම වේලාවක ඊ 12.00 ට දුරකථනයෙන් ගත්තත් ඒ අවශ්‍ය කටයුතු කර දී තිබෙනවා. ඒ පිළිබඳව සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

අපි එක ඉල්ලීමක් කරනවා. හැමදාම මේ පාරෙන් අපි එනවා. එනකොට අපේ නාලන්ද එල්ලාවල මැතිතුමාගේ පිළිරුවක් තිබුණා. අපි හිතුවේ ඒ පිළිරුව නැවත ස්ථාපිත කරයි කියලා. නමුත් දැන් එතැන වෙනත් ලස්සන රූපයක් හදලා තිබෙනවා. එතුමාට වුණු දෙයක්වත් නැහැ. එතුමාව මරපු මිනිස්සුත් එක්ක අද අපේ ආණ්ඩුව මඟුල් කනවා. ඒක තමයි ඇත්ත යථාර්ථය. නාලන්ද එල්ලාවල සහෝදරයා වෙනුවෙන් කථා කරන්න මිනිහෙක් පාර්ලිමේන්තුවේ නැහැ. එතුමාගේ පිළිරුව නැවත ස්ථාපනය කරන්න. ඒ නිසා අපි අපට මේ කථා කරන්න තිබෙන අවස්ථාවේදී ඉල්ලා සිටිනවා, එතුමාගේ පිළිරුව නැවත ස්ථාපනය කරන්න කියලා. මම අවසාන වශයෙන් කියනවා. නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා ඇතුළු සියලු ඇමැතිවරුන් ගත්තාම, උදය ගම්මන්පිළ ගරු ඇමැතිතුමා විශාල වැඩ කොටසක් කළා. නමුත් මේ සියල්ලන්ගෙන්ම රේස් එකෙන් ඉස්සරහා ඉන්නේ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා. මම මෙය කවියකින් අවසන් කරනවා.

පින්මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බලෙන් යුතු පුතුමය ඉතා ගරු
එක පුන්සඳින් දුරුවෙයි ලොව ගණ අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොම වේය දුරු

මෙවැනි ඇමතිවරු කිහිප දෙනෙක් සිටියා නම්, මේ රට ගොඩගන්න පුළුවන්. මෙතුමා මේ පළාත් සභාවෙන් ලබන පළාත් සභාවටත් ඇවිල්ලා, පාර්ලිමේන්තුවත් තරණය කරලා මේ සෝදාපාළු ඇමැතිවරුන්ගේ තිබෙන අලසකමට

කදිම උත්තරයක් දෙන්න ඔබතුමාට වාසනාව, ධෛර්ය, ශක්තිය ලැබේවා. මේ පළාත් සභාවේ ඇමැතිවරයෙක් නොවෙයි. ලබන වසරේ පාර්ලිමේන්තුවේ ඇමැතිවරයෙක් වශයෙන් උසස්වීමක් ලැබෙන්න වාසනාව, ධෛර්ය, ශක්තිය, සියලු දෙවියන්ගේ රැකවරණය ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින් අපි නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.31]

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න විනාඩි 10 ක හරි අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම විශේෂයෙන් නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව යමක් සඳහන් කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම වර්තමානයේ මෙම අමාත්‍යාංශයේ ප්‍රගතිය සතුටුදායක තත්ත්වයක පවතින බව අපි විශේෂයෙන් කියන්න ඕනෑ. මුල් කාලයේදී නම්, අර විගණන වාර්තා අධ්‍යයනය කරපු කාලයේ ඒ අමාත්‍යාංශයේ විශාල අඩුපාඩුකම් රාශියක් තිබුණා. ඒවා බොහෝදුරට නිමා කරගෙන එතුමාගේ නායකත්වයෙන් ඒ කාර්ය මණ්ඩලය අද හොඳ ගමනක් ඇවිල්ලා තිබෙනවා කියන එක විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. නමුත් මේවායේ අඩුපාඩුකම් තවමත් තිබෙනවා. ඒ අඩුපාඩුකම් සම්පූර්ණ කර ගන්න මැදිහත් වෙනවා නම් අපට වැඩිදුරටත් සතුටු වෙන්න හැකියාවක් තිබෙනවා.

මේ මාර්ග සංවර්ධනය ගැන කථා කරනවා නම්, විශේෂයෙන්ම මේ පළාත් මාර්ග සම්බන්ධව කටයුතු කිරීමේදී ප්‍රදේශ ගණනාවක එතුමා මාර්ග සංවර්ධනය පිළිබඳව උනන්දුවක් දක්වලා, ඒ අඩුපාඩුකම් සම්පූර්ණ කරලා තිබෙනවා. මම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට බේරුවල ප්‍රදේශය වාගේම කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඉල්ලීම් ඉදිරිපත් කරපු අවස්ථාවකදී බැහැයි කියන්නේ නැතිව ඒ සඳහා දායකත්වය දරලා ඒ මාර්ග සංවර්ධනය කර දීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයටත් මතක් කිරීමක් කරන්න වෙනවා. ඒ අයගේ සේවාවන් පිළිබඳව සතුටු වෙන ගමන්ම තවදුරටත් මේ මාර්ග සංවර්ධනය පිළිබඳව සොයා බැලීමක් කරලා, ඒ ජනතාව වැඩිපුර ගමන් කරන මාර්ග පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා මේ සංවර්ධන කටයුතුවලට දායකත්වය දරනවා නම් වඩාත් සුදුසුයි කියන එක මතක් කරනවා.

ධීවර ප්‍රදේශය හැටියට පානදුර, කළුතර, බේරුවල ගත්තාම ඒ ප්‍රදේශවල වැඩ කරලා එතුමාගේ මහන්සියෙන් යම් ඉදිරි ගමනක්, දැක්මක් පෙන්නුම් කළා. නමුත් මීට වඩා අතුරු ගම්මානවල තවදුරටත් අසරණව ජීවත්වන ධීවර ජනතාවක් ඒ ප්‍රදේශයේ ඉන්නවා. ඔවුන් පිළිබඳවත් ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. 100% ක් නොවෙයි. එතුමාට කරන්න තව විශාල වැඩ කොටසක් තිබෙනවා. ඒ ශක්තිය එතුමාට ලැබෙන්න ඕනෑය කියන එකයි අපේ ප්‍රාර්ථනය.

ඒ වාගේම ධීවර ජනතාව ගැන ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරනවා. පසුගිය මාස කීපයකට උඩදී වුණු ඛේදජනක අවස්ථාවලදී තවමත් ඒ පවුල්වලට යම් යම් අවස්ථාවල් සේවාවන් ලැබිලා නැහැ, ඔවුන්ගේ ජීවන මාර්ගය කර ගෙන යන්න. ගෙදර ප්‍රධානියා නැති වෙලා තිබෙනවා. ඒ දූ දරුවන් ඉතාමත් අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ජීවත් වීම සඳහා මාර්ගයක් ඒ අයට ලබා දෙන්න ඕනෑ. ඔබතුමා 2014 ට යෝජනා කරලා තිබෙනවා වාගේම ඒ පවුල්වලට විශේෂත්වයක් ලබා දීලා, ඔවුන් ස්වයං රැකියා සඳහා යොමු කරනවා නම්, දැන්මම ඒ සඳහා යොමු කරනවා නම් ඔවුන්ට දෙන ලොකුම ආධාරය තමයි එය.

ඒ වාගේම විපතේදී අසරණ වුණු ධීවරයන් ඉන්නවා. ඔවුන්ගේ බෝට්ටු විනාශ වෙලා ගියා. ඒ වාගේම අබලන් තත්ත්වයට පත් වුණා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. බේරුවල රන්තවත්ත ප්‍රදේශයේ එක ගෙදරකට මම ගියාම දැක්කා. තාත්තා නැති වෙලා. අබාධිත දරුවෙකුත් ඉන්නවා. එවැනි පවුල් ගැන විශේෂ අවධානය යොමු කළොත් ඔබතුමාගේ ගමන් මාර්ගයට ලොකු ශක්තියක් ලැබෙයි කියන එකයි මගේ විශ්වාසය. ඔබතුමා යෝජනා කරලා තිබෙනවා, ධීවර ප්‍රජාවට ස්වයං රැකියාවක් ලබා දෙන්න. ස්වයං රැකියා වැඩ පිළිවෙළ දියුණු කරන්න. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම වාරකන් කාලයේදී ස්වයං රැකියා වැඩ පිළිවෙළට වඩා සුදුසුයි, වාරකන් කාලයේ ලියාපදිංචි ධීවර පවුල් සොයා

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

බලලා මාස තුනක කාලයක් යම් සහනාධාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම්. අර සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම මමත් කිහිපවතාවක් යෝජනා කරලා තිබෙනවා. ඒ වාරකන් කාලය තුළදී, අඩුම තරමින් ඒ පවුල්වල ඉන්න සංඛ්‍යාව ගණනය කරලා, ඔවුන්ට ජීවත්වන්න සලාක ක්‍රමයක් හදලා ලබා දෙනවා නම්, ඒක වඩාත් යෝග්‍ය යැයි කියන එක මම යෝජනා කරන්න කැමැතියි. විශේෂයෙන්ම ධීවර ජනාතවගේ තරුණ කොටස් ඉන්නවා. ඔවුන් විශාල පිරිසක් අධ්‍යාපනය අවසන් කරලා මසුන් මරන්න මුහුදු යනවා. ඒ තරුණ කොටස් ඊට වඩා විධිමත් ක්‍රමයක් ඇතිව, ඔවුන්ට අවශ්‍ය තාක්ෂණ පුහුණුව ලබා දීලා ඔවුන්ගේ වෘත්තිය තහවුරු කර ගන්න පුළුවන් නම් හොඳ ආදායමක් ලබා ගෙන අපට පුළුවන් වේවි ඔවුන්ගේ පවුල් ජීවිතය නඟා සිටුවන්න.

ඒ වාගේම මම නිවාස පිළිබඳව මතක් කරනවා නම්, මේ නිවාස ඉදි කිරීමේදී ධීවර ප්‍රජාවට විශේෂ සැලකිල්ලක් දක්වන්න. ඒ ධීවර ප්‍රදේශයේ පැල්පත්වල ඉන්න අයට මුල් තැන දෙන්න වෙනවා. ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට යොමු කරනවා. ඒ පැල්පත් ටික සංචාරක ප්‍රදේශය තුළ තිබෙන නිසා ඒ පැල්පත් තිබීමෙන් වෙන්නේ, සංචාරකයන්ගේ පැමිණීමට ලොකු බාධාවක් වෙනවා. ඒ නිසා එම පවුල් සම්බන්ධව, ඔවුන්ගේ පදිංචිය සම්බන්ධව දියුණුවක් ඇති කරන්න. ඔවුන්ගේ නිවාස වැඩ පිළිවෙළ ශක්තිමත් කර දෙන්න පුළුවන් නම්, අඩු තරමින් කාමර දෙකකුයි, මැද සාලයකුයි එක්ක සම්බන්ධ කර ගෙන නිවාස වැඩ පිළිවෙළක් අමාත්‍යාංශයෙන් සාදා දෙන්න අවශ්‍ය කටයුතු තහවුරු කරන්න පුළුවන් නම් වඩාත් හොඳයි.

නිවාස කියන කොට මට මතක් වෙනවා. අපේ මේ සභාවේ ලොකු යෝජනාවක් තිබුණා. රජයේ සෙවකයන් වෙනුවෙන් අපි හෝමගම ප්‍රදේශයේ තට්ටු නිවාස හදනවා කියන එක. නමුත් එහි වර්තමාන තත්ත්වය පිළිබඳව මම දන්නේ නැහැ. විශාල මුදලක් වියදම් කරලා තිබෙනවා. අරමුණට පටහැනිව කටයුතු කරලා තිබෙනවා. එයින් විශාල මුදල් ප්‍රමාණයක් නාස්ති වෙලා තිබෙනවා. එක්තරා සමාගමක් ඇවිල්ලා, ඔවුන් ඒකෙන් ප්‍රයෝජනය ගත්තා මිසක ඉන් අපට ලැබුණු කිසිම වාසියක් නැහැ. නමුත් තවමත් ඒ ගැන සාකච්ඡා වෙමින් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාගේ අවධානයට මම යොමු කරන්න කැමැතියි. තරුණ ඇමැතිවරයෙක් හැටියට එතුමාට ඒ හැකියාව තිබෙනවා. විශේෂයෙන් විදේශ සම්බන්ධතාවයක් ඇති කරගෙන, විදේශ ආධාර මුදලක් ලබා ගෙන තට්ටු නිවාස ක්‍රමයක් හෝ හදලා, අපි ඉල්ලුම් කැඳෙව්වා. අපි කැඳවපු ඉල්ලුම්පත් දැන් වේයොත් කාලා ඇති. රජයේ සේවකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳෙව්වා. ඒ කැඳවපු ඉල්ලුම්පත් ටික සවුත්තු වෙලා ගිහිල්ලා ඇති. අපේ අරමුණ නිසි ලෙස හදන්න පුළුවන් නම් නිවාස සම්බන්ධයෙන් තිබෙන ඒ ගැටලු ටික නිරාකරණය කර ගන්න අපට පුළුවන් වෙයි.

ඒ වාගේම කොළඹ නම් ගෙවල් හදනවා. විශාල වශයෙන් කෝටි ගණන් වියදම් කරලා පරණ ගෙවල් ටිකට තීන්ත ගානවා. කළුතර දිස්ත්‍රික්කයේ නාගරික නිවාස තිබෙනවා. ඒ වාගේම රජයෙන් හදපු නිවාස තිබෙනවා. ඔවුන්ගේ ඒ නිවාස අලුත් වැඩියා කර දීමේ වැඩ පිළිවෙළක් කරනවා නම් ඒක වඩාත් යෝග්‍යයි කියන එක විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට කියනවා. නිවාස වැඩ පිළිවෙළේදී පළාත් සභා ගරු මන්ත්‍රීවරුන්ට ඔබතුමා ඉල්ලුම්පත් ලබා දීලා තිබුණා. එය ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලට අමතරව මේ අරමුදල තවත් තර කර ගන්න පුළුවන් නම් - තවමත් පළාත් සභාවේ ඉන්න හෝ අනාගතයේ පත් වන මන්ත්‍රීවරු හෝ වේවා. වර්තමානයේ සිටින මන්ත්‍රීවරු හෝ වේවා, ඒ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න, ඒ දෙන ආධාර මුදල වැඩි කර දෙන්න. ඒ ආධාර මුදල නිසි ලෙස ඵලදායි වැඩ පිළිවෙළක් හැටියට කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියලා මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

එහෙමනම් ධීවර ප්‍රජාව පිළිබඳව ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මිරිදිය මසුන් සම්බන්ධයෙන් මතක් කරන්න ඕනෑ. පොඩි ඔරු ටිකක්, පොඩි බෝට්ටු ටිකක් ලබා දෙන්න පුළුවන් නම් වඩාත් යෝග්‍යයයි. අද තිබෙන සහනාධාරය කප්පාදු වෙලා තිබෙන මොහොතක, විශාල බෝට්ටුවලට විතරයි සහනාධාරය ලැබෙන්නේ. අද කොම්පැණිකාරයන්ට නැත්නම් මුදලාලිලාටයි සහනාධාරය ලැබෙන්නේ. පුංචි මනුස්සයාට - අර මම කිව්වේ, බෝට්ටුවල යන උගත් තරුණයන් ඉන්නවා. පිට අයගේ බෝට්ටුවල යන්නේ. විශේෂයෙන්ම ඒ තරුණයන්ට

තාක්ෂණ දැනුම ලබා දීලා, ඔවුන්ට යම් සහනාධාර මට්ටමෙන් අඩි 34 බෝට්ටුවක් හෝ ලබා දෙන්න පුළුවන් නම් ඔවුන්ට ඔවුන්ගේ ආර්ථික ශක්තිය වර්ධනය කරගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම මත්ස්‍ය සම්පත අපට ලැබිලා තිබෙනවා. මේ දවස්වල දැල් වට කරන නිසා මාස දෙකකට පොඩි මාළු තිබෙනවා. ගණන අඩුයි. නමුත් අනිකුත් මාළු මිල ඉතා ඉහළට යන අවස්ථා තිබෙනවා. පාලන ක්‍රමයක් හදන්න වෙනවා. පාලන ක්‍රමයක් ඇති කළා නම් අපට පුළුවන් වෙයි ජනතාවට යම් සහනයක් ලබා දෙන්න. ඒකයි අපේ අරමුණ වෙන්න ඕනෑ. වැඩිවන ජීවන වියදමට යම් රුකුලක් දෙන්න පුළුවන් නම්, යම් සහනයක් ලබා දෙන්න පුළුවන් නම් ජනතාවට එයින් ලොකු වාසිදායක තත්ත්වයක් උදා වෙයි කියන එක ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය. බෙන්තර, බේරුවල තමයි මුලින්ම සංචාරක ව්‍යාපාරය ඉතා සාර්ථකව තිබුණේ. අද ඒ ප්‍රදේශයට සංචාරකයන් පැමිණීම බොහෝදුරට අඩු වෙලා තිබෙනවා. නැගෙනහිරටයි සංචාරකයන් අද වැඩිපුර ඇදී යන්නේ. සංචාරකයන්ගේ ප්‍රතිශතය බැලුවාම 50% ක් වැඩියි, 60% ක් වැඩියි කියලා අපි කථා කළාට, මේ සංචාරකයින් එක්කෙනෙක්වත් සති දෙකක්වත් ලංකාවේ රැඳෙන්නේ නැහැ. එන්නේ දවස් කීපයකට පමණයි. ඒ නිසා ඒ සංචාරකයින් ගෙන්වා ගැනීමේ වැඩ පිළිවෙළක් - මධ්‍යම රජය කුමක් කිව්වත් පළාත් සභාවක් හැටියට සම්බන්ධීකරණයක් ඇති කරන්න ගරු ඇමැතිතුමාට හැකියාවක් තිබෙනවා. ඒ සම්බන්ධතාවය ඇති කර ගෙන හොටෙල් සමාගම් එක්ක කථා කරලා පළාත් සභාවක් හැටියට යම් වැඩ පිළිවෙළක් කරන්න පුළුවන් නම්, යටිතල පහසුකම් ලබා දෙනවා වාගේම සංචාරක ව්‍යාපාරය තුළ ඒ සංචාරක සේවයේ යෙදී සිටින උදවිය පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්නය කියන එකත් මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ධීවර විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් 13 වැනි සංශෝධනයෙන් අපට බලය නැති වුණත්, අපි ඒ පිළිබඳව මඟ පෙන්වීමක් කරලා, උනන්දුවීමක් කරලා ඔවුන්ට විශ්‍රාම වැටුපත් එක්කම නැවත වරක් ඒ ධීවර සහනාධාරය ලබා දෙන්න. පසුගිය කාලයේ ඩීසල් මිල අධික වුණු නිසා සහනාධාරය ලබා දුන්නා. නමුත් දෙවැනි වටයට ඩීසල් මිල වැඩි වුණාම ඒ සහනාධාරය තවමත් ඔවුන්ට ලැබෙන්නේ නැහැ. සමහරවිට මාස දෙකක්, තුනක් ගියාට පස්සේ තමයි මේ සහනාධාරය ලබා දෙන්නේ. ඒ පිළිබඳවත් විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්න. මේ අංශය පිළිබඳව විශේෂයෙන් දක්වන උනන්දුව පිළිබඳව ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඉදිරි කාලයේදී අඩුපාඩුකම් සම්පූර්ණ කර ගෙන වැඩ කරන්න ඔබතුමාට පුළුවන් නම් මම හිතන හැටියට පළාත් සභාවක් විධියට ජයග්‍රහණ ලබා ගන්න පුළුවන්. සමහරවිට හිතන්න පුළුවන් විපක්ෂයෙන් ඇයි මෙතුමාට මෙහෙම කථා කරන්නේ කියලා. හොඳ දේ හොඳට දකින පුද්ගලයෙක් හැටියට. ඒ නිසා මම හොඳ දේ අගය කරලා කථා කරනවා. ඒකයි වුණේ මට. ගරු සභාපතිතුමනි, මම හිතනවා ඔබතුමා කාලය පිළිබඳව මට ඉඟියක් කරනවා. මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ. එම්.යූසුෆ් ගරු මන්ත්‍රීතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙසට ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Yoosuf M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමා, විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.46]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම ප්‍රථයෙන්ම සන්තෝෂ වෙනවා. අපේ ධුර කාලය අවසන් වන අවසාන

[ ගරු ජානක සූරියබණ්ඩාර ]

මොහොතේ මේ පළාත් සභාව අවුරුදු 05 ක් නියෝජනය කරපු මන්ත්‍රීවරුන් හැටියට අපි විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ පූර්ණ ආශිර්වාදය ඇතිව පළාතේ ජනතාවට අපි තෘප්තිමත්ව වැඩ කෙරුවේ, ඇත්තෙන්ම ඒ අපේ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය නිසයි කියන එක මම නිර්භයව ප්‍රකාශ කරන්න ඕනෑ. පළාත් සභාව සුදු අලියෙක් කියලා සමහර අය කෑ ගහන කොට, පළාත් සභාවෙන් වැඩක් වෙන්නේ නැහැයි කියලා සමහර අය කෑ ගහන කොට අද පළාත් සභාව තුළින් - විශේෂයෙන් බස්නාහිර පළාත් සභාව තුළ වෙලා තිබෙන වැඩ දිහා බැලුවාම, ඇහැට පෙනෙන්න වැඩක් කරලා තිබෙන්නේ, නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයෙන් කියන එක මම ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද ඒකට හේතුව, මෙතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි බස්නාහිර පළාත් සභාවේ තිබෙන C හා D කියන ශ්‍රේණියට අයත් පාරවල් තිබෙන්නේ. අද අපි අවුරුදු 05 කට පෙර ඒ පාරවල් දිහා බැලුවාම ඒ පාරවල්වල අපට පයින්වත් යන්න බැරි තත්ත්වයක් තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වත්තල ආසනය දිහා බැලුවාම පළාත් සභාවට අයිති පාරවල් 12 ක් විතර තිබෙනවා. එක පාරක්වත් හදලා තිබුණේ නැහැ. අද ඉතා සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. වත්තල ආසනය දිහා බැලුවාම අපේ ආසනයේ එක පාරක්වත් ඉතිරි වෙලා නැහැ. ඔක්කෝම කාපට් කරලා ඉවරයි. ඒ නිසා මේකට පූර්ණ දායකත්වය දෙන්නේ අපේ ගරු ජනාධිපතිතුමා සහ ආර්ථික කටයුතු අමාත්‍ය බැසිල් රාජපක්ෂ ඇමැතිතුමා. අපි එහෙම සිහි කෙරුවේ නැත්නම් ඒකත් වැරැද්දක්. අපි කරන ලොකු මදිකමක්. මොකද හේතුව, මේ සියල්ලක්ම පිටිපස්සේ ඉන්නේ ඒ අය. ගරු ඇමැතිතුමාට, අපට ධෛර්යය දෙන්නේ ඒ අය. ඒ නිසා අපි ඒ අයව අමතක කරන්න හොඳ නැහැ.

සමහර අය යම් යම් දේවල් කියනවා. අපේ බස්නාහිර පළාත් සභාවේ මහා මාර්ග අමාත්‍යාංශය ලාභ ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් මේ ළඟදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට, හැමිල්ටන් ඇළ සංවර්ධනය කරන්න දුන්නා. මාස තුනයි තිබෙන්නේ. ජැයිකා ආධාර හරී. ණය ආධාර හරී. කෝටි 40 ක්. මාස තුනෙන් කෝටි 40 ක වැඩ කරන්නේ කොහොමද? මේක ලොකු ප්‍රශ්නයක් වුණා. නමුත් නිමල් ලන්සා ගරු ඇමැතිතුමා එය භාර අරගෙන, අපේ සාමාන්‍යාධිකාරිතුමා, සභාපතිතුමා, නිලධාරී මහත්වරු ඇවිල්ලා වැඩ පටන් අරගෙන අද ලංකාවේ තිබෙන දර්ශන ස්ථාන අතරින් ඉතාමත් සුන්දර ස්ථානයක් බවට හැමිල්ටන් ඇළ පත් වෙලා තිබෙනවා. ඉස්සර වටේම ඉන්න අය කුණු දැම්මේ මේ ඇළට. නමුත් අද සුන්දර ස්ථානයක් බවට පත් කරලා තිබෙනවා. අපි මේවා ගැන අගය කරන්න ඕනෑ. ඒ නිසා අපට නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයට යෝජනා කරන්න දෙයක් නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

දැන් ලන්සා ඇළ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

දැන් ලන්සා ඇළ වෙලා තිබෙන්නේ. ඕලන්ද ඇළ. නමුත් අපි මේ අයට ඒවා කියලා දෙන්න දෙයක් නැහැ. අපට අලුත් යෝජනා ගෙනෙන්න දෙයක් නැහැ. මේවායේ හොඳ සැලසුම් තිබෙනවා. ඒ නිසා අද වත්තල ආසනයේ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්පහ දිස්ත්‍රික්කය තුළ සහ බස්නාහිර පළාතේ තිබෙන PRD එකට අයිති පාරවල්වලින් 80% ක්ම දැන් කාපට් කරලා ඉවරයි. සංවර්ධනය කරලා ඉවරයි. රන් අරුණ තුන ඉවර වෙන කොට ගම්පහ දිස්ත්‍රික්කයේ පාරවල් 100% ක්ම හදලා ඉවරයි කියන එක ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ නිසා මේ පාරවල් හැදෙන කොට, මේ මංමාවත් ඉදි වෙන කොට, පරිසරය ලස්සන වෙන කොට, අර Jogging track හැදෙන කොට අර මහත ඇඟ තිබෙන ගෑණු, ප්‍රෙෂර් එක තිබුණු පිරිමි, රෝස්ලා වාගේ අය අද ඇවිදගෙන ගිහිල්ලා ඒ අය යම්කිසි තෘප්තියක් ලබනවා. නිරෝගීමත් බව අත් වෙලා. අද ඉස්පිරිතාල වැහිලා. සමහර අය ඩිස්පැන්සරිවලට බෙහෙත් ගන්න යන්නෙත් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඉස්පිරිතාල වැහිලා තිබෙන්නේ, බෙහෙත් නැති හින්දා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

නැහැ. නැහැ. සමහර අයට ප්‍රෙෂර් එක නැහැ. කොලෙස්ටරෝල් නැහැ. Sugar නැහැ. තමුන්නාන්සේ ඇවිදින්නේ නැති වුණාට කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සේ ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමාගේ අහලා බලන්න කෝ. ජෝර්ජ් පෙරේරා සංවිධාකයතුමා ඇවිදිනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආණ්ඩුව පැරදෙන කොට Suger හැදෙයි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

නැහැ. නැහැ. ඒක ඔබතුමියන්ලාට හැදෙන දෙයක්. අපි 17 ක් සිටියා. දුක් වින්දා. Sugar වැඩි වුණේ නැහැ. අපි ඔයිට වැඩිය හොඳට සිටියා. අපි ඔහොම කෑ ගැහුවෙත් නැහැ. කුහක වැඩ කෙරුවෙත් නැහැ. ඒ නිසා අද බස්නාහිර පළාත් සභාව තුළ නිමල් ලන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන මාර්ග පද්ධතිය ඉතාමත් අංගසම්පූර්ණ ලෙස හදන්න හොද නායකත්වයක් ලබා දීලා තිබෙනවා. ඒ වගේම ලාභ ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ එක.

මේ දෙවැනි එක. මාතෘ සායන. ඒ වාගේම සති පොළවල්. ඉස්සර සති පොළවල් තිබුණා, මැස්සෝ ඇහිරෙනවා. මම උදාහරණයක් වශයෙන් කියන්නම්. අපේ බෝපිටියේ සති පොළක් තිබුණා. ඇතුළට පයින් යන්නවත් බැහැ. නහය වහගෙන යන්නේ. අද ඒක සුපර් මාකට් එකක්. කෝටි ගණනක් වියදම් කරලා සංවර්ධනය කරලා සතියකට දවසක් දෙකක් වෙළඳ පොළේ බඩු වික්ක මිනිස්සු දැන් ඇතුළේ ඉඳන් සතිය පුරාම බඩු විකුණනවා. එළියට යන්නේ නැහැ. මේක තමයි ක්‍රමය. මෙන්න මේවා ඉගෙන ගන්න. මේවා අගය කරන්න. මේවා විවේචනය කරන්න එපා. කොහොමත් නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාව සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විවේචනය කරන්න බැහැ. අගය කරනවා මිසක්. ඒක මම 100% ක් දන්නවා. ඒක කරන්න බැහැ. එහෙම කෙරුවොත් ගුණමකුවෙක් වෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමාගේ ගුණමකුකම මගෙන් අහගන්න එපා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

එහෙම නොකර බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමා වාගේ ගුණමකුවෙක් නොවන නිසා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

එහෙම නොකර බැහැ. නමුත් අපි විපක්ෂයේ සිටියා නම් අපි සත පහක දෙයක් ආණ්ඩු පක්ෂයෙන් ගන්නේ නැහැ. අපි ගන්නේ නැහැ. අපි ප්‍රතිපත්ති වශයෙන් ඉන්නවා. අපි අවුරුදු 17 ක් සිටියා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ කියන්නේ මෙතුමා පාවා දුන්නාද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ඒක අපි දන්නේ නැහැ. විපක්ෂයට වෙලා තිබෙන දේ තේරුම් ගන්න. අපි යන්නේ නැහැ. අපට ඕනෙත් නැහැ. අපි විවේචනය කරන්නේ නැහැ. අපි පැත්තකට වෙලා ඉන්නවා, කර ගන්න දෙයක් කර ගන්න දීලා. ඒ වාගේම තමයි පශු සම්පත් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දැන් මෙතුමා වත්තල සංවිධායක වෙලා ආපුවාම අවංකවම වැඩ කරනවාද? ඒක කියන්න කෝ. කෙළින් කියන්න. අවංකව වැඩ කරනවාද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

තමුන්නාන්සේව ගෙනාපු ජෝන් අමරතුංගව -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම අහන්නේ අවංකව වැඩ කරනවාද කියලා. එතුමාගේ නායකත්වය පිළිඅරගෙන අවංකව වැඩ කරනවාද? ඒකට කෙළින් උත්තරයක් දෙන්න කෝ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

අපි දැනුත් වැඩ කරනවා. තමුන්නාන්සේව ගෙනාපු (බාධා කිරීමක්)

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නීල් රූපසිංහ -

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

නීල් රූපසිංහට නොවෙයි. තමුන්නාන්සේ ජනාධිපති කිව්වත් කමක් නැහැ. ලන්සා ඇමැතිතුමාට තමයි වැඩ කරන්නේ. තමුන්නාන්සේලා වාගේ හය නැහැ. තමුන්නාන්සේව ගෙනාපු ජෝන් අමරතුංගව තමුන්නාන්සේ කැපුවා. ඒ නිසා තමුන්නාන්සේ වාගේ ගුණමකුවෝ නොවෙයි අපි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ කාලයේ මාව කපනවා කිව්වාම මෙතුමා ගිහිල්ලා එහේ බැස්සා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

දේශපාලන පියාටත් ගැහුවා. දේශපාලන පියාව මැරුවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

අවුරුද්දක් කථා කරන්න පුළුවන්. කරපු දේවල් පිළිබඳව අවුරුදු පහක් වුණත් කථා කරන්න පුළුවන්. කියපු දේවල්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

යූ.ඇන්.පී. එකට එන්න හැදුවේ මොකද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ඕඩර්ස් දුන්න හැටි. පොලීසියේ බලතල අරගෙන, පොලීසියේ ASP ලා DIG ලා වාගේ සිටියේ. ඒ දවස්ල. ජෝන් අමතුරංග අභ්‍යන්තර ඇමැති කාලයේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරිකමල්?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මේ ගොල්ලෝ පොඩි මනුස්සයෝ නොවෙයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පශු සම්පත් දිහා බැලුවාම, සත්ත්ව නිෂ්පාදනය දිහා බැලුවාම කුකුල් පැටවු විතරක් - මම මේ පළාත් සභා මන්ත්‍රී. මේ නිකන් ඉන්න මන්ත්‍රීතුමා කුකුල් පැටවු විතරක් ලක්ෂ 50 ක බෙදලා තිබෙනවා. මම හිටපු සභාපතිතුමාගෙන් ඇහුවා, ඒ කාලයේ මේවා බෙදුවාද කියලා. එහෙම නැහැ. ඉඳලා හිටලා එකෙක් දෙන්නෙක් දෙනවා කියලා කිව්වා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වත්තල කුකුල්ලු ඔක්කොම මෙතුමන්ලාගේ ගෙදර.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

අද කිකිළියෝ ඉන්නවා. කුකුල්ලු නැහැ. කාන්තාවෝ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එක කුකුළෙක් සිටියා. ඌ පළාත් සභාවට ආවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

කිකිළියෝ ඉන්නවා. කුකුල්ලු අඩුයි. කුකුල්ලු අඩු නිසා අපි ගෙවල්වලට ගිහිල්ලා කුකුළන් බෙදා හරිනවා. ඒ වාගේම තමයි කිරි ගවයා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිරි ගවයන් පැටවු ගහන කොට පැටවු දාන්නේ එළියට. හුඟාක් පිරිමි සත්තු. පිරිමි සත්තු තමයි පැටවු ගහන්නේ. ඒ නිසා අද පිරිමි සත්තුගෙන් කිරි ගන්න

විධියක් නැහැ. ඒ නිසා අද කෘතිම සිංචනය තුළින් ගැණු සත්තු එළියට ගන්න පුළුවන් ක්‍රමයක් ඇති කරන්න ඕනැ. හොඳ ජාතියේ එවුන්. දැන් හරක් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හරක් ජාති ඉන්නවා. ඒ හරක් ජාතිය තුළ හොඳ කිරි ගවයන් හදන්න ඕනැ. නැත්නම් සමහර වැස්සියෝ ඉන්නවා, කිරිත් නැහැ. පැටවුත් නැහැ. ඌ කන්න අඳින්න දෙන්නෙත් නැහැ. බැඳලත් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මන්ද පෝෂණය.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

බැන්දලත් නැහැ. වැඩකුත් නැහැ. මොකුත්ම වැඩක් නැහැ. කිසිම වැඩක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හරියට නිකන් රෝස් වාගේ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

කිසි වැඩක් නැහැ. ලෝකයට වැඩක් නැහැ. ඔහේ කනවා. ඔහේ බොනවා. එහෙම වැස්සියෝ හදලා හරියන්නේ නැහැ. හොඳ කිරි වැස්සියෝ හදන්න ඕනැ. කිරි බෝතල් 20 ක් වත් ගන්න පුළුවන් එවුන්. පැටවු ගහන එවුන්. (බාධා කිරීමක්) පැටවු ගහන්නේ නැහැ නේ. කනවා. බොනවා. කෑ ගහනවා. එච්චරයි. තප්පුලනවා විතරයි. කනවා. බොනවා. තප්පුලනවා විතරයි. තෙල් මන්දාරන්න දෙන්න හොඳ නැහැ. ඒ නිසා අපි හොඳ ගවයින් හදන්න ඕනැ. හොඳ නිෂ්පාදනයක් කරන්න ඕනැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොඩාක් දේවල් කථා කරන්න පුළුවන්. මේ අමාත්‍යාංශය ගැන කථා කරන්න දෙයක් නැහැ. සංචාරක ව්‍යාපාරය දිහා බැලුවත් එහෙමයි. ඒ වාගේම ධීවර කර්මාන්තය දිහා බැලුවත් එහෙමයි. නිවාස දිහා බැලුවාමත් එහෙමයි. හැම දෙයක්ම අකුරට කරලා තිබෙනවා. ඒ නිසා මේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න දෙයක් නැහැ.

මේකට උපකාර වුණේ, නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා විතරක් නොවෙයි. ගරු ජනාධිපතිතුමා. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා. ගරු මහ ඇමැතිතුමා. අනික් අමාත්‍යවරු. මේ ඉන්න මන්ත්‍රීවරු. ඒ වාගේම මේ නිලධාරී මහත්වරු. සාමාන්‍යාධිකාරීතුමා. ඒ වගේම අපේ සභාපතිතුමා. අනික් නිලධාරීවරු කැප වුණා. මාස තුනෙන් කෝටි 40 ක වතුරේ වැඩ කරලා අංගසම්පූර්ණ ව්‍යාපෘතියක් බවට පත් කෙරුවා. මේක තමයි ප්‍රාතිහාර්යය. මේ වාගේ ප්‍රාතිහාර්යය කරන ඇමැතිවරු ඉන්නවා නම් මෙතැන නොවෙයි ඉන්න ඕනැ. මේ වාගේ ප්‍රාතිහාර්ය කරන ඇමැතිවරු ඉන්න ඕනැ පාර්ලිමේන්තුවේ. ඒ නිසා තමයි අද අපේ දැයට කිරුළ 2014 - මෙපමණ කල් කොන්ත්‍රාත්කාරයන් හම්බ කර ගත්තේ. ඒක බස්නාහිර පළාත් සභාවේ අපේ අමාත්‍යාංශයට දුන්නා, ඒ වැඩ ටික කරගෙන යන්න. ඔන්න බලන්න මේක තමයි ක්‍රමය. මේක තමයි ඇමැතිවරුන්ගේ හොඳකම. ඒ නිසා මම මේ අවස්ථාවේදී අවසාන මොහොතේ, පළාත් සභාවේ අවසාන කථාව. මම කියා සිටිනවා. අපට සහයෝගය දුන්න හැමෝටම අපි ස්තුතිවන්ත වෙන්න ඕනැ. ඒ වාගේම අලුත් අවුරුද්දක් ලබනවා. අපි ඊට පෙර හමුවෙන්නේ නැහැ. අපේ නත්තල් එනවා. සියලු දෙනාටම, නිලධාරී මහත්වරුන්ට, මේ අවුරුදු පහ ඇතුළත සහයෝගය දක්වපු සෞඛ්‍ය කම්කරුවාගේ සිට සියලු දෙනාටම අපි නත්තලටත් සුභ පතලා, අවුරුද්දටත් සුභ පතන ගමන්ම නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා ලබන අවුරුද්දේ නොවෙයි, ඊළඟ අවුරුද්ද වන විට පාර්ලිමේන්තුවේ ඉහළම පුටුවක ඉන්නවයි කියන එක විපක්ෂය මතක තියා ගන්න කියමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.57]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න ඇත්ත වශයෙන්ම අදහස් කරගෙන සිටියේ නැහැ. නමුත් අද උදෑසන ලැබුණු අවස්ථාව නිසා මේ පස්වැනි පළාත් සභාවේ සමහර වේලාවට අපෙන් සිද්ධ වන අවසාන කථාව වෙන්න පුළුවන්. හවස කොහොම වෙයිද දන්නේ නැහැ. නමුත් ඇත්ත වශයෙන්ම මේ අමාත්‍යාංශය පළාත් සභාවේ තිබෙන අමාත්‍යාංශ පහ එක්ක සංසන්දනය කරලා බලද්දී සමස්තයක් හැටියට ගත්තාම ප්‍රසංශනීය කටයුත්තක් ඉදිරිපත් කරපු අමාත්‍යාංශයක් බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනැ. විශේෂයෙන්ම ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමා

[ ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ]

කිව්වා, අපේ වත්තල ප්‍රදේශයේ පළාත් මාර්ග පිළිබඳව. පළාත් මාර්ග පිළිබඳව ඇත්ත වශයෙන්ම අපට ප්‍රශ්නයක් නැහැ. සියලුම මාර්ග හදලා ඉවරයි කියලා කිව්වා. සියලුම මාර්ග නම් හදලා ඉවර කරලා නැහැ. බෝඩ් ගහලා තිබෙනවා. ඒවායේ වැඩ තවම ආරම්භ කරමින් පවතිනවා. සියලුම මාර්ග ඉවර කරලා නැහැ. ඒක කියන්න ඕනෑ. ලකුණු දා ගන්න කිව්වාට (බාධා කිරීම්) –

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ ප්‍රාදේශීය සභාවට අයිති පාරවල්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

සමහර මාර්ගවල යන්නවත් බැහැ. ඇත්ත කතන්දරය ඒකයි. මෙතුමාට පිං සිද්ධ වෙන්න සමහර ප්රාදේශීය මාර්ගත් එතුමා මැදිහත් වෙලා කරලා දීලා තිබෙන නිසා තමයි ප්‍රාදේශීය සභාවේ නම්බුවත් රැකිලා තිබෙන්නේ. ඒ නිසා සියලුම මාර්ග ඉවර වෙලා නැහැ. ඒ කොහොම වුණත් අමාත්‍යාංශයක් හැටියට මේ වෙන් කරලා තිබෙන මුදලෙන් උපරිම ප්‍රයෝජනය අරගෙන තිබෙනවාය කියන ප්‍රකාශය කරන්න ඕනෑ. මොකද, මේ පළාත් සභාවෙන් සමස්ත අයවැයෙන් 2% ක වාගේ ප්‍රමාණයක් තමයි මේ අමාත්‍යාංශය සඳහා වෙන් වෙලා තිබෙන්නේ. හැබැයි, ඊට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් මධ්‍යම රජයෙන් නැවත මුදල් ලබාගෙන, කුමන හෝ මාර්ගවලින් ඒ වැඩ කරලා තිබෙනවා. ඒ නිසා අපි ඒ ගැන ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

විශේෂයෙන්ම මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා එතුමාට සම්බන්ධ යෝජනා දෙකක් මේ පළාත් සභාවේ මම ඉදිරිපත් කළා. ගිය අවුරුද්දේ එකක්. මේ පළාත් රාජ්‍ය සේවයේ ඉන්න නිලධාරීන්ට සුදුසු විධියට දිස්ත්‍රික්ක තුනේ නිවාස සංකීර්ණ තුනක් ඉදි කරන්න කියලා. ඒ යෝජනාවට කිසිම කෙනෙක් විරුද්ධ වන්නේ නැතිව ඒකමතිකව සම්මත කළා. නමුත් මට කනගාටුයි. ලබන අවුරුද්දේ තිබෙන මුදල් ප්‍රකාශයේදීවත් ඒ සඳහා වැඩි ඉඩකඩක් යොදවලා නැහැ. ඒ නිසා ඒ පිළිබඳව එතුමාගේ අවධානය යොමු කරනවා. මොකද, අද නිවාස ප්‍රශ්නය මේ ප්‍රදේශයේ බහුලව තිබෙනවා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රක්කයේ, කොළඹ දිස්ත්‍රික්කයේ. මේ දිස්ත්‍රික්ක දෙකේ විශාල වශයෙන් තිබෙනවා. එතකොට මම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් කියලා කියන්නේ - විවිධ ආකාරයේ ණය යෝජනා ක්‍රම මේ රටේ බැංකු හරහා ක්‍රියාත්මක වෙනවා. විවිධ ආයතන මාර්ගයෙන්. නමුත් අපේ පළාත් සභාවේ එවැනි වැඩ සටහනක් නැති නිසා ඒකට සෘජුව වග කියන්න පුළුවන් අමාත්‍යවරයා හැටියට එතුමා ඒක නියාමක ව්‍යාපෘතියක් විධියට ආරම්භ කළා නම්, අඩුම තරමින් මෙය දිස්ත්‍රක්ක තුනේ පටන් ගත්තා නම් විශාල සේවයක් සිදු වෙනවා. මහල් නිවාසවලින් හරි. නමුත් ඒ පිළිබඳව අවධානය යොමු නොකිරීම මම හිතන්නේ, එතුමාට මහ හැරුණු විෂයයක් හැටියට මම කල්පනා කරනවා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම අපි ජීවත්වන බල ප්‍රදේශය ධීවරයින් විශාල ප්‍රදේශයක් ආවරණය වෙනවා. වත්තල, ජා-ඇළ, මීගමුව, කටාන මැතිවරණ කොට්ඨාශවල. මේ ධීවරයෝ ඇත්ත වශයෙන්ම මේ රටට විශාල සම්පතක්. නමුත් ඔවුන් ගත කරන ඒ දුක්ඛිත ජීවිතය පිළිබඳව එක යෝජනාවක් ඉදිරිපත් කෙරුවා. අපි, මේ සියලුම මන්ත්‍රීවරු හැමදාම කරපු දේ, ධීවර කටයුතුවල නියැලී සිටින අපේ ඒ ධීවර කාර්මිකයන්ට දැළක් දෙනවා. එක්කෝ ඔරුවක් දෙනවා. බෝට්ටුවක්, මොනවා හරි ගෙවීමේ ක්‍රමයට දෙනවා. ඡන්ද කාලයට ගිහිල්ලා ධීවර දරුවන්ට පොත් ටිකක් බෙදනවා. මාළු පෙට්ටියක් දෙනවා. ඒ ඇරෙන්න ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට උවමනා කරන වෙන ව්‍යාපෘතියක්, වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ.

ඇත්ත වශයෙන්ම පළාත් සභාවට ඒ තරම් ලොකු කාර්යභාරයක් කරන්න නැහැ. ඒක මධ්‍යම රජයේ කටයුත්තක්. නමුත් පළාත් සභාවේ මේ වැඩ කෙරෙන විධිය දිහා බැලුවාම මීට වඩා යමක් ඔවුන්ට කරන්න තිබුණා. ඔවුන් ජීවත් වන බල ප්‍රදේශවල තිබෙන ඔවුන්ගේ නිවාස ප්‍රශ්නය. ඇත්ත වශයෙන්ම එය ඉතාමත්ම ඛේදනීය තත්ත්වයක තිබෙන්නේ. ඒ වාගේම තමයි ඔවුන්ගේ පාසල් අධ්‍යාපනය. 6, 7, 8 වන කොට මේ ළමයින් අධ්‍යාපනය අතහැරලා යනවා. මොකද, තිබෙන දුප්පත්කම නිසා. ඒක නිසා ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ඇති කරන්න කියලා අපි යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාවත් මේ සභාවේ ඒකමතිකව සම්මත වුණා. නමුත් ඒ පිළිබඳවත් අවධානය

යොමු කරලා නැහැ. සමහර වේලාවට එතුමාට මේ පාරවල් ගැන, එහෙමන නැත්නම් වෙනත් කාර්යයන් ගැන - දැන් අර කිව්වා, දැයට කිරුළේ වැඩ කරන්න කියලා මේ පළාත් සභාවේ මේ අමාත්‍යාංශයට තමයි ඒ වැඩ කටයුතුත් භාර දීලා තිබෙන්නේ කියලා. මම තලවිල පල්ලි යනකොටත් දැක්කා. බස්නාහිර පළාත් සභාවෙන් තමයි හදන්නේ. එතුමා මේ පළාත් සභාවේ මේ කාර්යයට අමතරව මේ ලංකාවේ අනික් තැන්වලත් මේ විධියට කටයුතු කරගෙන යනවා. අර වැඩක් කරන කෙනෙක් දැක්කාම ඉතින් ඒක භාර දෙනවා. මම හිතන්නේ, ඒක සිරිතක්. නමුත් එතුමාට වෙන් වුණු ඒ විෂයය පිළිබඳව මීට වඩා අවධානය යොමු කළා නම් මම හිතන්නේ සාර්ථක ඇමැතිවරයෙක් හැටියට එතුමාට මේ අවුරුදු පහ ගෙවනකොට තමන්ට සෑහීමකට පත් වෙන්න පුළුවන්කම තිබුණයි කියන එක මම විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි ඉදිරියේදී මැතිවරණයක් එනවා. අපේ ජානක සූරිය බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා කිව්වා, එතුමා බොහොම අකැමැත්තෙන් කියලා, කියලා, මම බලෙන්ම කියවා ගත්තා වත්තල මැතිවරණ කොට්ඨාශයේ සංවිධායක වුණාම එතුමාට වැඩ කරනවාද කියලා. එතුමා කිව්වා. මම හිතන්නේ ඒක හැන්සාඩ් ගත වෙනවා. මට පුළුවන් ගිහිල්ලා වත්තල ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට නීල් රූපසිංහ මහත්මයා ඇතුළු අයට දෙන්න. එතුමාගේ සහයෝගය නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාට දෙනවා කියලා. මම නම් බලාපොරොත්තු වුණේ, එතුමා පාර්ලිමේන්තුවට යවන්න නොවෙයි. මේ පළාත් සභාවේ මහ ඇමැති වෙන්න ඕනෑ. හැබැයි එහෙම වෙන්නේ නැහැ. මොකද, මේ පළාත් සභාව අපි දිනනවා කියලා මම ඊයෙත් අහගෙන කවුද කිව්වා. අපේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ඉන්නවා, මහ ඇමැතිකම ගන්න. ඒ නිසා ඒ තත්ත්වය ඇති වෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාට මම විශේෂයෙන්ම කියනවා. මේක කියලා නතර කරන්න ඕනෑ. මන්ත්‍රීවරයෙක් හැටියට යම්කිසි අවස්ථාවක අපේ ආත්ම ගෞරවය බේරන්න පළාත් සභාවේ ඇමැතිවරු පස් දෙනාගෙන් එකම එක ඇමැතිවරයයි අපි වෙනුවෙන් ඉදිරිපත් වෙලා සිටියේ. ඒක කියන්න ඕනෑ. ඒක ඕනෑම වේලාවක නොබියව කියනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාවත්, අනික් ඇමැතිවරු තුන් දෙනාවත් අපේ ආත්ම ගෞරවය බේරන්න ඉදිරිපත් වුණේ නැහැ. එවැනි අවස්ථාවක මොනවා හරි ඉල්ලීමක් කළාම - මම හිතන්නේ අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඒ වරප්‍රසාදය යම් අවස්ථාවලදී භුක්ති වින්දා. ඒක නිසා ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ ගැනත් ප්‍රකාශ කරමින්, තමුන්නාන්සේලා සියලු දෙනාටම ලබන්නා වූ 2014 වසර සුභ අලුත් අවුරුද්දක් වේවා, ප්‍රීතිමත් නත්තලක් වේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 10.02]

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත් එක්ක එකතුවීමට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ පළාත් සභාවක, අද මුළු ලංකාවේම පළාත් සභා රාශියක් තිබෙනවා. පළාත් සභාවේ වැඩ කරන අමාත්‍යාංශයක් තිබෙනවා නම් ඒ අපේ නිමල් ලන්සා ගරු ඇමැතිතුමා මෙහෙයවන මේ මහා මාර්ග අමාත්‍යාංශයයි කියලා භය නැතිව කියන්න පුළුවන්. මොකද, එතුමා කරලා තිබෙන කර්තව්‍යයන් ප්‍රමාණය විශාලයි. ප්‍රදේශයේ දියුණුවට, පළාතේ දියුණුවට විශාල වශයෙන් එතුමා කටයුතු කරලා තිබෙනවා. අපි දන්නවා, අද වනකොට මාර්ග සංවර්ධනය පමණක්, C හා D මාර්ග 70% කින් එහා ගිය මාර්ග ප්‍රමාණයක් නිම කරන්න ලැබිලා තිබෙනවා කියලා. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, සාමාන්‍යයෙන් අපි රජයේ ආයතනයකට යන්න ටිකක් මැලි වෙනවා. මොකද, රජයේ ආයතන කිව්වාම රාජ්‍ය ආයතනවල සේවකයන් හුඟාක් වේලාවට වැඩ කිරීම අතින් බොහොම දුර්වලයි. අපි දන්නවා, පැය අටක් වැඩ කරන්න තිබුණාට සමහර රාජ්‍ය ආයතනවල වැඩ කෙරෙන්නේ පැය හතරයි. පහයි. මොකද, තේ බොන්න, අනික් විවේක කටයුතුවලට ගොඩක් වෙලා යනවා. හැබැයි අපි දකිනවා, නිමල් ලන්සා ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයට ගියාම එතුමා උදේ හයට අමාත්‍යාංශයේ වැඩ පටන් අර ගන්නවා. නිලධාරී මණ්ඩලයත් එතැන. උදේ හය වන කොට සියලු දෙනාම එකතු වෙලා ප්‍රදේශය සංවර්ධනය කරන්නේ කොහොමද කියන කටයුතුත් එක්ක එකතුවෙලා, ඒ කටයුතු බෙදා හදා ගනිමින් ඉතා උවමනාවෙන් තමාගේ කටයුතු කරනවා. ඒක අපි වෙනත් රාජ්‍ය ආයතනවල දකින්නේ නැහැ. ඒ හැකියාව

[ ගරු සරත් සුමනසේකර ]

ලැබිලා තිබෙන්නේ, නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ කාර්යශූර හැකියාව නිසා කියලා මම හිතනවා. නැත්නම් එතුමා නවයට අමාත්‍යාංශයට ඇවිල්ලා වැඩ පටන් ගත්තා නම් මේ එක්කෙනෙකුටවත් වෙන වැඩක් කරන්න ලැබෙන්නේ නැහැ. එතුමාගේ කාර්යශූරත්වයත් එක්ක සියලු දෙනාම එකතු වෙලා අද අනික් රාජ්‍ය ආයතනවලින් එහා ගිය විශේෂ අමාත්‍යාංශයක් බවට පත් වෙලා තිබෙනවා කියන එක භය නැතිව කියන්න පුළුවන්. ඒ කර්තව්‍යයට නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාට අපි සියලු දෙනා ස්තුතිය පුද කරන්න ඕනෑ.

අපි දන්නවා, මේ අවස්ථාවේ මාර්ග පද්ධතිය හොඳින් සංවර්ධනය වෙලා තිබෙනවා. එතුමා පළාත් මාර්ග විතරක් නොවෙයි. එතැනින් එහාට ගිහිල්ලා එතුමා ග්‍රාමීය මාර්ග සංවර්ධනයටත් අපිත් එක්ක එකතු වෙලා තිබෙනවා. අපේ සියලු පළාත් පාලන ආයතනවලට ඒ අවස්ථාව ලං කර දීලා තිබෙනවා. මම මේ එක්කම යෝජනාවක් කරන්න කැමැතියි. අපි දන්නවා, පළාත් පාලන ආයතන මඟින් මේ වනකොට හුඟාක් පළාත්වල ග්‍රාමීය මාර්ග සංවර්ධනය කරනවා. මම හිතන්නේ, ලක්ෂ පහක මුදලක් යෙදෙව්වොත් අපි දන්නවා, මාර්ගයකට යන්නේ ලක්ෂ තුනකටත් අඩුවෙන්. හුඟාක් වේලාවට පළාත් පාලන ආයතවලින් කෙරෙන කර්තව්‍යයන්වලින් ඒක තමයි වෙලා තිබෙන්නේ. හැබැයි, අපට පුළුවන්කම ලැබෙනවා නම්, මේ කටයුතුත් මාර්ග සංවර්ධන අධිකාරියට ලං කරලා දෙන්න, මම හිතන්නේ, ලක්ෂ පහෙන් ලක්ෂ 4 ½ ක්වත් පාරවල් යෙදෙයි. මොකද, නැති වුණොත් අද වන කොට හුඟාක් පළාත් පාලන ආයතනවල අයගේ සාක්කුවල ඒ මුදල් තිබෙන්නේ. ඒක වෙනස් කර ගන්න පුළුවන් මේ කටයුතු මෙවන් වූ කාර්යක්ෂම ආයතනයකට ලං කර දුන්නොත්. ඒක තමයි වෙන්න ඕනෑ. මම හිතන්නේ, ඉදිරියේදී ඒ කටයුතු වෙයි. ඉතින් මම හිතන්නේ, පළාත් මාර්ග ගැන කථා කරන්න දෙයක් නැහැ. එතුමා ඒ කටයුතු ඉතා හොඳින් ඉටු කරලා තිබෙනවා.

අපි දන්නවා, අද වන කොට මිලියන - මම හිතන්නේ මම නිවැරදි ඇති. මිලියන 1000 කට එහා ගිය ශුද්ධ ලාභයක් පළාත් මාර්ගවලින් විතරක් ලබලා තිබෙනවා. මම හිතන්නේ, මිලියන 1000 ක්, 1500 ක් අතර මුදලක්. ඉතා විශාල මුදලක්. මම හිතන්නේ ගිය පළාත් සභාවල මේ වාගේ කර්තව්‍යයන් වෙන්න නැතිව ඇති. අද පළාත් සභාවට විශාල මුදල් ප්‍රමාණයක් ඒ තුළින් ගලාගෙන එනවා. මොකද, එතුමන්ලා අද මාර්ග සංවර්ධනය කරන්නේ, බස්නාහිර පළාතේ විතරක් නොවෙයි. අද වන කොට වයඹ, සබරගමුව වැනි පළාත්වලත් මාර්ග සංවර්ධනය කරන්නේ අපේ නිමල් ලන්සා ගරු ඇමැතිතුමාගේ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින්. අපි දකිනවා, කොයිතරම් දුරට කාර්යක්ෂමතාවය තිබෙනවාද කියලා. කොළඹ පාරවල් ටික කරන ගමන් එතැනින් එහාට ගිහිල්ලා වයඹටත්, සබරගමුවටත් ගිහිල්ලා ඒ මාර්ගත් සංවර්ධනය කරලා මේ ප්‍රදේශයේ ආදායම් තත්ත්වය තවත් වැඩි කර ගන්න එතුමා උනන්දු වෙලා තිබෙනවා. ඒක තමයි අපි දකින විශේෂත්වය. කාර්යශූර ඇමැතිවරයෙක් වශයෙන්. එතුමා අනික් ඇමැතිවරු වාගේ තමන්ගේ විෂයෙන් එහාට ගිහිල්ලා වැඩ කරලා නැහැ. අපි දකිනවා, හුඟාක් ඇමැතිවරු අද ඡන්දය නිසා වෙනත් වෙනත් දේවල් එක්ක එකතු වෙනවා. හැබැයි, එතුමා තමන්ගේ විෂයය හරියට නිවැරදිව තේරුම් අරගෙන විශාල කර්තව්‍යයක් ඉටු කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ උදය ගම්මන්පිළ ගරු ඇමැතිතුමා ගැනද කිව්වේ?

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

මම හිතන්නේ ඕනෑම කෙනෙකුට ඕනෑම දෙයක් හිතා ගන්න පුළුවන්. මම කිව්වේ එතුමා ගැන. එතුමා එතැනින් එහාට කොහෙවත් ගිහිල්ලා නැහැ. හැමදේම සාධාරණ විධියට හැම දෙනාටම බෙදා දෙන්න ලැහැස්ති වෙලා ඉන්නවා.

අපි දන්නවා, අද වන විට මාර්ග සංවර්ධන අධිකාරියට තමන්ගේ කියලා තැනක් තිබුණේ නැහැ. අද විශාල වශයෙන් ශක්තිමත් තැනක් අරගෙන මාර්ග සංවර්ධන අධිකාරිය සතුම ගොඩනැගිල්ලක් සහ අවශ්‍යතාවයන් ඉටු කරන තැනකට ඒ දේවල් පත් කරලා තිබෙනවා. මේක තමයි මම කියන කාර්යශූරත්වය. ඉතින් මම කිව්වා වාගේ මාර්ග ගැන කථා කරන්න දෙයක් නැහැ. කවුරුත් එකඟ වෙනවා. අපි දන්නවා, විපක්ෂයත් අද වන විට නිමල්

ලාන්සා ගරු ඇමැතිතුමාගේ හැකියාව දැනගෙන තිබෙනවා. මම හිතන්නේ ඒ ගැන කිසිම වාද විවාදයක් අද වන විට නැහැ.

එතුමාට තිබෙනවා, සත්ව නිෂ්පාදන, නිවාස, ඉදිකිරීම්, ධීවර හා සංචාරක කටයුතු වාගේ අමාත්‍යාංශත්. එතුමාට ඒ දෙවල් කරන්න මුදල් මදිකමක් තිබෙනවා කියලා අපි හොඳටම මේ වැය ශීර්ෂ තුළින් දකිනවා. එහෙම නොවුණා නම්, මුදල් තිබුණා නම් අපි දකිනවා, එතුමාට විශාල කර්තව්‍යයන් කරන්න පුළුවන්කම ලැබෙයි, සංචාරක ව්‍යාපාරයත් එක්ක. මොකද, තරුණ ඇමැතිවරයෙක්. රට ගැන හොඳ හැඟීමක් තිබෙන ඇමැතිවරයෙක්. ප්‍රදේශය ගැන හැඟීමක් තිබෙන ඇමැති කෙනෙක්. විශේෂයෙන් සංචාරක ප්‍රදේශයක ජීවත් වන ඇමැතිවරයෙක්. සංචාරකයන් විශාල පිරිසක් එනවා. මම අහගෙන අපේ ඒ.එම්. යුසුෆ් ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, සංචාරකයන් අද එනවා. හැබැයි ඉන්නේ නැහැයි කියලා. මම හිතන්නේ සංචාරකයින් සාමාන්‍යයෙන් එන්නේ දවස් හතර පහකට තමයි. ඒක තමයි හුඟක් තැන්වල වෙන්නේ. කොහොම වෙතත් සංචාරකයින් පැමිණීම ඉතා විශාල අයුරින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. අද රටේ වෙන ප්‍රශ්නයක් නැති නිසා. මම හිතන්නේ අපි නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාට තව මුදල් ටිකක් වෙන් කරලා දෙන්න පුළුවන් වුණොත්, විශේෂයෙන් රජයෙන් හරි අරගෙන අපට ලබා ගන්න පුළුවන්කම ලැබෙයි, සංචාරක ක්ෂේත්‍රයේත්, නිවාස ක්ෂේත්‍රයේත් ඒ කටයුතු මීටත් වඩා හොඳින් ඉටු කරන්න. මම මීට වඩා අවස්ථාව බලාපොරොත්තු වන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් අපට ඉඟි දක්වනවා, නවත්වන්න කියලා. ඉතින් කොහොම වෙතත් අපි සන්තෝෂ වෙනවා, ගරු ඇමැතිතුමා වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන. සියලු දෙනාටම ලබන්නා වූ නව වසර වෙනුවෙන් මම සුභ පතනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.08]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභාවේ මම ඉතාමත් ආශාවෙන්ම කථා කරන විෂයය තමයි අද මම කථා කරන්න සූදානම් වෙන්නේ. එයට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එයට හේතුව තමයි, අපේ ජීවිත කාලයේ අපි විවිධ දේශපාලන චරිත දැකලා තිබෙනවා. හැබැයි, ඒ දේශපාලන චරිත තමන්ගේ වගකීම් සහ යුතුකම් මේ ජනතාව වෙනුවෙන්, ඒ පළාත වෙනුවෙන් ඉටු කළාද කියන එක පිළිබඳව ජනතාව අතර ලොකු සැකයක් තිබෙනවා. මම මේ කථා කරන අමාත්‍යාංශය භාරව කටයුතු කරන ගරු අමාත්‍යතුමා පිළිබඳව අපට ඉතාමත්ම ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන්. ඔහු සැබෑ ලෙසම ඔහුගේ කාර්යභාරය අඳුනාගෙන විශේෂයෙන්ම තමන්ට පැවරුණු අමාත්‍යාංශවල වගකීම තමන්ගේ දක්ෂ නිලධාරී මඬුල්ලත් එක්ක එකතු වෙලා, අපේ ජනතාවට ඉතාමත්ම හොඳින් සමීප වෙමින් පළාතේ සංවර්ධන දායකත්වය රටට දැනෙන විධියට ක්‍රියාත්මක කරපු අමාත්‍යවරයෙක් හැටියට නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ මේ අමාත්‍යාංශ පිළිබඳව කථා කිරීමට ලැබීම පිළිබඳව මම ඉතාමත්ම සතුටු වෙනවා.

ඒ වාගේම මට මේ අමාත්‍යාංශය ගැන කථා කරනකොට ප්‍රධාන වශයෙන්ම අපේ බේරුවල, කළුතර සංචාරක කලාපය තුළ අපට ආවේණික ව්‍යාපාරයක් වූ සංචාරක ව්‍යාපාරය පිළිබඳව මම මුලින්ම කථා කරන්න බලාපොරොත්තු වෙනවා. එහිදී අද පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරයක් අපේ බේරුවල සහ කළුතර කලාපයට ලබා දීමට මේ ගරු අමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍යාංශය කටයුතු කළා. ඒ නිසා තමයි අපි ඉතාමත් ආඩම්බරයෙන් මේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්නේ. අද බේරුවල Golden mile, එහෙම නැත්නම් රන් සැතපුම කියන සංචාරක කලාපය ඉතාමත්ම සංවර්ධිත කලාපයක් හැටියට පත් වෙලා තිබෙනවා. එයට හේතුව තමයි මේ සංචාරක ව්‍යාපාරය පිළිබඳව මනා අවබෝධයක් තිබෙන, හැඟීමක් තිබෙන නායකයෙක් අපට නායකත්වය ලබා දීම. ඉතින් අද මම හිතන්නේ ඔබතුමා බේරුවල ප්‍රදේශය නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට පැහැදිලිවම දන්නවා, අද සංචාරක කර්මාන්තය බේරුවල ආසනයේ තිබෙන තත්ත්වය කුමක්ද කියලා. එහිදී බේරුවල හොඳ සංචාරක කලාපයක් බවට පත් කරන්න නම්, අපට භෞතික සම්පත්වල ලොකු අඩුවක් තිබුණා. එදා වැඩි වශයෙන්ම සංචාරකයින් බේරුවල සංචාරක කලාපයට එනකොට අඩු පහසුකම් තිබුණු සංචාරක කලාපය අද පහසුකම්වලින් පිරුණු සංචාරක කලාපයක් බවට පත් කරන්නට අපේ අමාත්‍යාංශයට හැකියාවක් ලැබුණා. ඒ වන විට තිබුණු අඩුපාඩුකම් මඟහරවාගෙන ඉතාමත්ම හොඳින්

[ ගරු පියල් නිශාන්ත ]

සංවර්ධනය කරන්න හැකියාව ලැබිලා තිබෙනවා. එහිදී විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, සංචාරක මාර්ග පිළිබඳව. එදා සංචාරකයෙකුට නොවෙයි, ඒ ගමේ අහිංසක ජනතාවටවත් යන්න බැරි වුණු මාර්ග වැඩි වශයෙන් සංවර්ධනය කරන්න සංචාරක අමාත්‍යාංශය අපට ලොකු හයියක් ලබා දීලා තිබෙනවා. ඒ නිසා අති විශාල මුදලක් වෙන් කරලා ඒ සංචාරක මාර්ග සංවර්ධනය කළා. ඒ වාගේම සංචාරක මාර්ග විතරක් නොවෙයි. සංචාරකයින් විවිධ ස්ථාන කරා යන ප්‍රධාන පෙළේ මාර්ග පවා, ඒ වාගේම ග්‍රාමීය මාර්ග පවා අපට සංවර්ධනය කරන්නට හැකියාව ලැබුණා.

සංචාරක කර්මාන්තයේ යෙදෙන රටවල්වලට ගියාට පස්සේ අපි දකිනවා, රාත්‍රී කාලයේ තමයි සංචාරක කර්මාන්තය වැඩි වශයෙන්ම තිබෙන්නේ. ඒ රාත්‍රී කාලයේ තමයි සංචාරකයින් වැඩි වශයෙන්ම මුහුදු වෙරළට බැහැලා, ඒ වෙරළේ සිරි නරඹමින්, විවිධ ප්‍රදර්ශනයන් බලමින් ඔවුන් සතුටට පත් වෙන්නේ, රාත්‍රී කාලයේදී. අපේ බේරුවල සංචාරක කලාපයට එවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. Solar Power, එහෙම නැත්නම් සූර්යාලෝකයෙන් විදුලි පද්ධතියක් ලබා දීලා ඉතාමත්ම විශාල වියදමක් දරලා ඒ කාර්යය ඉටු කළා. අද ඉතාමත්ම අලංකාර සංචාරක කලාපයක් බවට එම මුහුදු තීරය පත් වෙලා තිබෙනවා. අපි 14 වැනිදා අපේ නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ සංචාරක කලාපයට අඩුවක්ව තිබුණු Beach Clean යන්ත්‍රය, වෙරළ පිරිසිදු කිරීමේ යන්ත්‍රය අපි ලබා දීමට කටයුතු කර තිබෙනවා. ඒ නිසා ගරු අමාත්‍යතුමා සංචාරක කලාපය වෙනුවෙන් මහා දැවැන්ත කාර්ය භාරයක් කරපු සංචාරක අමාත්‍යවරයෙක් හැටියටයි මම දකින්නේ.

ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ සංචාරක කර්මාන්තය ගැන අපි මෙහෙම කථා කරන කොට මේ රටේ මධ්‍යම රජයේ සංචාරක කර්මාන්තය පිළිබඳව, ඒ අමාත්‍යාංශ පිළිබඳව අපි සෑහීමකට පත් වෙන්නේ නැහැ. අදටත් ඒ කලාපවල පැවැත්ම රැඳී තිබෙන්නේ, නිමල් ලන්සා කියන සංචාරක ගරු ඇමැතිතුමාගේ තිබෙන ඒ මැදිහත්වීම නිසා. නැත්නම් ඒ තරමට ඒ සංචාරක ව්‍යාපාරයට කුඩම්මාගේ සැලකිලි ලැබුණේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, එතුමා මේ පළාත් සභාවේ නොවෙයි. මහ ආණ්ඩුවේ සංචාරක සහ මහා මාර්ග අමාත්‍යවරයා හැටියට පත් වෙනවා නම් මම හිතන්නේ, මුළු රටටම දැනෙන්න වැඩක් කරන්න පුළුවන් අමාත්‍යවරයෙක් හැටියටයි අපි දකින්නේ. ඒක නිසා අපි ඒ ප්‍රාර්ථනය හදවතින්ම ඉටු කරනවා.

ඒ වාගේම අපේ මාර්ග සංවර්ධන අමාත්‍යාංශා ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක් දියත් කරමින් අද අපේ පළාත් මාර්ග සංවර්ධනය වෙනුවෙන් අති විශාල මුදලක් වියදම් කරලා තිබෙනවා. මම හිතන්නේ, තවත් අපට 20% ක විතර වාගේ ප්‍රමාණයක් තමයි පළාත් මාර්ග සංවර්ධනයේ ඉතුරු වෙලා තිබෙන්නේ. ඒ පළාත් මාර්ග සංවර්ධනය ඉටු කරනවා වාගේම ග්‍රාමීය මාර්ග සංවර්ධනය කරන්නටත් අපේ නිමල් ලන්සා ගරු ඇමැතිතුමාගේ මැදිහත්වීම තුළ අපට දායකත්වය ලැබිලා තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අමාත්‍යාංශය පිළිබඳව යම් කෙනෙක් ඉතාමත් වැරැදි සහගත ලෙස බලනවා නම්, එහෙම නැත්නම් වැරැදි සහගත ලෙස යමක් ප්‍රකාශ කරන්නට සූදානම් වෙනවා නම් ඒ පුද්ගලයා මම හිතන්නේ, මන්ද බුද්ධික පුද්ගලයෙක් හැටියටයි. ඒ පුද්ගලයා පිළිබඳව අපට හිතන්න තිබෙන්නේ ඉතිහාසයේ කුමක් හෝ වෛරයක් තියාගෙන කථා කරන පුද්ගලයෙක් හැටියටයි අපි දකින්නේ. අපි අවුරුදු 4 ½ ක් තිස්සේ මේ පළාත් සභාව නියෝජනය කළා. එතැන්දී අපි දන්නවා සමහර උදවිය ලාන්සා ඇමතිතුමා පිළිබඳව කථා කළේ කුමන ආකාරයෙන්ද? පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඔවුන් කථා කළා. ඒ අතරින් එක්කෙනෙක් දෙන්නෙක් බොහොම වැරැදි ආකල්ප හිත තුළ තියාගෙන කථා කරන්න උත්සාහ ගත්තා. එතැනදී තමයි අපට දැනෙන්නේ මේ මහජන නියෝජිතයෝ එවලා තිබෙන්නේ ජනතාව කුමන දේකටද කියන එක පිළිබඳව අපට හැඟෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇමැතිතුමාට මඩ පහරක් ගහගන්න හදනවා වාගේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ වාගේම අද ගත්තොත් අවිධිමත් සංචාරක ව්‍යාපාරය විධිමත් ආකාරයෙන් පවත්වන්නට විශේෂ පුහුණු වැඩමුළු සහ අනෙකුත් දේශණ සංවිධානය කරමින් අපේ බස්නාහිර

පළාතේ සංචාරක ව්‍යාපාරය විධිමත් ආකාරයෙන් - විශේෂයෙන්ම අපේ බස්නාහිර සංචාරක මණ්ඩලය. ගරු සභාපතිතුමා ප්‍රමුඛ ඒ සියලු දෙනා, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, ඒ වාගේම සහකාර ලේකම්තුමා ඇතුළු සියලු දෙනාම අපේ ඇගයීමට ලක් වෙනවා. ඉතාම හොඳින් ඒ කටයුතු කළා. ඒ විතරක් නොවෙයි, එතුමාගේ අමාත්‍යාංශයට සම්බන්ධ අනෙකුත් සියලු අමාත්‍යාංශවල සහකාර ලේකම් සහ ඒ සියලුම නිලධාරීන් අපට පුදුම ශක්තියක් ලබා දීලා තියෙනවා. අද අපි අමාත්‍යාංශය පිළිබඳව ආඩම්බරයෙන් කථා කරනවා වාගේම, අපේ ගරු අමාත්‍යතුමාට චිරං ජයතු කියලා ප්‍රාර්ථනා කරනවා වාගේම ඔහු බලාපොරොත්තු වන ඉදිරි ගමන තුළ සංචාරක මහා මාර්ග අමාත්‍යවරයා හැටියට අපේ මධ්‍යම රජයේ එම වගකීම දරන්නට ඔහුට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.18]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. අපි මෙතෙක් වෙලා අහගෙන හිටියා. අයවැය විවාදයේදී අංක 108, 124,125, කියන වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා රාශියකට ඇහුම්කන් දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පා පැදි අලුත්වැඩියා කරන ස්ථානවල ඉස්සරහ බෝඩ් එකක් ගහලා තියෙනවා. නොමිලේ හුළං වෙරළෙන් කියලා. ඒ කියන්නේ පා පැදිය හුළං ගහන්න ඕනෑ නම් රුපියලක් දෙන්න ඕනෑ. නොමිලේ ගහන්න බැහැ. නොමිලේ හුළං තියෙන්නේ වෙරළේ. අද උද්ගත වෙලා තියෙන තත්ත්වය තමයි මේ බෝඩ් ඒක අද පා පැදි අලුත්වැඩියා කරන ස්ථානවල නැහැ. මොකද, ජනතාවට දැන් වෙරළට ගිහිල්ලාවත් නොමිලයේ හුළං ටිකවත් ලබා ගන්න හැකියාවක් නැති තත්ත්වයක් තිබෙන්නේ. ඇයි මම එහෙම කියන්නේ? අපේ ධීවර, සංචාරක කටයුතු කරන ගමන් අද වෙරළ තීරය ආණ්ඩුවට ගැති පුද්ගලයින්ට භාර දීලා ගණිකා නිවාස, විවිධ ගොඩනැගිලි හදලා තියෙනවා. අද මේ රටේ උපන් පුරවැසියන්ට මේ රටේ ස්වභාවික සෞන්දර්ය විඳ ගන්න ඒ අයට සල්ලි ගෙවලා එහෙම නැත්නම් මේ හෙංචයියලාගේ පිටිපස්සෙන් යන්න සිද්ධ වෙලා තියෙනවා. අද වාහනයක් නවත්වන්න බැහැ, ඒ සිරි නරඹන්න. ඒ සියලු දෙයටම මුදල් කඩා ගන්න ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. විවිධ මාෆියා කල්ලි ක්‍රියාත්මක වෙනවා. මා ඇත්ත වශයෙන්ම ද්වේශයෙන් කථා කරනවා නොවෙයි. මම දන්නවා. මේ ඇමතිතුමා මීගමුව ප්‍රදේශයේ බිහි වෙලා ඒ පුංචි මිනිසුන්ගෙන් ඇවිල්ලා විශාල කාර්යභාරයක් කරමින් ඉස්සරහට එන ඇමතිතුමෙක්. අපි එතුමාට කියනවා, මේ කැසිනෝ රැල්ලට අසු වෙන්නේ නැතුව ඒ පුංචි දිළිඳු මිනිසුන්ගේ අහිංසක අයිතිවාසිකම් ආරක්ෂා කරන්න තමන්ගේ හැකියාව පාවිච්චි කරන්න කියලා. මේ හම්බන්තොටින් දාලා තියෙන නාස් ලණුවලට රැවටෙන්නේ නැතුව අපි ස්වාධීනව ගමනක් ගිහිල්ලා ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ඉස්සරහට යන්න ඕනෑ.

ඒ එක්කම අපි ධීවර තත්ත්වය ගැන කථා කළොත්, මේ දේශපාලන පක්ෂවලින් පොළඹවපු පිරිසක් නොවෙයි. තමන්ගේ ඉන්ධන ටික සල්ලිවලට අරගෙන මුහුදට ගිහිල්ලා, ඒ යන වියදම හොයා ගන්න බැරි නිසා ධීවරයෝ පාරට ඇවිල්ලා උද්ඝෝෂණය කළේ, අපිට සහනාධාරයක් හරි, අපේ රක්ෂාව හරි කර ගන්න පුළුවන් වාතාවරණයක් හදලා දෙන්න කියලා. අන්තිමට වෙඩි උණ්ඩවලින් ඇන්ටන්ලා මැරිලා යන කොට, එය වහගන්න ධීවර සහනාධාරයක් දෙන්න, යම්කිසි සහනාධාර ක්‍රමයකට තෙල් දෙන්න පොරොන්දු වුණත්, අද ඒවා යථාර්ථයක් බවට පත් වෙලා නැහැ. අද ධීවරයෝ ඉතා අහිංසක තත්ත්වයට පත් වෙලා තියෙනවා. ඊට අමතරව, චීනයෙන් ආපු විවිධ නෞකාවලින් මෙහි මසුන් මැරීම පටන් අරගෙන තියෙනවා. අද ධීවරයාට කවදා හරි චීනයෙන් අල්ලන මාළු අරගෙන කන්න සිද්ධ වෙන තත්ත්වයකට පත් වෙලා තියෙනවා. ඉතින් මේ රටේ උපන් පුරවැසියෝ හැම කෙනෙක්ම, මේ යන පැත්තට මැස්ස ගහන්නේ නැතුව, මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට මම කියනවා, ඔය මන්ද බුද්ධික වචන පාවිච්චි කරන එක ඉතාම වැරදියි. තමුන්නාන්සේලා මන්ද බුද්ධික වෙන්නේ නැතුව ඉතාම බුද්ධියෙන් මේ ගැන හිතලා බලන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි Jogging track ගැන කථා කරනවා. පාරවල් ගැන කථා කරනවා. ඒවා සංවර්ධනය කරන එක ඉතාම හොඳයි. නමුත් මේකේ යටි පැත්ත ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. අද අපි විදේශවලට ගිහින් විදේශ වෙළඳ පොළෙන් ණය ගන්නේ හරියට සල්ලි හදිස්සි වුණාම, වෙන්දේසි

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

සීට්ටුවක් ඕනෑ ගණනකට ගන්නවා වාගේ, වැඩි පොළියට අපි ණය ගන්නවා. ඉස්සර එහෙම නොවෙයි ණය ගත්තේ. අපි foreign direct investment එහෙම නැත්නම් සෘජු විදේශී ණය වශයෙන් අරගෙන මේවා යම්කිසි නිෂ්පාදනවලට යෙදෙව්වා. ඒවා ගැන ලෝක බැංකු අධීක්ෂණයක් තිබුණා, ඒවා නියම ආකාරයෙන් යොදවනවාද කියලා බලන්න. අද හිතෙන හිතෙන විධියට වෙළඳපොලින් ණය ගන්නවා. විවිධ ආයතනවලින් ගන්නවා. තමුන්ට ඕනෑ දෙයක් මෙහි ඇවිල්ලා කරනවා. හොයන්න බලන්න කෙනෙක් නැහැ. මේ ණය ඕනෑම වෙලාවක ආපහු ඉල්ලා සිටින්න එම ආයතනයට පුළුවන්. කිසිම වගකීමක් නැති ණය ගැනීමක් අද රටේ සිද්ධ වෙනවා. මේවා ගැන අවබෝධයක් නැතුව අපි කථා කරනවා. අපි මේ සල්ලි අරගෙන ආර්ථික අමාත්‍යාංශයෙන් බෙදනවා. නැත්නම් මහා භාණ්ඩාගාරයෙන් විවිධ ස්ථානවලට බෙදනවා. මේවාවලින් මොනවා ඉදි කළත්, හරියට මේ රටේ ආර්ථිකය අද වණ වුණු තුවාලයක් වාගෙයි. හරියට අර දදයක් ඇති වුණාම කසන කොට පොඩි විනෝදයක් වින්දනයක් තියෙනවා. නමුත් කසලා ඉවර වුණාම මේක ඕජස් ගලන විශාල තුවාලයක්. මේ වාගේ තත්ත්වයට අද ආර්ථිකය පත් වෙලා තියෙනවා.

මම බුද්ධිමත් අයට කියනවා, ඇස් ඇරලා මේ දිහා බලන්න. අපි මේ විවේචනය කරන්නේ රටේ පුංචි තැන්වලින් ආපු අය හැටියට. මේ රට තවත් අගාධයට යනවාට අපි අකැමැතියි. මේ පුංචි මිනිසුන්ගේ පුංචි රට ඉතාම සශ්‍රීකත්වයට පත් වෙන්න ඕනෑ. හැම පැත්තෙන්ම වැඩිදියුණු වෙන්න ඕනෑ. නමුත් අද තියෙන්නේ තාවකාලික එහෙම නැත්නම්, මේ Road show එහෙම නැත්නම් ඒ කියන්නේ, පාර බැලුවාම ලස්සණයි. කථාවට ලස්සනයි. නමුත් ඇතුළේ පුස්සක් වැනි තත්ත්වයක් තිබෙන්නේ. එහෙම නම් මේ ආර්ථිකය ගැන අපි වාද විවාද කරන කොට මේ හැම වැඩ සටහනකම තිබෙන නාස්තිය අවම කර ගන්න කිසිම වැඩ පිළිවෙළක් නැහැ. අද ජනතාවට බදු ගහලා, කුමන ක්‍රමයෙන් හරි යම් යම් සේවා සපයා ලබා ගන්නා මුදල්වලින් එදිනෙදා යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා මිසක් ජනතාවට සැබෑවට තමුන්ගේ ආර්ථිකය නංවා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් නැහැ. ඇත්ත වශයෙන්ම මේ අමාත්‍යවරයෙකුට මේ භාර දූර වගකීම ඉෂ්ට කරන්න බැහැ. මුළු ලංකාවම සමස්තයක් හැටියට වැඩ පිළිවෙළක් සකස් කරලා ඉදිරියට යන්න ඕනෑ ගමනක් මේ තියෙන්නේ. එහෙම නම්, මේ පළාත් සභා ඇමතිවරුන්ට වැඩ කරන්න සිද්ධ වෙන්නේ, මහ ආණ්ඩුවේ අධීක්ෂණය යටතේ. ඒ අයගේ වැඩපිළිවෙළ පෙන්වා දෙන ක්‍රමය යටතේ. එහෙම නම් මේ තත්ත්වය උඩ අපි ඉතාම වැදගත් තීන්දු තීරණ අනාගතයේ ආර්ථිකය සම්බන්ධයෙන් ගන්න අවශ්‍යයි.

තවදුරටත් කථා කළාම අපි දන්නවා, සත්ත්ව නිෂ්පාදනය ගැන තිබෙනවා. නිවාස ඉදිකිරීම් ගැන තිබෙනවා. අද ධීවර ජනතාවට Toilet එකක් හදා ගන්න බැහැ. කාණුවල පණුවෝ. පල්වෙන වතුර. ඒ එක්කම ගඳ ගහන, යන්න බැරි පළාත් තියෙනවා. අපි ඉතා දිළිඳු මිනිසුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කළාම තමයි මේ ජනතාව ඉස්සරහට ඇවිල්ලා ඒ දරිද්‍රතාවයෙන් ගැලවිලා අධ්‍යාපනික වශයෙන් ඉගෙනුම ලබලා මේ රටට සේවයක් කරන්න පුළුවන් පුරවැසියන් බවට පත් වෙන්නේ. අද විවිධාකාරයෙන් ඇළ මාර්ග සංවර්ධනය කරලා, සංචාරක වශයෙන් හෝ, මේ රට කුමන ආකාරයෙන් හෝ ඉදිරියට ගියත්, අපේ අභ්‍යන්තර ගමනට සූදානම් නැත්නම් මේ රට ඉස්සරහට ගෙනියන්න බැහැ. එම නිසා මේ කාලවේලාව ඉතාම මදියි. ජානක ගරු මන්ත්‍රීතුමා කිව්වා, කිරි එරෙන වැස්සියෝ ඉන්න ඕනෑය කියලා. මම ජානක මන්ත්‍රීතුමාට කියනවා, අද ලංකාවේ බොහොම කිරි වැහෙන වැස්සියෝ ඉන්නවා. අද චීනයේ ඉන්න ලොක්කන්ටයි, ජේම්ස් පැකර්ලටයි මේ කිරි බොන්න දීලා බලාගෙන ඉන්න හරක් ටිකක් තමයි මෙහේ ඉන්නේ කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

[පූ.භා. 10.25]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාමත් ස්තුතිවන්ත වෙනවා, මාර්ග සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී අපේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව අපට ලැබීම සම්බන්ධයෙන්. විශේෂයෙන් බස්නාහිර පළාත් සභාව තුළ අතිවිශාල කාර්ය භාරයක් ඉෂ්ට කරන අමාත්‍යාංශයක් හැටියට, නිමල් ලාන්සා ගරු ඇමතිතුමාගේ නායකත්වයෙන් මෙහෙයවන මෙම අමාත්‍යාංශය බව

සඳහන් කරන්න පුළුවන් වෙනවා. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමිය විශේෂයෙන්ම රජයේ ජනතාවගෙන් බදු අය කිරීම තුළ රටේ සංවර්ධනය සඳහා ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් නැතැයි කියන චෝදනාව නැගුවත්, අපි විශ්වාස කරනවා මූලික වශයෙන්ම යටිතල පහසුකම් දියුණු කිරීම තුළින් තමයි එම රටට ශීඝ්‍ර සංවර්ධනයක් කරා ගමන් කිරීමේ අවස්ථාව උදා වන්නේ. ඒ නිසා රටක් හැටියට අද එම යටිතල පහසුකම් නගා සිටුවීම සඳහා ගන්න ක්‍රියමාර්ගයන් වෙනුවෙන් යොදවන මුදල්, ඒ වෙනුවෙන් ඉදිරිපත් කරන සංවර්ධන ව්‍යාපෘතීන් තුළ, අපේ ගම්වල ජනතාව අතරේ ඒ ඇතිවන යටිතල පහසුකම් පාවිච්චියට ගනිමින්, ඒ අයගේ ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන එන්න අවශ්‍ය මග සලසා ගැනීමක් තමයි අපට මේ තුළින් පෙනෙන්න තියෙන්නේ. ඒ නිසා දේශපාලන වශයෙන් ද්වේශ සහගත ආකාරයට නොවෙයි, යථාර්ථයත් එක්ක කල්පනා කරනවා නම්, අපට යටිතල පහසුකම් දියුණු කිරීම තුළම විශාල සංවර්ධනයක ගමන් වේගයක් ආරම්භ වෙලා තියෙනවයි කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අපි ජීවත් වන ප්‍රදේශය ගත්තොත් අපි දන්නවා, පහුගිය කාල සීමාව තුළ අපට පළාත් මාර්ග වැඩිම ප්‍රමාණයක් මේ වනවිට සම්පූර්ණයෙන්ම සංවර්ධනය කරන්න පුළුවන් අවස්ථාව ලැබිලා තියෙනවා. ඒ වාගේම, ග්‍රාමීය මාර්ගත් යම් ප්‍රමාණයකට සංවර්ධනය කරා ගිහින් තියෙනවා. නමුත් අපි කියන්නේ නැහැ, ප්‍රමාණවත් වෙනවා කියලා.

විශේෂයෙන්ම මම නියෝජනය කරන අගලවත්ත පස්යොදුන් කෝරළය වැනි ප්‍රදේශවල ග්‍රාමීය මාර්ග දහස් ගණනක් තියෙනවා. ඉතින් මේ දහස් ගණන එකවර සංවර්ධනය කිරීමේ අපහසුව අපට තේරෙනවා. අපි විශේෂයෙන් ඉල්ලා සිටිනවා. පළාත් මාර්ග සංවර්ධනය කිරීමට ප්‍රමුඛත්වයක් දෙනවා වාගේම, අපේ බස්නාහිර පළාත් සභාව තුළ පවතින ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමට ආධාර වන යම් වැඩපිළිවෙළක් ආරම්භ කරන්න අවශ්‍ය වෙනවා කියන එකත් සඳහන් කරනවා. විශේෂයෙන්ම ප්‍රාදෙශීය සභාවලට ඒ සඳහා ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම නිසා, බස්නාහිර පළාත් සභාව හැටියට අපට ශක්තියක් ලබා දෙන්න පුළුවන් නම්, ගමේ මාර්ග තවදුරටත් සංවර්ධනය කිරීමේ අවස්ථාව උදා වෙනවා.

ඒ වාගේම අපි දකිනවා. අපේ ප්‍රදේශවල කාන්තාවන් දිහා බැලුවොත් කාන්තාවන් තමයි ගෙවල්වල විශාල බරක් ඉසිලීමේ කටයුත්ත කරන්නේ. ඒ නිසා මේ කාන්තාවන්ගේ ජීවන මට්ටම නගා සිටුවීමට උපකාරී වෙලා තියෙනවා, ලාන්සා ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් සත්ව නිෂ්පාදන පැත්තෙන් ලබා දෙන සහයෝගය. ඒ නිසා විශේෂයෙන්ම මෙම සත්ව නිෂ්පාදන හරහා ලබා දෙන පහසුකම් කාන්තාවන් මුල් කර ගෙන ලබා දෙනවා නම් මම හිතනවා, තමන්ගේ ස්වාමියා උපයන ආදායමට අමතරව, ස්වයං රැකියාවක් හැටියට කාන්තාවන්ට එය ප්‍රයෝජනයට ගනිමින් තමන්ගේ ජීවන මට්ටම, තම පවුලේ ජීවන මට්ටම ඉහළට නංවා ගන්න හේතු වෙනවා කියන එක විශේෂයෙන් සිහිපත් කරන්න මේ අවස්ථාවේ බලාපොරොත්තු වෙනවා වාගේම, මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කරන්නෙයි කියලා.

ඒ වාගේම නිවාස සංවර්ධනය පැත්තෙන්, ග්‍රාමීය නිවාස සම්බන්ධයෙන් ඉතාම අඩු ආදායම්ලාභීන් කෙරෙහි අවධානය යොමු කරලා ඒ අයට පහසුකම් ඇතිවන පරිදි නිවාස ආධාර ක්‍රමයක් ඇති කරනවා නම් වඩාත් ඵලදායී වෙනවා. කාලය ඉක්මවන නිසා මම අවසාන වශයෙන් සඳහන් කරන්නේ, මම ඉතාම සතුටු වෙනවා. මේ අපේ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ පහුගිය දිනවලත් අපේ ප්‍රදේශවල පාරක් හදන්න කියලා උද්ඝෝෂණයක් ඇති වුණු වෙලාවේ එතුමාගේ මැදිහත් වීමෙන් අපට ලක්ෂ 380 ක් ලබා දීලා පරෙයිගම පාර සංවර්ධනය කරන්න කටයුතු කරලා තියෙනවා. අපි ඒ පිළිබඳව විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ අමාත්‍යාංශයේ එතුමාට පමණක් නොවෙයි, අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීන්ට විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු නිලධාරි මහත්වරුන්ට, ඒ වාගේම අපේ ප්‍රදේශය භාරව කටයුතු කරන විධායක ඉංජිනේරු කාර්යාලයේ සියලු දෙනාටත් - ඒ අය විශාල කැපවීමකින්, උනන්දුවකින් ක්‍රියා කරන නිසා ඒ අයව ප්‍රශංසාවට ලක් කරන්න මෙය අවස්ථාව කර ගනිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා. 10.31]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රියාශීලී අමාත්‍යාංශයක් හැටියට ඒ වාගේම පක්ෂ විපක්ෂ කාගේත් ඉල්ලීම් ඉටු කරමින් කටයුතු කරන අමාත්‍යාංශයක් යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ

[ ගරු පී.ඩී. අබේරත්න ]

වැඩ පිළිවෙළ යටතේ කථා කරන්න ඉතා සීමිත කාල ප්‍රමාණයක් තමයි මට ලැබිලා තියෙන්නේ. විශේෂයෙන්ම මම කථා කරන්න බලාපොරොත්තු වන්නේ නිවාස වැඩපිළිවෙළ ගැන. එතුමා මෙම අයවැයෙන් ගිය වර්ෂයේ රුපියල් 40,000/- දක්වා තිබුණු නිවාස ආධාර මුදල රුපියල් 60,000/- ක් දක්වා වැඩි කිරීම අති ප්‍රශංසනීයයි. ඒ වාගේම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා, පසුගිය වසරේ නිවාස 10 ක් සෑදීම සඳහා මිලියන දෙකක් වෙන් කරලා, අපේ වැඩ පිළිවෙළ තවම අවසාන වෙලා නැහැ. ගරු ඇමතිතුමාට මම යෝජනා කරනවා, ඔබතුමා 60,000/- ගණනේ දෙනවා නම් මන්ත්‍රීවරුන්ට, ගෙවල් දහයකට දෙන කොට ඇත්තටම අද ගම්වල තියෙනවා ඉතාම දිළිඳු ගෙවල්. ඉටි රෙදිවලින් වහ ගෙන, පොල් අතුවලින් වහ ගෙන ඒ වාගේ ගෙවල් තෝරා ගත්තාම ඔබතුමා 60,000 ගණනේ දුන්නොත් ප්‍රදේශයේ අයගේ සහයෝගය ලබා ගෙන ශ්‍රමය උපයෝගී කර ගෙන කාමර දෙකක ඉස්තෝප්පුවකුත් සමග ඒ අයට සරිලන ප්‍රමාණයේ ගෙයක් හදාගන්න ප්‍රමාණවත්. ඒ වැඩපිළිවෙළ මන්ත්‍රීතුමා ක්‍රියාත්මක කළොත්, සෑම ග්‍රාම සේවා කොට්ඨාශයකටම ගෙවල් කිහිපයක් හදන්න ඔබතුමාට හැකි වේය කියලා මා විශ්වාස කරනවා. ඒක බැරිකමක් නොවෙයි. ඒ වාගේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තියෙනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, පශු සම්පත් ගැන කථා කරන කොට අද මේ රටේ කිරි නිෂ්පාදනය ප්‍රශ්නයක් වෙලා තියෙනවා. විශාල මුදල් ප්‍රමාණයක් විදේශ රටවල්වලට යනවා. ඒ සඳහා දැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කිරීම දේශීය මුදල් ඉතුරු කිරීමේ කර්තව්‍යයට සම්බන්ධ වීමක් තියෙන්නේ. අපේ දිස්ත්‍රික්ක තුන දිහා බැලුවාම, කොළඹ, කළුතර, ගම්පහ මේ දිස්ත්‍රික්කවල ගවයන් ඇති කිරීමට තියෙන්නේ තෘණ හිඟතාවයයි. විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. ගරු ඇමතිතුමනි, අද වතු සමාගම්වල ඉඩම් අක්කර සිය ගණන් කැළේට ඇරලා තියෙනවා. ඔබතුමාගේ අවධානය යොමු කරලා, ඒ සමාගම් සමග කථා කරලා මේ ඉඩම් අරගෙන තෘණ වගාවට යොදා ගත්තොත් තෘණ වගා කරන ප්‍රදේශයක් ඇති කරලා ඒ අවට ගම්මානවල ජනතාවට ගවයින් කිහිප දෙනෙක් ලබා දුන්නොත් ඒ තෘණ පිට්ටනිවලින් ලැබෙන තණකොළවලින් විශාල ගව සම්පතක් ඇති කරලා කිරි නිෂ්පාදනය වැඩි කර ගන්න පුළුවන්. මොකද, අද ගව සම්පත අඩු වීමට ප්‍රධානම හේතුව තෘණ වගාවන් නැතිකම. ගම්මානවල ගෙවල් වැඩියෙන් හදලා හදලා අද සෑම ගමකම විශාල ගෙවල් ප්‍රමාණයක් අළුතෙන් ඇති වෙලා හරකෙක් හදා ගන්න විධියක් නැහැ. ඒ නිසා ඒ විධියට තමුන්නාන්සේ වැඩපිළිවෙළක් සකස් කළොත් තෘණ ප්‍රශ්නය විසඳන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම විශාල අක්කර ප්‍රමාණයක වතුවල කැළෑ බිහි වෙලා තියෙනවා. ඒවා තෘණ වගාවට සුදුසු ඉඩම්. විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ඒ වාගේ විශාල වතු තියෙනවා. එහෙම තෘණ පිට්ටනි හදලා අවට ගම්මානවලට විශාල හරක් ප්‍රමාණයක් දුන්නොත් මේ කිරි නිෂ්පාදනය කරන්න ගවයින් බෝ කිරීමේ වැඩපිළිවෙළ ඉතාම සාර්ථකව කරගන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා.

ඒ වාගේම මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, දිවි නැගුම වැඩ පිළිවෙළ යටතේ කුකුළු පැටවුන් බෙදුවාට සියයට සියයක් සාර්ථකයි කියන්න බැහැ. සමහර අවස්ථාවල අපි දකිනවා, කුකුල් පැටවුන් බෙදන්නේ. කිකිළි පැටවුන් කියලා. ඒ වාගේ සිදු වූ අවස්ථා තියෙනවා. ඒ වාගේම නිලධාරීන් ගමට යන්න ඕනෑ. පසු විපරමක් නැහැ. කුකුල් පැටවුන් දෙනවා. තව තව දේවල් දෙනවා. නමුත් පසු විපරමක් නැහැ. ඒ අය කාර්යාලවලට සීමා වෙලා තිබෙනවා. මේ අය ගමට ගිහිල්ලා හොයලා බලලා, ඒ අවශ්‍ය කටයුතු කරන අයට දීලා ඒ ගැන පසුවිපරමක් කරනවා නම්, ඔබතුමා ගෙන යන වැඩපිළිවෙළ මීට වඩා හුඟක් සාර්ථක කර ගන්න පුළුවන් වෙනවා.

ඒ වාගේම මාර්ග වැඩ පිළිවෙළ ගැන කථා කරන කොට, ඔබතුමා මුද්‍රණය කරන ලද පොතේ තියෙනවා, ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් මිලියන 12,000 ක් වියදම් කරලා කිලෝ මීටර 148 ක් හදලා තියෙනවා කියලා. එතකොට ඒ සඳහා කිලෝ මීටරයකට රුපියල් ලක්ෂ 96 ක් විතර තමයි වියදම් වෙලා තියෙන්නේ. අයවැය යෝජනා යටතේ ලැබුණු මුදල්වලින් මිලියන 8998 ක් වියදම් කරලා කිලෝ මීටර 691 ක් හදලා තියෙනවා. එතකොට එතැන ලක්ෂ 130 ක් විතර ගිහින් තියෙනවා. එහෙම බැලුවාම විශාල මුදල් පරතරයක වෙනසක් තියෙනවා. ලක්ෂ 35 ක විතර වෙනසක් තියෙනවා. අපට ඕනෑ අඩු මුදලින් වැඩි වැඩ කොටසක් කරන්න. ඒ නිසා ඔබතුමාගේ අධීක්ෂණය යටතේ වැඩ කළොත් අඩුවෙන් වැය කරලා වැඩ කොටසක්

කර ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. දීර්ඝ වශයෙන් කථා කරන්න අවස්ථාවක් නැති නිසා මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු ඇමැතිතුමා ගෙනියන වැඩ පිළිවෙළ ගැන අපේ ප්‍රසාදය පළ කරනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මතක් කරන්න කැමතියි, අපි මේ අයවැය විවාදයට සහභාගි වුණා. සමහර අමාත්‍යාංශ ගැන කථා කරන අවස්ථාවේ මේක එකම ගාලගෝට්ටියක්. මූලාසනයට මෙම සභාව මෙහෙයවන්න බැරි තත්ත්වයකට පත් වුණා. ඒකට හේතුව ඇමතිවරුන්ගේ වැරැද්ද. අද මේ ඇමැතිතුමාගේ අමාත්‍යාංශය ගැන කථා කරන වෙලාවේ කිසිම හැලහොල්මනක්, ප්‍රශ්නයක් නැතිව ඉතාම සාමකාමීව කවුරුත් තෘප්තිමත්ව කථා කළා. ඒකට හේතුව ක්‍රියාශීලී අමාත්‍යවරයෙක්. ඒ නිසා අනෙක් අමාත්‍යවරුන්ට ආදර්ශමත් විධියේ වැඩ පිළිවෙළක් කර ගෙන යන අමාත්‍යතුමාට සුභ පතමින් ලබන්නාවූ නව වසර අපේ ගරු සභාපතිතුමාට, ගරු මන්ත්‍රීවරුන්ට සහ, අපට අනුබද්ධ සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ට ඉතාමත් සාර්ථක නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.36]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිමල් ලාන්සා ගරු ඇමතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධව කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත්, නිමල් ලාන්සා ගරු ඇමතිතුමාගේත් වැය ශීර්ෂ ගැන කථා කරන අවස්ථාවේ ඒ සඳහා මේ පළාත් සභාවේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සහයෝගය ලැබුණා. මම හිතන්නේ, අපි හැමදාම මධ්‍යම රජයේ අයවැය රූපවාහිනියෙන් රෑට බලනවා. ඒ බලනකොටත් කිසිම අමාත්‍යාංශයකට විරුද්ධ පක්ෂයෙන් සහයෝගය දක්වන්නේ නැහැ. මම හිතන්නේ, මේ ලංකාවේම පළාත් සභාවලින් මේ සහයෝගය දක්වපු, ප්‍රශ්න දාපු නැති අමාත්‍යාංශ දෙක තමයි අපේ ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයත්, නිමල් ලාන්සා ඇමතිතුමාගේ අමාත්‍යාංශයත්. ගරු සභාපතිතුමනි, කියමනක් තියෙනවා. හොඳ ඉස්කෝලවල පරණ ප්‍රින්සිපල්ලා නැහැයි කියලා. පරණ ප්‍රින්සිපල්ලා ඉන්න ඉස්කෝලත් හොඳ නැහැයි කියලා. ඒ නිසා ඒ වාගේ හොඳ අමාත්‍යවරු ඉන්න හොඳ අමාත්‍යාංශ දෙකක්. නිමල් ලාන්සා ගරු ඇමතිතුමා මගේ කටාන ආසනයට අල්ලපු ආසනයේ. මම එතුමාව ඒ කාලයේ ඉඳන් දන්නවා. එදා ඉඳන්ම දක්ෂ පුද්ගලයෙක්. ඒ වාගේම වාසනාවන්ත පුද්ගලයෙක්.

මීගමුව නගරය කියන්නේ, පොඩි ගංවතුරටත් යට වෙනවා. නිමල් ලාන්සා ගරු ඇමතිතුමා එහි පුරපති තනතුර භාර ගත්තාට පස්සේ ඒ නගරය පුරාම විශාල ජල බස්නා ඇළ මාර්ගයක් හැදුවා. මා හිතන්නේ, පුංචි වැස්සකට විතරක් නොවෙයි, මහ ගංවතුරටත් මීගමුව නගරය අද යට වෙන්නේ නැහැ. උදාහරණයක් ගත්තොත් 2009, 2010 ගංවතුර කාලයේ කොළඹ මීගමුව අඩි හතරක් යට වුණා. නමුත් මීගමු නගරයේ එක අඟල් හයක් යට වුණේ නැහැ. මා හිතන්නේ, ඒ එතුමාගේ දැක්ම අනුව එතුමා හදපු යෝජනාවලිය නිසා.

ඒ වාගේම තමයි අපි ඒ දවස්වල දැක්කා, පළාත් සභා පාරවල්වල පැච් එකක් දා ගන්න බැරුව පළාත් සභාව සුදු අලියෙක් කියලා බනිනවා. නමුත් නිමල් ලාන්සා ගරු ඇමතිතුමා පළාත් සභාව භාර ගත්තාට පස්සේ මා හිතන්නේ, අද වන කොට අපේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ එකම පාරක්වත් නැහැ නිම කරපු නැති පළාත් සභා පාරවල්. එතැන්දි අපි ස්තුතිවන්ත වෙන්න ඕනැ, අපේ ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට. එතුමාගේ, මධ්‍යම රජයේ සියලුම මුදල් මගින් නිමල් ලාන්සා ගරු ඇමතිතුමාගේ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ තමයි සියලුම වැඩ කටයුතු කළේ. ඒකට හේතුව එතුමා නිමල් ලාන්සා ගරු ඇමතිතුමා කෙරෙහි දැඩි විශ්වාසයක් තියලා තියෙනවා. ඒ වාගේම ඒ අමාත්‍යාංශයේ ඉන්න නිලධාරි මණ්ඩලය කෙරෙහි. මා හිතන්නේ, ඉතාම දක්ෂ නිලධාරි මණ්ඩලයක් ඉන්න අමාත්‍යාංශයක් තමයි නිමල් ලාන්සා ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය.

ගරු සභාපතිතුමනි, තවත් පළාත් සභා තියෙන කොට අපේ පළාත් සභාවේ පාරවල් පමණක් නොවෙයි, මධ්‍යම, වයඹ, උතුර ඒ හැම පළාත් සභාවකම මාර්ග සංවර්ධනය කරන්න ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ලබා දෙන්නේ, බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට. ඒ කියන්නේ, ඒ තරම් දැඩි විශ්වාසයක් ඒ අමාත්‍යාංශය

[ ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා ]

කෙරෙහි තියෙනවා. එතැන්දී මම නිමල් ලාන්සා ගරු ඇමතිතුමාට වාගේම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, පළාත් මාර්ග පමණක් නොවෙයි, මාතෘ සායන වැනි ඊට පිටින් තියෙන විෂයයන් පවා මේ අමාත්‍යාංශා හරහා කර ගන්නේ, මේ අමාත්‍යාංශයේ ඇමතිතුමාගේත් නිලධාරීන්ගේත් තියෙන දක්ෂතාවය මතයි. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. මා හිතන්නේ වැඩිදුර කියන්න ඕනෑ නැහැ. එතුමාගේ අමාත්‍යාංශය කෙරෙහි හැම කෙනාම ප්‍රශංසා මුඛයෙන් කථා කළා. මට අවස්ථාව ලබා දීම සම්බන්ධන ඔබතුමාට ස්තුතියි. ලබන්නා වූ නව වසර සියලු දෙනාටම සුභ නව වසරක් වේවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ඒ.එම්. යූසුෆ් මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Presiding Member [Mr. A.M. Yoosuf M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.43]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ කාලය ලබා දීම ගැන. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ ආණ්ඩු පක්ෂයේ අය කථා කරන්න දෙන්නේ නැත්නම් කථා කරලා වැඩක් නැහැ නේ? අර ඉස්සෙල්ලා කථා කළ මන්ත්‍රීතුමිය කිව්වා වාගේ, මන්දබුද්ධිකයෝ ගොඩාක් ඉන්නවාද කොහේද මේ සභාව ඇතුළේ, මට පේන විදියට. ඒ නිසා කථාව පටන් ගන්නත් ඉස්සෙල්ලා - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා එතුමාට. විනාඩි හතක කාලයක් තියෙන්නේ. 11.00 ට ඡන්දයට යන්න ඕනෑ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාලා බාධා කිරීම්වලින් වළකින්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මා දීර්ඝව විස්තර කරන්න යන්නේ නැහැ. නමුත් මාර්ග සම්බන්ධයෙන් කථා කරන කොට අද අපට පේන තෙක් මානයේ පේන්නේ දිලිසෙන කාපට් පාරවල්. හැබැයි ගරු සභාපතිතුමනි, මේකේ යන්න ගත්තාම තමයි අර ලොකු වළවල්, ඩප්පි ගහපුවා ඔක්කෝම පේන්නේ. දුර ඉඳන් බලද්දි හොඳට දිලිසෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොහේද? කොහේද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉස්සෙල්ලා අත්පුඩි ගැහුවා නේ? ඒ නිසා මේක කියද්දිත් අහගෙන ඉන්න. අත්පුඩි ගැහුවා වාගේම. පොඩ්ඩක් කකියනවා ඒවා කියද්දි.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

කොහේද? කොහේද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අහගෙන ඉන්න. කොහේද කියන්නම්. දැන් ඔබතුමාගේ ගෙදරට යන පාර හදලා කොච්චර කල්ද? දැන් ඔබතුමා නේ මැදිහත් වෙලා හැදුවේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අවුරුදු තුනයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අවුරුදු තුනයි. අර පාලම කැඩිලා දැන් මාස කියක්ද කියන්න කෝ? මාස හයකට වැඩියි. පාලම හදන්නේ නැතුව පාර හැදුවා. ඔන්න තියෙන මෝඩකම. (බාධා කිරීම්) අපි මෙච්චර කල් කිව්වා ලාන්සා. ගරු ඇමතිතුමාගේ උපදේශක කාරක සභාවේ මම ටික කාලයක් හිටියා. ඒ පළමුවැනි රැස්වීමේදීම මම ඇමතිතුමාට යෝජනාවක් කළා, මේ පාරවල් පද්ධතිය හදන්න ඉස්සෙල්ලා. අඩුම ගණනේ මේ වතුර බට දාලා නැති පාරවල් - (බාධා කිරීම්) මම යෝජනාවක් කළා, ඒ පාරවල ජල නල එලුවාට පස්සේ මේ පාරවල් ටික හදන්න කියලා. හැබැයි ඒක කළේ නැහැ. මේ රජයේ වැඩ පිළිවෙළ ඡන්දෙ කාලෙට මොනවා හරි කරලා සල්ලි නාස්ති කරලා මිනිස්සුන්ව රවට්ටලා තමයි වැඩ පෙන්වන්නේ. ගරු සභාපතිතුමනි, මම අභියෝග කරනවා. මේ කාපට් කරලා, කොන්ක්‍රීට් කරලා තියෙන පාරවල් 75% ක් මේ වෙන කෙට කඩලා තියෙන්නේ ජලනල එලන්න. මේකේ වියදම දරන්නේ කවුද? මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් තමයි මේ ඔක්කෝම කරන්නේ. අද කියනවා මෙහි විතරක් නොවෙයි, සබරගමුවේත් පාරවල් හදනවයි කියලා. සබරගමුවෙහි අරෙහෙයි මෙහෙයි පාරවල් හදන්නේ ඇයි කියලා මම කියන්නම්. අහගන්නයි කියන්නේ. අද මේ පාරවල්වලට විශේෂයෙන්ම 90% ක් මුදල් ලැබෙන්නේ, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා. දැන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් එක තමයි අපේ නිමල් ලාන්සා ඇමතිතුමා කරන්නේ. එතුමා ඒ කොන්ත්‍රාත් එක අරගෙන තව කාට හරි දෙනවා, තව පාරක් හදන්න. ඒ වාගේ පාරක් තමයි ඒකල පන්සල පාර. ඒකල පන්සල පාර කාපට් කරලා මාසයක් ගියේ නැහැ, දෙපැත්තෙන්ම කෑලි කැඩිලා ගියා. (බාධා කිරීම්)

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අම්මේ මෙහෙම බොරු කීමක්. ඉරිසියාව. ඉරිසියාව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපේ ලාන්සා ගරු ඇමතිතුමාගේ ලේකම්වරයෙක් ඉන්නවා, මහේෂ් කියලා. ඒ පැත්තේ. එතුමා ඇවිල්ලා පරීක්ෂා කරලා බැලුවා. එතුමා මටත් හම්බ වුණා. එතුමා මටත් කිව්වා. මම ලාන්සා ඇමතිතුමාට වරදක් කියනවා නොවෙයි. එතුමා ඒක තව කාටද sub කොන්ත්‍රාත් දීලා. ඉහළ තැනට යන කොමිස් එක ගත්තාම ඒ මිනිහාත් ගානක් තියා ගන්න එපායැ. නැත්නම් වැඩක් නැහැ නේ? ස්වේච්ඡාවෙන් කරන්නේ නැහැ නේ ඕවා. මේ කොමිස් පාර වැදිලා යද්දි, පාරට ලක්ෂ සියයක් යනවා නම් ලක්ෂ 40 කයි පාරෙ වැඩට යන්නේ. ඉතින් ලක්ෂ සියයක් පෙන්නන්න හොරට කරන්න ඕනෑ. අඟල් හයේ කොන්ක්‍රීට් එකට අඟල් දෙකක් තුනක් ගහනවා. ඕක තමයි වෙලා තියෙන්නේ. තව උදාහරණයක් ඕනෑ නම් දෙන්නම්. ජා-ඇළ ප්‍රාදේශීය සභාවට අයිති අපේ සිරිකමල් මන්ත්‍රීතුමාගේ ගෙදරට යන පාර. ප්‍රාදේශීය සභාවේ ඇස්තමේන්තුව ලක්ෂ 30 යි. හැබැයි මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ඇස්තමේන්තුව ලක්ෂ 60 යි. ඉතින් ලක්ෂ 30 යි හැටයි අතර පරතරය මොකක්ද? එකම ආණ්ඩුව. එකම පළාත් සභාව. එකම ප්‍රාදේශීය සභාව. එකම රජය. එකම ඇමතිවරයා. එකම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා. හැබැයි වෙනස ලක්ෂ 30 ක්. මෙන්න මේක තමයි අපි කියන්නේ, වැඩ කරන එකෙන් හරියට අඩක් මාටියා ගහනවා කියලා. ඕක තමයි ඇත්ත කථාව.

අද අපි එක එක කථා කියනවාලු. හැබැයි, අද අපි සන්තෝෂ වෙනවා. අපේ නිමල් ලාන්සා ඇමතිතුමාත්, අපිත් කම්කරු පන්තියේ මිනිස්සු. එවැන්නෙක් මේ ස්ථානයට ඇවිල්ලා ඉන්න එක ගැන අපි සන්තෝෂ වෙනවා. එතුමා පාර්ලිමේන්තුවටත් ගිහිල්ලා ඇමතිකෙනෙක් වුණොත් ඒකටත් අපි සංතෝෂයි. හැබැයි ජනතාවගේ බදු මුදල් හොරා ගන්නවාට අපි අකමැතියි. අපි සීනි කිලෝ එකට ගෙවන සල්ලි, අපි පරිප්පු ටිකට ගෙවන සල්ලි, අපි කොත්තමල්ලි ටිකට ගෙවන සල්ලි හොරා කනවා නම් ඒකට අපි විරුද්ධයි කියලා කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි,

ඒ එක්කම ගරු සභාපතිතුමනි, මට තියෙන කාලයත් එක්ක මේවා කියන්න කාලය මදියි. අපේ මහ ඇමතිතුමාගේ ආසනයේ මීනුවන්ගොඩ නොවැම්බර් මාසයේ කුකුල් පැටවුන් විසිදාහක් බෙදුවා. කුකුල් පැටවුන් විසි දාහක්. මට ආරංචි විදියට බයිසිකල් කන්ටේනර් පහක් දැන් එනවා. මැෂින් කන්ටේනර් පහක් එනවා. මේ ඡන්දෙට බෙදන්න. පළාත් සභා ඡන්දෙට බෙදන්න. අපේ නිමල් ලාන්සා ඇමතිතුමා තමයි ගෙන්වන්නේ. ඉතින් ගරු සභාපතිතුමනි, මම අහන්නේ, අපේ සිරිකමල්

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

මන්ත්‍රීතුමාගෙන් 30 න් කරන්න පුළුවන් එක 60 න් කළාම ඉතින් මේවා බෙදන්න බැරි කමක් නැහැ. මේවා බෙදන්න පුළුවන්. අත දිග ඇරලා දේවි. මෙතුමා ඡන්දයක් ආවාම අත දිග ඇරලා-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකයි කාලය තියෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේවා මඩ නොවෙයි. ඇත්ත කථා. බලන්න ගිහිල්ලා මීගමුව Beach Park එක. අද කොන්ත්‍රාත් එක අරන් තියෙන්නේ- Beach Park එකේ සල්ලි එකතු කරන්නේ කවුද ? අද මීගමුව නගර සභාවේ සියලුම කොන්ත්‍රාත් 10% එකතු කරලා, ඒ හැම අවුරුද්දේම කොන්ත්‍රාත් ටික ඔක්කෝම දීර්ඝ කරනවා. සියලුම දේවල්වලට මෙහෙම තමයි වෙන්නේ. මේවායේ සල්ලි යන්නේ කාගේ අතට කියලයි මම අහන්නේ. අද පළාත් සභාවේ අපේ මහ ඇමතිතුමා ඉන්නවා. මේ ගැන සියලු දෙනාම දන්නවා. හැබැයි, මේවාට කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මොන චක්‍රලේඛයේද නීතියක් තියෙන්නේ 10% ක් වැඩි කරලා, ඒ ඉන්න එක්කෙනාටම කොන්ත්‍රාත් එක දෙනවයි කියලා. කොහේවත් නැහැ. දැන් නිමල් ලාන්සා ඇමතිතුමා කියයි, බහුතරයක් මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත අනුව මේක දෙනවයි කියලා. ඉතින් මේක තමයි වෙලා තියෙන්නේ. මන්ත්‍රීවරු වුණත් එතුමාට ඕනෑ ගණනක් දීලා ගන්න පුළුවන් තත්ත්වයක් තමයි අද තියෙන්නේ. මම පුදුම වෙන්නේ නැහැ මේවාට. මේවා සාමාන්‍ය දේවල්. මෙතුමා විතරක් නොවෙයි නේ? මෙතුමා විතරක් ගන්නවා නම් මෙතුමාට 10% ක් එනවයි කියලා. උදාහරණයක් වශයෙන්. ඒක විතරක් නොවෙයි නේ? එයාගෙ උඩින් ඉන්න එක්කෙනාටත් දෙන්න එපායැ තිහක් විතර. ඒක නේ වැඩේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මාතෘකාවට අනුව කථා කරන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම උදාහරණයක් හැටියට කියලා කිව්වේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

දැන් 10% ක් මෙතුමාට යනවයි කියලා-

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි. මෙතුමා අහගෙන හිටියා. මම කිව්වා උදාහරණයක් කියලා. මෙතුමාත් අර මන්ද බුද්ධික ගණයට වැටිලද දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඡන්දෙට යන්න තියෙනවා. දැන් වෙලාවේ ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

වෙලාවේ ප්‍රශ්නයක් නොවෙයි. මේ සභාවේ මෙපමණ කලක් හිටපු මන්ත්‍රීවරයෙක් මෙවැනි දූෂණ ක්‍රියා තිබෙනවා නම්, ගිණුම් කාරක සභාවේ විගණනය තියෙනවා. වෙන පරීක්ෂණ තියෙනවා. ඒ කිසි දෙයකට ඉදිරිපත් නොවී මේ අවසාන අවස්ථාවේ කථාවක් කරනවා, මහා දූෂණ චෝදනා එල්ල කරමින්. මේ සභාවේ ගෞරවය මේ කෙළෙසන්නේ. මේ මන්ත්‍රීවරයෙකුගේ ගෞරවය කෙළෙසන්නේ. වගකිව යුතු මන්ත්‍රීවරයෙක් හැටියට අපි සියලුම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් තමුන්නාන්සේ නැගිට්ටේ නැහැ නේ මන්ද බුද්ධිකයෝ ඉන්නවාය කියද්දි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා, ඔබතුමාට කාලය දෙන්නම් පසුව වරප්‍රසාද ප්‍රශ්නය ගැන කථා කරන්න. ඡන්දෙට යන්න තියෙනවා.

**ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

තමන්ගේ තාත්තාගේ මට්ටමට ඔක්කෝම - මේ වාගේ තුප්පහි බලු කථා කියන්න - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේ සභාවේ මන්ද බුද්ධිකයෝ ඉන්නවාය කියද්දී දැන් මෙතුමා, අපේ සංවිධායකතුමා කට වහගෙන හිටියා. හැබැයි මම උදාහරණයක් වශයෙන් කොමිස් ගහනවයි කියද්දි, මෙතුමාගේ ප්‍රතිපත්තිය මොකක්ද? මොනවද මේ කියන්නේ? බයිලා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැබැයි දුමින්ද සිල්වා යි හිරුණිකායි ආවා නම් මෙතුමා දුවනවා, ගව් ගණනක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අවසාන වශයෙන් මම ප්‍රාර්ථනා කරනවා, අපේ ඇමතිතුමාට අනෙක් හැම දෙනාම කිව්වා වාගේ, මේ පළාත් සභාවේ ඇමතිකම නොවෙයි, පාර්ලිමේන්තුවටත් ගිහිල්ලා ඇමතිකමක් අරගෙන ජනතාවට හොඳ සේවයක් කරන්න හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා, තමන්ගේ සාක්කුව ගැන විතරක් බලා ගන්නේ නැතුව.

[පූ.භා. 10.55]

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

ගරු සභාපතිතුමනි, අංක 108, 124, 125 යන වැය ශීර්ෂයන්ට අදහස් දැක් වූ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය පිරිනමනවා. විශේෂයෙන් මම මෙය අවස්ථාවක් කොට ගන්නවා- මේ පළාත් සභාවට මම මාර්ග සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් පත් වෙලා ආවාම අපි දැක්කා, එදා අවුරුද්දකට මාර්ග සංවර්ධනය සඳහා සාමාන්‍යයෙන් මුදල් වෙන් වෙලා තිබුණේ, මිලියන දෙකයි තුනයි. කිලෝ මීටර 20 යි හදන්න පුළුවන්කම තිබුණේ. නමුත් අතිගරු ජනාධිපතිතුමා මේ රටේ යුද්ධය අවසන් කළාට පසුව මේ රටේ යටිතල පහසුකම් දියුණු කරන්න විශාල මුදල් සම්භාරයක් ලබා දුන්නා. විශේෂයෙන් ලංකාවේ සියළුම පළාත් සභාවලට හැම ආසනයේම කිලෝ මීටර 25 දක්වා සංවර්ධනය කරන්න මුදල් ලබා දීම තුළ මා හිතනවා, බස්නාහිර පළාත් සභාවේත්, අපේ දිස්ත්‍රික්ක තුනක 70 % ක සම්පූර්ණ කාපට් කරලා කොන්ක්‍රීට් කරලා අවසන් කරන්න අපට පුළුණවන්කම ලැබුණා. ඒ නිසා මම පෞද්ගලිකව සන්තෝෂ වෙනවා, අද මේ අවුරුදු පහක කාලය තුළ විශේෂයෙන් ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය තුළ, අපට ලබා දුන් ඒ ජනවරම තුළ, ඒ බලය තුළ මේ බස්නාහිර පළාතේ මාර්ගවලින් 70% ක් සම්පූර්ණයෙන් කාපට් කරන්න පුළුවන්කම ලැබීම ගැන. ඒ එක්කම ගම්පහ දිස්ත්‍රික්කයේ විශේෂයෙන් ගත්තාම ලබන අවුරුද්දේ මාර්තු වෙද්දි 100% ක් පළාත් මාර්ග කාපට් කිරීමේ අවස්ථාව අපට උදා වෙනවා.

ඒ එක්කම ගරු සභාපතිතුමනි, මම දන්නවා මගේ වැය ශීර්ෂයට කථා කරපු පක්ෂ විපක්ෂ සියලුම දෙනා ඉතාමත්

[ ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා ]

හොඳින් කථා කළා. නමුත් ශ්‍රීනාත් මන්ත්‍රීතුමා, එතුමා මගේ ආසනයේ නිසා එතුමාට මොනවා හරි ජනතාව ඉදිරියේ කියන්න ඕනෑ නිසා කිව්වා. එතුමාට මම උත්තර දෙන්න යන්නේ නැහැ. නමුත් ජනතාව ඡන්දේදී එතුමාට නියම උත්තරය දෙයි කියන එකත් මතක් කරනවා. විශේෂයෙන් ආර්ථික කටයුතු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා රන් අරුණ ව්‍යාපෘතිය යටතේ පළාත් මාර්ග විතරක් නොවෙයි, ප්‍රාදේශීය සභා, නගර සභා මාර්ගත් කිලෝ මීටර 800 ට වැඩි ප්‍රමාණයක් මේ දිස්ත්‍රික්ක තුන තුළ හදන්න අපට ශක්තිය දුන්නා. එතුමාටත් අපේ ස්තුතිය පිරිනමමින් විශේෂයෙන් මේ බස්නාහිර පළාත් සභාව තුළ ප්‍රධාන අමාත්‍යතුමා අපි දෙන්නා එක දිස්ත්‍රික්කයේ සිටියත් පැහැදිලිව කියන්න ඕනෑ. ප්‍රධාන අමාත්‍යතුමා මට වැඩ කරන්න, මට මේ තරම් ජනප්‍රිය වෙන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මාගේ ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමන්න ඕනෑ. අපි දන්නවා පහුගිය කාලේදී සභාපතිවරු, උප සභාපතිවරු හැසිරෙන හැටි දැක්කාම විශේෂ ස්තුතියක් ප්‍රධාන අමාත්‍යතුමාට පිරිනමනවා.

ඒ එක්කම පක්ෂ විපක්ෂ අපේ මන්ත්‍රීවරු සියලු දෙනාම අපට සහයෝගය ලබා දුන්නා. ඒ එක්කම ප්‍රධාන අමාත්‍ය ලේකම්තුමිය. හැම තිස්සේම කැබිනට් එකට - අපට මුදල් අවශ්‍යතාවයක් වුණාම ගණකාධිකාරිතුමා අපට අවශ්‍ය සහයෝගය ලබා දුන්නා. ඒකටත් අපේ ස්තුතිය පිරිනමනවා මෙම කාර්යය මට තනිවම කරන්න බැහැ. විශේෂයෙන් මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු අනෙකුත් සියළුම දෙනාත් අනෙක් දෙපාර්තමේන්තු, සත්ත්ව නිෂ්පාදන, නිවාස හා ඉදිකිරීම්, සංචාරක, ධීවර විෂයයන් ඉතා සාර්ථකව කරන්න අවශ්‍ය මග පෙන්වීම සහ සහයෝගය ලබා දීම පිළිබඳ ඒ සියළු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන් ගරු සභාපතිතුමනි, මේ මාර්ග සංවර්ධනය කියන්නේ පළාත් සභාවට හීනයක් වෙලා තිබුණේ. මේ මාර්ග සංවර්ධනය කාපට් කරනවා කියන්නේ, ඒ වකවානුව තුළ හීනයක් වෙලා තිබුණේ. අපේ මහ ඇමතිතුමාගේ නායකත්වයෙන් මේ බස්නාහිර පළාතේ - විශාල මාර්ග සංවර්ධනයක් කියන්නේ පහුගිය අවුරුදු දෙකට ගරු සභාපතිතුමනි, ලංකාවේ බස්නාහිර පළාත් සභාව මැදිහත් වෙලා කිලෝ මීටර 2800 කට වැඩි ප්‍රමාණයක් සංවර්ධනය කරලා තියෙනවා. බිලියන 40 ක සංවර්ධන කාර්යයන් කරලා තියෙනවා. ඒ එක්කම ලබන අවුරුද්දේ දැයට කිරුළ සඳහා බිලියන එකක ව්‍යාපෘති කරන්න අපි සැලසුම් සකස් කරලා තියෙනවා. ඒ නිසා මම හිතනවා, අතිගරු ජනාධිපතිතුමාට, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මහ ඇමතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය පිරිනමනවා. මොකද, මට පැවරුනු කාර්ය භාරය කරන්න මේ අය ලබා දුන් ශක්තිය පිළිබඳව. ඒ එක්කම මගේ වාසනාවක් තියෙනවා, මම යන තැන සාමාන්‍යයෙන් මට වැඩ කිරීමේ හැකියාව තියෙනවා. විශේෂයෙන් සංචාරක අමාත්‍යාංශය ගත්තාම අද ලංකාවේ වැඩිම සංචාරකයන් පහුගිය අවුරුදු කාලය තුළ ආවා නම් ඒ ආවේ 2012, 2013 වර්ෂයේ කියන එක ප්‍රකාශ කරමින්, ඒ එක්කම ධීවර කර්මාන්තය ගත්තාමත්, යුද්ධය අවසන් වුණාට පස්සේ උතුරු පළාත සම්බන්ධ වීම නිසා වැඩි මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගැනීමට හැකියාව ලැබුණා.

ඒ එක්කම සත්ත්ව සංවර්ධනය ගත්තාම දිවි නැගුම ව්‍යාපෘතිය තුළින් ගමේ ආර්ථිකය ශක්තිමත් කරන්න, ගෘහ ආර්ථිකය ශක්තිමත් කරන්න විශාල වැඩ පිළිවෙළක් අපට කරන්න පුළුවන් වුණා. ඒ නිසා මේ අවුරුදු කාලය තුළ ඒ සියළු ශක්තිය ලබා දුන් සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් ලබන්නා වූ නව වසර සුභ නව වසරක් වේවා කියා ප්‍රකාශ කරමින් අවසාන වතාවට යම්කිසි අභියෝගයක් ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට ප්‍රකාශ කරනවා.

මීගමුව ආසනය තුළ එතුමා මාත් එක්ක මැතිවරණයට ඉදිරිපත් වෙනවා. මම ගන්න මනාපවලින් තුනෙන් එකක් පුළුවන් නම් අරගෙන පෙන්වන්න. ඒ එක්කම තව අභියෝගයක් තියෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ මම ගන්න මනාපවලින් තුනෙන් එකක් පුළුවන් නම් අරගෙන පෙන්වන්න. ඒ එක්කම තමන් මැතිවරණයට ඉදිරිපත් වන ආසනය තුළ පුළුවන් නම් ඡන්ද ප්‍රතිශතය 40% ට වඩා, මට වඩා අරන් පෙන්වන්න. මම 88% ක් ගන්නවා කියන එක ප්‍රකාශ කරමින්, ගම්පහ දිස්ත්‍රික්කයෙන්ම තමුන්නාන්සේගේ පක්ෂයට වැටෙන ඡන්දවලින් ගන්න ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයක් ගන්න බව ඔප්පු කරමින් තමුන්නාන්සේ පුළුවන් නම් ඒ අභියෝගය භාර ගන්න කියමින් සියලු දෙනාට ස්තුති කරමින් මම නිහඬ වෙනවා. අභියෝග හතරක් කළා. පුළුවන් නම් භාර ගන්න.

*ඊට අනුකූලව පූ.භා. **11.00** ට, අංක **108, 124** හා **125** යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.*

*Accordingly discussion on the Expenditure Head Nos 108, 124 and 125 was concluded at 11.00 a.m..*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මාර්ග සංවර්ධන, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 108, 124, 125 යන වැය ශීර්ෂ පිළිබඳ විවාදයන් මේ අවස්ථාවේදී අවසන් වෙනවා. ඒ පිළිබඳ මේ සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

බෙදීමක් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

*ඊට අනුකූලව,*

***ශීර්ෂ අංක 108හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 11 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 108 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 53 for, 11 against and 00 decliners.*

***ශීර්ෂ අංක 124 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 11 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 124 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 53 for, 11 against and 00 decliners.*

***ශීර්ෂ අංක 125 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 11 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 125 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 53 for, 11 against and 00 decliners.*

**ශීර්ෂ අංක-106 - කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාර්මාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු අමාත්‍යාංශය**

**ශීර්ෂ අංක-120 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක-121 - කර්මාන්ත දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක-126 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

Head no 106 - Ministry of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs

Head no 120 - Department of Agriculture

Head no 121 - Department of Industries

Head no 126 - Deparment of Irrigation

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, *"කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂ රුපියල් 10/- ක සංකේත කපා හැරීමක් සිදු කළ යුතු යැයි"* යෝජනා කරනවා.

[පූ.භා. 11.04]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මෙම අයවැය විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම උපදේශක කාරක සභාවේ සමාජිකයෙක් හැටියට පසුගිය වසර පහ තුළම අපි ඉතා සහයෝගයෙන් පක්ෂ විපක්ෂ සියලු දෙනාම අපේ බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඒ වාගේම කර්මාන්ත ඇතුළු මෙම අමාත්‍යාංශයේ වැඩිදියුණුව වෙනුවෙන් මේ බස්නාහිර පළාතේ ප්‍රදේශවාසීන්ට වැදගත් සේවාවක් සිදු කරන්න, අපි සියලු දෙනාගේම දායකත්වය මෙම උදය ගම්මන්පිල ඇමතිතුමාටත්, නිලධාරි මණ්ඩලයටත් ලබා දුන්නා. අපි සියලු දෙනාගේම එකම අවශ්‍යතාවය පරමාර්ථය වුණේ, කොළඹ, කළුතර, ගම්පහ කියන මේ දිස්ත්‍රික්ක තුනේ මෙම අමාත්‍යාංශයේ විෂයට අදාළව

[ ගරු හර්ෂණ රාජකරුණා ]

ඒ සියලුම සේවාවන්, අවශ්‍යතාවයන් වඩා ඵලදායී මට්ටමට, ගෙනෙනා මේ අමාත්‍යාංශය තුළින් අපි සේවාවක් ඉටු කර ගන්න එම උපදේශක කාරක සභාවට අපේ අදහස් යෝජනා අපි ලබා දුන්නා. ඒ වාගේම එම අදහස් යෝජනා ගැන සළකා බලා, යම් යම් අවස්ථාවලදී වාද විවාද කර ගත්තත්, ඉන් උපරිම සේවාවක් ලබා දීමට හැකිවීම ගැන අපි සතුටු වෙනවා.

කෙසේ වෙතත්, බස්නාහිර පළාත් සභාව කියලා ගත්තාම විශේෂයෙන් මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කය තුළ අමාත්‍යාංශයක් හැටියට ගත්තාම අපට ලබා දී තියෙන මුදල් ප්‍රමාණයෙන් ඇත්තටම අපට යම් ප්‍රගතියක් ලැබිලා තියෙනවා. මේ පළාත් සභාව පටන් ගන්න කොට ඇත්තටම කෘෂිකර්ම අමාත්‍යාංශය, අමාත්‍යාංශයක් කියලා කියන්නත් බැරි මට්ටමේ තිබුණේ. නමුත් මේ පහුගිය වසර පහ තුළ අපි යොදන මුදල් ප්‍රමාණය - ඒ වාගේම මම සතුටුයි කියන්න, ප්‍රාග්ධන මුදල්- අනෙක් අමාත්‍යාංශ දිහා බලන කොට ප්‍රතිශතයක් හැටියට බලන කොට, ප්‍රාග්ධන මුදල් විශාල ප්‍රමාණයක් අපට යොදවා ගන්න පුළුවන් වී තිබෙනවා. නමුත්, අපි තවත් වැඩි මුදල් ප්‍රමාණයක් මේ කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබා දිය යුතුයි. මොකද, මේ අමාත්‍යාංශය අපේ පළාතට ඉතා වැදගත් අමාත්‍යාංශයක්. මේ බස්නාහිර පළාත් සභාව විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මට අපේ පළාතට ආවේණික වූ කෘෂිකර්ම - විශේෂයෙන්ම මඤ්ඤොක්කා. අන්නාසි. මම හිතන හැටියට මේ රටේ පොල්, රබර් පිළිබඳව යම් දැනුමක් හා ඒ සඳහා වූ යම් අරමුණක් තියෙනවා. නමුත් අපට විශාල ආදායමක්, විශාල සංවර්ධනයක් ළඟා කර ගන්න පුළුවන් අන්නාසි. මඤ්ඤොක්කාවලින්. විශේෂයෙන්ම රඹුටන්, දූරියන්වලින්.

රඹුටන්, දූරියන් වාගේ මේ ප්‍රදේශයට ආවේණික වූ භෝග තියෙනවා. නමුත් අපි ඒ පිළිබඳව අවධානය යොමු කරනවා ගොඩාක් අඩුයි. අපට අන්නාසි - මම දන්නවා අපේ පළාත්වලින් අන්නාසිවලින් විශාල ආදායමක් ලබා ගන්නවා. නමුත් අපේ අමාත්‍යාංශයක් හැටියට අන්නාසි - උදාහරණයක් හැටියට මම කියන්නේ. අන්නාසි සඳහා අපට දර්ශනයක් තියෙනවාද? අපි ඒ ගැන ගොවීන් දැනුවත් කරන්න, ගොවීන්ට පුහුණුවක් ලබා දෙන්න, ගොවීන්ට වෙළඳ පොළක් ලබා දෙන්න කටයුතු කරනවාද? අමාත්‍යාංශයක් හැටියට අපි කරන සේවාව ගොඩාක් අඩුයි. අපට පුළුවන් ගරු සභාපතිතුමනි, යම් ප්‍රඥප්තියක් හදලා, අධිකාරියක් හදලා - මේ අන්නාසි කියන්නේ අපේ ප්‍රදේශයේ ලොකු ආදායමක් ගෙන එන පළතුරක්. ඔබතුමා දන්නවා. ගම්පහ දිස්ත්‍රික්කයේ අපට අන්නාසිවලින් කොපමණ ආදායමක් එනවාද කියලා. ගම්පහ දිස්ත්‍රික්කයේ මල්වාන වාගේ ප්‍රදේශවල රඹුටන්වලින් විශාල ආදායමක් ලැබෙනවා. නමුත් අපට රඹුටන් සඳහා මොකක්ද තිබෙන දැක්ම? අපි දන්නවා, පාරේ දෙපැත්තේ රඹුටන් තියෙන කොට මෙන්න රඹුටන් කාලේ කියලා. නමුත් අපි වෙළඳ පොලක් හදලා දීලා තියෙනවාද? ගොවීන්ට රඹුටන් සඳහා මොකක්ද ලබා දීලා තියෙන ආධාරය. මේ දැනුම අපි ලබා දීලා තියෙනවාද? වෙළඳ පොළක් අපි ලබා දීලා තියෙනවාද? මඤ්ඤොක්කා අපේ ප්‍රදේශයට විශාල ආදායමක් ගෙන එන දෙයක්. අපි පිටරට යවනවා. නමුත් අමාත්‍යාංශයක් හැටියට අපි ඒ ගැන වැඩි අවධානයක් යොමු කරලා තියෙනවාද? අපට පුළුවන් මේ භෝග සඳහා වෙනම අධිකාරි පිහිටුවලා, ඒ අධිකාරි තුළින් එම ප්‍රඥප්ති ඇති කරලා මේ නිෂ්පාදන වැඩි කරන්න අපට පුළුවන්. දිරිමත් කරන්න. ඒ විතරක් නොවෙයි, අපි කල්පනා කරලා බැලුවොත් අපේ ප්‍රදේශයට - මොකද, බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය කියන්නේ, අපේ මේ බස්නාහිර පළාතේ ප්‍රවර්ධනය කරන්න- අපි හඳුනා ගන්න ඕනෑ, බස්නාහිර පළාතට ආවේණික වූ දේවල්. මම කථා කරන්න යන්නේ නැහැ, අපේ කෘෂිකර්මය පිළිබඳව රේඛීය අමාත්‍යාංශයෙන් කරන වෙනත් වැඩ කටයුතු පිළිබඳව. ඒ සියල්ලම අපි අමතක කරලා, මේ ප්‍රදේශය දියුණු කරන්න, විශාල ශක්තියක් ලබා ගන්න අපට පුළුවන්.

ඒ වාගේම තමයි, අපේ කර්මාන්ත අමාත්‍යාංශය. අපේ කර්මාන්ත අමාත්‍යාංශය මම හිතන්නේ, අපට මීට වඩා පුළුවන් වෙනවා - දැන් අපි කථා කළොත් Handloom. Handloom අපේ රටේ විදේශිකයන් අතර විශාල ඉල්ලුමක් තියෙන දෙයක්. නමුත් අපේ කර්මාන්ත අමාත්‍යාංශයෙන් Handloom නිෂ්පාදනය කළාට ඒකට වෙළඳපලක් නැහැ. මේ කොළඹ තියෙන ප්‍රධාන වෙළඳපලවලට අපේ නිෂ්පාදන අරගෙන වැඩි මුදලට විකුණනවා. ඉතින් අපේ පළාත් සභාවට ලබා ගන්න පුළුවන් ලොකු ආදායමක් අහිමි වෙනවා, අපි වෙළඳපොල නිර්මාණය කරන්නේ නැති නිසා.

ඒ වාගේම තමයි අපි ආරම්භ කළා, මී මැසි පාලනය. දැන් කල්පනා කරලා අපට පුළුවන්ද බලන්න මී මැසි පාලනයට - ඇත්තටම අපේ ප්‍රදේශයේ කජුගම කිව්වාම කජුවලට ප්‍රසිද්ධයි. මල්වාන කිව්වාම රඹුටන්වලට ප්‍රසිද්ධයි. මී මැසි පාලනය කිව්වාම අපට පුළුවන් වෙන්න ඕනෑ - අපි ආරම්භ කළා. නමුත් අපට මීට වඩා අපේ මී මැසි පාලනය දියුණු කර ගන්න පුළුවන්. ගම්මාන ඇති කරලා මීපැණි නිෂ්පාදනය කරන්න පුළුවන්. ඇයි අපට බැරි නුවර පාර ප්‍රදේශයේ මීපැණි වෙළඳාම් කරන්න? අපි කජුගම නිර්මාණය කළා වාගේ නුවර පාරේ අපට පුළුවන් මී පැණි වෙළඳාම් කරන්න. මම බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී මෙවැනි කටයුතු වෙයි කියලා. අපට ආවේණික වූ පළතුරු නිෂ්පාදන වෙන්න පුළුවන්. එළවළු වෙන්න පුළුවන්. සත්ත්ව නිෂපාදන වෙන්න පුළුවන්. අපට පුළුවන් නම් ඇති කරන්න Market එකක්. වෙළඳ පොළක්. මම ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම කොළඹ නගර සභාවෙන් ඉල්ලීමක් කළා. අපේ රඹුටන්, දූරියන්, මැංගුස්ටින් වාගේ එක එක කාලවලට එක එක නිෂ්පාදන එනවා. ඒ නිෂ්පාදාන එන කොට ඒ අයට වෙළඳ පොළක් තියෙන්න ඕනෑ. තුන්මුල්ල ප්‍රදේශවල වෙළෙන්දන් ඉන්න කොට ආරක්ෂක හේතූන් මත කියලා ඒ අයව අයින් කළා. ඒ අයව අයින් කළාට කමක් නැහැ. නමුත් ආරක්ෂක හේතූන් මත අයින් කරන්න ඕනෑ. කිසි ගැටළුවක් නැහැ. අයින් කරන්න ඕනෑ. ඒ අයට වෙළඳපළක් ලබා දෙන්න, අපේ බස්නාහිර පළාතේ අපට අයිති තැනක ලස්සන පළතුරු පොළක් ලැහැස්ති කරන්න අපට පුළුවන් නේ? පළතුරු විතරක් නොවෙයි. මේ අපේ නිෂ්පාදනවලට වෙළඳ පොළක් ඇති කරන්න.

අන්න ඒ අවශ්‍යතාවය අපි ඉටු කර ගන්න ඕනෑ. පළතුරු එළවළු පමණක් නොවෙයි. අපට පුළුවන් නම් නාගරික සංවර්ධන අධිකාරියෙන් දිනයක් දාගන්න, පාර්ලිමේන්තුව ඉදිරිපිට ඇති කරලා තියෙන වෙළඳ පොළ සඳහා - මම දන්නවා, බ්‍රහස්පතින්දා දවස්වලට එක එක ජාති නිෂ්පාදනය එනවා. සෙනසුරාදා ඉරිදා තියෙනවා මල් පැළ. අපට දිනයක් තියෙනවා නම්, ඒ ස්ථානයේ හරි ළඟා කරන්න. මම කියන්නේ, අපටම කියලා දින හතටම පාවිච්චි කරන්න පුළුවන් දිනයක් තියෙනවා නම් වඩා හොඳයි. නමුත් මේ නිෂ්පාදනවලට අපි වෙළඳ පොලක් හදා දෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. අපේ නිෂ්පාදන ලංකාවට පමණක් නොවෙයි. අපේ නිෂ්පාදන දේශීය වෙළඳාමට පමණක් නොවෙයි. තමුන්නාන්සේලා දන්නවා. අපේ රටේ අන්නාසිවලට වඩා ඉහළ අන්නාසි මේ ලෝකයේ කොහෙවත් නැහැ. මේ අන්නාසි මුළු ලෝකෙටම අපට ලබා දෙන්න පුළුවන්. නමුත් අපි මේ පලතුරු සඳහා අපේ ප්‍රදේශයට ආවේණික වූ නිෂ්පාදන පිට රටට ලබා දෙන්න අපි අරගෙන තියෙන ක්‍රියාමාර්ගය මොකක්ද? අපේ බස්නාහිර පළාතේ අපට අවේණික වූ කෘෂිකර්මය, කර්මාන්තය මේ නිෂ්පාදන ලෝක වෙළඳපොලට ලබා දෙන්න පුළුවන් නම්, අපට මීට වඩා විශාල සේවාවක් - මොකද, මේ කර්මාන්ත දියුණු කරනවා කියන්නේ, අපේ මුඛ්‍ය අරමුණ වන අපේ බස්නාහිර පළාතේ ජනතාවට සේවාවක් කරනවා කියන එකයි. අන්න ඒ කටයුත්ත කරන්න ඉදිරියේදී අපි සියලු දෙනා එකතු වී වැඩකරමුයි කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 11.17]

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

ගරු සභාපතිතුමනි, මම ඉතාම සන්තෝෂයට පත් වෙනවා අපේ උදය ගම්මන්පිල අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ අදහස් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව. මට දැනෙන හෘද සාක්ෂිය තමයි මේ අමාත්‍යාංශය යටතේ පක්ෂ විපක්ෂ කවුරුත් එතුමා හා බැඳුනු එතුමාගේ වැඩපිළිවෙළ හා එකතු වූ පිරිසක් බවට පත් කර ගන්නට ගරු ඇමතිතුමාට පුළුවන්කම ලැබුණා. අපේ හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමා කථාව ආරම්භයේදීම - මම ස්තුතිවන්ත වෙනවා එතුමාට. අප හැමගේම එකතුවෙන් තමයි, මේ සියල්ල සිද්ධ වෙන්නේ. මා විශේෂයෙන්ම එතුමාගේ අමාත්‍යාංශයේ අතිශයින්ම වැදගත් ව්‍යාපෘති රාශියක් මේ ගෙවී ගිය වසර පහකට ආසන්න කාලය තුළ බස්නාහිර පළාතට, ජනතාවට මහජන නියෝජිතයින් වන අපට අපේ අතට පත් කළා. ඒ කරුණු කාරණාවල මම ඉතා සන්තෝෂයෙන් මතක් කරනවා. එතුමා හොඳ පරිසරවේදියෙක්. එතුමා මීට පෙර නියෝජනය කළ පරිසර අධිකාරියේ සභාපති ධූරය. එතුමා පරිසරවේදියෙක් වාගේම, එතුමා රටට ජාතියට ආදරය කරන හොඳ විද්වත් මහත්මයෙක් කියන එකත් මම බොහොම ආදරයෙන් මතක් කරනවා.

[ ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා ]

ඒ නිසා මගේ මනසේ පෙර සිටම තිබුණු සිතිවිල්ලක් තමයි, අද අප මුහුණපාලා තියෙන මේ රසායනික බේදවාචකය. මේ රසායනික බේදවාචකය ජනිත වෙන්නට- අපට මට මතකයි. ඉතිහාසය මම කියවද්දි, එක්දහස් නවසිය හැටේ දශකයේ ඇති වුණු හරිත විප්ලවය. අද වැරදි විධියට තේරුම් අරගෙන, අද අපි හුඟක් තැන්වල කෘෂිකර්මය කියන කාරණාවේ අතරමං වෙලා ඉන්නේ. එතුමා ඉතාම හොඳ පුවත්පතක් එළිදක්වනවා. සියසර. මේකේ බැලූ බැල්මට සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය පිළිබඳව කතිකාවක්. බැලූ බැල්මට මේකේ වරදක් තේරෙන්නෙ නැතුව ඇති. හැබැයි, මතක් කරන්න ඕනෑ. මේ කාරණය තමයි අද දවසේ අපේ සාකච්ඡාවට භාජනය වෙන්නේ. ඒක ප්‍රස්තුත කාරණාව ලෙසම අරගෙන තියෙනවා. මම දැක්කා ඒ වාගේම යුසුෆ් මැතිතුමනි, එතුමා සාකච්ඡා කර ගෙන තියෙනවා බොහොම හොඳ දෙයක්. මොනවද මේ? කාබනික ගොවිතැන වෙත යා යුත්තේ ඇයි? මේක තමයි අද තියෙන අභියෝගය.

ඒ නිසා එතුමාගේ වැඩකටයුතු අතර මා වඩාම ප්‍රිය කරන කාරණාවක් තමයි මිහිකත හෝරාව. මිහිකත හෝරාව වැඩසටහන ලංකාවේ පළමුවැනි වතාවට තමයි එතුමාත් අපේ පාඨලී චම්පක ඇමතිතුමාත් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූයේ. මාර්තු මාසේ 23 වැනිදා. මම හිතන්නේ, ඊළඟ පළාත් සභාවත් පැමිණිලා තියේවි මාර්තු 23 වැනිදා රාත්‍රියේ 8.30 , 9.00 අතර වනකොට. මම බොහෝම ආදරයෙන් මතක් කරන්න ඕනෑ, ඇන්ඩ්‍රි රිද්ලේ. මේ ආදරණීය පරිසරවේදියා තමයි මෙය නිර්මාණය කළේ. ඒ නිසා මිනිස්සු හැටියට අද අපි කල්පනා කරන්න ඕනෑ, මේ සියලු දේවල්වල ජාතික වශයෙන් මතු වන ගැටළු නිරාකරණය කර ගන්නේ කොහොමද කියලා. මිහිකත හෝරා වැඩසටහනේ, අවසාන වශයෙන් එතුමා මිහිකත රූ රැජිණත් ලංකාවට කැඳවා ගෙන ආවා.

ඒ වාගේම මම එතුමාගෙන් දැකපු දෙයක් තියෙනවා. මනරම් වැව් වැඩ සටහන. මට මතක් වෙනවා, ගෝඨාභය රාජපක්ෂ අපේ ලේකම්තුමා. කොළඹ බේරේ වැව කියන කොට කොළඹ නොවෙන, දෙවුන්දර නුවර මිනිස්සුත් නහය වහගෙන හිටියා. ඒ තරමම කොළඹ කැළිකසළවලින් පිරිලා. මහ විශාල පරිසර හානියක් තිබුණේ. අද බේරේ වැව සුන්දර මනරම් වැවක් බවට පත් වෙලා තියෙනවා. අපේ ගරු ඇමතිතුමාගේත් තියෙනවා ඒ වාගේ ඉතාම හොඳ වැඩසටහන්. මොකද, මේ වැව් බැඳි රාජ්‍යය ඉතිහාසයේ තියෙන්නේ, දහසක් වැව් බැඳි රට කියලයි. මේ රටේ ඉතිහාසය අපට කියා දීලා තිබෙනවා පරිසරයට ආදරය කරන මිනිසුන් රටට ආදරය කරන මිනිසුන් බව. ඒ නිසාවෙන් මනරම් වැව් වැඩ සටහන යටතේ එතුමා ඉතාම හොඳ නිර්මාණශීලී වැඩ සටහනක් කරගෙන යනවා. මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අද සොබා කැකුළු වැඩ සටහන. මම පාසල් දරුවන් ගැන කාලයක් තිස්සේ කටයුතු කරමින් සිටින මන්ත්‍රීවරයෙක්. මට ඕනෑකම තිබෙනවා, අද මේ කෘෂිකර්මය දරුවන්ට මිත්‍රශීලී ව්‍යාපෘතියක් බවට පත් වෙනවා දකින්න. බොහෝ අය කෘෂිකර්මය හැර යනවා. අද ශ්‍රම හිඟය කියන කාරණාව කෘෂිකර්මය තුළ ප්‍රමුඛතාවය ගත යුතු කාරණාවක්. අපේ පැත්තේ තේ වැව්වත්, අපේ පැත්තේ රබර් වැව්වත්, වෙන පැත්තක මොනවා හරි දෙයක් කළත්, පොල් වැව්වත් අද ඒ සඳහා යොදා ගන්න ශ්‍රමිකයෝ නැහැ. ඒ නිසාවෙන් කෘෂිකර්මය ලෙංගතු මිත්‍රශීලී ළඟින් ඉන්න පුළුවන් මිතුරෙක් බවට පත් කරන්න, එතුමා පාසල් දරුවන් ළඟට ගියා.

සොබා කැකුළු වැඩ සටහන පරිසරයට ආදරය කරන දරුවෝ බිහි කිරීමක්. පරිසරයට ආදරය කරන්න පුරුදු වන හැම දරුවෙක්ම ගරු සභාපතිතුමනි, රටට ආදරය කරනවා. තමන්ට ආදරය කරනවා. අවට මිනිස්සුන්ට අදරය කරනවා. එහෙම උසස් පරමාර්ථ පෙරදැරි කරගෙන පාසල් කෘෂි ව්‍යාපෘති හදලා, දරුවන්ව ඒ කෘෂිකර්ම වැඩවලට යොදවලා, එතුමා ලොකු වැඩ සටහනක් කළා. මම බොහොම සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ, තව දෙයක් තිබෙනවා. සුළු දෙයක් වාගේ පෙනුනත් මට නම් ඒක ලොකු දෙයක්. ඒ තමයි පරිසර හිතකාමී සැරසිලි. මට මේකට දාන්න නමක් පවා ආවා. අපේ ගරු මහ ඇමැතිතුමා සරුදම් අරුණැල්ල කිව්වා වාගේ ගරු සභාපතිතුමනි, මෙය පරිසරයට අරුණැල්ලක්මයි. දේශපාලනයටත්, මහජන සේවාවටත් ගම්මන්පිල හුදෙක් ගම්මන්පිල උදාවක්, අරුණැල්ලක් කියලා මම භය නැතිව කියන්න ඕනෑ. මේක තමයි ඇත්ත. අපි ඇත්ත ඇති සැටියෙන් දකින්න ඕනෑ. මේ පුවත්පතේ තිබෙනවා, මම ආදරය කරන මිනිහෙකුගේ පණිවිඩයක්. මම මේ පළාත් සභාවේ වැඩියෙන්ම ආදරය කරන කෙනෙක්. ඒ තමයි,

*"මම මුදල් පසුපස හඹා ගියේ නැහැ. මම සාමාන්‍ය පන්තියක මිනිහෙක්."* ඒ.එම්. යූසුෆ්.

මගේ ආදරණීය ලොකු අයියා. බලමු ඒ ලොකු අයියා කියලා තිබෙන කථාව. මේක තමයි අද දවසේ පණිවුඩය. මේ ඉන්නේ ප්‍රාදේශීය සභාව ඉහළට ගෙන ගිය නායකයන්. අද පළාත් සභාවලට ඇවිල්ලා. වැරැදි තැනකට ආවේ මල්ලී. එතැන සිටියා නම් හොඳයි. අර ඉන්නේ අපේ ලංකාතිලක මැතිනිය. ගම් මට්ටමේ මහජන නියෝජිතයාට තිබුණු ගෞරවය අද කිළිටි වෙලා, ඕජස් ගලනවා. අපට උදාහරණයක්, අපට පූර්වාදර්ශයක් තිබෙනවා. මම මතක් කරන්න ඕනෑ, අද ලංකාවේ අපේ දේශපාලනයට ආපු, හෙළ උරුමය හරහා එතුමාගේ දේශපාලන ප්‍රතිපත්තිය ගොඩනැඟුණු, අපේ පළාත් සභාවට ආපු, අපට මඟ පෙන්වන, අපට මඟ සරසන, යා යුතු මඟ නිවැරැදි කරන පළාත් සභාවේ දක්ෂතම ඇමැතිරයෙක් තමයි උදය ප්‍රභාත් ගම්මන්පිල. පළාත් සභාවට, කෘෂිකර්මයට, පරිසරයට ප්‍රභාතයක්ම යැයි කියලා මම බොහෝම අවංකයෙන්ම කියන්න ඕනෑ. ඒ නිසාවෙන් ගරු සභාපතිතුමනි, බොහෝ දේ කතා කරන්නට තිබුණත් මං හිතන්නේ, වේලාවත් පොඩි ප්‍රශ්නයක් තමයි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමාත් හොඳයි.

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

එතුමා මුදල් හදල් ඉතිරි කරලා දෙන - අපේ පළාත් සභාවේ නොවෙයි, රටේ හුඟක් තැන්වල වංචාව දූෂණය අද අපි දකිනවා. වළල්ලාවිට සභාවත් එකයි. අනිත් ඒවත් එකයි. නේද අපේ නායකතුමනි?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

බස්නාහිර පළාත් සභාවේ සභාපතිතුමාත් හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ඉතා හරවත් රසවත් කතාවක් කරනවා. ඒ නිසා ඔබතුමාට තව විනාඩි 05ක කාලයක් ලබා දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් කියයි කැපුවා කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුදුම සැළකිලි.

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

ඒක නේ? දැන් ඉතින් මම ඒක කියන්ට ඕනෑ. පළාත් සභාවේ විතරක් නොවෙයි අද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කතා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වාහනය නැත. කාලය ඇත.

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

මම ඒකට මෙහෙම කියන්නම්.

රටට ජාතියට හිතැති
පරිසරයට ගොවිතැනට කැමති
ඊර්ෂ්‍යා ක්‍රෝධ නොමැති
ගම්මන්පිල ඇමති

ඉතින්, මිනිස්සු මේවා ගෙනියන්නේ නැහැ. හෙට දවස නිර්මාණය කරන්නේ, හෙට දවස ගොඩ නගන්නේ රටේ සමාජ නායකයෝ. ප්‍රාදේශීයට සභාවට ආවත්, පළාත් සභාවට ආවත්, පාර්ලිමේන්තුව තුළට ගියත් හෙට දවස නිර්මාණය කරන මහජන නියෝජිතයෝ, සමාජ නායකයෝ නිවැරදි වෙන්නට ඕනෑය කියලා තමයි මම විශ්වාස කරන්නේ. පොදු දේපළ අපේ නෙවෙයි. අපේ න්‍යාය පත්‍රයේ පුද්ගලීකරණයට ඉඩක් නැහැ. මම සඳහන් කරන්න ඕනෑ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ විවිධ වැඩ කටයුතු රාශියක්, ගෙවී ගිය කාලය තුළ ඉතාම නිර්මාණශීලි වැඩ කටයුතු රාශියක් උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා මේ අමාත්‍යාංශය හරහා කළා. අපි ඒක කියන්න ඕනෑ.

[ ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා ]

දැන් අපි මෙතන විශේෂයෙන් කාරණාවක් මතක් කරන්න ඕනෑ. බිඳුණු පුටුවට දැතේ සවියක්. මම විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මන්ත්‍රීකම තිබුණත්, වෙන වැඩ තිබුණත් නොතිබුණත් මම හැමදාම පාසල්වලට යන කෙනෙක්. හැම තැනකම ගරු සභාපතිතුමනි. ගමේ ඈත දුෂ්කර පාසල්වල කැඩුණු පුටුව කර්මාන්ත අමාත්‍යාංශය යටතේ අපේ නිලධාරීන්, අපේ කාර්මික සහෝදරවරු ගිහිල්ලා හදලා දීලා තියෙනවා. මිලියන තිස් දෙකයි වියදම් කළේ, මිලියන එකසිය අසූ අටක දැවැන්ත ආදායමක් අපේ ගරු ඇමතිතුමා අපට ලබා දීලා තිබෙනවා.

මම බෝග සායන පිළිබඳව කියන්න ඕනෑ. සෞඛ්‍ය සායනත් තියෙනවා. සෞඛ්‍ය සායනයේ නම් දාලා තියෙනවා, උත්තම පූජා කියලා මහ ලොකු නමක්. මම දන්නේ නැහැ, ඒ තුළින් සිදු වුණු එහෙම සේවාවක් තියනවාද කියලා. වැඩි හරියේම අපේ පැත්තේ බෙදුවේ, ඉදිආප්ප වංගෙඩි. තේ පැළ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

සෞඛ්‍ය ඇමතිතුමත් ඉන්නවා .

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

සෞඛ්‍ය ඇමතිකම නොවේ. එතුමා කළේ කෘෂිකර්ම ඇමතිකම. එතුමා කෘෂිකර්ම ඇමතිකම කළේ නේද ? මේ පළාත් සභාවේ හොඳම අමාත්‍යාංශය කරපු ඇමතිවරු කිහිපදෙනෙක් ඉන්නවා. ඒ සියළු දෙනාටම හිස නමලා මම ගරු කරන්න ඕනෑ. පොදු බව. ජනාධිපතිතුමා කිව්වා, මේ තනතුරු පිරිනමන ක්‍රමයට, එය පුද්ගලීකරණය කර ගන්න එපාය කියලා. පුද්ගලීකරණ න්‍යාය පත්‍රයක් තුළ ගොනු වුණු - මම මතක් කරන්න ඕනෑ. අපේ මහ ඇමතිතුමා දීර්ඝ කාලයක් මේ ක්ෂේත්‍රයේ හිටපු කෙනෙක්. දැන් එතුමා පියෙක් වගේ. එතුමා යම් කිසි වැඩක් කළා නම් බෙදා හදාගෙන, අනුන් එක්ක බොහොම මිත්‍රශීලීව ඒ කටයුතු කළා. සෞඛ්‍ය අමාත්‍යාංශය කෘෂිකර්ම අමාත්‍යාංශය බදා ගත්තා. එහේ ගිහිල්ලා තේ පැළ බෙදනවා. එහේ ගිහිල්ලා රඹුටන් පැළ බෙදනවා. වංගෙඩි මෝල්ගස් බෙදනවා. කාන්තාවන්ට සාරි අන්දවනවා. කූරු හැට්ට මාල දෙනවා. මම දන්නේ නැහැ මොනවාද මේ කියලා. මේකද සෞඛ්‍ය අමාත්‍යාංශය? ඒ හින්දා අපි කියන්න ඕනෑ අද -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

සාරි ගලවන්නේ නැද්ද ?

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

පූර්වාදර්ශ අමාත්‍යාංශයක් බව කරලා පෙන්වලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සාරි අන්දන එක කොච්චර දෙයක්ද ?

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

උදය ගම්මන්පිල ගරු ඇමතිතුමා පළාත් සභා අටටම පූර්වාදර්ශ ඇමතිවරයෙක්, පූර්වාදර්ශ නායකයෙක් කියලා මතක් කරන්න ඕනෑ. මම තව කාරණාවක් කියන්න ඕනෑ. පාසල් කෘෂි සමාජ. මම මතක් කරන්න ඕනෑ, අද පාසල් කෘෂි සමාජ හරහා - ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ගුවන් සංස්ථාවේ ඉස්සර වැඩ සටහනක් තිබුණා, 70 දශකයේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

තරුණ ගොවි සමාජය.

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

70 බිහි වුණු සමගි පෙරමුණු රජයේ න්‍යාය පත්‍රයේ තිබුණේ, ගොවියා රජ කරවන වගා සංග්‍රාමය තමයි ඒ න්‍යාය පත්‍රයේ තිබුණේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ කාලයේ මේ රටේ ශ්‍රේෂ්ට නායකයෙකු වූ හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂිකර්ම ඇමතිතුමා තමයි මේ වැඩ සටහන කළේ. ඒ නිසාවෙන් අපේ ඇමතිතුමා පුංචි වුණත් ඇමතිතුමාගේ අදහස්, ඇමතිතුමාගේ ප්‍රතිපත්ති, ඇමතිතුමාගේ වැඩ පිළිවෙළවල්, පළාත් සභාවට විතරක්

සීමා නොවී, ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන්න පුළුවන් වැඩ පිළිවෙළවල් රාශියක් තමයි ගම්මන්පිල ඇමතිතුමා ස්වකීය අමාත්‍යාංශයෙන් සිදු කළේ. අපි කියන්න ඕනෑ. මේ ව්‍යාපෘතිය අරගෙන බලන්න රංජිත් රූපසිංහ ගරු මන්ත්‍රීතුමනි, මධ්‍යම රජයේ - තරහකට කියනවා නොවේ. මධ්‍යම රජයේ හොඳ ඇමතිවරයෙක් ඉන්නේ. හැබැයි, මේ වගේ තමන්ට පැවරිලා තියෙන කෘෂිකර්ම අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, යුසුෆ් ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත අමාත්‍යාංශය. කර්මාන්ත අධිකාරියටත් ප්‍රඥප්තියක් ගෙනල්ලා කර්මාන්ත අමාත්‍යාංශය හරහා ගමේ පුංචි පුංචි කර්මාන්ත කරන අපේ අහිංසක මිනිස්සුන්ට දැතේ සවියක් ඇති කරලා, ඒ කර්මාන්තවලට හොඳ වෙළඳ පොළක් ඇති කරන්න කටයුතු කළා. විශේෂයෙන්, පේෂ කර්මාන්තය ප්‍රමුඛ මේ සියළු දේවල් වලට හොඳ වෙළඳ පොළක් ඇති කරන්නත් එතුමා ලොකු කැපවීමක් කළාය කියලා මම මතක් කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි මීටර්?

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

මීටර් වැඩෙත් තියෙනවා. දැන් මම එකක් කියන්න ඕනෑ, එතුමා පොඩි මිනිස්සුන්ට ආදරය කරන බොහෝම ලෙංගතු -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපේ සමාජයේ කෙනෙක්

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

අපේ පංතියේ කෙනෙක්. මේ ලොකුවට හිටියට එතුමා එහේ. අපේ පංතියේ කෙනෙක් ඒ හිංදා එතුමා කල්පනා කළා, එතුමාට අභියෝගයක් ආවා. මේ ත්‍රීවිල් එළවන අය අහිංසක මිනිස්සු. ත්‍රීවිල් සංගමයේ සභාපති තමයි රණවිරු විකුම් ගුණසේකර. අද පළාත් අද පළාත් සභාවට ඇවිත් තියෙන්නේ. ඒ හින්දා එතුමා බොහෝම කැපවීමෙන් ඒ වෙනුවෙන් කථා කරනවා. මේ ත්‍රීවිල් රියැදුරන්ට දවසේ වේල හොයාගන්න බැරුව - පුංචි දූලා පුතාලා ඉස්කෝලේ යවන්න, ගෙදර විය හියදම හොයාගන්න ත්‍රීවිල් රථ දහස් ගාණක් අද පාරේ නවත්වාගෙන ඉන්නවා. මම මතක් කරන්න ඕනෑ, ත්‍රීවිල් මීටරේ දීපු එක නොවේ, මේ කියන්නේ. ත්‍රීවිල් මීටරේ දුන්නාම ඒ හරහා නිවැරදි ගමනාගමන පහසුවක් ඇති කළා, ත්‍රීවිල් එකට ගොඩවෙන මනුස්සයාට. ත්‍රීවිල් එකට ගොඩවෙන මනුස්සයාට නියමිත මුදල ප්‍රදර්ශනය වෙනවා. ගමනාන්තය ඇහුවාම -

**ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ප්‍රවාහන අමාත්‍යාංශයට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඔබතුමාගේ කාලෙත් දැන් අවසන් වෙලා තියෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

කොතැනක පිදුවත් දිළිඳුන් උදෙසා - ප්‍රවාහන අමාත්‍යාංශයේ නොවේ ඒක. කර්මාන්ත අධිකාරිය යටතේ ඒ කාරණාව කරන්න පුළුවන්. ඒ නිසා මම මීට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම හිතනවා, දැන් මේ කවුරුත් මේ පළාත් සභාවෙන් හෙට අනිද්දා - නේද මන්ත්‍රීතුමා? යන්න හෝ එන්න ඉඩ තියෙනවා. සත්‍ය තේරුම් ගන්නට ඕනෑ. ගරු සභාපතිතුමනි, වැඩියෙන්ම හෘද සාක්ෂිය හා සත්‍ය තේරුම් ගත යුත්තේ ඇයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසාවෙන් අපි සියලු දෙනා පිළිබඳව මගේ ප්‍රාර්ථනාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කරන්න එපා. එතුමා කියන දේවල් මට ඇහෙන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

මගේ ප්‍රාර්ථනාව මම නිර්ලෝභීව කියන්න ඕනෑ. ගරු මහ ඇමතිතුමා ඇතුළු සියලුම ගරු ඇමතිතුමන්ලා, ඒ වාගේම ගරු සභාපතිතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සෞඛ්‍ය ඇමතිතුමා.

**ගරු රංජිත් සෝමවංශ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Ranjith Somawansa - Deputy Chairman

සෞඛ්‍ය ඇමතිතුමාත් එන්න ඕනෑ. එතුමාත් සභාවට එන්න ඕනෑ. ගරු සභාපතිතුමා ඇතුලු සියලුම ගරු මන්ත්‍රිතුමන්ලාට හදවතින්ම සුභ පතනවා. බස්නාහිර පළාත් සභාව යළිත් සන්ධානයටමයි හිමි වෙන්නේ කියන කාරණාව අපි කවුරුත් පිළිගන්න ඕනෑ. සන්ධාන ගත වෙලා ගොඩනැගෙන පළාත් සභාවෙත් රටට ජාතියට යළිත් සේවය කරන්නට, අපි සියලු දෙනාම යළි සභාවට එන්න ඕනෑ. ඒ හින්දා 2014 වසර හෙට අනිද්දා උදා වෙන මොහොතක හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රිතුමාත්, අපේ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රිතුමත්, කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රිතුමත්, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රිතුමත් මේ සභාවේ ඉන්න ඕනෑ කියන කාරණාව මතක් කර සිටිනවා. ඒ නිසාවෙන් අපේ ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමා ඇතුළු සියලුම මැති ඇමතිතුමන්ලා ගරු මන්ත්‍රිතුමන්ලා අපේ ආදරණීය අශෝකා ලංකාතිලක, අපේ සකළසූරිය මැතිනිය ඇතුළු සියලු දෙනාටම මේ සභාවේ අසුන් ගන්නට ශක්තිය ධෛර්ය වාසනාව සියලුම දෙනාටම ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. උදය ගම්මන්පිල ගරු ඇමතිතුමාට නිදුක් නිරෝගී සම්පත් දිර්ඝායුෂම ලැබේවා. ඔබ සියලු දෙනාටත් ඒසේම වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු නියෝජ්‍ය සභාපතිතුමාටත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මම ඔබතුමාට ගෞරවයෙන් ආරාධනා කරනවා මුලාසනයේ අසුන් ගැනීමට.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [රංජිත් සෝමවංශ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රිතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් නියමිතව තිබෙනවා.

[පූ.භා. 11.36]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අයවැය විවාදයට සම්බන්ධ වන අතරේ වැය ශීර්ෂ අංක 106, 120, 121, 126 වෙනුවෙන් දිර්ඝ ලෙස කථා කිරීමට ප්‍රථම, ඔබතුමාගේ සාකච්ඡාවට අපි ඇහුම්කම් දුන්නාම එක දෙයක් මතක් කරන්න හිතුනා. ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයට පිවිසෙන පුද්ගලයින් ගැන බැලුවාහම ජන විඥානය හඳුනන, යම්කිසි දර්ශනයක් තිබෙන, වැඩ පිළිවෙළක් තිබෙන දේශපාලඥයන් අද ඉන්නේ අතලොස්සයි. අද අපි පාර්ලිමේන්තුව ගත්තොත්, සමහරවිට කනගාටුදායක තත්වයන් තිබෙනවා. ඉතාම සැලෝලයිට් බේබිලාගෙන් තමයි අද සභාව පිරිලා තිබෙන්නේ. නමුත් යම්කිසි දර්ශනයක් ඇතිව රටට වැඩ කරන්න පුළුවන් දේශපාලඥයින්ගේ හිඟයක් තිබෙනවා. ඒ අතරින් උදය ගම්මන්පිල අමාත්‍යතුමා යම් කිසි දැනුමක් ඇතිව, යම් කිසි වැඩ පිළිවෙළක් ඇතිව මේ දේශපාලනයට අවතීර්ණ වෙලා තියෙනවා. ඒක ගැන අපි සන්තෝෂයට පත් වෙනවා. අද දේශපාලනයේ ඉතාම හිඩසක් තියෙන අවස්ථාවක්. අපිට හර බර කතා අහන්නට, වටිනා අදහස් උදහස් හුවමාරු කරගන්නට වැදගත් සාකච්ඡාවලට සම්බන්ධ වෙන්න බැහැ. කුඩු ගහන උදවිය, එහෙම නැත්තම් රේඩියෝ චැනල් එකකින් මොනවාහරි බෙදලා මිනිස්සු රවට්ටලා පාර්ලිමේන්තුවට රිංගලා අද මේ දේශපාලනය එකම ගාලගෝට්ටියක් බවට පත්වෙලා තියෙන යුගයක්. ඉතින්, මෙම යුගයේ දී මෙම හරි පැත්ත තෝරා බේරා ගෙන මේ කඩඉම් පැනගෙන ඉස්සරහට ගිහිල්ලා අද ජාතිය වෙනුවෙන් යම්කිසි මෙහෙවරක් කරන්න ඉතාම උත්සාහයක් ගන්න ඇමැතිතුමෙක් හැටියට එතුමාට මා ආශිර්වාද කරනවා, ඒ එක්කම සුභ ප්‍රාර්ථනා කරනවා.

ඒ එක්කම කෘෂිකර්මය, ගොවිජන සංවර්ධනය, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු සම්බන්ධයෙන් අපි කතා කරද්දී අපි දන්නවා, රජ කාලයේ සිට දිවෙන කෘෂිකර්මය නිසා අපි සහලෙන් ස්වංපෝෂිත වුණු බව. ඒ එක්කම අපට පුළුවන්කම ලැබුණා, මේ රටේ ගොවියා උසස් තැනක තියලා මඩ සෝදා ගත් කල ගොවියා රජ කමටත් සුදුසුයි කියන කථාව කියන්න අපට පුළුවන්කම

තිබුණා. එවැනි දැක්මක් අපට ඇති වුණා. අද වනකොට මේ රට සහලින් ස්වයංපෝෂිත කර ගන්න අපිට හැකියාවක් තිබුණත්, අදත් පිටරටින් හාල් ගෙන්වන තත්ත්වයක් තිබෙනවා. 2013 වර්ෂයෙත්, 2012 වර්ෂයෙත් පිටරටින් හාල් ගෙනාවා. මා ඔබතුමා මගින් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. මේක ඇත්ත වශයෙන්ම මධ්‍යම ආණ්ඩුවෙන් සිදු කරන දෙයක්. නමුත් පළාත් සභාවක් හැටියට අපේ නිෂ්පාදනය කරන, අපේ ගොවියාට නිසි සැලකිල්ලක්, අවධානයක් අපි යොමු කරලා, ඔවුන් නිෂ්පාදනය කරන සහල්වලටත් තැනක් අරන් දීලා අපේ නිෂ්පාදන අපේ රටේ භාවිත කරන තැනට මේ රට අරගෙන යන්නට අවශ්‍යයි. ආර්ථික වශයෙන් පිරිහීමට ලක් වුණු රටක් හැටියට අපේ සල්ලි තවදුරටත් පිටරටවලට ඇදිලා යන්න නොදී අපි වටිනා කියන මේ සම්පත ආරක්ෂා කරගෙන, මේ ගොවිකම ආරක්ෂා කරගෙන මේ තත්ත්වය ආරක්ෂා ගන්න කැප වීමෙන් වැඩ කටයුතු කරන්න අවශ්‍යය වෙනවා.

ඒ එක්කම අපි දන්නවා. අපි ජාතික ආදායම ගැන බැලුවාහම රටේ වියදම් පියවගන්න මේ ආදායම මදියි. ආර්ථිකයේදී හිඟයක් හැමදාම සිටිනවා. එතකොට මේ හිඟය ඇති වෙන්න හේතුව තමයි, අපි සැලැස්මක් නැතුව විදේශවලින් යම් යම් දේවල් ආනයනය කිරීම. අද උදාහරණයක් හැටියට ගත්තාම ලොකු ළූණු මිල ඉහළ යන කොට, ටොන් ගණනින් ලොකු ළූණු ආනයනය කරන්න සිද්ධ වුණා. ඒ නිසා මේ සඳහා අපේ ජාතික වැඩ පිළිවෙළක් තියෙන්න අවශ්‍යයි. යම් කාල වකවානුවක වගා කරන්න බැරි බෝග සංරක්ෂණය කරලා, ඒවා හිඟ වෙන කාලයට පාවිච්චි කරන්න වැඩ පිළිවෙළක් තියෙන්න අවශ්‍යයි. උදාහරණයක් ගත්තාහම අද දෙහි ගෙඩිය, ළූණු, කඩල, පරිප්පු, මුං ඇට හැමදෙයක්ම ආනයනය කරන්න පුරුදු වෙලා ඉවරයි. මේ දේශීය සංස්කෘතිය ගැන කථා කරපු, ටෙලිෆෝන් එල්ලාගෙන හැමතැනම යන ඇමතිවරු හිටපු රටක අද අපට ඇහෙන්නේ නැහැ, ඒගොල්ලෝ මේ ජාතික ආර්ථිකය නඟා හිටවන්න ඒ කටවල්වලින් මොනවද කියන්නේ කියලා. ඒ දවස්වල කට පුරා කෑ ගහගෙන, වේදිකා උඩ නැඟගෙන රටේ සංවර්ධනය ගැන, එහෙම නැත්තම් මේ පුංචි මිනිස්සුන්ව තැනකට ගේන්න කතා කරපු උදවිය දැන් කටවල් වහගෙන තමන්ගේ මල්ලට ගාන වැටෙන හින්දා සද්ද නොකර ඉන්නවා. ඉතින් මෙවැනි දේවල් ගැන කතා කරන්න ශක්තියක් කොන්දක් ඇති දේශපාලඥයෝ ඉදිරියටත් බිහි වෙන්න ඕනැය කියන ප්‍රාර්ථනාව මේ අවස්ථාවේ දී මම කරනවා.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ කෘෂිකර්මයේ දී අපි දන්නවා - පුංචි රටක් හැටියට අපට තියෙන භූමි ප්‍රමාණය ඉතාම සීමිතයි. ඕස්ට්‍රේලියාව හා සංසන්ධනය කළොත් එම රටේ තව අඩිය තියපු නැති බිම් පළාත් තියෙනවා. නමුත් ලංකාවේ එන්න එන්න භූමි හිඟ වෙනවා. කෙසේ වෙතත් මේ භූමිවල වැඩකට නැති ගස් කොළන් වැවිලා ඉබේ තියෙන්න ඇරලා තියෙනවා. රජයට අයිති ඉඩම් තියෙනවා. මිනිසාට ප්‍රයෝජනයක් ගන්න පුළුවන් ගහක් ඇර අනෙක් සියළුම ගස් ඉවත් කරලා යම් කිසි වැඩ පිළිවෙළකට අපි අවතීර්ණය වෙන්න ඕනෑ. මේ රටේ සංවර්ධනය උදෙසා ඒ සෑම භූමියකින්ම ප්‍රයෝජනයක් ගන්න අවශ්‍යයි.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට දිගින් දිගටම කතා කරන්න බැහැ. විනාඩි දහයයි තියෙන්නේ. මම කර්මාන්ත සහ පරිසර, සුළු වාරිමාර්ග ගැන කථා කළොත් - අපි දන්නවා, අද කුඹුරු යායවල් මැටි වළවල් බවට පත් කරලා, කපලා, විනාශ කරලා, පරිසරයට හානි සිද්ධ කරලා මේ භූමියෙන් නැවත වැඩක් ගන්න බැරි තත්වයකට පත් කරලා තිබෙන බව. මේ ගැනත් මම ඔබතුමා හරහා අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. විශේෂයෙන්ම, ගංගා ආශ්‍රිත ප්‍රදේශවල මැටි කපා ඉවත් කරපු අක්කර ගණනාවක් තියෙනවා. ජලය පිරිලා, මදුරුවෝ බෝ වෙනවා. භූ ගත ජලයට අපද්‍රව්‍ය එක්වෙනවා. මේවා නිරීක්ෂණය කරලා, මේ සම්බන්ධයෙන් නීතිමය පියවර අරගෙන, විශේෂයෙන්ම මධ්‍යම ආණ්ඩුව සම්බන්ධ වෙලා භූ විද්‍යා හා පතල් කැණීම් අංශයෙන් කෙරෙන යම් යම් බලපත්‍ර දීම මත මේ හැරීම් කරනවා. ඒවා ගැන පසු විපරමක් සිදු වන්නේ, නැහැ. ඔවුන් තැන්පත් මුදලක් ගන්නවා. නමුත් මේ පරිසරය නිසි පරිදි සකස් කරන්න, කිසිම උනන්දුවක් ගන්නේ නැහැ. කීයක් හරි දුන්නාම ඕනෑම ඉංජිනේරුවෙකුගෙන් වැඩක් කර ගන්න පුළුවන්. බලපත්‍රයක් හදා ගන්න පුළුවන්. මේ සම්බන්ධයෙනුත් මා අමාත්‍යතුමාගේ අවධානයට යොමු කර සිටිනවා. මොකද, ඉතාම සීමිත භූමියක් අපට තියෙන්නේ. මේ භූමිය කවදා හරි වැඩක් ගන්න බැරි තැනක් බවට පත් වුණොත්, මේ භූමිය ප්‍රකෘති තත්ත්වයට පත් කර ගන්න මෙයින් වැලි මැටි හාරලා ලබා ගන්නා මුදලට වැඩිය තුන් හතර ගුණයක්

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

අපට ආයෝජනය කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ වේලාවේම මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලනවා.

ඒ එක්කම කර්මාන්තකරුවන් සමහර සුළු වාරිමාර්ග, ඇළ මාර්ග වහලා ගොඩ කරලා තමන්ගේ නිවාස, කර්මාන්ත ශාලා සමහරු ඉදිකර ගෙන තිබෙනවා. සමහරවිට ඇළ මාර්ගයක් සොයාගන්න බැහැ. ප්‍රාදේශීය සභාවේ සභාපතිගෙන් ඇහුවාම ඇළ කොහෙද තියෙන්නේ කියලා, සභාපති දන්නේ නැහැ. සභාපතිට වෙන ප්‍රශ්න. එයාට අවබෝධයක් නැහැ, තමුන්ගේ බල ප්‍රදේශයේ තියෙන සුළු වාරිමාර්ගික ඇළ මාර්ගවල ගමන් මාර්ගය ගැනවත් දන්නේ නැහැ. ඒ ගැන සටහනක් නැහැ. අඩු ගණනේ මේවා තමන්ට අයිතිද කියලා දන්නේ නැති සභාපතිවරු ඉන්නවා. ඒ නිසා මේ ඇළ මාර්ග නිශ්චිතව හඳුනාගෙන, ඒවා මැනලා, ඒවා ගැසට් කරලා, ඒවා ලේඛන ගත කරලා ඕනෑම පුද්ගලයෙකුට නිසි පරිදි පරිහරණය කරන්න, පොදුවේ සංවර්ධනය කරන්න පුළුවන් මාවතකට අවතීර්ණය කරන්න අවශ්‍යයි කියන යෝජනාව ඔබතුමා හරහා කරනවා.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ගොවියාගේ විශ්‍රාම වැටුප ලැබෙන්නේ නැති තත්ත්වයකට පත්වෙලා ගොවියා අසරණ වෙලා තියෙනවා. ඇත්ත වශයෙන්ම ගොවියා එදා රජකමට සුදුසුයි කියලා කිව්වේ, ගොවියා තමුන්ගේ දහඩිය, ශ්‍රමය කැප කරලා මුළු මහත් ජනතාවටම බත සපයපු නිසයි. ඒ ගරුත්වය එදා ගොවියාට දුන්නේ ඒ නිසයි. ඒ කියන්නේ, එයාගේ දහඩිය මහන්සියෙන් තමයි අනික් අය බඩගින්න නිවාගෙන, තමුන්ගේ ජීවිතය පවත්වාගෙන යන්න එදා වෙල සවිකර ගත්තේ. ගොවියා හින්දා. ඒ නිසයි ඒ ගරුත්වය දුන්නේ. නමුත් අද ගොවියා අසරණ වෙලා. මේ ගොවියාගේ නිෂ්පාදනයට නිසි මිලක් ලැබෙන් නැහැ. අද එළවළු වගා කෙරුවොත් සමහර විට රුපියල් දෙකකට කිලෝ එක යනවා. එක සැරයක් මට මතකයි, එළවළු නාස්තිය වළක්වන්න කුඩ ක්‍රමයක් අරගෙන ආවා. බලහත්කාරයෙන් පැටෙව්වා. නමුත් ඒවා දැන් අසාර්ථක වෙලා තියෙනවා. මේ වාගේ අඥාන ක්‍රියා පිළිවෙතක් නොවේ අවශ්‍ය වෙන්නේ. මේවා වටහගෙන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමියට තව විනාඩියක කාලයක් පමණයි ඉතුරු වෙලා තියෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙම නිෂ්පාදන නිසි මිලකට අරගෙන ඒවා නියම ප්‍රමිතියකට යුතුව ජනතාවට ඉදිරිපත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙනවා . ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේ දී උදය ගම්මන්පිල මැතිතුමා ඒ කරගෙන යන කාර්ය භාරයට ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කළත් මම කියන්න ඕනෑ, විපක්ෂය හැටියට අපි සෑහීමකට පත්වෙන්නේ නැහැ. අද මේ රජය කෘෂි කර්මයට දීලා තියෙන තැන ඒ අවධානය ගැන අපි සෑහීමකට පත් වෙන්නේ නැහැ. ඒ නිසා මේ අයවැය ශීර්ෂ සම්බන්ධයෙන් අපිට විරුද්ධත්වය ප්‍රකාශ කරන්න සිද්ධ වෙනවා. එතුමාගේ කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටත් මේ රටේ අපි අපේක්ෂා කරන නියම සංවර්ධනයකට යන්න වැඩ කරගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා . ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහෝම ස්තුතියි. ගරු පූජ්‍ය තෙඹුවන පියනන්ද ස්වාමිපාදයානන් වහන්සේ, ඔබ වහන්සේට විනාඩි දහයක කාලයක් වෙන් වෙලා තියෙනවා.

[පූ.භා. 11.47]

**පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සන්තෝෂ වෙනවා, විශේෂයෙන්ම එකම දේශපාලන පක්ෂය නියෝජනය කරන අපේ ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව. ඒ පිළිබඳව මම ඔබතුමාට ස්තුතිය පළ කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍යයෙන් රටේ තියෙන මතයක් තමයි බොරු නොකියා දේශපාලනය කරන්න බැහැ. ඒ වාගේම හොරකම් නොකර දේශපාලනය කරන්න බැහැයි කියන එක. සාමාන්‍යයෙන් එවැනි මතයක් සමාජයේ මිනිස්සු තුළ තියෙනවා. මම හිතන්නේ, උදය ප්‍රභාත් ගම්මන්පිල

ගරු ඇමතිතුමා දේශපාලනය වාගේම මේ පළාත් සභාවේ අමාත්‍ය ධූරයක් දරමින් එතුමා තහවුරු කරලා තියෙනවා, බොරු නොකියා දේශපාලනය කරන්න, බොරු නොකියා ඇමතිකම කරන්න පුළුවන්කම තියෙනවා කියන කාරණය සහේතුකව ඔප්පු කරලා තියෙනවා. හොරකම් නොකර දේශපාලනය කරන්න පුළුවන්. හොරකම් නොකර ඇමතිකම් දරන්න පුළුවන් කියන කාරණය එතුමා සහේතුකව ඔප්පු කරලා තියෙනවා. දේශපාලනයේ දී පරිසරයට හානියක් නොවන විධියට දේශපාලනය කරලා දේශපාලන ලැයිස්තුවේ, මනාප ලැයිස්තුවේ අංක එකට එන්න පුළුවන් කියන කාරණය එතුමා සහේතුකව ඔප්පු කරලා තියෙනවා. ඒ නිසා එතුමා අමාත්‍ය ධූරය භාර ගන්න වෙලාවේම ඉතාම හොඳ ආදර්ශයක් දුන්නා. මොකද, තමන් හොඳ බෞද්ධයෙක් හැටියට, පන්සිල් සුරකින බෞද්ධයෙක් හැටියට ජනාධිපතිතුමා ඉදිරියේ කිව්වා, මෙම අමාත්‍යාංශය මම භාර ගන්නම් ජනාධිපතිතුමනි. නමුත් මේ සත්ත්ව නිෂ්පාදන කොටස මගෙන් ඉවත් කරන්න කියලා. ජනාධිපතිතුමා ඒක ඉෂ්ට කරලා දුන්නා. ඒ නිසා ආරම්භයේ ඉඳලම ඉතාමත්ම හොඳ ආදර්ශමත් අමාත්‍යවරයෙක් හැටියට තමන්ගේ දේශපාලන කටයුතුත්, මේ සියලුම කටයුතුත් සිද්ධ කිරීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. එකම දේශපාලන පක්ෂයක මට නියෝජනය වෙන්න අවස්ථාව ලැබීම පිළිබඳව, ඒ විධියේ ආදර්ශවත්, විනිවිද භාවයෙන් යුතුව කටයුතු කරන අමාත්‍යවරයෙක් සමඟ කටයුතු කරන්න ලැබීම පිළිබඳව පළමු කොට මම මගේ සන්තෝෂය ප්‍රකාශ කරනවා.

අපි මූලික සාකච්ඡාවල් වලදි සාකච්ඡා කර ගත්තා එක එක මන්ත්‍රීවරු මේ අමාත්‍යාංශය යටතේ තියෙන විෂය පථයන්ගෙන් එක් එක් අංශ පිළිබඳව සාකච්ඡා කරන්න. මම ඒ වෙලාවේ භාර ගත්තේ, කෘෂිකර්ම අංශය ගැන කථා කරන්න. ඒ නිසා මම ඉන් එහාට යන්න බලාපොරොත්තු වෙන්නේ නහැ. කෘෂිකර්මය ගැන අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා. එතුමිය පිළිබඳව මම ඇත්තටම සන්තෝෂ වුණා. උපදේශක කාරක සභාවේ පැමිණීම් ලැයිස්තුව බැලුවාම, පැමිණීම බිංදුව තියෙන එකම මන්ත්‍රීවරිය, එතුමිය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇත්තටම මට ඒ වේලාවට එන්න අපහසුයි.

**පූජ්‍ය ගරු තෙබුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

ඒ වුණත් ඔබතුමිය ඉතාමත් හොඳ අගය කිරීමකින් යුක්තව මේ පිළිබඳව කථා කිරීම ගැන මම ඇත්තටම සන්තෝෂය ප්‍රකාශ කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්තමානයේ ලෝකයේ පවතින දේශගුණික විපර්යාසයන් වාගේම විවිධ හේතූන් මත දැන් අපට පේනවා, ලෝකය ඉදිරියේදී ආහාර නිෂ්පාදනය පිළිබඳව, නැත්නම් මිනිස්සුන්ට බඩගින්නේ ඉන්න සිද්ධ වෙන තත්ත්වය උදාවිය හැකි බව. එම තත්ත්වය ඉදිරියේදී කුමන ආකාරයට උත්සන්න වෙනවද කියන එක පිළිබඳව, අනාගතයේදී ඇති වෙන්න පුළුවන් අවධානම පිළිබඳව ලෝකයේ විවිධ ප්‍රකාශනයන් දැනට ඉදිරිපත් වෙලා තියෙනවා.

අපේ රට, ආවේණික කෘෂි කාර්මික රටක්. ඒ නිසා කෘෂිකර්මයෙන් රට සංවර්ධනය කිරීමේ දී නව සැලසුම් ඇතුව, අනාගත දැක්මක්, දර්ශනයක් ඇතුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. මම හිතන්නේ ඒ වගකීම, වගකීමක් හැටියට බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කරන්න සුදුසුකම් තියෙන, ඒ අනාගත දැක්ම තියෙන අමාත්‍යවරයෙකුට මේ වගකීම පැවරුණා. ඒ නිසාම එතුමාට පුළුවන්කම ලැබුණා, ඉදිරියේ ඇතිවෙන ඒ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙන්න පුළුවන් විධියට කටයුතු කරන්න. එතැන්දී අත්‍යවශ්‍ය දෙයක් තමයි මම හිතන්නේ, නිකම් නිස්කාරනේ ගොවිතැනට වෙන්වෙලා තියෙන ඉඩම්, අපි කියන්නේ පුරන් කුඹුරු කියලා. මේ පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩ පිළිවෙළ අත්‍යවශ්‍ය සාධකයක්. නිෂ්පාදනය වැඩි කරන්න නම්, අපතේ යන කුඹුරු ඉඩම් වගා කරන්න ඕනෑ. බස්නාහිර පළාත තුළ පුරන් කුඹුරු අස්වැද්දීමේ සුවිශේෂි වැඩ සටහනක් අපේ අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කරන්නට යෙදුනා. ඒ අනුව පසුගිය වසර තුනේ හෙක්ටෙයාර් 1395 ක් පුරන් කුඹුරු අස්වද්දන්න මේ අමාත්‍යාංශය ශක්තිමත් වෙලා තියෙනවා. එලෙස ශක්තිමත් වුණා විතරක් නොවෙයි, ඒ පිළිබඳව හරියාකාරව පසුවිපරම් කරලා තියෙනවා. ඒ පසු විපරම් අනුව පුරන් කුඹුරු අස්වද්දපු ඒවායින් නැවත පුරන් වීමේ ප්‍රතිශතය තියෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි 15% ක් පමණයි. ඒ නිසා මම හිතන්නේ, ඉදිරි සැලැස්ම තියෙන්නේ, ඒකත් අවම කර ගැනීම සඳහා අවශ්‍ය හොඳ පසු විපරමකින් යුක්තව ඒ කටයුතු කරන්න බලාපොරොත්තු වන බවයි. 2014 වසරේදී මේ සඳහා රුපියල් බිලියන 35ක් වියදම් කරන්න සැලසුම් කරලා තියෙන බව මේ වෙලාවේ දී

[ පූජ්‍ය ගරු තෙබුවන පියනන්ද ස්ථවිර ]

මතක් කරන්න ඕනෑ. ඒ නිසා මේක ඉතාම හොඳ ඉලක්කයක්. මොකද බස්නාහිර පළාතේ, විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කය, ඒ වාගේම කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවල අපි දැක්කා, පහු ගිය කාලයේ විශාල වශයෙන් පුරන් වුණු කුඹුරු. ඒ නිසා පසුගිය අවුරුදු තුන ඇතුළේ අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි එයින් විශාල ප්‍රයෝජන ගන්න අපට පුළුවන්කම ලැබුණා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ කෘෂිකර්මය පිළිබඳව අනාගත දැක්මක් ඇතිව කටයුතු කරනකොට, කෘෂිකර්මයට තියෙන ඊළඟ දැවැන්ත අභියෝගයක් තමයි අපේ තරුණ පරම්පරාව කෘෂිකර්මයෙන් ඈත් වීම. ඔබතුමා හොඳටම දන්නවා. ඔබතුමා කතා කළා, මේ කෘෂිකර්මය සම්බන්ධයෙන් පාසල් විෂයට අදාළව - කෘෂිකර්මයෙන් රටක් දියුණු කරනකොට තරුණ පරම්පරාව කෘෂිකර්මයෙන් ඈත් වීම ඉතාමත්ම ලොකු අභියෝගයක්. මම හිතන්නේ, මේ අභියෝගය සාර්ථකව ජයග්‍රහණය කිරීම සඳහා තරුණ පරපුර කෘෂිකර්මයට නැඹුරු කරන්න, ඉතාමත්ම ක්‍රමවත් සහ විධිමත් වැඩ පිළිවෙළක් අපේ ගරු අමාත්‍යතුමාගේ අදහස් අනුව ක්‍රියාත්මක වෙලා තියෙනවා. පාසල් කෘෂි සමාජ 632ක් මේ ගත වුණු වකවානුව තුළ බස්නාහිර පළාතේ මේ දිස්ත්‍රික්ක තුනේ ආරම්භ කරන්නට යෙදුණා. ඒ සඳහා මම හිතන්නේ, එක පාසලකට රුපියල් 50,000/= ක කෘෂි උපකරණ හා බීජ ඒ යටතේ ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. අපි මේ වැඩ පිළිවෙළේදී පාසල් දරුවන්ට මේ උපකරණ බෙදා දෙන්න අපේ කොට්ඨාශවල පාසල්වලට අපි ගියා. කෘෂිකර්මය උගන්වන ගුරුවරු මම හිතන්නේ පුදුම සන්තෝෂයකට පත් වුණා. කිසිම කාලයක නොලැබුණු සහනයක් දරුවන්ට මේ කෘෂිකර්මය පිළිබඳ ලැදියාවක් ඇති කරන්න අවශ්‍ය කරන විධියට අපේ අමාත්‍යාංශය හරහා මේ සහාය ලබා දීම පිළිබඳව පාසල් මට්ටමින් ලොකු ඇගයීමක් තියෙනවා කියලා අපි දන්නවා. අපේ ගම්බද ප්‍රදේශවල දරුවොත් එක්ක කතා කළාම මම හිතන්නේ, බස්නාහිර පළාතේ ග්‍රාමීය ප්‍රදේශ වැඩියෙන්ම තියෙන්නේ අපේ කළුතර දිස්ත්‍රික්කයේ. ඒ නිසා ඒ දරුවන්ට ආවේණික දෙයක් කෘෂිකර්මය කියන එක. කුඹුරු ගොවිතැන් වෙන්න පුළුවන්. ගොඩ බෝග වෙන්න පුළුවන්. මේ වගා ක්‍රමයන් පිළිබඳ පාසලේ දී මේ ලබා දෙන දැනුම ඒ දරුවට අනාගතයේ තමාගේ ජීවිතය සුරක්ෂිත කර ගන්න ඉතාම හොඳ රැකවරණයක් බවට පත් වෙනවා විතරක් නොවේ, කෘෂිකර්මය අපේ ජීවිතයේ අංගයක් කියන එක තේරුම් අරගෙන කෘෂිකර්මයට ලැදි අනාගත පරපුරක් බිහි කරන්න මේ වැඩ පිළිවෙළ ඉතාමත්ම ශක්තිමත් වෙලා තියෙනවා කියන කාරණයත් මතක් කරන්න ඕනෑ. ඒ වගේම තමයි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තව එක් විනාඩියක් විතරයි, ස්වාමීන්වහන්සේට ඉතිරි වෙලා තියෙන්නේ.

**පූජ්‍ය ගරු තෙබුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

විශේෂයෙන්ම බස්නාහිර පළාත් තුළ කෘෂිකර්මය පිළිබඳව ශ්‍රම හිඟය ලොකු ගැටළුවක් වෙලා තියෙනවා. ඒ නිසා මේ ශ්‍රම හිඟය අවම මට්ටමට පත් කර ගැනීම සඳහා ඉතාමත්ම හොඳ වැඩ පිළිවෙළක් ඇතිව වැඩ සටහන් ක්‍රියාත්මක කළා. රුපියල් මිලියන 26 ක් වියදම් කරලා, ගොවි සංවිධාන 88 කට පහු ගිය වකවානුවේ අත් ට්‍රැක්ටර් ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. මම හිතන්නේ, මේ ශ්‍රම හිඟයට ඉතාම හොඳ වැඩ පිළිවෙළක් හැටියට, ප්‍රායෝගික වැඩ පිළිවෙළක් හැටියට ඒ කටයුත්ත එතුමාට ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබුණා. ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට කතා කරන්න හුඟක් දේ තියෙනවා. නමුත් කාලය ඉතාම ගැටළුවක්.

මම කෘෂිකර්මය පිළිබඳව කථා කරන්න ගත්තත් පරිසරය පැත්තෙන් එක වචනයක් මම කථා කරන්න ඕනෑ. මොකද, උපදේශක කාරක සභාවේදි එතුමා පරිසරය ආරක්ෂා කර ගැනීමට ඉතාම ප්‍රායෝගික වැඩ පිළිවෙළක් හැටියට අර පොලිතින් භාවිතය අවම කිරීම සඳහා අවමංගල්‍යාධාර සමිතිවලට සුදු කොඩි ලබා දෙන්න කටයුතු කළා. මේ පළාත් සභාවේ ඉන්න එකම හාමුදුරුවෝ හැටියට උපදේශක කාරක සභාවේදී මම යෝජනාවක් කළා. මේක ගිහි අයට විතරක් නොවෙයි. හාමුදුරුවන්ගේ ආදාහන අවස්ථාවලදිත් ඔසවන්න මේ විධියේ කහ පාට කොඩි ලබා දෙන්න කියලා. මම හිතන්නේ ඉතාමත්ම සාර්ථකව පළාතේ ශාසනාරක්ෂක බලමණ්ඩලවලට ඒ පහසුකම ලබා දෙන්න ඇමතිතුමා ක්‍රියාත්මක වුණා. ඒ පිළිබඳව පෞද්ගලිකව

මගේ ප්‍රශංසාව පිරිනමන අතර, බුදු වදනකින් මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. අපි හැමකෙනෙක්ම දේශපාලනය කළත් මොනවා කළත් ජීවිතේ අපිට සැනසීමක් ඇති වෙන්න පුළුවන්කම තියෙන්නේ, නිවැරැදිකම උඩයි. බුදුහාමුදුරුවෝ දේශනා කළා,

තංච කම්මං කතං සාධු - යං කත්වා නානු තප්පති
යස්ස පතීතෝ සුමනෝ - විපාකං පටි සේවති

යම් කිසි කෙනෙක් වැඩක් කළාම, වැඩේ කරලා ඉවර වුණාම, කරපු වැඩේ පිළිබඳව හිතලා පසුතැවිලි වෙන්න සිද්ධ වෙන්න නැත්නම්, එහෙම නැත්නම් සතුටු සිතින් ඒ ප්‍රතිඵලය භුක්ති විඳින්න පුළුවන් නම් එබඳු වැඩ කිරීම හොඳයි කියන එක තමයි ඒ අවවාදයේ තේරුම.

මම හිතන්නේ, උදය ගම්මන්පිල ඇමතිතුමාගේ සමස්ත ජීවිතය තුළම මේ ඇමතිකම විතරක් නොවෙයි, සමස්ත ජීවිතය තුළ ඒ බුදු වදනට අනුව එතුමා කරලා ඉවරවෙලා සතුටු වෙන්න පුළුවන්, නිවැරිදි අහිංසක සතුටක් ලබන්න පුළුවන් ජීවිතයක් ගත කිරීම පිළිබඳව අපි එතුමාට සුභාශීර්වාද ප්‍රාර්ථනා කරන ගමන්ම මේ වර්ෂය අවසන් වන වෙලාවේ පස්වන පළාත් සභාවේ අවසන් අයවැය කතාවට සහභාගී වන මේ අවස්ථාවේ දී සියලුම දෙනාට අපේ සන්තෝෂය ප්‍රකාශ කරනවා. ඒ වාගේම විශේෂයෙන් අමාත්‍යතුමාගේ සියළුම අමාත්‍යාංශවල දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩලයේ, නිලධාරී මණ්ඩලයේ, ඒ කැපවීමේ ශක්තිය එකට මිටියක් හැටියට එකතු වෙලා, සහයෝගයෙන් ක්‍රියා කිරීම නිසා තමයි ඇමතිතුමාට මේ විශිෂ්ට ප්‍රතිඵල උදා කරලා දෙන්න පුළුවන්කම ලැබුණේ. ඒ නිසා ඒ සියලුම නිලධාරි මණ්ඩලවලටත්, සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත් අපි තුණුරුවන්ගේ සරණනින් යහපතක් වේවා කියලා ආශිර්වාද ප්‍රාර්ථනා කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එම්. අර්ෂාද් නිසාම්ඩීන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් නියමිතව තියෙනවා.

[පූ.භා. 11.58]

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

බොහෝමත්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. උදය ගම්මන්පිල ගරු ඇමතිතුමාගේ වැය ශීර්ෂ යටතේ කථා කිරීමට ලැබීම පිළිබඳව මම ඉතා ගෞරව පූර්වකව ස්තුතිය පිරිනමනවා. ඒ වාගේම ඔබතුමා පවා ඔබතුමාගේ කතාවේදී කිව්වා, එතුමාගේ විශේෂ ලක්ෂණය ගැන. මම සීයට සීයක් එකඟ වෙනවා. උදය ගම්මන්පිල ඇමතිවරයා වගේ ඇමතිවරයෙක් මේ බස්නාහිර පළාතට ලැබීම ඉතාමත්ම හොඳයි. ඒ කියන්නේ උදය ගම්මන්පිල ඇමතිතුමාගේ බුද්ධිය මොනතරම්ද කියලා මම එක් අවස්ථාවකදී දැනගත්තා. එක වකවානුවේ දී බූකර් කියන Reseption hall එකේ දී Media Conference එකක් තිබ්බා. ඒ Media Conference එක පැවත් වූයේ, ඉංග්‍රීසි මාධ්‍යයෙන්. එතකොට රජය නියෝජනය කරමින් උදය ගම්මන්පිල ඇමතිතුමා පමණයි හිටියේ. විපක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රිවරු, පක්ෂ නායකවරු හතර පස් දෙනෙක් විතර හිටියා. එතකොට මේ උදය ගම්මන්පිල ඇමතිතුමාගේ බුද්ධිය මම එදා තමයි දැනගත්තේ. මම පිටිපස්සේ Row එකේ ඉඳන් මෙතුමාගේ කථාව අහගෙන සිටියා. ඒගොල්ලන් අහන ප්‍රශ්නවලට මෙතුමා ඒවාට පිළිතුරු දීපු හැටි. කථාව කරපු හැටි ඉතා විශිෂ්ටයි. රජයට ගරුත්වයක් ලබා දීම වෙනුවෙන් එතුමා කතාව පැවත්තුවා. එතකොට තමයි මම දැනගත්තේ, එතුමාට තිබෙන්නේ එසේ මෙසේ නොවන බුද්ධියක් කියලා. ඉතාම සුවිශේෂී නුවණක්කාර බුද්ධියක් කියලා මම එදා දැනගත්තා. ඒ වාගේම පක්ෂ විපක්ෂ සෑම කෙනෙක්ම කථා කළේ, එතුමාගේ ගුණ. ඒ කියන්නේ, එතුමාට විරුද්ධව කථා කිරීමට දෙයක් නැහැ. ඒ නිසා තමයි විපක්ෂයේ අපේ හර්ෂණ ගරු මන්ත්‍රීතුමාත්, අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත් එතුමාට කොහෙත්ම දෝෂාරෝපණය කළේ නැහැ. හොඳ කතාවක් තමයි කළේ. ඒ කියන්නේ, එතුමාගේ ගුණ කතා කළා.

ඒ වාගේම කෘෂිකර්මය නඟා සිටුවීම. කෘෂිකර්මය කියන්නේ, ඒ රටේ දියණුවයි. අද චීනය, ඉන්දියාව, පකිස්ථානය වැනි රටවල් පටන් ගත්තේ කෘෂිකර්මයෙන්. කෘෂිකර්මය දියුණු කරමින් තමයි රට දියුණු කළේ. ඒ වාගේ තමයි අපේ රටේ කෘෂිකර්මය දියුණු කළා කියන්නේ, වෙන කිසිම දෙයකට යට නොවී හොඳ දියුණු වුණු රටක් බවට පත්

[ ගරු අර්ෂාද් නිසාම්දීන් ]

වෙන්න පුළුවන්. කෘෂිකර්මයෙන්. ඒ වාගේම කෘෂිකර්මය තමයි එතුමාට ලැබිලා තියෙන්නේ. එතුමා කෘෂිකර්මයට සැහෙන්න සේවාවක් කරලා තියෙනවා. ඒ කියන්නේ, එතුමාගේ කාලයේ වටිනා කෘෂි සැකසුම් මධ්‍යස්ථානයක් පිහිටවලා තියෙනවා. ඒ වාගේම එතුමා සුළු වාරිමාර්ග ව්‍යාපෘති ඇති කරලා තියෙනවා. සුළු ව්‍යාපෘති ඒවා. ඒ වාගේම පුරන් කුඹුරු අස්වැද්දීම. ඒ වාගේම කෘෂි උපකරණ ගොවි ජනතාවට ලබා දීලා තියෙනවා. ඒ වාගේම ගෙවතු වගාව සඳහා ඒ ඒ ගෙවත්ත තෝරා ගෙන, ඒ ඒ ප්‍රාදේශීය ලේකම් හරහා ගෙවතු හිමියන්ට ඒ පැළ ලබා දීලා ගෙවතු වගාව නඟා සිටුවවීමට එතුමා මැදිහත් වෙලා තියෙනවා. ඒ වාගේම කෘෂි බෝග සායන වැඩ සටහන් ක්‍රියාත්මක කළා. ඒ කෘෂි බෝග සායනවලින් ප්‍රයෝජනයන් ජනතාවට තමයි ලැබිලා තියෙන්නේ. ඒ වාගේම ඔබතුමා කිව්වා වගේ සායනවල්. ඒ වගේම පළාත තුළ බිත්තර වී නිෂ්පාදනය සඳහා ප්‍රජාව පොළඹවලා ඒකට යොමු කරලා තියෙනවා. මෙවන් ආකාරයේ වැඩ පිළිවෙළවල් එතුමා බස්නාහිර පළාතට කරලා තිබෙනවා.

ඒ වාගේම පරිසරය සුරැකීම සඳහා කටයුතු කරලා තිබෙනවා. එතුමා කොළඹ උපන් කෙනෙක්. නමුත් කෘෂි කර්මය, පරිසරය වැනි දේවල්වලට පෙළඹිලා තිබෙනවා. පරිසරය සුරැකීම සඳහා යම් යම් ක්‍රියා මාර්ග ගන්නවා. මිහිකත හෝරාව පැවැත් වූවා. ඒ හෝරාව දැක බලා ගන්න අපිත් නුවරට ගියා. ඒ අවස්ථාවේදී මම එතුමාගේ කථාවෙන් සැහෙන්න යමක් ඉගෙන ගත්තා. ඒ කියන්නේ, අපේ රටේ අනාගතය විදුලිය සුරක්ෂිතව තබා ගැනීමට අපි අද සිටම ක්‍රියාත්මක විය යුතුයි කියන පණිවුඩය මුළු රටේ ජනතාවටම යවලා තිබුණා. ඒකට තමයි මිහිකත හෝරාව වැනි වැඩ සටහන් තෝරාගෙන වර්ෂයක් පාසා ඒ වැඩ කටයුතු කරන්නේ. ඒ වාගේම ඒ වෙනුවෙන්ම ක්‍රියාත්මක වුණා. ඒ මිහිකත හෝරාව රටේ විදුලිය සුරක්ෂිතව තබා ගැනීම කට වචනයෙන් මම සිදු කළේ නැහැ. ඒකට ක්‍රියාත්මක වුණා. ඒකට ක්‍රියාත්මක වුණේ කොහොමද? විදුලි බුබුළු. ජනතාව ඒ සඳහා යොමු කිරීමට CFL වැනි විදුලි බුබුළු, Fifteen Watts. Five Watts වැනි විදුලි බුබුළු ජනතාවට ලබා දුන්නා. ජනතාවට ඒ විදුලි බුබුළු ලබා දුන්නා.

ඒ වාගේම එතුමාගේ තවත් දේවල් තිබෙනවා. ඒ කියන්නේ, පරිසරය සුරැකීම සඳහා පැළ රෝපණය කිරීම. පැළ ලබා දීලා මුළු බස්නාහිර පළාතම ආවරණය වන පරිදි පැළ සිටුවීම සඳහා ජනතාව යොමු කළා. එවැනි දේවල් කරපු අපේ ඇමැතිවරයෙක් තමයි උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා. ඒ වාගේම ගරු ඇමැතිතුමාට හොඳ නිලධාරි මඬුල්ලක් ලැබිලා තිබෙනවා. මිත්‍රශීලී, සවන් දෙන නිලධාරි මඬුල්ලක් තමයි එතුමා සමඟ සිටින්නේ. අපේ ස්වාමීන් වහන්සේ කියපු පරිදි ඒක තමයි එතුමාට ශක්තියක් වුණේ. නිලධාරි මඬුල්ල. ඒ වාගේම වාරි මාර්ග සඳහා එතුමා වැඩ පිළිවෙළක් යෙදුවා. දැනට කඩා බිඳී තිබුණු වාරි මාර්ග සොයලා, ඒ වාරි මාර්ග සැදීම සඳහා එතුමා මැදිහත් වුණා. ඒ වාගේම එතුමා කර්මාන්ත මඟින් තවත් දේවල් කළා. කර්මාන්ත යොදවලා ඔබතුමා කියපු පරිදි, පේෂ කර්මාන්තවලින්, කුඩා කර්මාන්තවලින් නිෂ්පාදනය කරන ඒවා සඳහා අලෙවි කිරීමටත් ජනතාව යොමු කළා. ඒ අලෙවි කිරීම් කටයුතුවලට, පාරිභෝගිකයන්ට ඒවා ලබා ගැනීම සඳහා ජංගම සේවාවල් පැවැත්තුවා. ඒ ජංගම සේවාවන්වලින් ඒ නිෂ්පාදනයන් ජනතාවට ලැබීමට සලස්වා දුන්නා. ඒ වාගේම ඒ ජනතාවට තවත් බොහෝ දේවල් ලබා දුන්නා. දැතේ සවිය මඟින්. පාසල්වලට තිබුණු ලොකුම අඩුපාඩුවක් තමයි ඩෙස් පුටු. බිඳුනු පුටුවට දැතේ සවිය කියන නමින් ආරම්භ කරලා ඒ පාසල්වලට ගිහිල්ලා ඒ කැඩුණු පුටු අරගෙන අලුත්වැඩියා කරලා දුන්නා.

ඒ වාගේම ත්‍රීරෝද රථ සඳහා මීටර් ලබා දුන්නා. ත්‍රීරෝද හිමියන්ට එය කොයිතරම් අස්වැසිල්ලක් වුණාද කියන්නේ, සමහර ත්‍රීරෝද රථ රියැදුරන් ඒ මීටරය ලබා ගන්න බැරිව ඇඬුවා. ඒකට ත්‍රීරෝද රථ රියැදුරන් දුක් මහන්සි වුණා. සමහර වේලාවට පොළියට සල්ලි ලබා ගෙන ත්‍රීරෝද රථ මීටර්වලට ඔවුන් යොමු වුණා, 20% ට, 15% ට පොළියට සල්ලි ලබා ගෙන. නමුත් මෙතුමාගේ මේ සංකල්පය මත ත්‍රීරෝදකරුවන්ට විශාල ශක්තියක් ලබා දුන්නා. ඒ වාගේම ජාතික තලයේ ඇමැතිවරයෙක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. අපේ රටට සේවාවක් ලබා දීම සඳහා එතුමාට ශක්තිය, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.05]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අත්දැකීමෙන්ම දන්න දෙයක් තිබෙනවා. ඒ තමයි සමූපකාර සමිතියකින් ජනතාවට හොඳ සේවාවක් වෙන්න නම්, ඒ සමූපකාර සමිතියේ නායකත්වය ගන්නා කෙනා අනුව තමයි ඒ සමූපකාර සමිතිය හොඳද නරක ද කියලා තීන්දු වෙන්නේ කියන එක. ඒ වාගේම පාසලක් ගත්තත්, පාසලේ විදුහල්පතිතුමා අතේ තමයි පාසල හොඳ ද නරක ද කියන එක තීන්දු වෙන්නේ. ඒ වාගේම අපි අද හැම තැනම කථා කරන ප්‍රාදේශීය සභාවක් ගත්තත්, ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා අතේ තමයි ඒ ප්‍රාදේශීය සභාව හොඳ ද නරක ද කියලා තීන්දු වෙන්නේ. අද මේ රටම එහෙමයි. අද ඒකත් එක්කම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ මුළු රටටම දෙන නායකත්වය නිසා තමයි අපි ඉදිරිපත් වන ඡන්දයක් ඡන්දයක් පාසා විශාල වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ජනතාව අපව ජයග්‍රහණය කරවන්නේ. ඒ එතුමාගේ නායකත්වය නිසා.

ඒ වාගේම තමයි බස්නාහිර පළාත් සභාව. බස්නාහිර පළාත් සභාවේ මේ කෘෂිකර්ම ගොවි ජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර අමාත්‍යාංශය. අද මේ අපි හැමෝම කථා කරන විධියට පල්ලෙහා මට්ටමේ, බිම් මට්ටමේ ඉන්න ජනතාව අද ගෞරවාන්විතව මේ අමාත්‍යාංශය ගැන කථා කරන්නේ, පැහැදිලිවම උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා දෙන නායකත්වය අනුව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අද පැහැදිලිවම සතුටු වෙනවා. මොකද, මම ගොවියෙකුගේ පුතෙක් හැටියට මම සතුටු වෙනවා. මම මේ පළාත් සභාවට මුලින්ම ඇවිල්ලා, ගරු ඇමතිතුමාගේ නායකත්වය යටතේ තිබෙන මේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට තෝරා ගැනීම පිළිබඳව මම අද සතුටු වෙනවා. ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ලොකු දෙයක් දැක්කා. අද ගරු අමාත්‍යතුමා කොළඹ සිටියත්, ගමේ ඉපදුණු කෙනෙක් හැටියට පැහැදිලිවම එතුමා දැකපු දේවල් තිබුණා. අපි හුඟක් වෙලාවට, හැමදාම කථා කළා. අද ගොවිජන සේවා මධ්‍යස්ථානවල තමයි අපේ කෘෂිකර්ම උපදේශක මහත්වරු ඉන්නේ. ඒ ඉන්න කොට ගොවි ජන සේවා මධ්‍යස්ථානයකට ගියාම, අපට යමක් දැන ගන්න, ගොවියෙකුට යමක් දැන ගන්න කෙනෙක් හිටියේ නැහැ. සමහර වෙලාවට ඒවායේ ගොවිජන උපදේශකවරු නැහැ. අද අපි සතුටු වෙනවා. අද මේ වන කොට ගරු අමාත්‍යතුමා ආවාට පස්සේ, අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවි ජන සේවා මධ්‍යස්ථානවල - අද ගරු ඇමතිතුමා ආවාට පස්සේ අපේ බස්නාහිර පළාතට පුළුවන්කම ලැබිලා තිබෙනවා කෘෂිකර්ම උපදේශකවරු 103 දෙනෙක් බඳවා ගන්න. අද සෑම ගොවි ජන සේවා මධ්‍යස්ථානයකම අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙන්නෙක් හෝ තුන් දෙනෙක් ඉන්නවා. අද ඒ තුළින් විශාල සේවාවක් වෙනවා. ඒ අයත් බොහොම ක්‍රියාකාරීව වැඩ කටයුතු කරනවා. ඒකත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැකපු තවත් දේවල් තිබුණා. ඒ වාගේම අපි එතුමන්ලා ගැන හිතපු විධිය, අද ජනතාව අතරට ගිහිල්ලා, නවීන ක්‍රමයට මේ කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳව දැනුවත් කරන්න, කෘෂිකර්ම සායන තියනවාත් එක්කම එතුමන්ලාට අවශ්‍ය සියලුම දේවල්, මම හිතන්නේ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර ආදිය සියලුම දේවල් කෘෂිකර්ම උපදේශකවරුන්ට, ඒ කාර්යාලවලට ලබා දුන්නා. මෙය පුංචි දෙයක් වුණාට, අද ගම් මට්ටමේ මහා විශාල දෙයක් හැටියට පරිවර්තනය වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වාගේම තවත් මම දැකපු, මම හැමදාම කථා කරන දෙයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පුංචි කාලයේ ඉඳන් ගොවියෙක් හැටියට මම දැකපු දෙයක් තිබුණා. අපි යුතුමාන් පහ හය දාලා වී වපුරපු අය. අපේ තාත්තලා. ඒ වාගේම අපිත් වපුරපු අය. අපි දැකපු දෙයක් තිබුණා. ඇළ වේල්ලක් හදන්න රජයෙන් සල්ලි වෙන් කරන කොට, වර්ෂය අවසානයේ මුදල් ටික ආවාම ගං වතුර ගලලා තිබෙන්නේ. දෙසැම්බර් 31 වෙනිදාට කලින් මේ ව්‍යාපෘතිය අවසන් කරන්න ඕනෑ නිසා කවුරු හරි කොන්ත්‍රාත්කරුවෙකුට දෙනවා. කොන්ත්‍රාත්කරුවෙකුට දුන්නාට පස්සේ අර වතුර ගලපු ඇළ සුද්ධ කරනවා. බට දැල්ල ටික, උඩ තිබෙන තණකොළ ටික විතරයි මැකෙන්නේ. වතුර බැස්සාට පස්සේ ආයිත් ඇළ අර පරණ තත්ත්වයේමයි. ගරු ඇමතිතුමා කෘෂි අධිකාරියක් පිහිටෙව්වා. අපි එදා පුංචි කාලේ ඉඳන් දැකපු දේ කාගෙන්වත් ක්‍රියාත්මක වුණේ නැහැ. මෙතුමා නායකත්වය දෙන කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ බස්නාහිර පළාතේ කෘෂිකර්ම අධිකාරිය පිහිටෙව්වා. ඒ අධිකාරිය පිහිටවපු නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අත්දැකීමෙන් දන්නවා. ගිය වසරේ වෙන් කරපු සල්ලිවලින් වතුර

[ ගරු ලලිත් එල්ලාවල ]

බැස්සාට පස්සේ, මේ ගමන ජනවාරි පෙබරවාරි වන කොට ඉතාමත්ම ලස්සනට, ඉතාමත් හොඳට වාරිමාර්ග කර්මාන්තයක් අපට කරන්න පුළුවන් වුණා, ඒ කෘෂි අධිකාරිය නිසා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා අපි හැමෝම කථා කරන විධියට, මේ පොලිතීන් භාවිතය අවම කරන්න විශාල වැඩ පිළිවෙළක් කළා. එය පුංචි දෙයක් වුණාට, ඒ පිළිබඳව අද ගම් මට්ටමේ කථා කරනවා. ගම් මට්ටමේ කථා කරනවා විතරක් නොවෙයි, අද ගොඩක් ජනතා නියෝජිතයෝ ඒක ආදර්ශයට අරන් තිබෙනවා. අද ඒ විධියට කටයුතු කරනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාගේ දේවල් නිසා අද අපි පාසල් මට්ටමින් ගත්තාම පාසල්වලට ගිහිල්ලා ලොකු සේවාවක් කළා. මේ හැමෝම මන්ත්‍රීවරු කථා කරපු විධියට. ඒ වාගේම වාරිමාර්ග ප්‍රතිසංස්කරණය පිළිබඳව අපි කථා කළාම පැහැදිලිවම අපි දකිනවා, 2011 වර්ෂයේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශයට පුළුවන් වෙලා තිබෙනවා, කිලෝ මීටර් 48 ක් සංවර්ධනය කරන්න. වාරි කර්මාන්තය. ඒ වාගේම 2012 දී කිලෝ මීටර් 49 ක් සංවර්ධනය කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම 2013 මේක දෙගුණ තෙගුණ කරන්න පුළුවන් වෙලා තිබෙනවා. මේක දෙගුණ කරලා කිලෝ මීටර් 99 ක් සංවර්ධනය කරන්න පුළුවන් වෙලා තිබෙනවා. මේ සඳහා විශාල මුදලක් වැය කරලා තිබෙනවා. 2013 වර්ෂයේ මුදල් විශාල ප්‍රමාණයක් මේ සඳහා වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි හැමදාම කථා කරපු දේවල් තිබුණා. මට මතකයි. මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් සිටින කාලයේදී අපේ ප්‍රදේශයේ අමුණක් තිබුණා. ඒ අමුණ ජලයට ගලවලා ගියා. ඊට පස්සේ එදා ඉඳලාම මම කථා කළා, මේ අමුණ හදා ගන්න. මෙය එක්කෝටි පනස් ලක්ෂයකට වැඩි වියදමක් යන වැඩක්. අපි හැමදාම කථා කළාට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක කර ගන්න පුළුවන් වුණේ නැහැ. නමුත් අද අපි සඳහන් කරනවා. අද මේක බණ්ඩාරගමට විතරක් නොවෙයි. අද හොරණ නගරයේ ජලය ගලා යන්නෙත් මෙතැනින්. අද අපි සතුටු වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් විශාල මුදල් සම්භාරයක් වියදම් කරලා මේ අමුණ සකස් කරලා, මේ මාසේ 12 වැනිදාට ආරම්භ කරන්න දැන් කටයුතු සූදානම් කරලා තිබෙනවා. මෙන්න මේ වාගේ විශාල සංවර්ධනයක් අද දකින්නට තිබෙනවා.

ඊත් එක්කම මම පුංචි යෝජනාවක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ලබන වර්ෂයේ අපට හැකියාව තිබෙනවා නම් - බස්නාහිර පළාතේ පුරන් කුඹුරු ගත්තාම සමහර වෙලාවට වී වගා කරන්න බැරි තැන් පවා තිබෙනවා. මම කියන්නේ මෙන්න මේවා හඳුනාගෙන වී වගා කරන්න පුළුවන් තැන්වල වී වගා කරලා, ඒ වාගේම කීර වගා කරන්න පුළුවන් තැන්වල කීර වගා කරලා, ඒ වාගේම ධීවර කර්මාන්තය කරන්න පුළුවන් තැන්වල ධීවර කර්මාන්තය යොදවලා මෙන්න මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න අපේ ගරු අමාත්‍යතුමාට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම මේ සඳහා අපි අනන්තවත් යෝජනා දැම්මා. නමුත් ක්‍රියාත්මක වුණේ නැහැ. මේ වාගේ විකල්ප ක්‍රම අනුගමනය කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සතුටු වෙනවා. මම මෙතුමාගේ අමාත්‍යාංශයේ ඉඳලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තව කරුණු රාශියක් කථා කරන්න තිබුණත් මම අවසාන වශයෙන් කියන්න ඕනෑ. අපි ගොඩක් වෙලාවට දැකපු දෙයක් තිබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි නිලධාරීන්ට ගොඩක් පුහුණු වීම් කළා. අපේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ට අපි පුහුණු වීම් කළා. එතුමා කියපු ගොවීන්ට අපි පුහුණු වීම් කළා. සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට අපි පුහුණු වීම් කළා. මම අවසාන වශයෙන් මතක් කරන්නේ. මේ එතුමන්ලා කියලා තිබුණු, එතුමන්ලා අදහස් දැක්වූ එක තැනක් විතරක් කියවලා, මම මගේ කථාව අවසන් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන කියලා තිබෙනවා. මේ උදය ගම්මන්පිල අමාත්‍යතුමාගේ වැඩ සටහන නිසා කිව්වේ,

ඔබ විසින් ලබා දුන්
මේ දැනුම ශක්තියක් කොට
අසරණ වූ ගොවි සිතට
මගේ දැනුම වටින්නේ
ඉරි තැලුණු මහ පොළොව
වැසි බින්දු සිඹින්නේ
පිපෙන හතු කුඩ අකුලලා
මල් කැකුළු පිපෙන්නේ

කියලා මේ අපි පුහුණුවට ගිය කෘපනිසලාට, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ට තමයි මේ අදහස් ප්‍රකාශ කළේ. මේ වාගේම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්. ඒ වාගේම අපේ ගොවීන් ඉදිරිපත් කරපු පුදුම විධියේ අදහස් තිබෙනවා. ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ, මම පැහැදිලිවම සතුටු වෙනවා. මෙතුමාගේ අමාත්‍යාංශය යටතේ ඉදීම පිළිබඳව. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ලොකු විශ්වාසයක් තිබෙනවා. මම නැවත මේ සභාවට එන කොට - මම ගිය මැතිවරණයේදී 40,000 කට වැඩි මනාප ඡන්ද ප්‍රමාණයක් අරගෙන ආවේ. මම පැහැදිලිව කියනවා, මේ ගමන මැතිවරණයේදී මෙතුමා දීපු ඒ ශක්තියත් එක්ක මේක දෙගුණ කරලා ලබන පළාත් සභාවට එන්න පුළුවන්කම තිබෙනවා කියලා. ඒ එන්න පුළුවන්කම තිබෙන්නේ, උදය ගම්මන්පිල ඇමතිතුමා නිසා කියන එක සඳහන් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහෝම ස්තුතියි. එසේම වේවා. මීළඟට ප්‍රදීප් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.15]

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පස්වන පළාත් සභාවේ මා නියෝජනය කරන කෘෂිකර්ම උපදේශක කාරක සභාවේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන. පළමුවෙන්ම මගේ ගෞරවනීය ස්තුතිය ප්‍රකාශ කර සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුනි, මම අවංකවම සතුටු වෙනවා. විශේෂයෙන්ම දේශපාලනය පැත්තකට තියලා, මේ රටේ නිදහස වෙනුවෙන් ලේ හලපු, තරුණ කාලය සම්පූර්ණයෙන්ම කැප කරපු රණවිරුවකු විධියට මම මගේ ගෞරවනීය ස්තුතියි මේ දේශමාමක, ජාති හිතෛෂී දේශපාලඥයාට පළමුවෙන්ම පුද කර සිටිනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඇත්තමද කියන්නේ?

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ඇත්ත කථාව. වැරදි තැන්වලදී වැරදියි කියනවා. හරි තැන්වලදී හරියි කියනවා. මම සන්තෝෂ වෙනවා. අවංකවම එතුමා යටතේ, එතුමාගේ නායකත්වය යටතේ අපට ලබා දීපු දේවල් පිළිබඳව. අපි පොරකාලා කිසි දෙයක් අරගෙන නැහැ. අපි බොහොම සාධාරණ ඉල්ලීම් එතුමාගෙන් කළාම, එතුමා ඒ සාධාරණ ඉල්ලීම් බොහෝ මානුෂිකව අපට ඉෂ්ට සිද්ධ කරලා දීලා තිබෙනවා. ඒ නිසා අවංකවම මම සතුටු වෙනවා. අනික් අමාත්‍යවරුන්ව විවේචනය කරනවා නොවෙයි. නමුත් මෙතුමා එක්ක, මෙතුමාගේ නායකත්වය අනුව වැඩ කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මතක් කරන්නට ඕනෑ. මම නියෝජනය කරන්නේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ආසනය. අපේ ආසනය කියන්නේ, බොහෝම සශ්‍රීක තැනක්. ඒකට ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් සාක්ෂි දරනවා. අපි බොහොම සශ්‍රීක පරිසරයක ඉපදුණු මිනිස්සු. අපේ ගහ කොළ, අපේ සතා සිවුපාවා, අපි උපයා ගන්න, අපි නිෂ්පාදනය කරන ධන ධාන්‍ය මේ සියලු දේවල් බොහොම ධාර්මිකව තමයි ඒ ප්‍රදේශවල පැතිරිලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මතක් කරනවා. අපේ පැත්තේ තිබෙනවා ගමක්. ඒකට කියන්නේ වරපලාන කියලා. වරපලාන කියන්නේ වර පල ආන. වාරයට එල ගන්න ආන පිහිටියේ මේ දිස්ත්‍රික්කයේ. කොහේද ඒක තිබෙන්නේ අපේ ආසනයේ. වළගම්බා රජ්ජුරුවන්ට පළතුරු ටික සැපයූ, ආහාර ටික සැපයූ, දන්ත ධාතූන් වහන්සේ පස් පොළක රැක ගත්ත ආසනයක ඉපදෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ආසනවල, අපේ දිස්ත්‍රික්කය පුරා අපේ අමාත්‍යාංශ හරහා නොවුණු සිද්ධි මම ගියවර පළාත් සභාවේ අයවැය විවාදයේදීත් මතු කළා.

[ ගරු ප්‍රදීප් පෙරේරා ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමා, තමන්ගේ ප්‍රදේශයේ ජනතාවට ඇලුම් කරන, ආදරය කරන කෙනෙක් විධියට මේ අයවැය විවාදයේ මේකට සහභාගී වුණා. මම එතුමාටත් ගරු කරනවා. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉස්සර අපි පොඩි කාලේදී අපේ භූමි ප්‍රදේශ - මම මේ කථාව ගියවරත් කිව්වා. අපි පොඩි කාලේ අපේ භූමියට උදළු පාරක් ගැහුවාම අනිවාර්යයෙන්ම පණුවෝ දහ පහළොස් දෙනෙක් කැපිලා යනවා. නමුත් අද අක්කර ගණනක් පුරා, මීටර් 100 ක් 200 ක් පුරා උදළු පහරවල් ගහගෙන ගියත්, අපේ ඒ වරපලාන කියන ප්‍රදේශවල - විශේෂයෙන්ම මම මේකට උදාහරණයකට ගන්නේ වරපලාන. අපේ ආසනයේ අද පණුවෝ දහයක් සොයා ගන්න නැහැ, ඇම ගැට ගහන්නවත්. මහ පොළොව ඒ තරමටම කම්පනයට පත් වෙලා. සතෙකුට ජීවත් වෙන්න බැරි තරමට මේ මහ පොළොව විනාශ කරලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මාලු අල්ලන්නද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මාලුත් නැහැ.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මාලුත් නැහැ. අල්ලන්න මාලුවෙක්වත් නැහැ. ඇළකට ගිහිල්ලා බැලුවොත් තිත්තයෙක් නැහැ. වැලිගොව්වෙක් නැහැ. කක්කුට්ටෙක් නැහැ. මේ පරිසර පද්ධතියම විනාශ කරලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නර පනුවෝ තමයි.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

නර පනුවෝ විනාශ කරලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳව අපි මීටත් වඩා විමසිලිමත් වෙන්නට ඕනෑය කියලා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. මේවා ගැන සමාජය දැනුවත් කිරීම් කරන්නට ඕනෑ. මේ පරිසර වෙනස ගැන මිනිස්සුන් දැනුවත් කරන්නට ඕනෑය කියන යෝජනාව මම කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ප්‍රදේශවල ඉන්නේ බුලත් ව්‍යාපාරිකයෝ. පකිස්ථානයට, බංගලා දේශයට, ඉන්දියාවට බුලත් යවන්නේ අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ මිනිස්සු. අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ වගාකරුවෝ. අද ඔවුන්ට ඒ බුලත් ටික යවා ගන්න ගියාම බඳු ප්‍රශ්න. ඒ වාගේම අපනයනය කරන්නට තිබෙන රජයේ සමහර නීති මත ඔවුන්ට විශාල අපහසුතාවයන්ට පත් වෙන්න වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා, කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපි මේ පිළිබඳව අපේ අවධානය යොමු කරන්නට ඕනෑය කියලා. ඒ වාගේම අපේ ප්‍රදේශ කියන්නේ ලුහු කර්මාන්තයෙන් මේ රටට කැත්ත, උදැල්ල, දෑ කැත්ත මේ සියලු දේවල් මේ රටේ ගොවියාට දුන්නේ අපේ ප්‍රදේශවල මිනිස්සු. ලුහු කර්මාන්තය හරහා. අද මේ රටේ ලංගම තිබෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුව තිබෙනවා. ඉංජිනේරු සංස්ථාව තිබෙනවා. මේ වාගේ අබලි යකඩ කැබලි සහ ලෝහ ද්‍රව්‍ය මේ සියලු දේවල් ටෙන්ඩර්කරුවන්ට විකුණන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි ඒක පිළිගන්න ඕනෑ. මම ඉල්ලීමක් කරනවා. මේ සඳහා ගරු ඇමතිතුමාට මැදිහත් වෙන්න කියලා. අපේ මිනිස්සුන්ට වානේ කෑල්ලක් සොයා ගන්න විධියක් නැහැ, කැත්තක් උදැල්ලක් හදන්න. පිහියක් හදා ගන්න. දෑ කැත්තක් හදලා මේ රටේ මිනිස්සුන්ට දෙන්න පුළුවන් හැකියාව නැහැ. අපේ කර්මාන්ත අමාත්‍යාංශය මේ සඳහා අවධානය යොමු කරන්නට ඕනෑ. රජයේ අබලි ලෝහ ද්‍රව්‍ය අරගෙන තමන්ගේ කර්මාන්තය ඔවුන්ට කර ගෙන යන්න, රටට අවශ්‍ය දේවල් නිර්මාණය කරලා දෙන්නට, අවශ්‍ය වට පිටාව නිර්මාණය කරලා දෙන්නට ඕනෑ කියන එක මම මතක් කරලා දෙනවා.

ඒ විතරක් නොවෙයි. අපේ ප්‍රදේශවල ජනතාව ආණ්ඩුවේ රස්සා ඉල්ලපු ජනතාව නොවෙයි. ඔවුන් ආණ්ඩුවේ රස්සා පස්සේ ගියේ නැහැ. ඔවුන් තමන්ගේ ගෘහ කර්මාන්ත හරහා තමයි ජීවන වෘත්තිය රැගෙන ගියේ. අපේ ප්‍රදේශවල රත්තරන් කර්මාන්තය පිළිබඳව ප්‍රසිද්ධම තැන් තමයි මහර, ගම්පහ, බියගම, දොම්පේ මේ ආදී තැන්. රත්තරන් කර්මාන්තය පිළිබඳව ඉතාමත් සූක්ෂම කාර්මිකයෝ ඉන්නවා. රත්තරන් කර්මාන්තය තමන්ගේ ජීවන වෘත්තිය කර ගෙන ගිය මිනිස්සු, අපි පාසල් යන කාලයේ බොහෝම සශ්‍රීකව හිටපු මිනිස්සු අද අන්ත අසරණ වෙලා. ඉන්න තිබෙන ඉඩම කඩම පවා උකස් තියන තත්ත්වයට පත් වෙලා තිබෙනවා, මේ කර්මාන්තය කඩා වැටීම තුළ. මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ කර්මාන්තය ගොඩ නගන්නට නම්. මේ මිනිස්සුන්ව ගොඩ ගන්නට ඕනෑ. බස්නාහිර පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශය හරහා ඔවුන්ට ඒ කර්මාන්තය කර ගෙන යෑමට අවශ්‍ය වටපිටාව අපි නිර්මාණය කරලා දෙන්නට ඕනෑ. ඒ විතරක් නොවෙයි, පිත්තල කර්මාන්තය කරන්නෙත් අපේ පැත්තේ. මැටි කර්මාන්තය කරන්නෙත් අපේ පැත්තේ. මැටි ටිකක් ගේන්න විධියක් නැහැ. මැටි ටික මංකොල්ල කන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මැටි ටික ප්‍රවාහනය කර ගන්න දෙන්නේ නැහැ. මැටි නිෂ්පාදනයට අවශ්‍ය ඒ අමුද්‍රව්‍ය ටික ලබා ගන්න ඉඩ දෙන්නේ නැහැ. මේක මහා පුදුමාකාර ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් ගරු අමාත්‍යතුමාගේ අවධානය මම යොමු කරනවා. මතක් කරනවා.

ඒ වාගේම මම බොහොම ගරු කරන දෙයක්. ගරු අමාත්‍යතුමා හඳුන්වා දුන්නා, මළ ගෙවල්වලට සුදු කොඩි දාන්න. පොලිතීන්වලින් තොර බස්නාහිර පළාතක් කියලා. ඒක කාටත් නොතේරුණාට බොහොම වැදගත් කර්තව්‍යයක්. අපේ පැත්තේ නම් කිසිම මළ ගෙදරකට මම දැනුවත්ව පොලිතීන් දාන්න දෙන්නේ නැහැ. අනිවාර්යෙන්ම මළ ගෙදරට කථා කරලා දාන්න කියන්නේ, සුදු රෙදි ටික විතරයි. ඉන් මුළු පරිසර පද්ධතියම රැකෙනවා. ඒ විතරක් නොවෙයි. මේක අපේ අමාත්‍යාංශයේ මාතෘකාවට අහු නොවුණාට, ගරු ඇමතිතුමා ජාති හිතෛෂියෙකු විධියට මේ කරුණ මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මහර ආසනය කියන්නේ වැම් ගෙවල්. මේකට කියන්නේ වැම්පිටි විහාර. වැම්පිටි විහාර මේ රටේ තුන හතරක් ඉතිරි වෙලා තිබෙනවා නම්, ඒ තුන හතර ඇතුළත වැම්පිටි විහාර, ඒ පිළිම ගෙවල් ඉතිරි වෙලා තිබෙන්නේ අපේ මහර ආසනයේ. ඒ විතරක් නොවෙයි, අනුරාධපුර යුගයට අයිති ශිලා ලිපියක් ලංකාවේ කොහේ හරි තියෙනවා නම්, ඒ තියෙන්නෙත් මහර ආසනයේ. ඒවා සංරක්ෂණය කරන්නටත් ඔබතුමාගේ අමාත්‍ය ධූරය හරහා සමස්ත බස්නාහිර පළාත් සභාවෙන්ම මම ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව වගකීමක් ගන්න අය, ඒ පිළිබඳව කටයුතු කරන්නය කියලා. එසේ ඉල්ලා සිටිමින් තමුන්නාන්සේලා සියලු දෙනාටම ලබන පළාත් සභාවේත් අපත් සමග එකට වැඩ කරන්නට, සාධු ගතිවලින් පිරුණු දේශපාලනයක් කරන්නට වාසනාව ලැබෙන්නය කියා ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 12.25]

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් නොවුණත්, අපි විපක්ෂයේ හිටියත් අගය කළ යුතු දේ අගය කරන්නට ඕනෑ. විවේචනය කරන්නට ඕනෑ දේවල් විවේචනය කරන්නට ඕනෑ. ඒ නිසා මම අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ වැඩිපුර කථා නොකරපු ස්ථාන කිහිපයක් පිළිබඳව කථා කරන්න උත්සාහයක යෙදෙනවා. විශේෂයෙන්ම මම නියෝජනය කරන දිවුලපිටිය ආසනය තුළ වන ක්‍රියාකාරකම් පිළිබඳවත්, ගම්පහ දිස්ත්‍රික්කයට ආවේණික වුණු කරුණු කිහිපයක් පිළිබඳවත් ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය දේශීයත්වයට සලකන, දේශීය ව්‍යාපාර පිළිබඳව හැඟීම් බරව කථා කරන රජයක් හැටියට අපේ යුතුකමක් තිබෙනවා, දේශීයත්වයට ප්‍රමුඛතාව දෙන කර්මාන්ත පිළිබඳව අපේ අවධානය යොමු කරන්න. අපි දන්නවා, ඉතිහාසය තුළ අත්‍යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය දිවුලපිටිය ආසනයේ ඉතාමත්ම දියුණු මට්ටමක පැවතුණු බව. නමුත් මෑත භාගයේදී - අපේ චන්ද්‍රිකා සකළසූරිය

[ ගරු කිත්සිරි මංචනායක ]

ගරු මන්ත්‍රීතුමියත්, නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාත් සාක්ෂි දරයි. ගම්මාන කිහිපයකට විතරක් යොමු වෙලා තිබෙනවා. නමුත් අද අපි සමාජය තුළ දකිනවා, අපේ සමාජයේ තරුණ තරුණියන් අඳින ඇඳුම් දිහා බැලුවාම, බොහෝ දුරටට ලිනන් රෙදිවලට ආකර්ෂණයක් තිබෙනවා. නමුත් මේ ලිනන් රෙදි නිෂ්පාදනය අපේ දේශීය නිෂ්පාදනයක් අත්යන්ත්‍ර කර්මාන්තශාලා තුළින් එළියට දාන්න පුළුවන්. ගරු ඇමැතිතුමාගේ පහළ තිබෙන ප්‍රදර්ශනාගාරයේ අපි දැක්කා ඉතාමත්ම හොඳ ලිනන් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ක්‍රියාත්මක වන වැඩ සටහන් හරහා පුහුණු වීම් කරලා දියුණුවක් ඇති වෙලා තිබෙනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

පොඩ්ඩක් අහගන්න කෝ? ඒ නිසා අපි විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 95% ක් අපි මේ ලිනන් ගෙන්වන්නේ ඉන්දියාවෙන්. එහෙම නැත්නම් බැංකොක්වලින්. එහෙම නැත්නම් චීනයෙන්. නමුත් ඇයි අපි මේ පිළිබඳව අවධානය යොමු කරන්නේ නැත්තේ. සමහරවිට නිෂ්පාදන වියදම වැඩි වෙන්නට පුළුවන්. නිෂ්පාදන වියදම වැඩි වුණත් - මොකද, මා පිළිබඳව කථා කරන්නේ, මීට අවුරුදු විසිපහකට ප්‍රථමයෙන් මගේ පියාගේ වැඩිමහල් සහෝදරයා මේ කර්මාන්තය තුළ විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා හිටියා. එතුමාගේ රෙදි යන්ත්‍ර ගණනාවක් තුළ අපේ ඒ කර්මාන්ත ශාලාවේ තුන් හාරසීයක් වැඩ කළා. එදා විශේෂයෙන් දේශීය වශයෙන් ජනප්‍රියත්වයක් තිබුණා. ගමේ ආර්ථිකයට අපේ ගමට, දිවුලපිටියට ලොකු හයියක් වුණා. අපේ ප්‍රදේශවල තුන්සියක් හාරසීයක් වැඩ කළා. ඔවුන් ජීවත් වුණේ ඒකෙන්. නමුත් අද මේක ගෘහ කර්මාන්තයක් බවට පත් වෙලා තියෙනවා. එහෙම නැත්නම් ඒක දියුණු කරන්න මම හිතන්නේ, මීට වැඩිය අපේ අවධානය යොමු විය යුතුව පවතිනවා.

**ගරු නෙලුක් මල්ලව**
Hon. Neluk Mallawa

දේශීය කර්මාන්ත නැති වුණේ කොයි කාලේද?

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

මෙතුමන්ලාගේ 77 න් පස්සේ -

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

හරි, අපි කරපු වැරදි හදන්න නේ තමුන්නාන්සේලාට මේ ආණ්ඩුව භාර දුන්නේ. ඒ හරි දේ කරන්න කෝ? ඒ නිසා තමයි කරපු වැරදි කරන්න එපා කියන්නේ. ඒ නිසා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ මේ කර්මාන්තය පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න. මොකද මේක අපට සම්පතක්. මොකද දේශීයත්වය ගරු කරන, දේශීය රෙදිපිළි නිෂ්පාදනය, දේශීය කර්මාන්තය අපේ ගමට අපේ පවුල්වලට ආදායමක් එන්න හැකියාව තිබෙනවා. අද මහ ආණ්ඩුවේ අයවැය දැක්කම අපි දැක්කා කොත්තමල්ලිවල ඉඳලා පරිප්පු ඇටේ හාල් ඇටේ හැම දෙයටම Tax ගහලා ජනතාවට විශාල ජීවන වියදමක් දරන්න සිදු වී තියෙනවා. අද බඩු මිල ඉතාම සිඝ්‍රයෙන් ඉහළ ගිහිල්ලා තියෙනවා. මේකට ප්‍රතිකර්මයක් හැටියට අපේ ගමක, ගෙදරක ඉන්න ඒ කාන්තාවට - ස්වාමි පුරුෂයා අද රස්සාවට යනවා. අඩුගාණේ ගෙදර ඉන්න කාන්තාවට මෙවැනි ආකාරයේ ස්වයං රැකියාවක් කරලා කීයක් හරි හොයා ගන්නට තමුන්නාන්සෙලාගේ අවධානය යොමු කරනවා නම් මම හිතන්නේ, ඉතාමත්ම වටිනවා. මොකද, අද ඒ ආකාරයට හිතලා, ඒ කියන්නේ ගමක ආර්ථිකය දියුණු කරන ආකාරය ගැන හිතලා, අපි ස්වයං රැකියාවක් හැටියට මෙය දියුණු කරන්නට, මීට වඩා අවධානය යොමු කළ යුතුයි කියන එක මම මේ අවස්ථාවේ අපේ ගරු අමාත්‍යතුමාට මතක් කරනවා.

ඒත් එක්කම අද කෘෂිකර්ම අමාත්‍යාංශයට මේ මහ ආණ්ඩුවේ කුඩම්මගේ සැලකිලි තියෙන්නේ. මම දන්න තරමට අද කෘෂිකර්ම අමාත්‍යාංශයට මහ ආණ්ඩුවෙන් දෙන මුදල් ප්‍රමාණය මදියි. ඊයේ පෙරේදා අයවැයෙන් ඉදිරිපත් කරලා තියෙනවා ගොවි විශ්‍රාම වැටුප. ගොවි විශ්‍රාම වැටුපත් දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොන්දේසි සහිතව

දාලා තියෙනවා. අවුරුදු 64 ක් වෙනකන් බලා ඉන්න ඕනෑ, ගොවි විශ්‍රාම වැටුප ගන්න. මේ රුපියල් එක්දහස් දෙසීය, එක්දහස් පන්සීයය ගන්න. සීනි බෝල දීලා රවට්ටපු අයවැයක් මහ ආණ්ඩුවෙත් තියෙන්නේ. නමුත් අපි දන්නවා, ඉතාමත් දක්ෂ කෘෂිකර්ම ඇමතිවරයෙක් අපේ පළාත් සභාවේ ඉන්නවා. එතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. අනාගතයේදී අපි මහ ආණ්ඩුවෙන් යැපෙන්නේ නැතිව අඩුගාණේ බස්නාහිර පළාතේ ඉන්න අපේ ගොවීන්ට යම්කිසි ක්‍රමයක් අනුව මෙම විශ්‍රාම වැටුප අපට දෙන්න පුළුවන් නම්, මේ විශ්‍රාම වැටුප අපේ ප්‍රතිපාදන තුළින් හෝ යම් ක්‍රමවේදයක් තුළින් හෝ දෙන්න අනුගමනය කරන්න පුළුවන් නම් ඉතාම වටිනවා.

මොකද අපේ රටේ පාරම්පරික රැකියාවක් හැටියට ගොවියාට අපි සලකන්න ඕනෑ. අපි කියනවා මඩ සෝදාගත් කල ගොවියා රජකමටත් සුදුසුයි කියලා. එහෙම කියලා අපි ගොවියාව ආරක්ෂා කරන්නේ නැත්නම්, ගොවියා බලාපොරොත්තු වන ඒ විශ්‍රාම වැටුප හරියාකාරව ගොවියාට අපි ලබලා දෙන්නේ නැත්නම්, අපි ජාතියටත් කරන විශාල අසාධාරණයක්. මේක අවුරුදු ගණනාවක ඉඳලා කිය කියා, කිය කියා ඉඳලා මේ අයවැයෙන් පොඩි සීනි බෝලයක් විසි කරලා ගොවියාව ඉතාමත්ම අවතක්සේරුවට ලක් කරලා තියෙනවා. අද රුපියල් එක්දාස් දෙසීය ගන්න අවුරුදු 64 වෙනකල් බලා ඉන්න සිදු වෙලා තියෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අපි බස්නාහිර පළාත් සභාව හැටියට, අද අපේ බස්නාහිර පළාත් සභාවට 13 වන ව්‍යවස්ථාව යටතේ ගොඩක් දේ තීරණය කරන්න පුළුවන්. බස්නාහිර පළාත් සභාව ඒ තීරණ අරගෙන - අපේ මුදල්වලින් අපට ගොඩක් වැඩ කටයුතු කරන්න පුළුවන්. මම හිතන්නේ, පහුගිය වකවානුව තුළ මෙතුමා විශාල වැඩ ප්‍රමාණයක් කළා. ඒ වාගේම අපි මේ අසරණ ගොවීන්ට බස්නාහිර පළාත් සභාව තුළ යම්කිසි විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබලා දෙන්න කටයුතු කරන්න පුළුවන් නම් මම හිතන්නේ, ඉතාමත්ම හොඳයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒත් එක්කම ගරු සභාපතිතුමනි මේ කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය නිසා මම කථා කරන්න කැමතියි මේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සමාවෙන්න මම නියෝජ්‍ය සභාපති.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

අපට සාමාන්‍යයෙන් කියැවෙනවා. අනාගතයේ ඔබතුමාට ලබන පාර පළාත් සභාවේදීවත් ඒ අවස්ථාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒසේ නොවේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මේ සභාවේ තිබුණු අඩුපාඩුකමුත් මහ හරවලා - මම හිතන්නේ, ඔබතුමාට ඒ අවස්ථාව ලබන පාර ලැබේවි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එසේ නොවේවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

අඩු ගාණේ ඔබතුමාට මේ පුටු හතරෙන් එකකට යන්නට අවස්ථාවක් ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ කියන්නේ ලබන පාරත් පරදිනවා කියලා දන්නවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ඔබතුමන්ලා දිනුවොත් ඒ පැත්තේ. එහෙම නැත්නම් අපි ඒ පැත්තේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව අපි අමතක කරලා දාපු කර්මාන්තයක් තියෙනවා. විශේෂයෙන් මම නියෝජනය කරන ආසනයට ආවේණික වුණු - ආවේණික වුණාම කියලා කියන්නත් බැහැ. නමුත් ඒ ප්‍රදේශය තුළ තියෙන ගඩොල්, වැලි සහ කළුගල් කර්මාන්තය. මේ කළුගල්, වැලි, ගඩොල් කර්මාන්තය අද ඉතාම අසරණ තත්වයකට පත්වෙලා තියෙනවා. එයින් ජීවිකාව කරගන්න තරුණ පවුල් ගණනාවක්ම අද ඉතාමත්ම දුඃඛිත තත්ත්වයට පත් වෙලා තියෙනවා. තමන්ගේ මැටි ටික ලබාගෙන ගඩොල් කර්මාන්තය සාර්ථකව කර ගන්න බැරුව නොයෙකුත් ප්‍රශ්නවලට යොමු වෙලා තියෙනවා.

[ ගරු කිත්සිරි මංචනායක]

කර්මාන්ත අමාත්‍යාංශයත් අපේ යටතේ තියෙන නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. මේ පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, අද වැලි ප්‍රවාහනය කරන කොට, එහෙම නැත්නම් මැටි ප්‍රවාහනය කරන කොට පොලීසියෙන් නොයෙකුත් ප්‍රශ්න ඇති වෙලා තියෙනවා. බලපත්‍ර පිළිබඳ ප්‍රශ්න ඇති වෙලා තියෙනවා. මම හිතන්නේ, විශාල ජනතාවක් සුළු සම්පත් ප්‍රයෝජනයට අරගෙන මේ නිෂ්පාදන කරන්න යොමු වෙලා තියෙනවා. මම හිතන්නේ, ඒක තමයි අපි දකින වරද. අපි විශාල ප්‍රමාණයක් සුළු සම්පත් ප්‍රයෝජනයට අරගෙන ව්‍යාපාරයන් කරන්න හැදීම තුළ මොකද, මේ මැටි කියන එක නැතිව යනවා. වැලි කියන එක නැතිව යනවා. ඒ නිසා විශාල ප්‍රමාණයක් මේ රැකියාවන් සඳහා යොමුවීම මම හිතන්නේ, මේ කර්මාන්තයට කණකොකා හඬන්න හේතුවක් වෙන්නත් පුළුවන්.

ඒ නිසා මම ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාට අවධානය යොමු කරනවා. විශාල පවුල් ප්‍රමාණයක් යොමු වෙලා ඉන්න මේ කර්මාන්තයෙන් ඔවුන්ව වෙන යම් ආකාරයේ කර්මාන්තවලට යොමු කරන්න. නැත්නම් අනාගතයේදී මේ රැකීරක්ෂා පිළිබඳ ප්‍රශ්නය විශාල ගැටළුවක්. මොකද, මේ අයට ජීවත් වෙන්න ඉස්සෙල්ලා තිබුණු ආදායම් මාර්ගය දිනෙන් දින අඩු වෙලා තියෙනවා. ඉතාමත්ම අසරණ තත්වයට පත් වුණු පවුල් සමූහයක් ඉන්නවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පුළුවන් නම් මේ කණ්ඩායම් තෝරාගෙන, ඔවුන්ව වෙන යම් ආකාරයේ රැකියාවලට යොමු කරන්න - අපි දන්නවා, අද මේ රටේ විශාල වශයෙන් කර්මාන්ත ශාලා බිහි වෙනවා. වෙළඳ කලාප. එවැනි පවුල් සමූහයක් අරගෙන මධ්‍යම රජයේ අනුග්‍රහය යටතේ, BOI එක යටතේ විකල්පයක් හැටියට අපට පුළුවන් නම් විශාල කර්මාන්ත ශාලාවක් ඒ ප්‍රදේශයේ පිහිටුවලා ඒ දරුවන්ව එම කර්මාන්ත ශාලාවල රැකියාවන්ට යොමු කරන්න - එහෙම නැත්නම් සදාකාලිකව අපට මේ ප්‍රශ්නයට විසඳුම් දෙන්න බැහැ. මොකද වැලි කියන එකත්, ගල් කියන එකත්, මැටි කර්මාන්තයත් සදාකාලිකව කරන්න බැරි තත්වයට පත් වෙනවා. මොකද අමුද්‍රව්‍යවල එහෙම නැත්තම් සම්පත්වල තියෙන හිඟය නිසා මම අවධානය යොමු කරනවා එවැනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට තව විනාඩියක පමණ කාලයක් ඉතිරි වෙලා තියෙනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

කර්මාන්තවල යෙදිලා ඉන්න අපේ අහිංසක අසරණ ජනතාව වෙනුවෙන් ලබන පළාත් සභා වාරයේදීවත් අපේ බස්නාහිර පළාත් සභාවේ අවධානය යොමු වේවා යැයි කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

තව විනාඩියක් දෙන්න. මගේ විනාඩිය අවසන් නැහැ නේ? ඒ නිසා මම හිතන්නේ, මේ පළාත් සභාවේ පස්වෙනි අයවැය. අවසාන අයවැය. ගරු ඇමතිතුමා අවුරුදු පහක් තිස්සේ ඉතාම හොඳ සේවයක් කළා. අපි එය අගය කරන්න ඕනෑ. ඉදිරියේදීත් ඔබතුමාට එවැනි සේවාවක් කරන්න, පළාත් සභාවෙන් ඔබ්බට - මම හිතන්නේ, ඊයේ පෙරේදා අපේ පක්ෂයේ නායකතුමෙක් ඔබතුමාට ඒ ප්‍රාර්ථනාව කළා. ඒ ප්‍රාර්ථනාවට යන්නට ඔබතුමා අවස්ථාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 12.35]

**ගරු එච්.එම්.ජී.බී. කොටකදෙනිය**
Hon. H. M. G. B. Kotakadeniya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උදය ගම්මන්පිල ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිබඳ විවාදයට සම්බන්ධ වෙලා, කරුණු පැහැදිලි කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. උදය ගම්මන්පිල ගරු ඇමතිතුමා සමග වර්ෂ දහයකට පෙර මම දේශපාලනයට සම්බන්ධ වුණේ. ඒ නිසා එතුමා ගැන මම හොඳින් අධ්‍යනය කරලා, එතුමාත් එක්ක ජාතික තලයේ, ජාතික සටනට එක්කහු වෙලා කටයුතු කරපු නිසා එතුමා කොතරම් කාර්ය ශූර කෙනෙක්ද කියලා මම දන්නවා.

එතුමා කොතරම් අවංක කෙනෙක්ද කියලා මම දන්නවා. එතුමාට මම සුභ පතනවා. ඒ අතරම මම සඳහන් කරන්න කැමතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ඔබතුමාගේ කථාවේදී ජාතික හෙළ උරුමයෙන් මේ බස්නාහිර පළාතට ප්‍රදානය කරපු සම්පතක් වශයෙන් ඔබතුමා එතුමාව හැඳින්වූවා. ඒක මම සම්පූර්ණයෙන්ම අනුමත කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා ගැන හැම දෙනාම ප්‍රශංසා මුඛයෙන් කථා කළේ. ඒ නිසා එතුමා ගැන තවදුරටත් නොයෙක් වර්ණනා කරලා මේ සභාව වෙහෙසීමට මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් එක්තරා කරුණක් ගැන මම සඳහන් කරන්නට ඕනෑ.

කර්මාන්ත ක්ෂේත්‍රයේදී එතුමා එතුමාගේ අමාත්‍යාංශය මගින් රැකියා විරහිත තරුණ තරුණියන්ට රැකියා පුහුණුව පිළිබඳව විශාල ව්‍යාපෘති රැසක් කරලා තියෙනවා. මේ බව පසුගිය කමිටු රැස්වීමේදීත් සඳහන් වුණා. මම එතුමාගෙන් ඉල්ලා සිටියා, කරුණාකරලා ඒ පුහුණුව ලබපු තරුණ තරුණියන්ගේ සේවය බස්නාහිර පළාතේ මහජනයාට ලබා ගැනීමට හැකි වන අන්දමේ යාන්ත්‍රණයක් සකස් කරන්න කියලා. ඒ කියන්නේ, තමුන්නාන්සේලා දන්නවා. අපි සියලු දෙනාම දන්නවා, කොතරම් ශ්‍රම හිඟයක් මේ රටේ, මේ පළාතේ තියෙනවාද කියලා. අපට මේසන් කෙනෙක්, වඩු බාස් කෙනෙක්, ඉලෙක්ට්‍රීෂියන් කෙනෙක් හොයාගැනීම ඉතාම අසීරු කාරණයක්. ඇත්ත වශයෙන්ම පසුවිපරම් කිරීමක් තිබුණද කියලා මම දන්නේ නැහැ. මේ තරුණ තරුණියන් ඒ රැකියාවල ලාභ විධියට යෙදිලා ඉන්නවාද කියලා. ඒ නිසා මම යෝජනා කරනවා යම්කිසි යාන්ත්‍රණයක් ඇති කළ යුතුයි කියලා.

මේ තරුණ තරුණියන්ගේ නම් ගම් ඒ විස්තර ඔක්කෝම එක්කාසු කරලා Labor Exchange වශයෙන් යම්කිසි ස්ථානයක ඒ විස්තර තබා ගෙන, වාර්තා තබා ගෙන, මහජනයාට ඒ අයගේ සේවය අවශ්‍ය වුණු අවස්ථාවන්වලදී ලබා ගන්නට හැකිවන පරිදි යම්කිසි වැඩ පිළිවෙළක් යොදන්නට කියලා යෝජනා කරනවා. නමුත් ඇත්ත වශයෙන්ම ඒ සඳහා ප්‍රධානම දෙයක් අවශ්‍යයි. එනම් රූපවාහිනිය හෝ ගුවන් විදුලිය මාර්ගයෙන් මහජනයාට ඒ පිළිබඳව දැනුවත් කිරීමක් කළ යුතුයි, මේ වගේ යාන්ත්‍රණයක් තියෙනවා කියලා. එසේ වුණොත් තමයි ඔබතුමා විසින් නායකත්වය දීලා කරපු මේ ශ්‍රමිකයන්ගේ පුහුණුවෙන් අපට යම්කිසි ප්‍රයෝජනයක් ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ මාර්ගයෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, එවැනි යාන්ත්‍රණයක් සකස් කරලා ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසට.

කෘෂිකර්මය පිළිබඳව පසුගිය දවසක මේ සභාවේ කථා කරන අවස්ථාවේදී, මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, ශ්‍රී ලංකාවේ සත්ත්ව ඝාතනය පිළිබඳව. විශේෂයෙන්ම හරක් ඝාතනය කිරීම පිළිබඳව. එය මුස්ලිම් ජාතිකයන්ට විරුද්ධව ගෙන යන ව්‍යාපාරයක් යන අර්ථ කථනය එතුමා ඒ වෙලාවේ සඳහන් කළා. ඇත්ත වශයෙන්ම මම කනගාටු වෙනවා. මෙතරම් සිංහලයෝ, මෙතරම් බෞද්ධයෝ මේ සභාවේ සිටියත් ඒ කථාවට කිසිම කෙනෙක් පිළිතුරු දුන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන සඳහන් කිරීමට කරුණාකර මට අවසර දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මුස්ලිම් ජාතිකයන් මේ රටේ සිංහලයන් සමග ශතවර්ෂ ගණනාවක් සිටම සහෝදරයන් වගේ ජීවත් වුණා. ඉතින් ඒ අය දැනගන්න ඕනෑ, සිංහල බෞද්ධයාගේ ගතිපැවැතුම්, ඒගොල්ලන්ගේ දර්ශනය, ඒගොල්ලන්ගේ වටිනාකම්, හරපද්ධති ගැන. ඒ පිළිබඳව ඒගොල්ලන්ගේ හැඟීමක් තියෙනවා. නමුත් මේ මන්ත්‍රීතුමා දන්නේ නැහැ, ඇත්ත වශයෙන්ම ගව ඝාතනය පිළිබඳව විශේෂ සැලකිල්ලක් සිංහල බෞද්ධයා දක්වන්නේ ඇයි කියලා. ඇත්ත වශයෙන්ම මා දන්නා විධියට එය ආගමික දෙයක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එය මේ රටේ සිංහලයාගේ තිබෙන කෙළෙහිගුණ සැලකීමේ විශිෂ්ට ගතිගුණයෙහි අංගයක් තමයි ඒක. ඒ කියන්නේ මේ සත්ත්වයා අපට, අපේ කෘෂිකර්මයට, අපේ ගොවිතැනට කොතරම් ආධාර කරලා තියෙනවද කියලා සිංහලයෝ වශයෙන් අපි දන්නවා. ඒ නිසා තමයි ගව ඝාතනය පිළිබඳ විශේෂ අවධානයක් සිංහල බෞද්ධයා යොමු කර ඇත්තේ ඒ නිසා තමයි. විශේෂයෙන්ම යෝජනා කරලා ඒ අය කියන්නේ, මේ වගේ ගව ඝාතනය ලංකාවේ තහනම් කරන්න කියලා. ඒක බොදුබල සේනාවේ විශේෂ දෙයක් නොවෙයි. නැත්නම්, ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි සිදුවෙන දෙයක් නොවෙයි. මා හිතන විධියට මම පොලිසියට බැඳෙන කාලේ පවා ගව ඝාතනයට විරුද්ධව මේ අය කථා කළේ කෘෂිකර්මයට සම්බන්ධ ඒ සත්තු මරන්න එපාය කියන එක. මුජිබුර් රහුමන් ගරු මන්ත්‍රීතුමා අද මෙතැන නැති වුණත් එතුමාට මේ බව පැවසීම අත්‍යවශ්‍යයි කියලා මම මේ අවස්ථාවේදී කියනවා.

[ ගරු එච්.එම්.ජී.බී. කොටකදෙණිය]

ගරු ඇමතිතුමාගේ කර්මාන්ත අංශය පිළිබඳව කථා කිරීමේදී පිටරටින් ආනයනය කරන භාණ්ඩ නිසා ලංකාවේ කෘෂිකර්මාන්තයට හා කර්මාන්ත නිෂ්පාදනයට වන හානිය පිළිබඳව සැහෙන දුරට අවබෝධයක්, සාකච්ඡාවක් මේ සභාවේ සිදු වුණේ නැහැ. ඇත්ත වශයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ කර්මාන්ත සහ කෘෂිකර්මය ආරක්ෂා කිරීමට නම් අවශ්‍ය වෙන්නේ, ලංකාවේ කරන නිෂ්පාදනවලට තරගකාරී ලෙස ආනයනය කරන භාණ්ඩ වෙළඳ පොළට ඇතුළු වීම සීමා කිරීමයි සිදු කළ යුතු වන්නේ. දැන් අපි බැලුවොත් පළතුරු නිෂ්පාදනය, බෝග නිෂ්පාදනය, එළවළු නිෂ්පාදනය මේ සියල්ලටම අද පිටරටින් ගෙන එන විකල්ප භාණ්ඩ තර්ජනයක් වෙලා තියෙනවා. ඒ නිසා ඇත්ත වශයෙන්ම ඔබතුමා මගින් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව මධ්‍යම රජයේ අවධානය යොමු කරලා ගත යුතු ක්‍රියා මාර්ගයක් අරගන්න කියලා. ඔබතුමා දන්නවා ඇති හැත්තෑව අසූව දශකයේදී ලංකාවේ තිබුණා අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව කියලා, මධ්‍යම රජය විසින් ක්‍රියාත්මක කරපු දෙපාර්තමේන්තුවක්. ඒ දෙපාර්තමේන්තුව මගින් ඒ කාලේදී ලංකාවේ නිෂ්පාදනය වැඩි වෙන අවස්ථාවේදී ඒ නිෂ්පාදනය රජය මගින් මිලදී අරගෙන ඒවා ශීත කාමරවල දාලා සංරක්ෂණය කරලා මිල වැඩි වන විට ඒවා මුදා හැරීම තමයි ඒ කාලයේ සිදු කළේ. ඒක තමයි ස්වභාවික මිල පාලනය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නමුත් අද ඒ වාගේ මිල පාලනයක් නැහැ. අද වෙළඳ පොළට වැඩිය භාණ්ඩ එනකොට තැරැව්කාරයෝ ඒවා ඔක්කොම එක්කහු කරලා විනාශ කරලා දානවා. ඒ නිසා මිල කෘතීම තත්වයක තියෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ට තව විනාඩියක පමණ කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු එච්.එම්.ජී.බී. කොටකදෙනිය**
Hon. H. M. G. B. Kotakadeniya

ඒ නිසා මුළු රටම වසාගෙන තියෙන යාන්ත්‍රණයක් ලෙස ස්ථාපිත කරන ලෙසට මධ්‍යම රජයට බල කරන ලෙස මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අධිකාරියක් ඇති කරලා ඒ මගින් කළ හැකි දෙයක් නොවෙයි කියලා මම හිතන්නේ. මොකද, ලංකාවේ හැම පැත්තකම වගාවන්, අනික් පැත්තේ වගාවන්ට බලපානවා. මිල පාලනය සම්බන්ධයෙන්. ඒ වාගේම අවසාන වශයෙන් මම අතිගරු ජනාධිපතිතුමා ගැන යම් දෙයක් සඳහන් කළ යුතුයි. එතුමා විසින් මේ රටේ ඒකීයභාවය රැක ගැනීම සඳහා ගෙන ගිය ක්‍රියා මාර්ගය දේශපාලඥයින් ඇත්ත වශයෙන්ම සලකන්නේ නැහැ. එතුමා කරපු උදාර සේවය. නමුත් පොලීසියේ, යුද්ධ හමුදාවේ සේවය කරපු අය වශයෙන් අපි දන්නවා, ඊට ඉස්සර හිටපු ජනාධිපතිවරු අගමැතිවරු මේ රටේ ඒකීයභාවයට හානි වන අයුරින් කොතරම් දුරට වැඩ කළාද කියලා. එතුමා තමයි ඇත්ත වශයෙන්ම මේ රටේ ඒකීයභාවය පිළිබඳ ස්ථාවර අධිෂ්ඨානයක් අරගෙන, මේ රටේ ඒකීයභාවය රැක ගැනීම සඳහා අපේ හමුදාව යොමු කළේ. ඒ නිසා ඉදිරියේදීත් එතුමා නැති දවසක - මේ රටේ ත්‍රස්ත්‍රවාදය බෙදුම්වාදය නැවත වරක් හිස ඔසවන බව දැනටමත් පෙනී ගෙන යනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඊට හේතුව නොයෙක් කාණ්ඩ, ඩයස්පෝරාව මේ සියල්ලම සංවිධානය වෙලා නැවත වරක් මේ රට සටන් බිමක් කිරීමට අවශ්‍ය කටයුතු දැන් සංවිධානය වේගෙන යනවා. ඒ නිසා මම ප්‍රාර්ථනා කරනවා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට තවත් චිරාත් කාලයක් අපේ ජනාධිපති වශයෙන් සිටීමට ශක්තිය, වාසනාව ලැබේවා කියලා. ඔබ සියලු දෙනාටම සුබ නව වසරක් වේවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. දේශපාලනයට ආපු නවකයෙක් වශයෙන් මම මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් විශාල වශයෙන් පාඩම් ඉගෙන ගත්තා. විශේෂයෙන්ම අපි මෙතැන කොතරම් කෑ කෝ ගහගත්තත්, ඝට්ටනය වුණත් මෙතැනින් එළියේදී අපි සුහදව කටයුතු කරනවා. නොයෙක් කමිටුවලදී අපි සුහදව කටයුතු කරනවා. ඒ එක්සත් භාවය, වඩා පුළුල්ව අපි පාවිච්චි කළොත් මේ රටේ සමගිය, සංවර්ධනය, අභිවෘධිය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක් විතර වැඩිපුර දෙන්න පුළුවන්.

**ගරු එච්.එම්.ජී.බී. කොටකදෙනිය**
Hon. H. M. G. B. Kotakadeniya

සැලසෙන බව මට මේ අවස්ථාවේ කියන්න පුළුවන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඇත්ත වශයෙන්ම මගේ අදහසක් තියෙනවා නැවත දේශපාලනය නොකරන්නට. ඒකට හේතුව මම ආපු, මම ආදරය කරපු මගේ පක්ෂය, ඒ කියන්නේ ජාතික හෙළ උරුමයේ නායකත්වය සමග මගේ ඇති වුණ මතබේදයක් උඩ මට ඇත්ත වශයෙන්ම ක්‍රියා කරන්න බැරි වුණා. නැත්නම් මීට වඩා සේවයක් මාගෙන් මේ පළාතට කෙරෙන්න අවස්ථාව තිබුණා. ඒ කරුණ නිසා මම ඉදිරියේදී මැතිවරණ දේශපාලනයෙන් ඉවත් වෙනවා. නමුත් ඉදිරියේදීත් හෙළ උරුමය වැනි ජාතික අභිවෘධිය, ජාතික ආරක්ෂාව සඳහා කටයුතු කරන ව්‍යාපාරවලට සම්බන්ධ වෙලා මගේ සේවය අවසාන මොහොත දක්වා මේ රටට යෙදීමට මං කටයුතු කරන බව මේ අවස්ථාවේදී සඳහන් කරමින් නැවත වරක් ඔබ සියලු දෙනාටම සෞභාග්‍යමත් අනාගතයක් වේවා යැයි පවසමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මූලාසනය නම් ප්‍රාර්ථනය කරන්නේ ඔබතුමා මේ සභාවට පත් වේවා යැයි කියලා. කෙසේ වෙතත් අපේ රටට සේවය කිරීමට ඔබතුමාට නිදුක් නිරෝගී සම්පත්තිය, දීර්ඝායුෂම ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 10 ක කාලයක් නියතමිතව තිබෙනවා.

[අ.භා. 12.48]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාව සලසා දීම පිළිබඳව මම ස්තූතිවන්ත වෙනවා. ඇත්තෙන්ම මම හුඟාක් සන්තෝෂයෙන් මෙම අමාත්‍යාංශය යටතේ මගේ අදහස් ප්‍රකාශ කරනවා. මොකද මම ඉතාම ප්‍රිය කරන ඇමතිවරයෙක්, මේ අමාත්‍යාංශය ඉතාම ශක්තිමත්ව පාලනය කළා කියලා සතුටින් මම මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා. ගරු ඇමතිතුමා මට වෙලාවකට පේන්නේ දරුවෙක් වගේ. තවත් වෙලාවකට සහෝදරයෙක් වගේ. තවත් වෙලාවක හොඳ මිතුරෙක් වගේ. එතුමාගේ දක්ෂකම්, එතුමගේ ඉදිරි දැක්ම, එතුමාගේ මනුස්සකම, එතුමාගේ නිර්මාණශීලී ගතිය හොඳ ප්‍රශස්ත මට්ටමේ තියෙනවා. කාර්යක්ෂමතාවය ඉහළයි. විවාදවලට ගියාම ජාතික මට්ටමින් ඉදිරිපත් වෙලා ප්‍රතිවාදියාට මනාව කරුණු පැහැදිලි කරලා දීම. ඒ වාගේම විනිවිධභාවයෙන් අමාත්‍යාංශයේ වැඩ කිරීම. ඒ වාගේම එතුමාට බණින කිසිම කෙනෙක් මම දැකලා නැහැ. අපේ මන්ත්‍රීවරු හැම කෙනෙක්ම පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව එතුමාව අගය කරනවා. ඒ වාගේම දේශපාලන භේදයෙන් තොර එතුමා සියලු දෙනාටම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් උදව් කරනවා. හැම කෙනාටම ගෞරවයෙන් සලකනවා. ඒ වාගේම එතුමාගේ පුද්ගලික කාර්යය මණ්ඩලය ඉතාම කරුණාවන්ත විධියට අපි ගියාම හැම මන්ත්‍රීවරයෙකුටම එක වාගේ සලකලා ඒ කටයුතු ඉෂ්ට කරන්න මහන්සි ගන්නවා. ඒ වගේම ලේකම්තුමා, හිටපු ලේකම්තුමා ඇතුළු ඒ නිලධාරීනුත් බොහෝ කරුණු තේරුම් අරගෙන හොඳ මහජන සම්බන්ධතාවයක් පවත්වාගෙන යනවා. ඒක නිසා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ කටයුතු බොහෝම ප්‍රශස්ථ මට්ටමෙන් ඉටු කරන බව මම මේ වේලාවේ ප්‍රකාශ කරනවා. ඒකට මම හේතුවක් වශයෙන් දකින්නේ තමුන්නාන්සේ හැම මාසයකට සැරයක් උපදේශක කාරක සභාව පවත්වනවා. ඒකේදී අපට අපේ අවශ්‍යතා ගැන කථා කරන්න පුළුවන්. ඒ වාගේම ප්‍රදේශයේ අඩු පාඩු ගැන කථා කරන්න පුළුවන්. ඒවා සම්පූර්ණ කරන ක්‍රමය ගැන කථා කරන්න පුළුවන්. ඒ වාගේම අපට ලබා දුන්නු යම් යම් ව්‍යාපෘතිවල අඩු පාඩු තියෙනවා නම්, නිලධාරීන් එක්ක කරුණාවෙන් ඒ ගැන කථා කරගන්න පුළුවන්කම තියෙනවා. ඒ වාගේම නැවත ඒවා ක්‍රියාත්මක වන තත්ත්වයක් තියෙනවා. ඒක නිසා ඒ අමාත්‍යාංශය ප්‍රියජනක තැනක් හැටියට තමයි මම හැම විටම දකින්නේ.

ඒ වාගේම මම ඔබතුමන් නිර්මාණශීලී මනුස්සයෙක් කියලා කිව්වේ, ඔබතුමාගේ අමාත්‍යාංශයේ හැම විෂයකටම වැඩ කරන ක්‍රමයක් තියෙනවා. ඒකේ ගොවීන් වෙනුවෙන් ගොවිලිය අරුණ, රෝද තුනට මනු සවියක්, සොබා කැකුළ, රණවිරු පුණ්‍යානුමෝදනා, මනරම් වැව්, මිහිකත හෝරාව, ක්‍රාෆ්ට් ලංකා, ඒ වාගේම අටවිසි බෝ පැළ රෝපණය, බිඳුණු පුටුවට දෑතේ සවිය, බෝග සායන, හරිත ගෙවතු, කෘෂිකර්ම ප්‍රවර්ධන සති, පාසල් කෘෂි සමාජ, සෑදැ සෙවණ වශයෙන් නම් කරලා තියෙනවා. ඒවා බොහෝම ක්‍රමානුකූලව සියලු

[ ගරු අශෝකා ලංකාතිලක]

දෙනාටම ගැළපෙන ආකාරයටම ගොවියාට, කර්මාන්තකරුවාට, පාසල් දරුවන්ට, අවසානයේ සැඳෑ සමය ගත කරන අපේ අහිංසක ආච්චිලා, සීයලා, අම්මලා, තාත්තලාට පවා ඔබතුමා නිර්මාණශීලී විධියට යම් වැඩ කොටසක් කරන්න මහන්සි ගන්නවා. ඒවා ඉතාම කැපවීමෙන් කර ගෙන යනවා. මම හිතන්නේ ඒක අපිටත් ලොකු වාසනාවක්. ඒ නිසා ඒවා යටතේ මන්ත්‍රීවරුන්ට වැඩ කරන්න පුළුවන්කම තියෙනවා. උදාහරණයක් හැටියට බිඳුණු පුටුවට දැතේ සවියක් කියන මාතෘකාව යටතේ පාසල්වල කරපු ඒ පුටු බංකු ප්‍රතිසංස්කරණය කිරීම මම හිතන්නේ, ඔබතුමාගේ අමාත්‍යාංශයටත් වඩා අධ්‍යාපන අමාත්‍යාංශයට ලොකු හයියක්. මම දැක්කා, ඒ තැන්වලට ගියාම විශාල ලෙස පුටු ගොඩගහලා තිබුණා. බංකු ගොඩගහලා තිබුණා. ඒවා හදන්න වත්කමක් පාසලේ සංවර්ධන සිමිතියට නැහැ. නමුත් මේ ව්‍යාපෘතිය යටතේ අපේ දරුවෝ ලොකු සැනසිල්ලක් ලැබුවා. සමහර අයට කොළයක් තියලා බංකුවේ ලියන්න බැහැ. වේයෝ ගහලා කඩතොළු වෙලා. නමුත් මේ ව්‍යාපෘතිය නිසා අපේ දරුවන්ට පහසුකම් ඇතිව ඒ අධ්‍යාපන කටයුතු කරන්න ලොකු හයියක් ලැබුණා. හැම විදුහල්පතිවරයෙක්ම, හැම සංවර්ධන කමිටු සමාජිකයෙක්ම ඒ පිළිබඳව ඉතාම සතුටින් කථා කළාය කියන එක මම මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ වාගේම මහින්ද චින්තනය යටතේ ආසියාවේ ආශ්චර්ය කරා යන ගමනේ දී ඒ මහින්ද චින්තන පොතේ සඳහන් වෙලා තිබුණා, දේශීය සම්පත් දේශිය දැනුමෙන් කියලා. විදේශයන් ජය ගන්න ව්‍යවසායකයන් බිහි කිරීමට අපේ ජනාධිපතිතුමා හුඟක් කැමතියි කියන එක. මම හිතන්නේ, මහ ආණ්ඩුවටත් වැඩිය ඒ අත්වැල ඔබතුමා සපයනවා. මොකද, ඔබතුමා කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඒක දියුණු කරන්න, මේ අදහසත් එක්ක විශාල වැඩ කොටසක් කරනවා. කාලෙකදී කර්මාන්ත අසරණ වෙලා තිබුණා. මට මතකයි 77 මට රස්සාව නැති වෙලත් මම ජීවත් වුණේ, මැහුම් කර්මාන්තයෙන්. හැබැයි, කාලයක් යනකොට අසූගණන් එනකොට අපේ රටට නොයෙකුත් විදේශ රටවලින් මැහුම්, එම්බ්‍රොයිඩර් කරපු ඇඳුම් මේ වාගේ දේවල් එනකොට අපි හරි අසරණ වුණා. අපේ වෙළඳ පොළ නැති වුණා. අපේ තියෙන හයියට, අපි ඒවා කරගෙන ගියා මිසක් අපට ශක්තියක් තිබුණේ නැහැ, නියම ආකාරයෙන් පෙර වාගේ ඒවා කරගෙන යන්න. මොකද, විදේශ වෙළඳ පොළත් එක්ක සටන් කරනවා කියන එක එපමණ පහසු දෙයක් වුණේ නැහැ. නමුත් මේ වනකොට තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශයෙන් කර්මාන්තකරුවන්ට දෙන හයිය, තමන් උපන් රටේ ශක්තිමත් මිනිස්සු හැටියට, ශක්තිමත් ව්‍යවසායකයින් හැටියට ඒ අයට වැඩ කරන්න ලොකු හයියක් වෙලා තියෙනවා. අපි දකිනවා, ඒ අය කර්මාන්ත පුහුණු වෙනවා. කර්මාන්ත පුහුණු වෙලා එළියට යනකොට ඒ අයට වැඩ කරන්න ඕනෑ ඒ ආයුධ කට්ටල් ලැබෙනවා. ඒවා පටන් අරන් කර ගෙන යන්න ඔවුන්ට ඒකෙන් ලොකු ශක්තියක් ලැබෙනවා. බැංකුවලින් ණය ආධාර ගන්න පුළුවන්කම තියෙනවා. ඒ වාගේම ඒ අයව ධෛර්යමත් කරන්න, ඒ අයට වෙළඳ පොළ හොයා දෙන්න ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ලොකු කාර්ය භාරයක් කෙරෙනවා. මොකද කර්මාන්තකරුවාට වෙළඳ පොළ නැත්නම් කොයි තරම් ඉහළ මට්ටමකින් ඒවා නිෂ්පාදනය කළත් වැඩක් නැහැ. ඒකේ දුක අපි හොඳට දන්නවා. අපි හදන භාණ්ඩවලට වෙළඳ පොළ නැතිව ගෙවල්වල ගොඩගහගෙන ඉන්න වුණොත්, සමහර වෙලාවට අපේ ජීවිතයවත් රැකෙන්නේ නැති තත්ත්වයන් ඇති වෙලා තියෙනවා. මිනිස්සු ඒ වාගේ වනකොට ජීවිතය අහිමි කර ගන්න තරම් පෙළඹෙන අවස්ථා තියෙනවා. නමුත් අද ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ලොකු ධෛර්යයක් ඒ අයට ලබා දෙනවා . මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ හොඳින් ඒ වැඩ කරන අයට රත්තරන් පවුමෙන් පවා ශක්තිමත් කරන්න කටයුතු කරලා තියෙනවා. ඒ ඇගයීම මම හිතන්නේ, ඒ අයව බොහොම ශක්තියෙන් ඉදිරියට තල්ලු කරන දෙයක් බවට පත් වෙනවා.

ඒ වාගේම හැම වර්ෂයකම ප්‍රදර්ශන තියෙනවා. මේ ප්‍රදර්ශන බලන්න එන අය ඒ දේශීය දේවල්වලට ඇලුම් කරලා ඒවා ලබා ගන්න උත්සහ කරනවා. අලුත් පිරිසකට මේ සඳහා යොමු වෙන්න කැමැත්ත ඇති වෙනවා. ඒ වාගේම අමාත්‍යාංශ යටතේ තියෙන පුහුණුවීම්වලට හොඳින් සහභාගී වෙලා කැමැත්ත බොහොම පහසුවෙන් ඉටු කරගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම වෙළඳ පොළ ලබා දීමේදී මම ඔබතුමාගෙන් ඉල්ලනවා - ඒක ඉතාම වටිනා කාර්යයක්. මම හිතන්නේ, බස්නාහිර පළාත පුරා ක්‍රාෆ්ට් ලංකා වෙළඳ කුටි 12 ක් 15 ක් විතර තියෙනවා. ගුවන්

තොටුපළේ පවා තිබෙනවා. නමුත් ඒ තත්ත්වය ගමට ගෙනියනවා නම් ප්‍රාදේශීය සභා, නගර සභා එක්ක කථා කරලා වෙළඳ කුටි ඒ ප්‍රදේශවලටත් ලබා දෙනවා නම් අවුරුදු පතා මේවා පුහුණු වෙලා එළියට යන අයට තමන්ගේ ගමෙන් වැඩේ පටන් ගන්න පුළුවන්. ඊට පස්සේ ඒ අය එතැන වැඩ කරන ගමන් ඒ කර්මාන්තයේ ප්‍රවීණයන් බවට පත් වනකොට ඒ අයට අවට නගරවලට, ක්‍රාෆ්ට් ලංකා වෙළඳ පොළවල්වලට සපයන්න පුළුවන්. එතැනින් නවතින්නේ නැතුව ඒවා විදේශීය රටවලට යවන්න තමුන්නාන්සේට ශක්තිය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. මොකද, අපේ අත්යන්ත්‍ර රෙදිපිළිවලට ලෝකයේ ලොකු අවස්ථාවක් තිබෙනවා. පසුගිය කාලයේ ඒක වැටිලා තිබුණේ. විගණන විමසුම් කරන කොට අපි දැක්කා, කොයි තරම් අප්‍රසන්න තත්ත්වයක්ද කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳව තිබුණේ කියලා. නමුත් අද කර්මාන්ත අමාත්‍යාංශය ලාභ ගෙනෙන තත්ත්වයකට තමුන්නාන්සේට පත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදකයින්ට නූල් නොතිබුණු නිසා, අතීතයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ වනිතාවන් එකතු වෙලා කරපු මහිලා සමිතිවලින් පවා ඒ කර්මාන්තයට ශක්තියක් තිබුණා. නමුත් පසු කාලයේදී මේක නැතුව ගියා. නමුත් දැන් අලුත් නවෝදයක් මේ පිළිබඳව රැගෙන ඒම ගැනත් ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා පළාත් සභා ඇමැතිවරයකු නොවෙයි, මහ ආණ්ඩුවේ ඇමැතිවරයකුගේ තත්ත්වයට දියුණු වෙන්නට ශක්තිය ලැබේවා. ඒ තුළින් රටට සේවයක් කරන්න ඔබතුමාට ශක්තිය වාසනාව ලැබේවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක් නියමිතව තිබෙනවා.

[අ.භා. 01.00]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, - (බාධා කිරීම්) මම නැගිටිද්දිත් මේගොල්ලන්ට කකියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔබතුමාගේ ආසනයට යන්න. දැන් මූලාසනයට වැඩි ප්‍රශ්නයක්ව තිබෙන්නේ, ආසනයේ නොඉඳ සිදු කරන බාධා කිරීම්වලටයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා කාලය ලබා දීම ගැන. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සියලු දෙනාටම මීට අවුරුදු පහකට ආසන්න කාලයකට පමණ පෙර යම්කිසි ජනවරමක් ලබා දුන්නා, මේ පළාත් සභාව නියෝජනය කරන්න. ඒ අනුව අපේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාව ආණ්ඩු පක්ෂයටත්, මාව විපක්ෂයටත් පත් කරලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මට ඡන්දය දුන් ජනතාව බලාපොරොත්තු වන රාජකාරිය මම හරියට ඉටු කළාය කියලා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට, ඇමතිවරයෙක් හැටියට අපේ උදය ගම්මන්පිල අමාත්‍යතුමාට ඒ ලබා දුන් ජනවරමට අනුව එතුමා හිතට එකඟව, අවංක පුද්ගලයෙක් විධියට තමන්ට ලැබිලා තිබෙන ප්‍රතිපාදන අනුව, ඒ මුදල් අනුව විශිෂ්ට සේවාවක් කළාය කියලා මම විශ්වාස කරනවා. මම මේක කියන්නේ, සමහරු හිතයි එතුමා එක්ක මගේ මොනවා හරි යාළුකමක්, මිත්‍රකමක්, සම්බන්ධයක් තිබෙනවාය කියලා. දැන් මේ පළාත් සභාව පටන් ගත්ත ගමන්ම එතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ අත්තිවාරම හොඳට කළු ගල්වලින්, සිමෙන්තිවලින් බැඳලා තිබෙන අත්තිවාරමක්. මම වීදුරු ගෙදරක නොවෙයි ඉන්නේ. ඒ නිසා මට ගල් ගහන කට්ටියට ගල් ගහන්න පුළුවන්. හොඳ කියන කට්ටියට හොඳ කියන්න මට ඒ ආත්ම ශක්තිය තිබෙනවා. ඒ නිසා ඒ විශ්වාස භංග යෝජනාව ගෙනෙන වෙලාවේ මම කිව්වා, අපි විපක්ෂයක් හැටියට මේක අපේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාට අනවශ්‍ය ප්‍රසිද්ධියක් දෙන වැඩක් කරන්න හදන්නේ. ඒ නිසා මේක කරන්න එපාය කියලා. ඒ ගෙනාපු කට්ටියගෙන් සමහර අය ඒකට විරුද්ධව කථා කරන්න බැහැයි කිව්වා. ඇයි කියලා මම ඇහුවාම සමහර අය කිව්වා, අපේ බෞද්ධ ඡන්ද පදනමට හානියක් වෙනවාය කියලා. අන්න ඒ නිසා තමයි මම එදා

[ ගරු ශ්‍රීනාත් පෙරේරා]

තීරණය කළේ, ඒ යෝජනාවේදී ඡන්දය දීමෙන් වැළකී සිටින්න. සමහර අය ඒ ගැනත් නොයෙකුත් ප්‍රචාර ඇරියා, මෙතුමා මාගේ මිත්‍රයෙක් කියලා. එතුමා මිත්‍රයෙක් තමයි. අපි කුඩා කාලයේ ඉඳන් දන්නවා. මගේ සහෝදරයාවත් කුඩා කාලයේ ඉඳන් දන්නවා. ඒක වෙනම කථාවක්. අපි දේශපාලනයට ඇවිල්ලා තිබෙන්නේ, අපට ඡන්දය දුන් ජනතාවගේ ඒ අයිතීන් රැක ගන්නයි. ඒ නිසා සමහර අයට වාසි වන විධියට යෝජනා ගේන්නත්, අවාසි වන නිසා කථා නොකර ඉන්නත් කියන හේතුව නිසා තමයි මම එදා ඒ ඡන්දය දීමෙන් වැළකී සිටියේ. මොකද, එදා මම නවකයෙක් වුණත් මට ශක්තියක් තිබුණා හරි දේ වෙනුවෙන් පෙනී සිටින්න. මම දේශපාලනයේ නවකයෙක් තමයි. නමුත් හරි දේ වෙනුවෙන් පෙනී සිටින්න මට යුතුකමක් තිබුණා. මම අද මේ අවස්ථාවේදී ඒක කියන්න ඕනෑ. අපි ඇවිල්ලා ඉන්නේ විපක්ෂය වෙනුවෙන්. අද අපට පේනවා විපක්ෂයේ කාර්යභාරය ඉටු කරන අය මම හිතන්නේ මේ එක අතකින් පෙන්වන්න පුළුවන්. අතේ ඇඟිලි ගණනෙන්. ඒ ගැන මම ඉතාමත් කනගාටු වෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ අමාත්‍යාංශය ගැන කථා කළොත් මේ අමාත්‍යාංශය හරහා කුඩා දේවල් වුණාට ජනතාවට විශාල ප්‍රයෝජනයක් තිබෙන දේවල් ඉෂ්ට සිද්ධ වෙලා තිබෙනවා. අපේ අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ අපි එතුමාට දීලා තිබෙන ප්‍රමාණය අනුව ජනතාවට දැනෙන සේවයක් කරන්න එතුමාට හැකියාව ලැබිලා තිබෙනවා. එතුමා ඉතාමත් දක්ෂ ඇමතිවරයෙක් හැටියට, නිර්මාණශීලී ඇමතිවරයෙක් හැටියට මම දකින්නේ ඒකයි.

විශේෂයෙන්ම, විශාල චෝදනා මැද අපි ත්‍රීරෝද රථවලට ලබා දුන් මීටර්. ඇත්තටම කිව්වොත් එතුමාගේ විෂය පද්ධතියේ මේක නැහැ. සමහර අමාත්‍යාංශවල, සමහර දෙපාර්තමේන්තුවල වැඩ කරන්නේ, අර චක්‍රලේඛයේ එවලා තිබෙන අකුරටමයි. ඊට එක අකුරක්වත් එහාට යන්නෙත් නැහැ. මෙහාට යන්නෙත් නැහැ. නමුත් ඇමතිවරයෙක් වුණාම සමාජයට සේවාවක් කරන කෙනෙක් වුණාම, ඒ සඳහා ආපු කෙනෙක් වුණාම ඒ ශක්තිය, ධෛර්යය තිබෙන්න ඕනෑ. එතැනින් පොඩ්ඩක් ඔබ්බට ගිහිල්ලා ජනතාවට සේවයක් වෙනවා නම් ඒ සේවය කරන්න ඕනෑ. ඒ හැකියාව තිබෙන, දක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට, ඇමතිවරයෙක් හැටියට තමයි මම එතුමාව දකින්නේ. මම පොතේ බැලුවා. පසුගිය වසරේ උපදේශක කාරක සභාවට මගේ පැමිණීම 82% ක් තිබෙනවා. ඒ වුණත්, අපි මෙපමණ ප්‍රශංසා කළත් අපට ලැබුණේ ඉතාමත් සුළු දෙයක් කියන එකත් මතක් කරන්න ඕනෑ. අපි ලබා දුන් දායකත්වය දිහා බලනකොට. නමුත් අපි කිසිම දෙයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, අපි ඇවිල්ලා තිබෙන්නේ විපක්ෂයෙන්. අපි එක එක දේවල් බෙදා දෙයි කියලා ජනතාව අපෙන් බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. ජනතාව අපේක්ෂා කරන්නේත් නැහැ. නමුත් අපට ඒ සුළු දේ හරි ලැබුණා. අපි ඒ කරපු නියෝජනය අනුව අපට ඒ දේ ලැබුණා. ඒ නිසා අපි ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ දායකත්වය සළකා බලලා ඒ සුළු දේ හරි අපට ලබා දීම ගැන අපි සතුටු වෙනවා. මට ත්‍රී රෝද රථ මීටර් 20 ක් විතර ලැබුණා. ඒ එකකවත් ස්ටිකර් එකක්වත්, නමක්වත් ගහලා නොවෙයි දුන්නේ. මොකද, මේවා ආණ්ඩු පක්ෂයෙන් ලබා දෙන ඒවා හින්දා. මම දුන්නාය කියලා කියන්න මම ස්ටිකර් ගැහුවේ නැහැ. මම දුන්නාය කියන්න, මම කිසිම දෙයක් කළේ නැහැ.

ඒ වාගේම බිඳුණු පුටුවට දැතේ සවිය වැඩ සටහන යටතේ පාසල් දෙකකටත්, පසුගිය වසරේද, ඊට ඉස්සෙල්ලා වසරේද මන්දා අපට දායකත්වය ලබා දුන්නා. ඒකෙත් මම විදුහල්පතිවරයාට කථා කරලා ඒක සම්බන්ධ කරලා දුන්නා මිසක්, ඒ වැඩ සටහන කරන වෙලාවේ මම ඒ පාසලට ගියේ නැහැ. දෙමව්පියන්ව ගේන්න කිව්වෙත් නැහැ. ඒ කිසිම දෙයක් කළේ නැහැ. පාසලේ විදුහල්පතිතුමා කර්මාන්ත අමාත්‍යාංශයේ ඒ නියෝජිතයෝත් එක්ක සම්බන්ධ වෙලා තමයි ඒක කළේ. මේ වාගේ ඉතාමත්ම හොඳ වැඩ සටහන් රාශියක් මේ අමාත්‍යාංශය හරහා කෙරිලා තිබෙනවා.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ. කර්මාන්ත අමාත්‍යාංශය ගත්තාම මම හිතන්නේ, අපට කරන්න පුළුවන් දේවල් තිබුණාට කර්මාන්ත අමාත්‍යාංශය හරහා විශාල වශයෙන් අපට යම් දෙයක් කරන්න ලැබිලා නැහැ. මම දන්න තරමට මේ පළාත් සභාවට අයිති කර්මාන්ත කිහිපයක්ම වැසී ගොස් තිබෙනවා. නමුත් මම වේලාසන කිව්වා වාගේ මේ මුදල් ප්‍රමාණය අනුව කෘෂිකර්මයට යොදවලා තිබෙන ප්‍රමාණයයි මේ ඔක්කොම ගත්තාම අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර හතරක්

විතර තිබෙනවා. ඉතින් මේකට ලැබෙන මුදල් ප්‍රමාණය අනුව කරන්න පුළුවන් සීමාවන්, හැකියාවන් ඉතා සීමිතයි. ඒ නිසා ඒ සීමිත හැකියාව අනුව එතුමා මේ කරලා තිබෙන වැඩ සම්බන්ධව අපේ ස්තූතිය, ගෞරවය එතුමාට මේ අවස්ථාවේදී පුද කරන්නට ඕනෑ.

ඒ එක්කම අපේ කොටකදෙනිය ගරු මන්ත්‍රීතුමා එක කාරණයක් සඳහන් කළා. ඒ ගැනත් මම කිව්වොත් හොඳයි කියලා හිතුවා. අපි කවුරුත් විශ්වාස කරනවා. විශේෂයෙන් මම. අතිගරු ජනාධිපතිතුමා මේ රටේ අවුරුදු 30 ක යුද්ධය, ඒ ත්‍රස්තවාදය නැති කරන්න ඒ ලබා දුන් දායකත්වයට මම හැමදාමත් මේ සභාවේදී ලබා දිය යුතු ගෞරවය ලබා දෙනවා. ඒක එදත් කිව්වා. අදත් කියනවා. ඒක කියන්න භය වෙන්න ඕනැත් නැහැ. හැබැයි, එතුමා කියපු අන්දමට අද මේ ත්‍රස්තවාදයක් නැවත තිබෙනවාය කියලා නැවත වරක් මවා පාන කොටසක් ඉන්නවා. එහෙම වැඩි බහුතරයක් කථා කරන්නේ, මේ ආණ්ඩු පක්ෂයේම අය. හැබැයි, අපි මතක් කරලා දෙන්න ඕනෑ. අද මේ කියන ඩයස්පෝරාව, දෙමළ ත්‍රස්තවාදය මෙහෙයවන, ඩයස්පෝරාව මෙහෙයවපු කට්ටිය අද ඉන්නේ මේ රජයත් එක්ක, මේ ජනාධිපතිතුමාත් එක්ක කියන එක මතක් කරලා දෙන්න ඕනෑ. ඒකට ඉදිරියෙන්ම ඉන්න පුද්ගලයා වන්නේ කුමරන් පද්මනාදන් හෙවත් කේ.පී. නමින් හඳුන්වන පුද්ගලයා. එතුමා තමයි මේ ත්‍රස්තවාදයේ මුදල්, ඒ වාගේම විදේශ රටවල්වල මෙහෙයුම් සියලු දෙයක්ම, ලබා දිය යුතු මූල්‍ය ආධාර, එතකොට ආයුධ ගත්තොත් ඒවා සම්බන්ධව, ඒ සියලු දේ සම්බන්ධව ක්‍රියා කරපු පුද්ගලයා තමයි මේ කේ.පී. කියන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

එයාව අපි පුනරුත්ථාපනය කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩ්ඩක් ඉන්න. අහගන්න. ඔබතුමාට අවස්ථාව ආවම කියන්න. විශේෂයෙන් මම කනගාටු වෙනවා. මේ පුද්ගලයාව දැන් අත් අඩංගුවට අරන් අවුරුදු ගණනාවක් වෙනවා. නමුත් තවම කිසිම චෝදනාවක් නැහැ. මේ පුද්ගලයා තරු පහේ හෝටලයක නැවතිලා ඉන්නේ. ලක්ෂ ගණනක් මාසයට කුළිය ගෙවනවා. නමුත් අද වන කොට කුඩා කුඩා අය, අපි කුඩු සම්බන්ධව ගත්තොත්, මත්ද්‍රව්‍ය සම්බන්ධව ගත්තොත් අර කුඩා කුඩා බට්ටෝ ඉන්න ටික අල්ලනවා නේ? අල්ලලා හිරේ දානවා නේ? මාස හයක් යවනවා. අවුරුද්දක් යවනවා. එහෙමයි නේ? හැබැයි, අර ලොකු කට්ටිය තවම මේකෙන් බේරිලා ඉන්නවා. ඒ ගැන අපි ඉතාමත් කනගාටු වෙනවා. විශේෂයෙන්ම ත්‍රස්තවාදය ගැන කථා කරද්දී මම හිතන්නේ, අපි කවුරුත් සතුටු වෙනවා. මේ ත්‍රස්තවාදය අද යුධමය වශයෙන් පරාජය කරලා තිබෙන එක ගැන අපි සතුටු වෙනවා. නමුත් අපට සතුටු වෙන්න බැහැ, ඉදිරි අනාගතයේ එන්න තිබෙන ත්‍රස්තවාදය වළක්වන්න අවශ්‍ය පියවර මේ රජය විසින් අරන් තිබෙනවාය කියන එක ගැන අපට සතුටු වෙන්න බැහැ. ඒ මොකද, අපි මෑතකදී දැක්කා - අර සිරිකොත ගැන කථා කළා. සමහර කට්ටිය බෝඩ් අල්ලාගෙන හිටියා. අරන්තලාවේ භික්ෂු ඝාතනය ගැනත් බෝඩ් අල්ලාගෙන හිටියා. පින්තූර දාලා. නමුත් ඒගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා, මේ අරන්තලාවේ භික්ෂු ඝාතනය කළේ කවුද කියලා. ඒ කරපු කට්ටිය, කරුණා අම්මාන්ලා, පිල්ලෙයාන්ලා, අද මේ රජයත් එක්ක එකතු වෙලා ඉන්නේ. ඒගොල්ලන්ට කිසිම චෝදනාවක් නැහැ. හැබැයි, සිරිකොත ඉස්සරහාට ඇවිල්ලා මේ බෝඩ් එක ලජ්ජාවක් නැතිව අල්ලා ගෙන ඉන්නවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පුනරුත්ථාපනය වෙලා ඒ ඉන්නේ. ඕගොල්ලෝ තමයි සිරිකොතේ ගෙනැල්ලා රෙද්ද අස්සේ දා ගත්තේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ රට පාවා දීපු එවුන් රෙද්ද අස්සේ දා ගත්තා සිරිකොතේ ගෙනැල්ලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය කථා කරන්නේ පාවා දීපු අය - ඔබතුමන්ලා කථා කරද්දී සමස්තයක් පාවා දුන්න, භික්ෂූන් වහන්සේලා ඝාතනය කරපු සියලු දෙනා ගැනම කථා කරන්න. කේ.පී. ලා, කරුණා අම්මාන්ලා, පිල්ලෙයාන්ලා

[ ගරු ශ්‍රීනාත් පෙරේරා]

ඒගොල්ලෝ ගැනත් කථා කරන්න. හැබැයි, ඒගොල්ලන්ට සමාව දීලා, හෝටල්වල දාලා, ඇමතිකම් දීලා කට වහගෙන හිටියාට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කවුරු හරි බෝඩ් එකක් අල්ලාගෙන හිටියොත් ඒකට විරුද්ධව කෑ ගහනවා. ඉතින් ඒක තමයි දෙබිඩි පිළිවෙත කියන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා මේ කාලය ලබා දීම ගැන. විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට මීට වඩා විශාල දෙයක් කරන්න පුළුවන් දක්ෂ ඇමතිවරයෙක් හැටියට තමයි අපි දකින්නේ. ඒ නිසා එතුමාට පාර්ලිමේන්තුවට යන්න අවස්ථාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. ඔබ සියලු දෙනාටම සුභ නත්තලක් හා සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාටත්. අපි ඊළඟ පාර මේ පළාත් සභාවේ ඉදිරිද දන්නේ නැහැ. ඒ වරම තිබෙන්නේ, ජනතාව අතේ. අපි ඒ විශ්වාසය තියාගෙන සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව දිවා විවේකය සඳහා කල් තබනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.10 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Committee of the Whole Council Suspended and, it resumed at 02.10 p.m. with Hon. Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විකුම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 02.11]

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ගරු සභාපතිතුමනි, අපේ කෘෂිකර්ම ඇමතිතුමාගේ වැය ශීර්ෂයේදී කථා කරන කොට හුඟක් අය අමතක කරපු කරුණක් තමයි රණවිරු පුණ්‍යානුමෝදනා වැඩ සටහන. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මෙය රේඛීය අමාත්‍යාංශයට අයිති විෂයයක් වුණාට, එතුමා කොහොම හරි මේ රණවිරු පුණ්‍යානුමෝදනා වැඩ සටහන යටතේ රණවිරුවන්ටත් වඩාත් සේවයක් කළා. උත්සව තුනක් පැවැත්වුවා. රණවිරුවන්ට පිං තකා, රෝද පුටු, ඒ ආශ්‍රිත ගොඩාක් දේවල් ලබා දුන්නා. පළමුවෙන්ම ඒ ගැන මම මතක් කරනවා, ඒ රණවිරු පුණ්‍යානුමෝදනා වැඩ සටහන යටතේ රණවිරුවන්ව අමතක නොකරපු ඇමතිවරයෙක් හැටියට. හැබැයි, ඒකට හුඟාක් බලපාන්න ඇති. එතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී හැටියට කටයුතු කරන්නේත් රණවිරුවෙක්. 1985 දී අපි දෙන්නා ජාතික රෝහලේ එක ළඟ ඇඳන් දෙකක හිටියේ. එතුමාත් ආබාධිත රණවිරුවෙක්. විශේෂ කාර්ය බලකායේ හිටියේ. අපේ සුනිමල් ජනනන්දන පෙරේරා මැතිතුමා. එතුමා රණවිරුවෙක් හැටියට ආබාධිත වෙලා මාත් සමගම රෝහලේ හිටියා. ඒ නිසා එතුමා තමයි ගරු ඇමතිතුමාට දැවැන්ත සහයෝගයක් වෙන්න ඇත්තේ. රණවිරුවෝ අමතක කරන්න එපා කියන එකට - එදා ඇත්ත වශයෙන්ම මම දැක්කා. මම වැඩ සටහන් දෙකකට සම්බන්ධ වුණා. එකක් මහරගම. එකක් කැස්බෑව. නුගේගොඩ එකට මට සම්බන්ධ වෙන්න ලැබුණේ නැහැ. ආරක්ෂක ලේකම්තුමා, අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගෙනැල්ලා රණවිරුවන් වෙනුවෙන් විශිෂ්ට වැඩ සටහනක් මෙහෙයෙව්වා. පළාත් සභාව හැටියට හොඳට ඒ කටයුත්ත සංවිධානය කිරීම ගැන මම රණවිරුවන් වෙනුවෙන් එතුමාට පුණ්‍යානුමෝදනා කරනවා. විශේෂයෙන්ම රණවිරු පුණ්‍යානුමෝදනා කළා වාගේම එතුමාටත් පුණ්‍යානුමෝදනා කරනවා. එතුමා ඒ කරපු දෙයට කෘතගුණ සැලකීම පිළිබඳව.

ඒ වාගේම මට තිබෙන්නේ, පරිසර විෂය. පරිසර විෂය තුළ අපි බොහොම සතුටුයි කියන්න. එතුමා ජාත්‍යන්තර මට්ටමේ වැඩ සටහන් මෙහෙව්වා. අපි දන්නවා. අපේ මිහිකත දිනය. මිහිකත හෝරාව. අපි සෑම කෙනෙක්ම

සහභාගී වුණා. මහනුවර ජනාධිපති මන්දිරයේ වැඩ සටහන. ඒ වාගේම පසුගිය කාලයේ අපේ පරිසර ඇමැතිතුමා සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු කෝට්ටේ වැඩ සටහන. ඉතාම වැදගත් විධියට ඒ වැඩ සටහන කරලා තිබුණා. ඒක ජාත්‍යන්තරයට යන්න පුළුවන් විධියට, හොඳ ජාතික වැඩ සටහනක් හැටියට තිබුණා. කිසිම පළාත් සභාවකට කරන්න බැරි වුණු වැඩක්. ජාතික වශයෙන් වැදගත් වැඩ සටහනක්. ඒ පරිසර දින, ඒ මීහිකත හෝරාව සැමරීම සංවිධානය කරලා ලොකු ගෞරවයක් පළාත් සභාවට ලබා දුන්නා. ඒ පිළිබඳව අපි කෘතඥ වෙනවා. ඒ වාගේම විපක්ෂයෙන් හැමදාම කථා කරනවා, විදුලි බිල වැඩියි කියලා. ගොඩාක් විවේචන තිබුණාට, එතුමා ඒ වැඩ සටහනත් කළා. CFL බල්බ්, ප්‍රතිදීප්ති විදුලි පහන් ලබා දීම. ඒ නිසා ඒවා තුළදී එතුමා දැවැන්ත කාර්ය භාරයක් කළා. මොකද, විදුලිබිල අඩු කර ගන්න. අපටත් වැඩ සටහන් බොහොමයක් ලැබිලා තිබුණා. අපි බොහොම සතුටු වෙනවා. ඉතා විශිෂ්ට ආකාරයෙන් ග්‍රාමීය වශයෙන් තිබෙන අපේ ප්‍රදේශවලටත්, ඒ වාගේ දේවල්වලට ජනතාව යොමු කරලා - CFL බල්බ් දැකලාවත් නැති තැන් තිබුණා. අගලවත්ත වාගේ තැන්වලට අපි දුන්නා. ඒ තැන්වල මේ CFL බල්බ් දැකලා වත් නැති අය හිටියා. හොඳ වැඩ සටහනක් කළා. ඒකට යෙදුණු ඒ නියෝජිතයෝ සියලු දෙනාම ජනතාවට හොඳ දැනුවත් භාවයක් ඇති කළා. ඔවුන් ඒ පින්තූර මාර්ගයෙන් විශිෂ්ට කාර්යභාරයක් කළා. ඒ ගැන විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම මීහිකත රූ රැජින පැමිණීම තුළින් ඒ ජාත්‍යන්තර අවධානය යොමු කරන්න, ඒ කරපු වැඩ සටහන. ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ. මේ අටවිසි බෝ පැළ වැඩ සටහන. ඉතාම විශිෂ්ට විධියට, බෞද්ධයෝ හැටියට අපට හරිම වටිනා දෙයක්. මටත් පන්සල් දෙකක් ලැබුණා. ඒ තුළ අපි විශාල පිනක් කර ගත්තා. අපි දන්නවා. අපි යම් කාලයක ඒ කටයුත්තේදී අපි යම් පවක් කරලා මේ තත්ත්වයට පත් වුණත්, මම හිතන විධියට අපට පිනක් කර ගන්න අවස්ථාව එතුමා ලබා දුන්නා. ඒ වාගේම ගොඩක් ගැටළුවලට විසඳුම් ලබා දෙන්න හැකි වුණා. ඒ වාගේම අපට ආධ්‍යාත්මික සුවයක් ලබන්න අවස්ථාවක් ලබා දුන්නා.

ඒ වාගේම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අපේ පානදුර ශාන්ත අන්තෝනි බාලිකාව මැදින් තමයි මුළු නගරයේම කුණු කාණුව යන්නේ. මේක හැමදාම උතුරලා ගිහිල්ලා ලොකු පරිසර ගැටළුවකට මුහුණ දුන්නා. එතුමා මුදල් දීලා, සම්පූර්ණයෙන්ම එය අපට හදලා දුන්නා. අපි බොහෝමත්ම ස්තුතිවන්ත වෙනවා. දැනටත් මම හිතනවා, අපේ නගරාධිපතිතුමාට ලබා දීලා තිබෙනවා, තවත් කාණු පද්ධතියක් ගොඩ නගන්න. අපි බොහොම ස්තුතිවන්ත වෙනවා. අපේ පළාත් පාලන ආයතනවලටත් ඔබතුමා දැක්වූ සහයෝගය පිළිබඳව. කළුතර දිස්ත්‍රික්කයේ.

ඒ වාගේම විශේෂයෙන්ම වචනයක් කියන්න ඕනෑ. ඔබතුමා මට ලබා දුන්නා, කර්මාන්ත අධිකාරිය හරහා ව්‍යාපෘතියක්. විශේෂයෙන්ම අපේ මායිමේ තිබෙන සියලුම ගම්මානයන් තිබෙන්නේ කොහු කර්මාන්තය පිළිබඳව. පෝද්දරමුල්ල, පොතුපිටිය ප්‍රදේශ විශාල දායකත්වයක් දක්වනවා. අපට ඇත්ත වශයෙන්ම ඔබතුමා ව්‍යාපෘතියක් ලබා දුන්නා. කොහු මැෂින් ලබා දීම. ඇත්ත වශයෙන්ම ඒකේ ඉදිරි කොටස තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

අනේ සමාවෙන්න. මට මේක කියන්නම ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. කාලය ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඒ නිසා එම ව්‍යාපෘතිය ඉදිරියටත් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ සටහනක් හදන්නය කියලා ඉල්ලමින්, කාලය අවසන් වන නිසා අවසාන කථාව නිසා මේ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. මොකද, මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. මම මේකේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස්සේ කියන්න. දැන් කියන්න බැහැ.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ඉන්න, රෝද පුටුවෙන් ගමන් කරන එකම මන්ත්‍රීවරයා පස්වන පළාත් සභාවේ අවසාන කථාව මේ. සමාවෙන්න.

[ ගරු විකුම් ගුණසේකර]

ඔබතුමා ඇතුළු ඔබතුමාගේ කාර්ය මණ්ඩලයට ස්තුති කරන්නට ඕනෑ. මේ පෙරෙයිදා විදුලිය විසන්ධි වූ වෙලාවේත් කෑමට යන්න මාව ඔවුන් උස්සා ගෙන ගියා. මම ඒවා අගය කරන්න ඕනෑ. මම බොහොම සතුටු වෙනවා. ඒ සියලු දෙනාටම, ඒ වාගේම අමාත්‍යාංශවල සියලු දෙනාටම මට දක්වපු සහයෝගය පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, ඔබතුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.18]

**ගරු චන්ද්‍රිකා ගුණවර්ධන සකළසූරිය**
Hon. Chandrika Goonawardhana Sakalasooriya

ගරු සභාපතිතුමනි, පස්වන පළාත් සභාවේ අවසාන අයවැය විවාදයේදී උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ගරු අමාත්‍යතුමාට මගේ ගෞරවනීය ස්තුතිය ප්‍රකාශ කර සිටිනවා. විශේෂයෙන්ම උදය ගම්මන්පිල අමාත්‍යතුමා මව්බිම තුළ සිදු වන දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමය තුළ ජනතාවගේ හදවතට දැනෙන, වඩාත් ඵලදායී, වටිනා වූත්, වැදගත් වූත් දැක්මක් ඇතිව කටයුතු කරන අමාත්‍යවරයෙක් නිසා එම අමාත්‍යාංශ උපදේශක කාරක සභාව නියෝජනය කරමින් අදහස් ප්‍රකාශ කරන්න ලැබීමත් මගේ භාග්‍යයක් කොට සලකනවා. ඒ වාගේම අමාත්‍යතුමා කෙරෙහි මා දැකපු සුවිශේෂී සිදුවීමක් තමයි ඕනෑම මන්ත්‍රීවරයෙක් එතුමා ළඟට ඇවිල්ලා, මන්ත්‍රීවරයකුගේ දුක් ගැනවිල්ලක්, අවශ්‍යතාවයක් කියපු කිසිම මොහොතක එම අවශ්‍යතාවය, එම මන්ත්‍රීවරයා වෙත ඉටු නොකර, ඒක මග හරින්නවත්, පැහැර හරින්නවත් කටයුතු නොකරන, ඉතාමත් වටිනා උතුම් ගුණාංගයක් තිබෙන අමාත්‍යවරයෙක් හැටියට මේ සභාවට මේ අවස්ථාවේදී ඉතාමත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්න කැමැතියි. ඒ වාගේම පළාත් සභාව තුළ එතුමාට ලැබී තිබෙන සියලුම අමාත්‍යාංශවල කාර්යභාරය බලන කොට අපට විශේෂයෙන්ම කථා කරන්න යුතුකමක් සහ වගකීමක් තිබෙනවා. අපේ පාසල්වල කැඩී බිඳී ගිය ඩෙස් බංකු බොහෝ වෙලාවට ශාලාවල ගොඩ ගහලා, නැත්නම් ශාලාවෙන් පිට වැස්සට, අව්වට තෙමෙමින් තිබුණු යුගයක එතුමාගේ බිඳුණු පුටුවට දැතේ සවියක් කියන වැඩ සටහන තුළ රජයට ලොකු ආයෝජනයක් කරලා, දරුවන් වෙනුවෙන් ඒ ඩෙස් බංකු ටික සාදලා, නැවත ඒ දරුවාට පරිහරණය කිරීම සඳහා අවශ්‍ය කාර්යභාරය එතුමාගේ අමාත්‍යාංශයෙන් සිදු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළත් ලොකු ගෞරවයක් එතුමාට ලැබී තිබෙන බව ඉතාමත් සතුටින් මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

ඒ වාගේම එතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරපු හරිත බුබුළු වැඩ සටහන තුළ මා දැකපු දෙයක් තමයි ඒ හරිත බුබුළු මන්ත්‍රීවරුන්ට හරහා ගමට බෙදා දීමේ ක්‍රියාදාමයට වඩා, එතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන් පිරිසක් ඇවිල්ලා ඒ හරිත බුබුළු ලබා ගන්නා මහජනතාව හමු වෙලා ඔවුන්ව දැනුවත් කිරීමේ වැඩ සටහනක් කළා. ඒක ඉතාමත් සාර්ථක වැඩ සටහනක්. එක් නිලධාරී මහත්මයෙක් ආවා. ඇවිල්ලා සියලුම ජනතාව දැනුවත් කළා. විදුලිය අර පරිස්සමින් පාවිච්චි කිරීම තුළින්, මෙම විදුලි බුබුළු පාවිච්චි කිරීම තුළින් ඒ සියලු දෙනාටම විදුලි බිල අවම කිරීම සඳහා මහත් උපයෝගී වන ආකාරයේ වැඩ සටහනක් එතුමාගේ අමාත්‍යාංශය මගින් කටයුතු සිදු කළා. ඒ පිළිබඳවත් අපි එතුමාට මේ අවස්ථාවේ ගෞරවයෙන් පුද කර සිටින්න කැමැතියි.

ඒ වාගේම කර්මාන්ත විෂය යටතේ අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳව කථා කිරීමේදී ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය කොට්ඨාශයේ ජීවත් වන මම, අපේ කොට්ඨාශයේ බොහෝ ගම්මානවල ඈත අතීතයේ සිට අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳව ව්‍යාපාරයක් විධියට කටයුතු කරපු ගම්මාන තිබෙනවා. අතීතයේ ඉතාමත් සාර්ථක ව්‍යාපාරයක් බවට ක්‍රියාත්මක වුණත්, මේ විවෘත ආර්ථිකයත් සමග විදේශීය රෙදිපිළිවලට අපේ රටේ ජනතාව නැඹුරු වීම නිසා දේශීය රෙදිපිළිවලට ඒ ජනතාව අතර තිබුණු ප්‍රසාදය, ඇල්ම බැල්ම නැති වෙලා ගියා. නමුත් වර්තමානය තුළ මෙතුමාගේ නායකත්වයෙන් ඒ අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය නඟා සිටුවීම සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරලා, ඒ ව්‍යාපාරිකයන් දිරිමත් කරලා, ඔවුන්ට අවශ්‍ය කරන මූල්‍යමය ආධාර, උපකාර ලබා දීම තුළ එය නැවුම් ප්‍රබෝධයක් ඇති කිරීමට එතුමාගේ අමාත්‍යාංශය යටතේ කටයුතු කරන්නට ලැබිලා තිබෙනවා. ඒ වාගේම මේ වෙලාවේ සිහිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපි

දිවුලපිටිය කොට්ඨාශයේ ජීවත් වන අය හැටියට, අපේ කොට්ඨාශයේ ජීවත් වන ජනතාවගෙන් එම ව්‍යාපාරය කර ගෙන ගිය වැඩි පිරිසකට, මේ වන කොට ගරු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, පුෂ්පා රාජපක්ෂ මැතිනියගේ ප්‍රධානත්වයෙන්, ලිය අභිමන් කියන වැඩ සටහනක් ක්‍රියාත්මක කරලා, ඒ කාන්තාවන් සඳහා ඒ අවශ්‍ය කරන දැනුම ලබා දීලා, මෝස්තර නිර්මාණ මධ්‍යස්ථානයක් අපේ කොට්ඨාශයේ මරදගහමුල ආරම්භ කරලා, ඒ ව්‍යාපාරිකයන්ට අවශ්‍ය කරන තාක්ෂණික දැනුම, විෂය දැනුම ලබා දෙමින්, ඒ වර්ණ ආදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට නියමිත කාලය අවසන්.

**ගරු චන්ද්‍රිකා ගුණවර්ධන සකළසූරිය**
Hon. Chandrika Goonawardhana Sakalasooriya

බොහොමත්ම ස්තුතියි. ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් තත්පරයක් දෙන්න. ගරු අමාත්‍යතුමාට සුභ පතනවා. මෙවැනි දක්ෂ, නිර්මාණශීලී, ඉදිරි දැක්මක් තිබෙන දේශපාලන නායකයෙක් හැටියට මීටත් වඩා උසස් තැනකට ගිහිල්ලා රට වෙනුවෙන්, සමාජය වෙනුවෙන්, අනාගතය වෙනුවෙන් සේවය කරන්න අවශ්‍ය කරන ශක්තිය ධෛර්යය ලැබේවා. ඒ වාගේම ඒ අමාත්‍ය කාර්ය මණ්ඩලයටත් ඒ ශක්තිය ලැබේවා කියලා සුභ පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.23]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මෙම අයවැය විවාදයේදී කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට සම්බන්ධ වෙන්න ලැබීම පිළිබඳව මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. මම හිතන්නේ මේ වන විට අපි බොහොම ආදරය කරන උදය ගම්මන්පිල අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව අපේ හිතවත් පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා ඉතාමත්ම හොඳින් එතුමාගේ අමාත්‍යාංශයෙන් මෙතෙක් කෙරුණු වැඩ පිළිවෙළ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. මම බලාපොරොත්තු වෙනවා විෂයයන් දෙකක් අදාළ කර ගෙන මේ සභාව ඉදිරියේ මේ අයවැය විවාදයට සම්බන්ධ වෙන්න.

පළමුවන කාරණය තමයි. අපි කළුතර දිස්ත්‍රික්කයේ සොබා කැකුළු අධ්‍යාපනික ප්‍රදර්ශනය පැවැත්වුවා. ඒ අධ්‍යාපනික ප්‍රදර්ශනය අපේ දරුවන්ට මහා දැවැන්ත ශක්තියක් වුණු වැඩ සටහනක්, ව්‍යාපෘතියක් හැටියටයි මම දකින්නේ. මෙහිදී විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා පිළිබඳව. එතුමා අදහස ඉදිරිපත් කරලා, උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාගේ සංකල්පයක් සහ පූර්ණ අනුග්‍රහය, දායකත්වය උඩ තමයි කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ආසනයේ ඥානේස්සර මහා විද්‍යාලයේ මෙම වැඩ සටහන ක්‍රියාත්මක කළේ. අති විශාල දරුවන් සංඛ්‍යාවක් මෙම වැඩ සටහනට, ප්‍රදර්ශනයට සම්බන්ධ වුණා. . විවිධ ආකාරයෙන් ඒ දරුවන්ට දැනුම ලැබුණා වාගේම මම හිතන්නේ ඉතිහාසයේ අමතක නොවන අවස්ථා කිහිපයක් වැඩිහිටියන් හැටියට අපටත් ලැබුණා. මට මතකයි මම සිසු නැණ ප්‍රදීප වැඩ සටහන හරහා ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ කර ගෙන යන කොට, ඒ සෑම සම්මන්ත්‍රණයකදීම මම දරුවන්ගෙන් අහපු කාරණයක් තමයි පුතේ පතල් කර්මාන්තය දන්නවාද කියලා. එහෙම ඇහුවාම මේ සම්මන්ත්‍රණයට ආපු සියලුම දරුවෝ අත ඉස්සුවා. ඒ කර්මාන්තය දන්නවා කියලා. මම ඊළඟට ඇහුවා දුවේ, පුතේ ඔයගොල්ලෝ පතලක් දැකලා තිබෙනවාද කියලා. ගරු සභාපතිතුමනි, එක දරුවෙකුගේ අතක් ඉස්සුණේ නැහැ. ඒ සම්මන්ත්‍රණ මාලාව තුළ. එයට හේතුව තමයි අපේ දරුවන්ට ප්‍රායෝගික දැනුමක් ලබා දීලා තිබුණේ නැහැ, අපේ දෙමව්පියෝ. අම්මලා තාත්තලා දරුවන් එක්ක විනෝද චාරිකා යනවා. අධ්‍යාපන චාරිකා යනවා. හැබැයි, දරුවන්ට අවශ්‍ය කරන දැනුම ප්‍රායෝගික මට්ටමෙන් දෙන්නට ඒ දෙමව්පියන්ට හැකියාවක් ලැබී තිබුණේ නැහැ. නමුත් මේ සොබා කැකුළු අධ්‍යාපනික ප්‍රදර්ශනය තුළ දරුවන්ට ප්‍රායෝගික දැනුම ඉතාම විශාල වශයෙන් ලැබුණා. ඒ නිසා මේ වැඩ සටහනත් එක්ක බේරුවල ආසනය ප්‍රමුඛ කළුතර දිස්ත්‍රික්කයේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල අපට මෙවර ඉහළ දැමීමට හැකියාව ලැබුණා. ඒ නිසා අපි හුඟක් සන්තෝෂ වෙනවා, ගරු අමාත්‍යතුමාට, ඒ වාගේම ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරීන්, මෙවැනි වැඩ සටහනක් බේරුවල ආසනයට ලබා දීලා මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධව මම ස්තුතිය පළ කරනවා.

ඊළඟට මම කථා කරන්නේ විශේෂයෙන්ම හැමදාම බේරුවල ආසනය කිව්වාම කථා කරන්නේ ධීවර

[ ගරු පියල් නිශාන්ත]

කර්මාන්තයයි, සංචාරක කර්මාන්තයයි පිළිබඳව. හැබැයි මහජන නියෝජිතයෝ, එහෙම නැත්නම් දේශපාලන අධිකාරියේ නිලධාරීන් දන්නේ නැහැ. අවබෝධයක් නැහැ. බේරුවල ආසනය කියන්නේ, වැඩි ග්‍රාම සේවා වසම් සංඛ්‍යාවක් තිබෙන, කෘෂිකර්මාන්තයෙන් ජීවත් වන විශාල ජනතාවක් ඉන්න පළාතක් කියලා. ඒ නිසා අපට තිබුණු ප්‍රධාන ගැටළුව තමයි අපේ ඇළ මාර්ග, ඒ වාගේම ගොවි ජනතාවට අවශ්‍ය කරන භෞතික සම්පත් සහ දැනුම අවබෝධය ලබා ගැනීමට විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නට තිබුණු බාධාව මම හිතන්නේ ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළත් එක්ක අපට දියත් කරන්න හම්බ වුණා. ඒ නිසා පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩ සටහන තුළ, පුරන් කුඹුරු රාශියක් අස්වද්දන්න අපට හැකියාව ලැබුණා. ඒ නිසා අද කෘෂිකර්මාන්තය අතින් ශක්තිමත් ආසනයක් බවට අපේ බේරුවල ආසනය පත් වෙලා තිබෙනවා. ඒ වාගේම පාසල් කෘෂි ක්ෂේත්‍රය ගත්තාට පස්සේ අද පාසල් කෘෂි සමාජ පිහිටුවමින්, පුංචි දරුවාගේ ඉඳලා කෘෂිකර්ම ක්ෂේත්‍රයට තිබෙන නැඹුරුව වැඩි කරන්න, කෘෂිකර්ම ක්ෂේත්‍රයට තිබෙන ආශාව වැඩි කරන්න මම හිතන්නේ විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව අපට දීර්ඝව කථා කරන්න පුළුවන්. එතුමා පිළිබඳවත් එතුමාගේ සියලුම නිලධාරීන් පිළිබඳවත්. නමුත් කාල වේලාව නැති නිසා ගරු සභාපතිතුමනි, බේරුවල ආසනය ප්‍රමුඛ අපේ අහිංසක ජනතාවට ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය තුළින් ලබා දුන්නු සහයෝගයට අපගේ ගෞරවනීය ප්‍රණාමය, ස්තුතිය පුද කර සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.28]

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව විනාඩි 05 කින් කථා කරන්න බැහැයි කියන අදහස මා තුළ තිබෙනවා. කෙසේ වෙතත් මම හිතන්නේ උදය ගම්මන්පිල කියන්නේ ඉතාමත් ගුණවත්, නැණවත් ඒ වාගේම තමාගේ අමාත්‍යාංශයේ විෂයය පථයට රැඳිලා ඉන්නේ නැතුව, ඒ විෂයය පථයෙන් එහාට ගිහිල්ලා ඉතාමත් නිර්මාණශීලී සේවාවක් මේ බස්නාහිර පළාත් සභාවට සපයපු ඇමැතිවරයෙක් විධියට අපි දකිනවා. සමහර අවස්ථාවල ඉතිහාසයේ බස්නාහිර පළාතේ ජනතාව මේ අමාත්‍යාංශය දිහා බලන්න පුරුදු වෙලා හිටියේ, කිසිම වැඩක් නැති අමාත්‍යාංශයක් විධියට. කෘෂිකර්ම ඇමැතිතුමා කිව්වාම එහෙම වටිනාකමක් තිබුණේ නැහැ. නමුත් පළමු වතාවට කෘෂිකර්ම ඇමැතිතුමා විධියට එක් පැත්තකින් අපේ කෘෂිකර්මාන්තය නඟා සිටුවන්නට අලුත් ව්‍යාපෘති හඳුන්වා දෙන ගමන්, එතුමා ඒ විෂයය පථයට එහා ගිහිල්ලා අපේ සභාවේ අද සාකච්ඡා වුණු ආකාරයට, ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරපු ආකාරයට එතුමා සුවිශේෂ වැඩ කටයුතු රාශියක් කළා. පාසල් දරුවාගේ පටන් මහල්ලා දක්වා. රණවිරුවා, අපේ අඩු ආදායම්ලාභී ත්‍රිරෝද රථ හිමියා, එපමණක් නොවෙයි, මළ ගෙදර, මඟුල් ගෙදර මේ සෑම අවස්ථාවකටම එතුමාගේ අමාත්‍යාංශයේ විෂය පථයෙන් එහාට ගිහිල්ලා සුවිශේෂ කාර්ය භාරයක් ඉටු කරපු ඇමැතිවරයෙක් විධියට අපි දකිනවා.

අපි කොළඹ නගරයේ දේශපාලනය කරන අය විධියට අපට මතකයි, මෙතුමා ගොවි සංවිධානවලට අත් ට්‍රැක්ටර් ලබා දෙනකොට, අපට එහෙම ලබා දීමට හැකියාවක් තිබුණේ නැහැ. කොළඹ නගරයේ එහෙම ගොවියෝ හිටියේ නැහැ. ගොවි සංවිධාන තිබුණේ නැහැ. නමුත් අපි එතුමාගෙන් ඉල්ලීමක් කළා. මොකද, එතුමා හැම අවස්ථාවේම අපට පැහැදිලි කළේ, ගොවියාව ගොවි කර්මාන්තයට යොදවන්න, කෘෂිකර්මාන්තයට යොදවන්න අවශ්‍ය යටිතල පහසුකම් දෙන්නේ නැතුව අපි කථා කරලා වැඩක් නැහැ. ඒ නිසා එතුමා ආදර්ශවත් ඇමැතිවරයෙක් විධියට අත් ට්‍රැක්ටරය බැගින් ලබා දෙන්නට කටයුතු කළා. මම එතුමාගෙන් ඉල්ලීමක් කළා, අපට කොළඹ නගරයේ නැති වුණත් පාදුක්ක ප්‍රදේශයේ ගොවි සංවිධාන තිබෙනවා

කිව්වාම එතුමා කිසිම පැකිලීමකින් තොරව ඒ ගොවි සංවිධානවලට ඒ කටයුත්ත ලබා දෙන්න කටයුතු කළා. ඒත් එක්කම මම හිතන්නේ, අපි විශේෂයෙන්ම දකිනවා ඉතිහාසයේ කවදාවත් නොවුණු ආකාරයට අපේ සාම්ප්‍රදායික කෘෂිකර්මය පිළිබඳව කතිකාවක් එතුමා ආරම්භ කළා. මේක කවදාවත් වුණේ නැහැ. අපේ ඉතිහාසයේ ඉපැරණි කෘෂිකර්ම ක්‍රමවේදයන් පිළිබඳව කතිකාවක් ඇති කරලා එතුමා නැවත සැරයක් ගොවියාගේ ඉපැරණි ක්‍රමවේදවලට අවස්ථාව ලබා දෙන්නට කටයුතු කළා.

එපමණක් නොවෙයි ගරු සභාපතිතුමනි. මෙතුමාගේ සුවිශේෂ කටයුතු රාශිය අතර මා විශේෂයෙන්ම ගරු කරන්නේ, පාසල් පද්ධතිය කේන්ද්‍රගත කරගෙන - අපි හැමදාම විශ්වාස කරනවා වාගේ අපේ සමාජයේ මුදුන් මුල තමයි පාසල් දරුවෝ. එතුමා පාසලට ඇතුළත් වෙලා, පාසලේ බිඳුණු පුටුවට දැතේ සවිය ක්‍රියාත්මක කරන ගමන්, පරිසර හිතකාමී දරු පිරිසක් බිහි කරන්නට එතුමා විශාල වැඩ කටයුතු රාශියක් පාසල් පද්ධතිය හරහා කළා. එපමණක් නොවෙයි ගරු සභාපතිතුමනි. මම හිතන්නේ, එතුමා ඉතාමත් ආදර්ශවත් ඇමැතිවරයෙක්. එතුමා මේ රටේ මහින්ද චින්තනයට අනුව අතිගරු ජනාධිපතිතුමාගේ දේශපාලන වැඩ සටහනට ශක්තියක් දෙන්නට හරිත බුබුළු ව්‍යාපෘතිය ආරම්භ කළා. සමහර විට මේ ව්‍යාපෘතිය ආරම්භ කරනකොට මෙය ආරම්භ කිරීමට හැකියාවක් තිබෙනවාද කියලා යම් යම් කසු කුසුවක් තිබුණත්, යම් අයගේ සැකයක් තිබුණත් ඉතාමත් සාර්ථකව, ඉතාමත් නිහතමානීව තමාගේ විෂයය පථය පමණක් නොවෙයි, තමා කරන්නට යන ඕනෑම කටයුත්තක නිසි දැනුමක් ලබාගෙන කටයුතු කරන ඇමැතිවරයෙක් බව ඉතාමත් ආඩම්බරයෙන් කියනවා.

එතුමාගේ දේශනයට මම දෙපාරක් ඇහුම්කන් දීගෙන හිටියා. හරිත බුබුළු පිළිබඳ වැඩ සටහනේදී අපේ විදුලිය හරියට පිරිමසා ගන්න ඕනෑ ආකාරය, අපේ විදුලි පද්ධතියට අපි මේ ලබා දෙන සහයෝගය පිළිබඳව, විදුලි බුබුළු ලබා ගන්න ජනතාව ඉතාමත් දක්ෂ ලෙස දැනුවත් කරන්නට එතුමා හොඳ දැනුවත්කමින් පැමිණි බව ඉතාමත් ආඩම්බරයෙන් කියනවා. ඒ නිසා අපට හැකියාව ලැබුණා, මහින්ද චින්තන වැඩ සටහනේ එතුමා බලාපොරොත්තු වූ ඉලක්කවලට ගෙනියන්නට. එපමණක් නොවෙයි ගරු සභාපතිතුමනි. මම හිතන්නේ, විශේෂයෙන්ම ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මැටි කෞතුකාගාරයක් ඉදි කරන්නට එතුමා අදහස් කරලා තිබෙනවා. අපේ ඉතිහාසයේ මැටි කර්මාන්තයත් එක්ක බද්ද වෙලා ඉන්න සම්ප්‍රදායක් තිබෙන්නේ. කාටවත්, කිසිම ඇමැතිවරයෙකුට, කිසිම දේශපාලඥයෙකුට පහළ නොවුණු අදහසක් තමයි උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට පහළ වුණේ. ඒ පිළිබඳව අපි අපේ සාම්ප්‍රදායික ගොවියෝ වෙනුවෙන් සහ අපේ සංස්කෘතිය වෙනුවෙන් පළමුවෙන්ම ඔබතුමාට අපේ ගෞරවය ප්‍රණාමය පුද කරනවා, මැටි කෞතුකාගාරයක් ඉදි කිරීමට ඔබතුමාට අදහසක් පහළ වීම පිළිබඳව. ඒත් එක්කම අවසාන වශයෙන් මම කියන්නේ, ඔබතුමා වැඩ නොකළ අංශයක් මේ සභාව තුළ කියැවුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට ඇමැතිතුමාගේ කාලයෙන් තව විනාඩි 03 ක කාලයක් ලබා දෙනවා.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා අපි දන්න ආකාරයට මම අර මුලින් සඳහන් කළා වාගේ තමන්ගේ විෂයය පථයට පමණක් සීමා වෙලා හිටියේ නැහැ. එතුමාට හිතුනොත්, බස්නාහිර පළාත් සභාව තුළ අඩු ආදායම් උපයන ජනතාව නඟා සිටුවන්නට ක්‍රමවේදයක් හදන්නට ඕනෑ කියලා, එතුමා තමාගේ විෂයය පථයෙන් එළියට ගියා. අපි ඒකට දකින හොඳම උදාහරණය තමයි ත්‍රිරෝද රථ සඳහා මනුසවිය, මීටරයක් ලබා දීම. ඒක ඉතාමත් අගය කොට සලකනවා. මම හිතන්නේ, ඒ ලබා දුන්නු මීටරයත් අපි දන්න ඉතාමත් අඩුම මිලකට ලබා දුන්නු මීටරය. ඒ පිළිබඳව ඔබතුමාට අපේ ගෞරවය, ප්‍රණාමය පුද කරනවා. අපේ ප්‍රතිපාදන දාලා සමහර අවස්ථාවල අපට අපේ ප්‍රතිපාදනවලට ලැබෙන ප්‍රතිඵලවලට වඩා, ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් අපට ලැබුණා. එපමණක් නොවෙයි. ඔබතුමාගේ අමාත්‍යාංශයේ සෑම ඒකකයකම, සෑම අංශයකම ඉන්නේ ඉතාමත් දක්ෂ නිලධාරී පිරිසක්. ඉතාමත් නිහතමානී නිලධාරීන් පිරිසක්. ඔවුන් මහජන නියෝජිතයාට ඇහුම්කන් දෙන, මහජන නියෝජිතයාව මහින්ද චින්තනයේ ඉලක්ක කරා ගෙන යන්නට සැලසුම් සකස් කරමින් ක්‍රියාත්මක කරන නිලධාරීන් පිරිසක්.

පළමුවෙන්ම ඔබතුමාටත්, අවසන් වශයෙන් ඔබතුමාටත් අපි ගෞරව කරන්නේ ඔබතුමා මේ රටට අසීමිත ලෙස

[ ගරු දයාකාන්ත පෙරේරා]

ආදරය කරන දේශපාලඥයෙක්. ඔබතුමා මනාපය පස්සේ නොවෙයි, කවදාවත් මනාපය ගන්නට අපත් එක්ක දේශපාලන කටයුතු කළේ නැහැ. ඔබතුමා හැම තිස්සේම රටට, ආගමට, ජාතියට අසීමිත ලෙස ආදරය කරපු නායකයෙක්. ඔබතුමා සමහර වෙලාවට කරන ප්‍රකාශ දිහා බැලුවාම ඔබතුමාගේ තනතුර පිළිබඳව දැඩි අවධානමකට ලක් වෙමින් තමයි එහෙම ප්‍රකාශ කරන්නේ. අපි ආඩම්බර වෙනවා. මොකද, කොළඹ නගරයේ බහුතරයක් වන මුස්ලිම් මන්ත්‍රීවරුන් සමග, බහුතරයක් වන ද්‍රවිඩ මන්ත්‍රීවරුන් සමග කටයුතු කරන්නට මගේ ප්‍රතිපාදන මට මදි වුණා. මොකද, මම මන්ත්‍රීවරයෙක් විධියට කොළඹ නගරයේ ආසන පහේ පන්සල්වලට ඔක්කෝම දාන්න හැකියාව ලැබුණේ නැහැ. කෝවිල්වලට දාන්න හැකියාවක් ලැබුණේ නැහැ. පාසල්වලට දාන්න හැකියාව ලැබුණේ නැහැ. නමුත් ඉතාමත් නිතමානීව ඔබතුමා මගේ දේශපාලන ගමනට විශාල ශක්තියක් ලබා දුන්නා. ඔබතුමා නිතමානීව අපේ ප්‍රතිපාදනවලින් ඉල්ලන ප්‍රමාණයට වඩා ඔබතුමාට අපට ඒ සහයෝගය ලබා දුන්නා. ඒ නිසා ඔබතුමාගේ දේශපාලන ගමන ශක්තිමත් වෙන්නට ඕනෑ. අපි බලාපොරොත්තු වෙනවා ඔබතුමා මේ පළාත් සභාවේ තමාගේ විෂයය පථයට එහා ගිය කැබිනට් ඇමැතිවරයෙකුගේ විෂයය පථය හා සමානව සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කළා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා - අපට විශ්වාසයක් තිබෙනවා කවදා දවසක ඔබතුමා පාර්ලිමේන්තුවේ සුවිශේෂී කැබිනට් ඇමැතිවරයෙක් වෙනවාය කියලා. මේ වනවිට එම ලක්ෂණ ඔබතුමා වෙතින් පහළ වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා අපි අදහන ආගම අනුව බෞද්ධයෙක් විධියට තිසරණ සරණ පිහිට පතමින් - විශේෂයෙන් අපට වැඩිය විපක්ෂයේ අය තමයි ඔබතුමා ගැන -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තවත් මීටර් 100 ක් හම්බ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අනවශ්‍ය වාදවලට පැටලෙන්න එපා. දැන් කාලය අවසන්.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

තවත් විනාඩියක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, මම මේ කියන්නට අදහස් කළේ - මේ මීටර් කථාව මෙතරම් ජනප්‍රියයි කියලා මම දන්නවා නම්, විපක්ෂයට මෙතරම් මීටර් අවශ්‍යයි කියලා දන්නවා නම්, මීටර් දෙන හැම ඇමැතිවරයා පිළිබඳවම විපක්ෂය පුන පුනා හොඳ කියයි. නමුත් මම හිතන්නේ අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විතරයි ලැබුණු මීටර් 20 ට හොඳයි කියලා කිව්වේ. තව 20 ක් ගන්න තමයි මේ කථාව කළේ කියලා ඉතාමත් නිහතමානීව එතුමා ප්‍රකාශ කළා. මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා තවත් හොඳ කියන්න. හොඳ කියන තරමට මීටර් ලැබෙයි කියලා. අපි උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාව ඉදිරි වර්ෂ කිහිපය තුළ පාර්ලිමේන්තුවේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මහ ඇමැති කරනවාද?

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

නැහැ, කැබිනට් ඇමැතිවරයෙක්. අපට මහ ඇමැති එක්කෙනයි. ඒ ප්‍රසන්න රණතුංග මැතිතුමා විතරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

බොහොම ස්තුතියි.

[අ.භා. 02.37]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, පස්වන පළාත් සභාවේ අවසාන අයවැය විවාදයට සම්බන්ධ වන මේ මොහොතේදී උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ මේ විවාදය, විවාදයක් නොවෙයි. මට දැනෙන්නේ සංවාදයක් වාගේ. මොකද, මට

ඇහුනේ නැහැ කිසිම කෙනෙක් එතුමා ගැන විවේචනය කරනවා. කිසිම කෙනෙක් එතුමාගේ නරකක් කථා කරනවා. එතුමා අහවල් වැරැදි වැඩේ කෙරුවා කියලා කොහේවත් කියනවා මට ඇහුනේ නැහැ. මම වේලාවක හිතුවා වෙලාව අඩු වේගෙන, අඩු වේගෙන යනකොට නැඟිටලා පක්ෂ විපක්ෂ සියලු දෙනාම කියපු දේ සත්‍යයයි කියලා නිකම් අත්සනක් දාලා වාඩි වෙන්නද කියලා. ඒ තරම් විවාදයට සම්බන්ධ වෙන්න නොවෙයි. ඇත්තටම ඒක සංවාදයක් හැටියට ගියේ. විශේෂයෙන්ම මම කෘෂිකර්මාන්තය ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. පරිසර විෂයය ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. බොහෝ අය ඒ අයගේ අදහස් ඒ අය සම්බන්ධයෙන් ප්‍රකාශ කරපු නිසා.

එතුමාගේ අමාත්‍යාංශ විෂයය පථය යටතේ තිබෙන කර්මාන්ත විෂයය ගැන කථා කරද්දී අපේ සමහර මන්ත්‍රීවරුන්ගෙන් අදහසක් ආවා, අද දේශීය කර්මාන්තය දවසින් දවස ආපස්සට යන කාල වකවානුවක් තිබෙන්නේ කියන එක. විශේෂයෙන්ම අත්‍යන්ත්‍ර රෙදිපිළි සහ අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය ගැන කථා කරනකොට මට වෙලාවකට හිතුනා කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමාට එහෙම කථා කරන්න සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද කියලා. මොකද, මට මතකයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ රට තුළ අත්‍යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය ස්ථාපනය කරලා, එය දැඩිව සංවර්ධනය කරගෙන ආපු වෙලාවකදී 77 න් පස්සේ ආපු විවෘත ආර්ථිකයත් එක්ක තමයි මේ අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය අඩාල වෙලා ගියේ. නැවත වතාවක් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ අත්‍යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය වැඩි දියුණු කරන වැඩ පිළිවෙළවල් ගණනාවක් ක්‍රියාත්මක කරනවා.

ගරු අමාත්‍යතුමා හැටියට උදය ගම්මන්පිල මැතිතුමා අති දැවැන්ත වැඩ කොටසක් මේ අත්‍යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයත් එක්ක කරනවා. පේෂ කර්මාන්තය ගත්තොත් පේෂ කර්මාන්ත නිෂ්පාදන සහ පුහුණු කිරීම් මධ්‍යස්ථාන 54 ක් බස්නාහිර පළාත් සභාව තුළ ක්‍රියාත්මකයි. ඒ ක්රියාත්මක වන 54 තුළින් ඉතාමත් හොඳ නිෂ්පාදන එළියට ගෙන එන්න එතුමා කටයුතු කළා. මම බොහෝ වෙලාවට අත්‍යන්ත්‍ර රෙදිපිළි අදින කෙනෙක්. මට මතකයි මුල් කාලයේ මේ පස්වැනි පළාත් සභාවට කලින් තිබුණු පළාත් සභා කාලයේදී මම හැම වෙලාවකදීම බස්නාහිර පළාත් සභාවේ අපේ පේෂකර්ම මධ්‍යස්ථානවල තිබෙන සාරි තමයි මිලදීගෙන අදින්නේ. ඒ නිෂ්පාදනය වුණු සාරිවල හොඳ ප්‍රමිතියක් තිබුණත් සමහර වෙලාවලට අවශ්‍ය විධියට, වෙළඳ පොළට ගැළපෙන ක්‍රමවේදයක් තුළ සකස් වුණු සාරි තිබුණේ නැහැ. ඒ සාරිවල නිමි වටිනාකම සාමාන්‍යයෙන් රුපියල් 1000 කට 2000 කට එහා ගිය මුදලකට විකුණන්න බැරි වටපිටාවක් තමයි තිබුණේ. හැබැයි අපි හැමෝම කියනවා වාගේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා බොහොම නිර්මාණශීලීව සහ දූරදර්ශීව කල්පනා කරලා, අනෙකුත් පෞද්ගලික ආයතනත් එක්ක තරග කරන්න පුළුවන් ප්‍රමාණයේ නිෂ්පාදන ප්‍රමාණයක් මේ අත්‍යන්ත්‍ර රෙදිපිළි හරහා ගෙන දෙන්න කටයුතු කළා. ඒ වාගේම ඒ සඳහා මාස 06 ක පුහුණුවක් ලබා දුන්නා. පුහුණුවක් ලබන කෙනෙක්ට අත්‍යන්ත්‍ර රෙදිපිළි පිළිබඳව ඕනෑම තැනක වැඩ කරන්න පුළුවන් වන විධියේ වටපිටාවක් එතුමා හදලා දුන්නා.

මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ, අත්‍යන්ත්‍ර රෙදිපිළි ගැන කථා කරනකොට ගම්පහ දිස්ත්‍රික් නායක බැසිල් රාජපක්ෂ මැතිතුමා මීරිගම මැතිවරණ කොට්ඨාශයේ අත්‍යන්ත්‍ර රෙදිපිළි ව්‍යවසායකයන් 70 ක් බිහි කරන්න මේ වනකොට වැඩ පිළිවෙළක් සකස් කරලා දුන්නා. ඒ වැඩ පිළිවෙළ සකස් කරද්දී උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට කථා කරලා, මට මතකයි මම එතුමාගෙන් උදව්වක් ඉල්ලුවා. බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මේ වාගේ වැඩ පිළිවෙළක් යනවා. මේ කාන්තාවන් 70 දෙනා පුහුණු කර ගන්න අපට උදව් කරන්න කියලා මම කිව්වා. ඒ අවස්ථාවේදී උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා ඉතාමත් නිහතමානීව ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙන්න කටයුතු කළා විතරක් නොවෙයි. ඒ අය දෛනිකව වැඩ සටහන්වලට සම්බන්ධ වෙනවාද කියලා හොයලා බලමින් සමහර වෙලාවට මට දූරකථනයෙන් කථා කරපු අවස්ථාවල් තිබුණා.

ඇත්තටම මම දැක්කා, එතුමාගේ 2014 සැලැස්ම තුළ තිබෙනවා, අත්‍යන්ත්‍ර රෙදිපිළි විතරක් නොවෙයි, එතුමා බලාපොරොත්තු වෙනවා අත්‍යන්ත්‍රවලින් පාවහන් නිෂ්පාදනය කරන පුහුණු පාඨමාලාවන් ආරම්භ කරන්න. ගරු ඇමැතිතුමාට මම යෝජනාවක් කරනවා. අද අත්‍යන්ත්‍ර රෙදිපිළි, පාවහන් විතරක් නොවෙයි, ලංකාව තුළ සහ ලෝකයේ හොඳ වෙළඳ පොළක් තිබෙනවා අත්‍යන්ත්‍රවලින් නිෂ්පාදනය කරන Soft Toys එහෙම නැත්නම් විසිතුරු

[ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන]

සතුන්ට. හොඳ වෙළඳ පොළක් තිබෙනවා. අද කුඩා දරුවෙකුට විසිතුරු සතෙකු අරගෙන දෙන්න ගියොත් බොහෝ වෙලාවට බුල් යන විසිතුරු සතුන් අම්මලා මිලදී ගන්නේ නැහැ. ඒ වෙනුවට බොහෝ වෙලාවට ඒ අය පාවිච්චි කරන්න උත්සාහ කරන්නේ බුල් නොයන අත්යන්ත්‍රවලින් නිෂ්පාදනය වුණු විසිතුරු සතුන්. ඒ විසිතුරු සතෙක් මිලදී ගන්න ගියොත් සාමාන්‍යයෙන් රුපියල් 1500 ක 2000 ක වාගේ මුදලක් වැය කරන්න සිද්ධ වෙනවා. ගරු සභාපතිතුමා මගින් මම ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා අපට පුළුවන් නම් ලබන වසරේදී විසිතුරු සතුන් නිෂ්පාදනය කරන වැඩ පිළිවෙළකුත් ආරම්භ කරලා Craft Lanka ආයතනය හරහා මේවා විකුණන්න, වෙළඳ පොළට ඉදිරිපත් කරන්න, ඒ වාගේම පෞද්ගලික ආයතන ඕනෑ තරම් ඉදිරි වෙළඳ පොළ හදාගෙන මේවා මිලදී ගන්න.

විශේෂයෙන්ම Craft Lanka ආයතනය ගැන කථා කරනකොට හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා, රෙදිපිළි විකුණන්න තැන් හොයලා දීලා නැහැයි කියලා. මම එතුමාට කියනවා, මේ වනකොට බස්නාහිර පළාත් සභාව තුළ Craft Lanka ආයතනය හරහා ආයතන 12 ක් ක්‍රියාත්මක වෙනවා. ඔබතුමාටත් අවශ්‍ය නම් ගිහිල්ලා මහරින් රෙදි ටිකක් අරගන්න පුළුවන්. රෙදිපිළි විකුණනවා විතරක් නොවෙයි. ඒ ආයතනවල අවශ්‍ය විධියට මහලා දෙන්නත් උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා (බාධා කිරීමක්) ඇමැතිවරයෙක් හැටියට කටයුතු කරලා තිබෙනවයි කියලා මම ඔබතුමාට මතක් කරනවා. පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ රාජකාරිය හරියට ඉෂ්ට කරනවා නම් ඔබතුමා ඔය ගැන අනිවාර්යයෙන්ම අවධානයෙන් ඉන්න ඕනෑ. ඒත් එක්කම එතැනින් -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

අනේ ගරු මන්ත්‍රීතුමිය එහෙම නොවෙයි කිව්වේ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

එතැනින් ඔබ්බට ගිහිල්ලා කථා කරනවා නම්, එතුමාගේ බිඳුණු පුටුවට දැතේ සවිය කියන වැඩ සටහන මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාව තුළ ක්‍රියාත්මක වුණු වැඩ සටහන්වලින් ඉතාමත් අනර්ඝතම සහ ප්‍රශංසනීය වැඩ සටහනක් හැටියට මම හඳුන්වනවා. මන්ත්‍රීවරියක් හැටියට අපි පාසල්වලට යනකොට වෙනදාට නොදුන්නු ගෞරවයක් අපට ලබා දෙනකොට, අපි ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ වෙක් ටික බෙදන්න යන මොහොතේදී අපේ පාසල්වලින් විදුහල්පතිවරු අපට බොහෝ වෙලාවට කථා කරලා කිව්වේ ඔබතුමිය අපට එවපු කණ්ඩායම හරි හොඳයි. බොහොම මිත්‍රශීලීයි. ඒ අය අපේ පාසලේ තිබුණු සේරම පුටු ටික හදලා ගියේ කියලා. මට මතකයි අපි ඉස්කෝලේ යන කාලේ අපේ ඉස්කෝලේ කැඩුණු පුටු ටික තිබුණේ, එක පන්ති කාමරයක් අස්සේ. නැත්නම් අපේ සංගීත කාමරයේ හරි, නැටුම් කාමරයේ හරි මුල්ලක ගොඩ ගහලා තිබුණේ. අවුරුදු දෙකකට තුනකට සැරයක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් එනවා මේ පුටු ටික ගෙනියන්න. හැබැයි ගෙනියනවා විතරයි. කවදාවත් ඒ පුටු ටික ආපහු ආවේ නැහැ. දැන් මේ බිඳුණු පුටුවට දැතේ සවිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔබතුමා විනාඩියකට කලින් මාව දැනුවත් කළේ නැහැ නේ ගරු සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, දැනුවත් කරන්න අවශ්‍ය නැහැ. විනාඩි 07 යි කියලා ඔබතුමියට මුලින්ම කිව්වා. කාලය දෙන්න අමාරුයි.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, විෂයය භාර ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ පස්වැනි පළාත් සභාව තුළ සුදු අලියෙක් කියලා තිබුණු පළාත් සභා යුගය අවසන් කරලා, මන්ත්‍රීවරුන් හැටියට කෙළින් ඉඳගෙන වැඩ කරන්න අපට අවස්ථාව ලබා දෙමින් අපේ ගෞරවය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන්

නැවතත් මගේ ස්තූතිය පුද කරමින්, ගරු ඇමැතිතුමාට සුභ පතනවා.

[අ.භා. 02.45]

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොමත්ම ස්තූතියි. විශේෂයෙන් උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් හැටියට මෙම අමාත්‍යාංශ උපදේශක කාරක සභාව හොඳින් ක්‍රියාත්මක වන කාරක සභාවක්. අනෙකුත් අමාත්‍යාංශවලට වඩා වැඩිපුර රැස්වීම් පවත්වලා කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒක සඳහන් කරන්න ඕනෑ. ඇමැතිතුමාගේ විෂයය පථයට අමාත්‍යාංශ ගණනාවක් සම්බන්ධ වෙනවා. එයිනුත් එතුමා ප්‍රමුඛතාවය ලබා දීලා තිබෙන්නේ කෘෂිකර්මයට. ඇත්ත කියන්න ඕනෑ. එතුමාට කෘෂිකර්ම විෂයය පිළිබඳව මනා දැනුමක් තිබෙනවා වාගේම, එතුමාට අවශ්‍යතාවයක් තිබෙනවා, ග්‍රාමීය ජනතාවගේ ඒක පුද්ගල ආදායම වැඩි කර ගන්න. ඒ නිසා කෘෂිකර්මයට මුල් තැනක් ලබා දී කටයුතු කිරීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මම කෘෂිකර්මයේදී මතක් කරන්න ඕනෑ, අපේ ප්‍රදේශවල ඇළවල් ගණනාවක් තිබෙනවා. ඒ ඇළවල් ටික විශේෂයෙන්ම සකස් කර ගන්න පුළුවන් නම්, වැසි කාලයේ වතුර ටික රඳවා ගන්න පුළුවන් නම් - ඇල්මන් පීරිස් හිටපු ඇමැතිතුමාගේ ක්‍රමයක් තිබුණා. මට නම අමතක වුණා. ඒ කාලේ එතුමා නිතරම ඉල්ලුවා. වතු ආශ්‍රිතව ඒ වළවල් සකස් කරලා තිබුණාම වැසි කාලයට සෝදාගෙන යන වතුර ටික රැඳුණාම - ඇල්මන් පීරිස් හිටපු ඇමැතිතුමාගේ භූමිසාර ක්‍රමය පොඩ්ඩක් කල්පනා කළා නම් වඩාත් හොඳයි. ඒ වාගේම කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ඉදිරියට යන්න විශාල ගමනක් තිබෙනවා. විශේෂයෙන්ම පළතුරු පිළිබඳව මතක් කරන්න ඕනෑ. අපට සංචාරක ප්‍රදේශයත් එක්ක, විවිධ ජාතීන් ජීවත් වන ප්‍රදේශයක් එක්ක ආර්ථික වශයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු සභාව නිශ්ශබ්ද වෙන්න. එතුමා කියන කිසිම දෙයක් ඇහෙන්නේ නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

සවියක් තිබෙන පළාතක් හැටියට, පළතුරු ගම්මානයක් හෝටල් ආශ්‍රිතව සංචාරකයන්ටත් අනෙකුත් උදවියටත් පළතුරු ගම්මානයක් පිහිටුවන්න පුළුවන් නම් නිෂ්පාදන අලෙවි කර ගන්න අපට අවස්ථාව සලසා දෙන්න ඕනෑ කියන එකයි මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ගොවි මහත්වරුන්ගේ විශ්‍රාම වැටුප නවත්වලා තිබෙනවා. ඊයේ පෙරේදා Budget එකේ නම් කිව්වා දෙනවා කියලා. දීම කොහොමද කියලා මම දන්නේ නැහැ. ඉස්සරත් දෙනවා කියපු දේ ලැබුණේ නැහැ. ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරනවා, ඒ සම්බන්ධයෙන්. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. මට කලින් කථා කරපු මගේ දියණිය හා සමාන ගරු මන්ත්‍රීතුමිය කථා කළේ පේෂ කර්මාන්තය හරියට ඊයේ පෙරේදා ආපු දෙයක් වගෙයි. ඒක එහෙම නොවෙයි. කුවේණිගේ යුගයෙන් ආරම්භ කළේ. කුවේණිගේ කාලයේ පේෂ කර්මාන්තය ආවේ. වරින් වර හිටපු උදවිය ඒක දියුණු කරගෙන ඇවිල්ලා වර්තමාන පළාත් ඇමැතිතුමා ඒ සඳහා සෑහෙන ශක්තියක් දරනවා. ඒක නැහැයි කියලා කියන්නේ නැහැ. ඒ කාලේ පේෂකර්ම ගම්මාන තිබුණා. අසාර්ථක භාවයට පත් වුණා. පේෂකර්ම මධ්‍යස්ථාන බොහොමයක් දැන් වැහිලා තිබෙනවා. ඒවා සංවර්ධනය කරලා හොඳ ප්‍රතිඵලයක් ගන්න ඕනෑ. සීමාසහිත මධ්‍යස්ථාන ගණනාවක අද කරනවා. ඒක නැහැයි කියලා අපි කියන්නේ නැහැ.

ඒ නිසා මේ පේෂ කර්මාන්ත, අත්යන්ත්‍ර රෙදි පිළිවලින් හොඳ නිෂ්පාදනයක් ලබා ගන්න පුළුවන් නම් මම හිතන විධියට දේශීය වශයෙන් නොවෙයි, ඉන්දියාව වාගේ රටවල්වලට අපට අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත යවන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා එකම පැත්තක් නොවෙයි බලන්න ඕනෑ. රටේ ඉතිහාසය දිහා කල්පනා කරලා කථා කළා නම් මීට වඩා හොඳයි කියලා මම හිතනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම කර්මාන්ත පිළිබඳව මතක් කරනකොට මම ගියා, ඔබතුමා පසුගිය දවස්වල අපට ලබා දීපු කොඩි ගන්න. දෙදියවල මැටි කර්මාන්ත ශාලාව අවුරුදු 20 කට වැඩිය පැරණි මැටි කර්මාන්ත ශාලාවක්. ඒ ගිය අවස්ථාවේදී මම දැක්කා සේවකයෝ හතර පස් දෙනෙක් නිකම් ඉන්නේ. අවුරුද්දකට වැඩිය ලයිට් බිල් ගෙවලා තිබුණේ නැහැ. එහි

[ ගරු ඒ.එම්. යූසුෆ්]

තිබුණු පෝරණුව හරියට සකස් කරලා නැහැ. ඒ නිසා එම කර්මාන්ත ශාලාව අඩාල වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම ඒ පිළිබඳව අවධානය යොමු කරනවා. ප්‍රශංසා වාගේම අඩුපාඩු පෙන්වීම අපේ යුතුකමක් තිබෙනවා. ඔබතුමාට ඒ පිළිබඳව අවධානය යොමු කරන ගමන් තවත් කාරණාවක් මතක් කරන්න ඕනෑ. වප්මඟුල් කරනවා. පුරන් වුණු කුඹුරු, මගේ පළාතේ දෙකක් කළා. මම හිතන්නේ, එදා උත්සවයත් එක්ක එක කන්නයක් යනවා. අතරමගදී ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම මේ පිළිබඳව උපදේශක කාරක සභාවේදීත් පෙන්නුම් කළා. විශේෂයෙන්ම දරන වියදමට, විශාල උත්සවයක් කරලා, විශාල වියදමක් දරන නිසා ඔබතුමාට අවස්ථාව ලැබුණොත් ඉදිරි කාලයේදී ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියන එක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම දිවි නැගුම පිළිබඳව මගේ නම් විශ්වාසයක් නැහැ. පැළ බෙදනවා. සැප්තැම්බර් මාසේ ඕනෑ තරම් බෙදනවා. දිවි නැගුම උත්සවය තියලා. පැළවලින් ප්‍රතිඵලයක් ගන්න බැහැ. මම මීට පෙර උපදේශක කාරක සභාවේදීත් කිව්වා. මේවා කොහෙන් ගන්නවාද මම දන්නේ නැහැ. ඊට වඩා හොඳයි ගරු සභාපතිතුමනි, කොම්පෝස්ට් පොහොර සකස් කරන්න ස්වයං රැකියා වැඩ පිළිවෙළක් හැටියට හදලා දෙන්න. ඒවායෙන් ආදායම් ගන්න පුළුවන් ක්‍රමවේදයක් ඇති කරන්න පුළුවන් නම් වඩාත් යෝග්‍යයයි කියන එක මම මතක් කරන්න ඕනෑ. පරිසරය පිළිබඳව ඔබතුමා ඉතාමත් ඕනෑකමින් කටයුතු කරනවා. පරිසරය සඳහා පාසල් මට්ටමේ කෘෂි සංවිධානය පිහිටවෙව්වා වාගේම අපේ උගත් තරුණයෝ ඉන්නවා. ඒ තරුණයන්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමට සම්බන්ධ කරගෙන පරිසර සංවිධානයක් බිහි කරන්න පුළුවන් නම්, පරිසර කණ්ඩායමක් බිහි කරන්න පුළුවන් නම් මේ පිළිබඳව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. එතුමාගේ අවසාන -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

කථාව අවසන් කරනවා. විනාඩියක් දෙන්න. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කාලය පිළිබඳව ගැටළුවක් මතු වන නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට ස්තූතිවන්ත වෙනවා. යම් ගමන් මාර්ගයක් ආවා. ඒ ගමන් මාර්ගය ඉදිරියට ගෙන යන්න මම දන්නේ නැහැ කොයි විධියෙන් ශක්තියක් ලැබෙයිද කියලා. අපි කමිටුවක් හැටියට හිතලා තීරණය කළා. සාකච්ඡා කළා. විශේෂයෙන්ම ඔබතුමා ඇතුළු මාත් එක්ක හිටපු කමිටුවටත් ඒ වාගේම කර්මාන්ත අධිකාරිය, අනෙකුත් අධිකාරීවල නිලධාරී මහත්වරුන් පූර්ණ සහයෝගය ලබා දීලා තිබෙනවා. නැහැයි කියලා කියන්න බැහැ. ඒ අය පිළිබඳවත් මතක් කරන ගමන් මට තව එක විනාඩියක් දෙන්න ගරු සභාපතිතුමනි. මගේ කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. මෙතුමා කියන දේවල් ඇමැතිතුමාට ඇහෙන්නෙත් නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, පසුගිය කාලේ උපදේශක කාරක සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට හිටපු සාමාජික මහත්වරු හොඳ දේ සාකච්ඡා කළා. අපි යම් යම් අඩුපාඩු පෙන්නුම් කළා. අපෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දුන්න බව මම සන්තෝෂයෙන් මතක් කරනවා. එසේ නැතුව අපි මේක විනාශ කරන්න කථා කළේ නැහැ. අපි මේක කඩාකප්පල් කරන්න කථා කළේ නැහැ. සියලුම සේවක මහතුන්ගේ සහයෝගය ලැබුණු බව සන්තෝෂයෙන් මතක් කරමින් කාලය පිළිබඳව මතක් කළ බැවින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 02.53]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, පොදු සාකච්ඡාව ආරම්භ වන අවස්ථාවේදී විපක්ෂයෙන් මතු වුණු එක් කාරණයක් වුණේ, ආණ්ඩු පක්ෂය බඳු අය කරන්නම කටයුතු කරනවා. වෙනත් ආදායම් මාර්ග වැඩි කරලා පළාත් සභාවේ ආදායම වැඩි

කරන්න කටයුතු කරන්නේ නැහැයි කියලා. ගරු සභාපතිතුමනි, ඒ අවස්ථාවේදී මගේ පිළිතුරු කථාවේදී මම කිව්වා, අපි කිසිම බද්දක් වැඩි කරලා නැහැ. නමුත් සෑම දෙපාර්තමේන්තුවකම ආදායම වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. මම කිව්වා, මා යටතේ තිබෙන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේත්, කර්මාන්ත දෙපාර්තමේන්තුවේත් ආදායම සියයට සියයකට වඩා වැඩි වෙලා තිබෙනවා. මා ළඟ ඉලක්කම් නැහැ. මගේ වැය ශීර්ෂයේදී ඉලක්කම් මම සභාවට දෙන්නම් කියලා.

ගරු සභාපතිතුමනි, 2008 වර්ෂයේ කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් අපේ පළාත් භාණ්ඩාගාරයට ලැබුණු ආදායම රුපියල් මිලියන 49.9 යි. ඒක 2013 දී මිලියන 100.3 ක් දක්වා 101% කින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, 2008 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගෙනා රුපියල් මිලියන 2.4 ක ආදායම මිලියන 6.3 දක්වා වර්ධනය වෙලා 163% ක වර්ධනයක් පෙන්නුමක් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මෙම වැය ශීර්ෂ විවාදයේදී ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් මන්ත්‍රීතුමන්ලා අපේ අමාත්‍යාංශයේ කටයුතු, කැපවීම, මහන්සිය පිළිබඳව යම් ඇගයීමක් කළා. ඒ ගැන මම දෙපාර්ශවයේම මන්ත්‍රීතුමන්ලාට මගේ කෘතඥතාව පළ කරනවා.

ගරු සභාපතිතුමනි, මේ දෙපාර්ශවයේම මන්ත්‍රීවරුන් මට මල් මිට මිට ලබා දුන්නා නම් ඒ මල්වල අයිතිකාරයා මම නොවෙයි. ඒ මල් සියල්ලම මම එක පොදියට අරගෙන මගේ නිලධාරීන්ගේ දෙපා පාමුල තියනවා. හැමදාමත් සිද්ධ වුණේ මගේ නම. නිලධාරීන්ගේ හම. මගේ නිලධාරීන්ගේ ශක්තිය මට ලැබුණේ නැත්නම් මට මේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රශංසාව, කීර්තිය ලැබෙන්නේ නැහැ. ඒ නිසා අද මට ලැබුණු ඒ ප්‍රශංසා මල් සියල්ලම මගේ නිලධාරීන් ළඟ තිබෙනවා. මොකද, අපේ නිලධාරීන් රෑ වෙනකල් වැඩ කරද්දී සමහරු අහනවා මොකද, මේ අයට OT තියෙනවාද කියලා. ගරු සභාපතිතුමනි, OT තියා ප්ලේන්ටිවත් නැතුවයි අපේ නිලධාරීන් වැඩ කළේ. ඔබතුමා දන්නවා මම මත්පැන් බොන්නේ නැහැ. සාද දාන්නේ නැහැ. මමවත් අඩුම ගාණේ ප්ලේන්ටියක් අරගෙන දීලා නැහැ මේ කිසිම නිලධාරියෙකුට. ඒක නිසා මේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, ආයතන ප්‍රධානීන් ඇතුළු මේ නිලධාරීන්ට, මේ ගෞරවය මේ කීර්තිය ලැබිය යුතුයි කියන දේ මේ සභාවේදී ඔවුන්ට කරන ගෞරවයක් වශයෙන් මම සඳහන් කරනවා. ඒ වාගේම මේ අවස්ථාවේ අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරන වසර හතරක්ම මගේ අමාත්‍යාංශයේ ලේකම් ධූරය දැරූ එස්.ටී. කොඩිකාර මැතිතුමාවත් මේ අවස්ථාවේදී ඉතාමත් කෘතවේදීව සිහිපත් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම මේ අවස්ථාව පාවිච්චි කරන්නේ හුදෙක්ම ස්තුති කිරීමකට පමණයි. විශේෂයෙන්ම මාගේ කටයුතුවලදී හැමදාමත් මට මඟ පෙන්වමින් අවවාද, අනුශාසනා ලබා දුන්නු ගෞරවනීය මහ සංඝරත්නයටත්, අන්‍යාගමික පූජකතුමන්ලාටත් මා මුලින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ තනතුර මට ලබා දීමට මා කෙරෙහි විශ්වාසය තැබූ අතිගරු ජනාධිපතිතුමාට, ආණ්ඩුකාරතුමාට, ඒ වාගේම සහෝදරයෙක් වාගේ මට දේශපාලනය කියා දෙමින් බොහෝ ප්‍රශ්නවලදී මට මඟ පෙන්වූ ගරු ප්‍රධාන ඇමැතිතුමාට, මගේ සහෝදර අමාත්‍යවරුන්ට, ඒ වාගේම විවේචනාත්මක සහයෝගයක් ලබා දෙමින්, මගේ අඩුපාඩු පෙන්වා දෙමින්, විපක්ෂය මා කෙරෙහි කරන විවේචන මම දකින්නේ, ලබන වසරේ මා වඩාත් සාර්ථක කිරීමට මට කරන උදව් විධියටයි. ඒ නිසා පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මගේ ශක්තිය වර්ධනය කරන්නට සහාය ලබා දුන්න දෙපාර්ශවයේම මන්ත්‍රීතුමන්ලාට මගේ ප්‍රණාමය පුද කරමින්, ඒ වාගේම මේ සභාවේ සිද්ධ වන දේවල් දන්නේ අපි 104 දෙනා විතරයි. අපට උඩින් ඉන්නවා අපේ මාධ්‍යවේදී මිතුරන්. ඔවුන් නිසා තමයි අපි කියන කරන දෑ පිළිබඳව ජාතිය දැනුවත් වෙමින් තමන් ලබා දුන්නු ඡන්දයට මේ මන්ත්‍රීවරුන් සේවය කරනවාය කියන පණිවිඩය ජනතාව අතරට ගෙන යන ඒ මාධ්‍යවේදීන් සියලු දෙනාටත් මගේ ප්‍රණාමය පුද කරනවා. ගරු සභාපතිතුමනි, මගේ වැය ශීර්ෂයේදී කථා කළ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් කිව්වා, මා මේ කථා කරන්නේ පළාත් සභාවේ අවසාන කථාවයි කියලා. ආයිත් ඡන්දය ඉල්ලන්නේ නැහැයි කියලා ඔවුන් ස්වයං තීරණයක් අරගෙන තිබෙනවා - නැහැ, පළාත් සභාවේ කරන අවසාන කථාව. ඔවුන්ගේ විශ්‍රාම දිවියට මම සුභ පතමින් මේ සභාවේ සියලුම මන්ත්‍රීවරුන් යළිත් සභාවේ ඉන්න ඕනෑ. මෙහි විවිධත්වයක් තිබෙන්න ඕනෑ. නිකමට හිතන්න විපක්ෂයෙන් ආපු විවේචන නැති වුණා නම්, මේ ගැටුම් ඇති වුණේ නැත්නම්, මේ අදහස් උණුසුම් වාග් ප්‍රහාර එල්ල වුණේ නැත්නම් මේ සභාවට එන්න කම්මැලි හිතෙන තරමට, අහගෙන ඉන්න එපා වෙන තරමට

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා]

මේ සභාව අප්‍රසන්න තැනක් බවට පත් වෙන්න තිබුණා. සෑම මන්ත්‍රීවරයෙක්ම තමන්ගේ කාර්ය ඉටු කළා. ආණ්ඩු පක්ෂය ආණ්ඩුවේ කාර්යයත්, විපක්ෂය විපක්ෂයේ කාර්යයත් ඉටු කළා. ඒ නිසා අපි හැමෝම ඉදිරි මාස තුන හතර ඇතුළත ජනතාව ඉදිරියට ප්‍රගති වාර්තාව අරගෙන ගොස් පරීක්ෂණයකට මුහුණ දීමට නියමිතයි. මේ සභාවේ සිටින සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා ඒ පරීක්ෂණය සාර්ථකව සමත් වෙලා යළිත් මේ සභාවේදී එකිනෙකා හමු වෙන්න ශක්තිය, ධෛර්ය, වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි.

***ඊට අනුකූලව අ.භා. 02.59 ට, අංක 106, 120, 121 හා 126 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***

*Accordingly discussion on the Expenditure Head Nos 106, 120, 121 and 126 was concluded at 02.59 p.m..*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂ 106,120,121 හා 126 පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ සම්බන්ධව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, බෙදීමක් පවතිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

ශීර්ෂ අංක 106, 120, 121 හා 126 යන වැය ශීර්ෂයන්ට පක්ෂව ඡන්දය දෙන ගරු මන්ත්‍රීවරුන් නැඟී සිටින්න.

හොඳයි අසුන් ගන්න.

එම වැය ශීර්ෂයයන්ට විපක්ෂව ඡන්දය දෙන ගරු මන්ත්‍රීවරුන් නැඟී සිටින්න.

හොඳයි අසුන් ගන්න.

ඡන්දයෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් සිටිනවාද? කිසිවෙකුත් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මොන ගණයටද වැටෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, එතුමා දැන් ඇවිත් සභාවේ වාඩි වුණා.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අපි අහන්නේ ඡන්දය පාවිච්චි කිරීමේ වැළකී සිටියාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඔබතුමන්ලාට අදාළ නැහැ. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතුමා සභාවේ අසුන් අරගෙන තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම තීරණය කියනවා. වාඩි වෙන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අපට කියන්න එතුමා මොන ගණයටද වැටෙන්නේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක දන්නේ නැහැ. කොහොමත් පුරුෂ ගණයට.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පක්ෂද? විපක්ෂද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැවත ඡන්දයකට යමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අසාධාරණ නැහැ. කරුණාකරලා ඔබතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. ගණය වැඩක් නැහැ නේ? ඔබතුමාට අදාළ නැහැ නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එහෙම බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම බැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, නැවත ඡන්දයකට යමු.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු ඇමැතිතුමා නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා ඡන්දය දෙන්න ආවේ නැහැ. ඇමැතිතුමන්ලා වෙලාවට ඡන්දයට එන්න ඕනෑ. ඒක ඔබතුමන්ලාගේ වගකීමක්. මමයි ඒවායෙන් අසීරුතාවයට පත් වෙන්නේ. ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මූලාසනයයි අසීරුතාවයට පත් වෙන්නේ. කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරි මාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 106, 120, 121 හා 126 පිළිබඳව සභාවේ බෙදීමක් ඇති වූ නිසා ඒ පිළිබඳව ඡන්දය විමසීමේදී එම වැය ශීර්ෂයන්ට පක්ෂව ඡන්ද 61 කුත්, විපක්ෂව ඡන්ද 16 කුත්, ඡන්දයෙන් වැළකුණු ගරු මන්ත්‍රීවරු කිසිවෙකු නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඡන්දය වැරැදියි. ඡන්දයෙන් වැළකුණු මන්ත්‍රීවරු කිසිකෙනෙක් නැති වෙන්න විධියක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, මේ සභාවේ සමතුලිත භාවයක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඒ වෙලාවේ හිටියේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ, හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මූලාසනයට අනවශ්‍ය බලපෑම් කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමා කිව්වා -

[සභාවේ ඝෝෂා]

එතුමා සභාවේ හිටියා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම කරන්න පුළුවන්ද? එතුමා පක්ෂද, විපක්ෂද නැත්නම් මන්ද බුද්ධිකද කියලා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩිවෙන්න ඡන්ද ප්‍රතිඵලය කියන්න. අනවශ්‍ය වීරයෝ වෙන්න හදන්න එපා මේ සභාවේ. ගරු මන්ත්‍රීතුමන්ලා මෝඩ ප්‍රකාශ කරන්න එපා. කනගාටු වෙනවා. මේක විහිළුවක් කර ගන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාවේ මන්ත්‍රීවරු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විකාර -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විකාර නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා හැමදාම මෙහෙමයි. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. අතිපණ්ඩිත වෙන්න එපා. 61 (7) රීතිය කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවා.

*"තමන් ඡන්දය දීමෙන් වළකින බව ප්‍රකාශ කිරීමට මන්ත්‍රීවරුන්ට හැකිය. එවැනි අවස්ථාවකදී ඔවුන් ඡන්දය දීමෙන් වැළකී සිටි අය ලෙස ලේකම් විසින් සටහන් කළ යුතුය."*

ඒක පැහැදිලිව කියලා තිබෙනවා. ඒ ගැන ප්‍රකාශ කරන්න අවශ්‍ය නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ කියන්නේ ඡන්දය දීමෙන් වැළකී හිටියා කියන එකද ගරු සභාපතිතුමනි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, එතුමා ඒ වෙලාවේ හිටියේ නැහැ.

[සභාවේ ඝෝෂා]

කැමැත්ත අහන්න එතුමා හිටියේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රීතියෙන් කියපු දේ කරන්න. රීතියේ තිබෙන දේ කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා මට ප්‍රකාශ කළෙත් නැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කියවපු එක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා විකාර කථා කරන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා කියන කථාව -

[සභාවේ ඝෝෂා]

එක ප්‍රශ්නයයි තියෙන්නේ. ඔබතුමා කියන එක අපි පිළිගන්නවා. එතුමා ඡන්දය පාවිච්චි කළාද නැද්ද කියන එක පිළිබඳව ඔබතුමා අපිව දැනුවත් කරන්න. කිව්වම ඇති. සම්පූර්ණ රීතිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට දැනුවත් කරන්න අවශ්‍ය නැහැ. එතුමා ප්‍රකාශ කළේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සම්පූර්ණ රීතිය කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඒක අදාළ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීති පොතේ තිබෙන්නේ එහෙම නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕනෑම මන්ත්‍රීවරයෙකුට ඡන්දය නොදී ඉන්නත් පුළුවන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා සීනුව නාද කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රකාශ කරන්න අවශ්‍ය නැහැ. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. වාඩි වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා අපට තේරුම් කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

සභාව ඇතුළේ දැන් මන්ත්‍රීවරු 77 දෙනෙකුගේ නම් ප්‍රකාශ වුණා. 61 ක් පක්ෂයි. 16 ක් විරුද්ධයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමින් ඡන්දය ගත්තේ නැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

77 යි. නමුත් ඔබතුමාත් එක්ක මේ සභාවේ 79 දෙනෙක් ඉන්නවා. එහෙම නම් එකෙකුට ගිය කලක් තිබෙන්න එපැයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ආයිත් ඡන්දයකට යමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැවත ඡන්දයකට යන්න අවශ්‍ය නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ ඡන්දය අවලංගු ඡන්දයක් විධියටද ගන්නේ?

[සභාවේ ඝෝෂා]

*ඊට අනුකූලව,*

***ශීර්ෂ අංක 106 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 61 යි, විපක්ෂව 16 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***

*The question that the amount indicated in the Head No. 106 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 61 for, 16 against and 00 decliners.*

***ශීර්ෂ අංක 120 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 61 යි, විපක්ෂව 16 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***

*The question that the amount indicated in the Head No. 120 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 61 for, 16 against and 00 decliners.*

***ශීර්ෂ අංක 121 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 61 යි, විපක්ෂව 16 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***

*The question that the amount indicated in the Head No. 121 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 61 for, 16 against and 00 decliners.*

***ශීර්ෂ අංක 126 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 61 යි, විපක්ෂව 16 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුනේය.***

*The question that the amount indicated in the Head No. 126 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 61 for, 16 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ආරාධනා කරනවා 2014 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කරන ලෙසට.

[සභාවේ ඝෝෂා]

# 2014 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය
## THE APPROPRIATION STATUTE RELATING TO THE FINANCIAL STATEMENT - 2014

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, *"2014 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය." යන යෝජනාව යළිත් මා ඉදිරිපත් කරනවා.*

***ඊට අනුකූලව ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Accordingly, the Question proposed again.*

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවා පස්සේ කථා කරන්න. දැන් බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට අපහාස කරනවා. මොලේ නැති කිය කියා.

[සභාවේ ඝෝෂා]

එහෙම කියන්න පුළුවන්ද? වරප්‍රසාද ප්‍රශ්නයක්. 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36 (1) කියලා ඔබතුමා කාලය ගන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, දැන් මට මොළේ ඇති, නැතුවා. එතකොට අර පස්සේ ආපු කෙනා මොන ගණයටද වැටෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගණය මට වැඩක් නැහැ. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට මන්ද බුද්ධික ගණයට වැටෙනවා -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මේ අනවශ්‍ය බාධා කිරීම් නිසා විනාඩි 10 ක්ම ගියා.

[අ.භා. 03.12]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මෙම කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට මුලින්ම ස්තූතිවන්ත වෙනවා. අද මේ සභාවේ කථාවක් කරන්න බලාපොරොත්තුවෙන් නොවෙයි මම ආවේ. නමුත් ඇති වෙලා තිබෙන තත්ත්වය යටතේ කෙටියෙන් හරි යම්කිසි කාරණාවක් දෙකක් ගැන කියන්නට මේ අවස්ථාව උපයෝගී කර ගන්න බලාපොරොත්තු වෙනවා. සමස්තයක් හැටියට මේ රටේ ආර්ථිකය කඩා වැටුණු යුගයක, පළාත් සභාවක් තුළ ආර්ථිකය ශක්තිමත් කිරීම අපහසු දෙයක්. සමස්තයක් හැටියට මුළු රටේම ජනතාවගේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන යුගයකදී -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කොහේද?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒකත් කථා කරන්න දෙන්නේ නැද්ද? බස්නාහිර පළාත් සභාව කිනම් ආකාරයකින් උත්සාහ ගත්තත් ඒ ආර්ථික තත්ත්වය ඉදිරියට ගෙනයෑමේදී සමස්තයක් හැටියට බාධාවක් ඇති වෙනවා. ඒ කෙසේ වෙතත් පළාත් සභා අතරින් ප්‍රධානම පළාත් සභාව වන බස්නාහිර පළාත් සභාවේ අපි අවුරුදු 4 ක් නැත්නම් 4 ½ ක කාලයක් තුළ කළ කාර්යය දිහා හැරිලා බලද්දී මේ රටේ වැඩිම ජනගහනයක් ඉන්න ප්‍රදේශය හැටියට මම විශ්වාස කරන දෙයක් තමයි මේ රටේත් අපේ බස්නාහිර පළාත් සභාව තුළ තිබෙන සම්පත් නිසියාකාරව අපි කළමනාකරණය කරනවා නම්, කළා නම් අපේ බස්නාහිර පළාත් සභාවේ සිටින අයගේ ජීවන තත්ත්වයේ යම් හෝ වෙනස්කමක් ඇති කිරීමට අපට පුළුවන්කමක් තිබුණා කියලා. මම හිතන්නේ අපි හැරිලා බලනකොට අපි ඒ බලාපොරොත්තු වන ප්‍රමාණයේ ප්‍රගතියක් ලැබුණාද කියන එක ගැන මට පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ගැටළුවක් ඇති වෙනවා. මම මුලින් කිව්වා වාගේ රට තුළ සියලු අයගේ ආර්ථිකය කඩා වැටෙන යුගයකදී පළාත් සභාව මගින් පමණක් ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කිරීම කළ නොහැකි දෙයක්. ඒක මම පිළිගන්නවා. ඒ නිසා එම කඩා වැටීමට මේ පළාත් සභාව පූර්ණ වශයෙන් වගකිව යුතු යැයි මා කියා සිටින්නේ නැහැ. නමුත් අපට කළ හැකි සංවර්ධන කටයුතු ප්‍රමාණයක් මේ පළාත් සභාව තුළ තිබුණා.

මම දකින හැටියට අපි මේ අවුරුදු 4 ½ ක කාලය තුළ වැය කළ මුදල්වලින් එදිනෙදා වැඩ කටයුතු කරගෙන යාම සඳහා පුනරාවර්ථන වියදම් හැටියට වැය කළ මුදල හා සැසඳීමේදී සංවර්ධන ව්‍යාපෘති සඳහා, සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා අපි අවශ්‍ය ප්‍රතිශයට මුදලක් වැය කර තිබෙනවාය කියලා සඳහන් කරලා සන්තෝෂ වෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, මම දකින හැටියට එක්තරා ප්‍රමාණයකට මේ පළාත් සභාව තුළ අපට තිබුණු ධන සම්භාරයෙන් ප්‍රමාණයක් නිසි කළමනාකරණයකින් තොරව වැය කෙරුවාය කියන කාරණාව අපට අකමැත්තෙන් හරි පිළිගන්නට සිද්ධ වෙනවා. මම මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා එක කාරණාවක් පිළිබඳව පමණක් විශේෂ අවධානය යොමු කරන්න. ඒක මම කලින් සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව කථා කරනකොට යොමු කරන්න බලාපොරොත්තු වුණු කාරණයක්. බස්නාහිර පළාත තුළ වැඩිහිටියන් එහෙම නැත්නම් ජ්‍යෙෂ්ට පුරවැසියන් 11.5% ක් ඉන්නවා. අවුරුදු 80 දක්වා, නැත්නම් 80 ටත් වඩා වැඩි කාලයක් ජීවත් වීමේ හැකියාව, අද තිබෙන තාක්ෂණය සහ වෛද්‍ය පහසුකම් එක්ක ඇති වෙලා තිබෙන නිසා බස්නාහිර පළාත තුළ 11.5% ක වැඩිහිටි ප්‍රමාණයක් අද ජීවත් වෙනවා. ඒ 11.5 ක ප්‍රතිශතය සඳහා අපි අපෙන් කළ යුතු යුතුකම් නිසියාකාරව ඉෂ්ට කළාද කියන ප්‍රශ්නය මේ අවස්ථාවේදී මතු කරන්නට සිද්ධ වෙනවා.

අද මම දකින හැටියට 10% කට වැඩි වූ අපව මේ තැනට ගොනපු, අපට ශක්තියක් ලබා දීපු මේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන්නට දායකත්වය දුන්නු ඒ වැඩිහිටි පිරිසට පළාත් සභාවක් හැටියට, අපි අඩු ගණනේ අනාගතයේදී විශේෂ සැලකිල්ලක් දැක්වීම කළ යුතුව තිබෙනවා. මා මේකෙන් කියන්නේ අද මේ වැඩිහිටි පරම්පරාව කියන එක අර මම කියපු අවුරුදු 60 ත් 80 ත් අතර තිබෙන ප්‍රමාණයෙන් බහුතරයක් අද බලාගන්න කෙනෙක් නැති, වෛද්‍ය පහසුකම් ලබා ගන්න ක්‍රමයක් නැති, ආර්ථිකමය වශයෙන් ඉතාමත් දුර්වල වුණු තැනකට ඇවිල්ලා තිබෙන යුගයක අපි ඉන්නේ. ගරු සභාපතිතුමනි, මම හිතනවා ඔබතුමන්ලා සියලු දෙනා මා කියන දේ පිළිගනීවි කියලා. අද අවුරුදු 60, 65, 70 ට වැඩි වැඩිහිටියෙක් රෝහලකට ගෙන ගියොත් රෝහල්වල

[ ගරු ශ්‍රීනාත් ම. පෙරේරා]

තිබෙන සම්පත් ප්‍රමාණය සීමිත නිසා ඔවුන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් සලසා දීම වෙනුවට ඔවුන්ව පැත්තකට කොන් කරලා දාලා වෙනත් අයට ඒ තිබෙන පහසුකම්වලින් අවශ්‍ය වෛද්‍ය පහසුකම් සපයන තැනකට අද අපේ රට වැටිලා තිබෙනවා කියන එක කනගාටුවෙන් හරි මට කියන්නට සිද්ධ වෙනවා.

මේ අවස්ථාවේදී ප්‍රධාන වශයෙන් කාරණා දෙකක් විතරයි මතු කරන්නට බලාපොරොත්තු වෙන්නේ. එකක් තමයි අපි අඩු ගාණේ අනාගතයට මේක සැලකිල්ලට ගත යුතු කාරණාවක් හැටියට මට හිතෙනවා. අපි මේ අවුරුද්දකට සැරයක් වැය කරන මුදලින් වැඩි ප්‍රතිශතයක් ප්‍රධාන වශයෙන් සංවර්ධන කටයුතු සඳහා යොමු කිරීමට අපි අධිෂ්ඨාන කර ගත යුතුයි. ඒ අතින් බලද්දී මම කනගාටුවෙන් කියනවා. ගිය අවුරුදු 4 ½ ක කාලය තුළ අපි වැය කළ මුදලින් සංවර්ධන කටයුතු සඳහා වැය කළ යුතු ප්‍රතිශතය, ඒ ආකාරයෙන් වැය කර නැතෙයි කියලා. ඒ නිසා අවුරුදු 4 ½ ක් මේ සභාවේ හිටපු විපක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට අපි හැරිලා බලද්දී අපෙන් මේ බස්නාහිර පළාතට සිදු විය යුතු සේවාව ඒ ආකාරයෙන් සිදු වුණාද කියන එක ගැන මට අද ප්‍රශ්නයක් මතු වෙනවා.

දෙවැනි කාරණය හැටියට මම අර කියපු වැඩිහිටියන්. මේ බස්නාහිර පළාතේ ඉන්න 11.5% ඉක්මවන 2020 වනකොට මේක 20% දක්වා වැඩි වෙනවාය කියලා ගණන් හදලා තිබෙනවා. අන්න ඒ අයට විශේෂ ක්‍රමවේදයක් සකස් කරලා, විශේෂ රෝහල්, වෛද්‍ය අවශ්‍යතාවන්, ආහාර අවශ්‍යතාවන්, අනෙකුත් අවශ්‍යතාවන් පිළිබඳව සොයා බලන්නට හැකි ක්‍රමවේදයක් සකස් කරන අතර, අඩු තරමින් අපේ අතින් නොකෙරුණු මේ කාර්යය අනාගතයේදී මේ පළාත් සභාවට අලුතෙන් පත් වෙලා එන මන්ත්‍රීවරුන් හා ඒ පත් කරනු ලබන කැබිනට් මණ්ඩලය සහ අනෙකුත් අය විසින් මේ කාරණාව පිළිබඳව අවධානය යොමු කරලා ඔවුන්ට දිය යුතු ආරක්ෂණය සහ අනෙකුත් පහසුකම් සැපයීම සඳහා ගිය අවුරුදු 4 ½ දී අපි කළාට වඩා වැඩි ප්‍රමාණවත් ක්‍රමයකින්, සැලැස්මක් අනුව කටයුතු කරනවා ඇතෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

විපක්ෂයත්, ආණ්ඩු පක්ෂයත් අතර විවිධ වූ ගැටීම් ඇති වුණා. නමුත් මම හිතන්නේ අපි මේ අවුරුදු 4 ½ ක කාලය තුළ පුද්ගලයින් හැටියට බොහොම මිත්‍රත්වයෙන් යුක්තව කටයුතු කළා. ඒ පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ඉන්න අපේ මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂයේ සහෝදර මන්ත්‍රීවරුන්ටත් සභාපතිතුමනි, ඔබතුමාටත් ස්තුති කරමින්, ලබන පළාත් සභාවටත් එක්සත් ජාතික පක්ෂයේ වැඩි බහුතර ආසන සංඛ්‍යාවක් සහිතව තමුන්නාන්සේලා සියලු දෙනාටම නැවතත් මේ පළාත් සභාවට එන්නට අවස්ථාව ලැබේ යැයි කියන ප්‍රාර්ථනාව ඇතුව මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති රංජිත් සෝමවංශ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [රංජිත් සෝමවංශ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් නියමිතව තිබෙනවා.

[අ.භා. 03.23]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප සමග විශ්ව විද්‍යාල ජීවිතය ගත කරලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ශිෂ්‍ය සමිති ව්‍යාපාරයේ සිට එහි පුනර්ජීවනය උදෙසා අනූපමේය සේවයක් ඉටු කරපු අපේ සහෝදර රංජිත් සෝමවංශ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනය දරන අවස්ථාවේදී මේ බස්නාහිර පළාත් සභා සැසි වාරයේ අවසාන කථාව පවත්වන්නට ලැබීම මා හිතන්නේ දෛවෝපගත සිද්ධියක් හැටියටයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි බොහොම ගරු කරන අපේ ගුරුතුමා ශ්‍රීනාත් ම. පෙරේරා ජනාධිපති නීතිඥ මන්ත්‍රීතුමා ඉතා අපූරු සිහිනයක් දකිමින් තමයි එතුමාගේ කථාව අවසන් කළේ. අපි පුංචි කාලේ දිව්‍යාලෝකේ යන්න සිහින මැව්වා,

ගමරාළගේ වලිගයේ එල්ලී. එතුමාත් මම හිතන්නේ එක්සත් ජාතික පක්ෂයේ බහුතරයක් ගැන කථා කරන්නේ අර ගමරාළගේ වලිගයේ එල්ලී දිව්‍ය ලෝකයේ යාමට සැරසෙන ගැමියෙක් විධියටයි. කෙසේ වුවත් එතුමා වැදගත් කරුණු කිහිපයක් මේ සභාව තුළ අපේ අවධානයට යොමු කළා. එතුමා නගන මූලික තර්කය තමයි මෙවර අයවැය කථාව තුළ පුනරාවර්ථන වියදම් ඉතාම අධික බවත්, මූලධන වියදම් ඊට සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පවතින බවත්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප උගත් ආර්ථික විද්‍යාව අනුව මූලධන වියදම් පිළිබඳව දැනට කෙරෙන ගණනය කිරීම් කෙතෙක් දුරට යථාර්ථවාදීද කියන කාරණාව ගැඹුරින් සලකා බැලිය යුතුව තිබෙනවා. උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා පොදු සාකච්ඡා වාරයේදී මේ පිළිබඳව ඉතාම ශාස්ත්‍රීය විග්‍රහයක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම නූතන ආර්ථික විද්‍යාඥයන් අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි කාරණා සලකන්නේ මානව ප්‍රාග්ධනය ලෙසයි. එසේ ගත් කල මේ සංඛ්‍යා කෙතෙක් දුරට වෙනස් වෙනවාද කියා ගණන් හදා බැලීම අපේ උගත් මන්ත්‍රීවරුන්ගේ කාර්ය භාරයක් වෙනවා. පොදුවේ ගත් කල මේ පළාත් සභා ව්‍යුහය සකස් කොට තිබෙන්නේ, සංවර්ධනාත්මක දෘෂ්ටි කෝණයකින් නොවෙයි. එය හුදෙක් පරිපාලනමය අවශ්‍යතා ඉටු කර ගැනීමේ අභිප්‍රායන් ඇති කරනු ලැබූ ආයතනයක්. ඒ නිසා තමයි අපට සිද්ධ වෙලා තිබෙන්නේ සංවර්ධනාත්මක කරුණුවලට වඩා පරිපාලනමය කරුණු කෙරෙහි, පුනරාවර්ථන වියදම් කෙරෙහි වැඩි බරක් තබන්න. ඒක අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේවත්, මේ කැබිනට් මණ්ඩලයේවත්, මේ මන්ත්‍රීවරුන්ගේවත් දෝෂයක් හැටියට මා සලකන්නේ නැහැ. අර අපේ ගුරුතුමා කී පරිදි සුන්දර සිහිනයක් සැබෑ වී එක්සත් ජාතික පක්ෂය කවදා හෝ දවසක මේ පළාත් සභාවේ බලය ලබා ගත්තාද, ජනතා විමුක්ති පෙරමුණ මේ පළාත් සභාවේ බලය ලබා ගත්තාද, මේ සංඛ්‍යා ලේඛනවල බරපතළ වෙනසක් සිදු කිරීමට හැකියාවක් නැහැ. මක් නිසාද? මේ ව්‍යුහය සකස් කොට තිබෙන්නේම පරිපාලනමය අවශ්‍යතාවයන් මුල් කොට ගනිමින්. අපි වඩාත්ම පළාත් සභාව හැටියට යොමු වන්නේ, සේවාවන් සැලසීමට මිස සංවර්ධනාත්මක කාර්යයන්ට නොවන බව අපට කනගාටුවෙන් වුවත් පිළිගන්න සිදු වී තිබෙනවා. නමුත් මේ සියලු තත්ත්වයන් තුළ, මේ සියලු දුෂ්කරතා සහ අභියෝග තුළ යම් ප්‍රමාණයකින් පෙරට වඩා මූලධන වියදම් වැඩි කර ගැනීමට වර්තමාන ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු කැබිනට් මණ්ඩලය දැඩි ප්‍රයත්නයක් දරා තිබෙන බව මේ සංඛ්‍යා ලේඛන අධ්‍යයනය කිරීමේදී අපට තහවුරු වෙනවා. මේ විසර්ජන ප්‍රඥප්තිය කියන්නේ කුමක්ද? මෙය අපට වෙස්ට්මිනිස්ටර් ආභාෂයෙන් ලැබුණු ඒ ක්‍රමයෙන් අපට උරුම වුණු වැඩ පිළිවෙළක තවත් න්‍යෂ්ටාවශේෂයක් පමණයි. අයවැය ලේඛනය වැඩි ඡන්ද 100 කින් සම්මත වුවත්, මේ විසර්ජන ප්‍රඥප්තිය සම්මත නොවුණොත් මෙය නීතියක් බවට පත් වන්නේ නැහැ. ඒ නිසා තමයි අවාසනයේදී අපි සම්මත කර ගත්තා වූ සියලු ලේඛන, සංඛ්‍යා, කථා, වැඩ පිළිවෙළවල් සියල්ල එක ගොනුවකට ගෙන විසර්ජන ප්‍රඥප්තිය හැටියට ඉදිරිපත් කොට සම්මත කර ගනු ලබන්නේ.

අපේ උගත් ගුරුතුමා, ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා අවධානය යොමු කළ එක් කරුණක් කෙරෙහි මගෙත් තදබල අවධානය යොමු වී තිබෙනවා, මේ වැඩිහිටි ප්‍රජාව සම්බන්ධයෙන්. මට ලොකු උවමනාවක් තිබුණා, ප්‍රධාන රජයේ ජාතික අයවැයට පෙර රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ ලක්ෂ 5 කට අධික ඒ වැඩිහිටියන් වෙනුවෙන් යම්කිසි හඬක් මේ පළාත් සභාව තුළ නගන්න. නමුත් අවාසනාවකට පසුගිය පළාත් සභා සැසිවාර හතරක්ම ගණපූරණය නැතුව අහිමි වීම නිසා ඒ වැදගත් යෝජනාව අපට ගෙන එන්න බැරි වුණා. රජයට මේ තිබෙන්නා වූ මූල්‍ය දුෂ්කරතා හමුවේ සුභසාධන වැඩ පිළිවෙළවල් සහ සමාජ ආරක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කරන්න තිබෙන අභියෝගයන් අපි පිළිගන්නවා. නමුත් හිතට එකඟව විශ්‍රාමිකයන් වෙනුවෙන් වැඩි කළ රුපියල් 500 ප්‍රමාණවත් නොවන බහ නොවළහ කියන්න මගේ හෘද සාක්ෂිය මේ අවස්ථාවේදී විවෘත වෙනවා. මේ මිනිස්සු අවුරුදු 55 ක් 60 ක් මේ රටේ සංවර්ධනය වෙනුවෙන්, මේ ජාතියේ උන්නතිය වෙනුවෙන් තමන්ගේ ලේ, කඳුළු, දහඩිය වැගිරූ අහිංසක වැඩිහිටියන් පිරිසක්. ඔවුන්ට උද්ඝෝෂණ කරන්න බැහැ. ඔවුන්ට වැඩ වර්ජන කරන්න බැහැ. ඔවුන්ට පිකටිං යන්න බැහැ. ඩිස්ප්‍රින් පෙත්තකින් එහෙම නැත්නම් වෙනත් ප්‍රෙෂර් පෙත්තකින් ජීවිතය ගැට ගහ ගන්නා අහිංසක පිරිස්. මේ අය සමග මා කළ එක සාකච්ඡාවකදී ගරු සභාපතිතුමනි, එක්තරා වැඩිහිටියෙක්, රාජ්‍ය පරිපාලයෙහි නිලධාරියෙක් මට කිව්වා, මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය විසඳන්න. නැත්නම් අපට ගෞරවාන්විත මරණයක් උදා කරලා දෙන්නය කියලා. ඒ තරමට ඒ පිරිස බොහොම කලකිරීමෙන් ඉන්නේ. මතක තබා ගන්න

[ ගරු කීර්ති උඩවත්ත]

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මේ විශ්‍රාමික සංස්ථාව ලක්ෂ පහකට අධික ප්‍රමාණයක්. ඔවුන්ගේ එක පවුලක ඡන්ද හතරක් කියලා ගත්තොත් ලක්ෂ 20 ක, මිලියන දෙකක සමාජ බලවේගයක් හැටියට ඔවුන් ඉදිරි මැතිවරණයකදී ඉදිරියට එන්න පුළුවන්. ඒ නිසා මේ පුංචි පළාත් සභාව තුළින් අපි මධ්‍යම රජයට හඬගා කිය යුතුයි. මේ අහිංසක මිනිස්සුන් රැවටීම අපි ඉදිරියටත් නොකර, ඉදිරි අයවැය ලේඛනයකදීවත් මේ වැඩිහිටියන්ගේ සමාජ සංරක්ෂණය වෙනුවෙන් මීට වඩා විධිමත් වූ, ඔවුන්ට පිළිගත හැකි වූ ගෞරවාන්විත වූ විසඳුමක් ලබා ගත යුතුයි කියන කාරණාව මම මේ පළාත් සභාව තුළ මතක් කරනවා. මේ පළාත් සභාව ඇත්තටම පුංචි පාර්ලිමේන්තුවක්. මේ පාර්ලිමේන්තුව තුළ ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ භූමිකාව නිකම්ම නිකම් සරළ කාර්යයක් නොවෙයි. කැබිනට් මණ්ඩලයේ ඇඟිලි පහ වාගේ ඇද වුණු, කෙළින් වුණු, බුරුල් වුණු ඔක්කොම අය එකතු කර ගෙන ඒ හැමෝම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අදහස් දක්වන්න මූලාසනයෙන් තව විනාඩි පහක් වැඩිපුර ලබා දෙනවා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ඒක නම් අල්ලසක් හැටියටයි මට පේන්නේ. මොකද, එතුමා මගෙන් ඉල්ලීමක් කළා, ගරු සභාපතිවරයා ගැනත් මොනවා හරි කියන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. එහෙම නොවෙයි. හරවත් යමක් සභාවට ලැබෙනවා නේ?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මගේ මිත්‍රයා. ඔබතුමා ලබා දුන් කාලය ගැන ඔබතුමාට අනේකවාරයක් ස්තූතිවන්ත වෙනවා. මා කියා ගෙන ආවේ මේ අවුරුදු හතරහමාරක පළාත් සභා කාලය තුළ අපේ ප්‍රධාන අමාත්‍යවරයා ඉතාම බරපතළ අභියෝගයන්ට මුහුණ දුන්නා. සමහර ජනමාධ්‍යවලින් එතුමාව පට්ට ගැහුවා. නමුත් අනෙකුත් පළාත් සභාවන් සමග සංසන්දනය කරන කොට අපි ඒ සියලුම පළාත් සභාවන්ට පූර්වාදර්ශී පළාත් සභාවක් හැටියට මේ බස්නාහිර පළාත් සභාව එතුමා පවත්වාගෙන ගියාය කියන එක අපි කියන්න ඕනෑ. අපි එතුමා කියපු සියලු දේ එහෙයියන් මෙන් අනුමත කළේ නැහැ. අප එතුමා සමඟ තර්ක කරලා තිබෙනවා. වාද කරලා තිබෙනවා. නමුත් අවසානයේදී අපි තීන්දුවක් ගත්තා නම්, ඒ තීන්දුව තුළ ජයග්‍රහනය තෙක්ම අපි පෙනී සිටියාය කියන එක බොහොම නිහතමානීව මම සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම අපේ හැකියාවෙන්, අපේ දැනුමෙන් මේ පළාත් සභාවට උපරිම ප්‍රයෝජන ගන්න, එතුමා හැම අවස්ථාවකදීම මෙවැනි වැදගත් සාකච්ඡාවලදී අපට අවස්ථාව ලබා දුන්නාය කියන එක ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාට ගෞරවයක් වශයෙන් සඳහන් කරන්න කැමැතියි. මේ පළාත් සභාව ගාල ගෝට්ටියක් විධියට, මේ පළාත් සභාව බලාගෙන ඉන්න අයට අසුන්දර දර්ශනයක් විධියට කටයුතු කෙරෙන අවස්ථාවලදී, මේ පළාත් සභාව තුළ විධිමත්, අර්ථවත් විවාදයක් පවත්වන්න දායක වුණු ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ අපේ සහෝදර මන්ත්‍රීවරුන් අද මේ සභාවේ ඉන්නවා. ඒ සියලු දෙනාට ලබන වතාවේත් මේ පළාත් සභාව නියෝජනය කරන්න වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 03.32]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වාද විවාද, ඒ වාගේම තර්ක විතර්ක මතු කරමින් පුරා වසර හතරහමාරකට අධික කාලයක් විවිධ මතවාදවල අපි ගැබ්ගෙන සිටියත්, අද මේ මොහොතේදී අපට එක තීන්දුවකට එන්න සිදු වෙලා තිබෙනවා. ඒ තමයි ලබන අවුරුද්ද සඳහා අපේ වැය ශීර්ෂයන්වල කොතරම් - අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ කොතරම් දුරට අපි යථාර්ථවාදී ද ප්‍රායෝගික ද කියන කාරණය අපේ මනසට දැන් ඇතුළු වෙමින් තිබෙනවා. මේ ඉන්න ඇමතිවරු කවුරුවත් පසුගිය අවුරුදු හතරේ අයවැයේ වාගේ ලබන අවුරුද්දේ අයවැයේදී ඒ අමාත්‍යාංශ භාර ගන්නේ නැහැ.

එතකොට මේ හදලා තිබෙන අයවැය සියල්ලම ඒ අමාත්‍යවරුන්ගේ දායකත්වයෙන් හැදුවත් අපි කවුරුවත් දන්නේ නැහැ, ලබන අවුරුද්දේ මේ අයවැය දිගටම කර ගෙන යන්නේ කවුද කියලා. විශේෂයෙන්ම පළාත් සභාව විසුරුවලා මාස තුනකට අධික කාලයක් සමහර විට මේ සියලු බලතල ආණ්ඩුකාරතුමා යටතේ අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට ලැබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ අපි විශ්වාස කරනවා, ලබන අවුරුද්දේ වැය ශීර්ෂය ක්‍රියාත්මක කිරීමේදී වඩාත් මූල්‍ය විනයක් බස්නාහිර පළාත් සභාවට අවශ්‍යයි කියලා. ගෙදරක වුණත් විනයක් තිබුණොත් විතරයි දරුවෝ හරියට හැදෙන්නේ. පළාත් සභාවේ මේ කෝටි ගණන් මුදල් පරිහරණය කිරීමේදී ලබන වසරේදී දේශපාලන අධිකාරිය නැති මාස තුනක නොනගතයක් උදා වන අතර, නිලධාරීන්ටත් කිසියම් වූ කාර්ය භාරයක් ඒ සම්බන්ධයෙන් පැවරෙනවා. අපි මෙතැන ඉන්න සියලු දෙනාම කථා කළා වාගේ අපි 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉපදුණු ආයතනයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව කිව්වාම, අනික් පළාත් සභාවලට වඩා ඉදිරියෙන් ඉන්නේ. මේ අවස්ථාවේ ගරු මන්ත්‍රීවරු දෙන්නෙක් වැඩිහිටියන් සම්බන්ධයෙන් කථා කළා. මට මතක් වෙනවා, දැන් විශේෂයෙන්ම මේ පළාත් සභාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපට පැවරිලා තිබෙන බලතල. මම එදා මගේ අයවැය කථාවේදී කිව්වා. හිතට එකඟ වූ එකඟ නොවූ බොහෝ දේවල් අපි පසුගිය අවුරුදු හතරක කාලය තුළදී මධ්‍යම ආණ්ඩුවට දුන්නා. අපට ලැබුණු බලතල, දිවි හිමියෙන් බලා ගත්ත බලතල අපි නැවතත් මධ්‍යම ආණ්ඩුවට පැවරුවා. නමුත් ශ්‍රී ලංකා ඉතිහාසයේ මේ පළාත් සභාවේ අසුන් ගත් ගරු මන්ත්‍රීවරියක් මේ රටේ විධායක ජනාධිපති ධූරයට පත් වුණා. එදා මේ පළාත් සභා ක්‍රමයෙන් පැහැදිලි ගමනක් නිර්මාණය වුණු අයගේ අතින්වත් පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න දායකත්වයක් ලැබුණේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එහෙම තත්ත්වයක් තුළ පළාත් සභා ක්‍රමයට දැන් පවත්නා වූ ව්‍යවස්ථාදායකයෙන් අපට නැවත බලතල පැවරෙනවා යැයි විශ්වාසයක් ගොඩ නගා ගන්නට බැහැ. ඒ නිසා ලැබෙන ආදායම් වැඩි කර ගැනීම අතිශය සුවිශාල කාර්ය භාරයක් වෙනවා. විශේෂයෙන්ම පළාත් පාලන විෂය පිළිබඳව ලබන වසර, දැඩි අවධානයකින් ඉන්න වෙනවා. විශේෂයෙන්ම පළාත් පාලන පනත වෙනස් වීම තුළ ප්‍රධාන අමාත්‍යවරයාට ලබන වසරේ සුවිශාල කාර්යභාරයක් කරන්න තිබෙනවා. විශේෂයෙන්ම නගරාධිපතිවරුන් සහ සභාපතිවරුන්ගේ මූල්‍ය විනය සම්බන්ධයෙන් සහ ඔවුන් ක්‍රියා කරන ආකාරය පිළිබඳව දැඩි අවධානයකින් ඉන්න ලබන වසර අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ රටේ වැදගත් කාරණා දෙකක් එතුමියගේ කාලයේ කළා. එකක් තමයි එතුමිය පැය භාගයක් ඔරලෝසු කට්ට පස්සට දාලා ජාතිය පැය භාගයකට ඉස්සෙල්ලා නැගිට්ටෙව්වා. හැබැයි, ඒක ආයිත් රිවස් වුණා. හැබැයි, එතුමියට පුළුවන්කම ලැබුණා වැඩිහිටියන් සඳහා වූ ප්‍රඥප්තියක් මේ රටේ ක්‍රියාත්මක කරන්න. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අද බස්නාහිර පළාතේ වැඩියෙන්ම ඉන්නේ අපේ වැඩිහිටියෝ. අපි දන්නවා, යුරෝපා රටවල්වල ආණ්ඩු වෙනස් කරන්නේ වැඩිහිටියෝ. විශේෂයෙන්ම එංගලන්තවය වාගේ රටවල්වල. හැබැයි, අපේ රටේත් අද වැඩිහිටියන්ට යම් බලයක් ආරෝපණය වෙමින් පවතිනවා. ඒ නිසා මධ්‍යම ආණ්ඩුව අතින් යමක් අතපසු වුණත් ඒ අතපසු වීම් නවත්වා ගැනීමේ හැකියාවක් පළාත් සභා ක්‍රමයට තිබිය යුතුයි. ඇමතිවරු පස් දෙනෙක් ඉන්නවා. මේ ඇමතිවරුන් හැම කෙනෙකුටම පුළුවන්කම ලැබුණා, තමන්ගේ කීර්ති නාමය ගොඩ නගා ගැනීම සඳහා තමන්ටම ආවේණික වූ ව්‍යාපෘතිවල නියැලෙන්න. අපේ ගරු මහ ඇමතිතුමා සුපසන් නිම්තෙර කළා. උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා සමාධි පදනමත් එක්ක තවත් ව්‍යාපෘතියක් කළා. අනෙක් ඇමතිවරු තව තව ව්‍යාපෘති කළා. ඒ වාගේම මම අනාගතයේදී බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ අපි, මේ ඉදලා ගිය සභාවේ ලබන අවුරුද්ද සඳහා වූ මේ යෝජනා ක්‍රියාත්මක කිරීමට මේ අමාත්‍යවරු පස් දෙනා මේ අදාළ පුටුවල ඉන්නවාද නැද්ද කියන එක වෙනත් කාරණයක්. ඒ නිසා කවුරු මේ පුටුවල වාඩි වුණත්, ඔවුන් ලබන වසරේ කරන ක්‍රියාදාමයට මේ අයවැයෙන් සුවිශාල දායකත්වයක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් කියනවා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය 1994 ඩේලි නිව්ස් පුවත්පතට කිව්වා. I will continue the open economy with minor changes කියලා. හැබැයි එතුමියගේ කාලේ minor changes තිබුණේ නැහැ. Major changes තිබුණෙත් නැහැ.

[ ගරු නිරෝෂන් පාදුක්ක]

හැබැයි අන්තිම කාලයේදී කිව්වා human based කියලා. අන්තිම කාලයේදී. මුලින් කිව්ව මානුෂික මුහුණුවර. හැබැයි, අපේ පළාත් සභාවට, අපට ඕනෑ, අපටම ආවේණික ක්‍රමවේදයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාව මධ්‍යම රජය යටතේ තිබුණත් අපට තවු ඕනෑ ඉගිල්ලිලා යන්න. අපට ඕනෑ අපට ඕනෑ තැන වහන්න. ඒ නිසා ලබන අවුරුද්දේදී මේ බස්නාහිර පළාත් සභාව, මේ ඇමතිවරු, මේ මන්ත්‍රීවරු කවුරු පත් වුණත් අපි සතු කාර්ය භාරයක්, පළාත් සභාව සතු කාර්ය භාරයක් තිබෙනවා නම්, එයට කාටවත් අත තියන්න දෙන්න එපා. එය සුරක්ෂිත කර ගන්න. දිවි හිමියෙන් ආරක්ෂා කරපු පළාත් සභා ක්‍රමවේදයට බලතල ලබා ගෙන ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් කරන්න අනාගතයේදී පාලකයන්ට වාසනාව, ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.40]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පස්වන පළාත් සභාවේ අයවැය විවාදයේදී අදහස් ප්‍රකාශ කරන්න මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් නැවත වතාවක් ස්තුතිවන්ත වෙනවා. කොහොම වුණත් අපි දැන් මේ පළාත් සභා ක්‍රමයේ ප්‍රතිඵල අවුරුදු 25 ක් තිස්සේ භුක්ති විඳලා තිබෙනවා. අපි මේ පළාත් සභාවේ අයවැය විවාදය කර ගෙන යද්දී ඔබතුමා දකින්නට ඇති දවස් දෙකකට ඉස්සර වෙලා දෙමටගොඩ දුම්රිය අංගනයේ තිබුණු දුම්රිය එන්ජින් එකක් Auto start වෙලා කිලෝ මීටර් 15 ක් විතර දුර ගියා. රියදුරෙකුත් නැතිව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් දුම්රියත් එහෙම යනවා. කිලෝ මීටර් 15 ක් ගියාට පස්සේ යන්තම් හානියක් වෙන්නේ නැතිව නතර කර ගත්තා. මට පේන්නේ මේ පළාත් සභා ක්‍රමයත් ඒ වාගේ තමයි. අවුරුදු 25 කට ඉස්සෙල්ලා අපට ලැබුණා. ඔහේ යනවා. දීපු නිසා යනවා. ඉතින් මේකේ රියදුරෙක් හිටියත් නැතත්, ඒ රියදුරු ආසනයේ සුසිල් මුණසිංහ ද, රෙජිනෝල්ඩ් කුරේ ද, ප්‍රසන්න රණතුංග මහ අමැතිතුමාද කවුරු හිටියත් ඉතින් මේක යනවා. හානියකුත් නැහැ වාගේ පේනවා. ඔහේ ඉස්සරහාට යනවා. පරිපාලනයේ අවුලක් වියවුලක් කරමින්. ඉතින් මේකට අර තිබෙන දුම්රියේ එන්ජිමේ වෙනස තමයි ඒක Auto start. මේකට තල්ලුවක් හම්බ වුණා ඉන්දියාවෙන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම අපි ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා මෙතැන ඉන්නවා අවුරුදු 20, 15. මේ පළාත් සභා ක්‍රමයේ අත්දැකීම් තිබෙන අය. ආණ්ඩුව ඇතුළේ සාකච්ඡා කරන්න. අපට විවේචනයක් තිබෙනවා. හැබැයි, ඒ විවේචනය දැන් කොතරම් දුරකට මේ පොළොවේ යථාර්ථයක් වෙලා තිබෙනවාද? පරිපාලනය සම්බන්ධයෙන් ගැටළුවක් මතු වෙලා තිබෙනවාද? උතුරේ පළාත් සභා පිහිටෙව්වාට පස්සේ මෙහි බලතල පාවිච්චි කරලා බෙදුම්වාදය දිහාවට උතුරේ පළාත් සභාව ගෙන යන්න පුළුවන් ආකාරයේ අවස්ථාවක් නිර්මාණය වෙලා තිබෙනවාද කියලා ඔබතුමන්ලා ඇතුළේ සාකච්ඡා කරන්න. සංවර්ධනයේ ප්‍රතිඵල ජනතාවට අත් කරලා දෙන්න පුළුවන් ආකාරයකට පරිපාලන ව්‍යුහයකට රට ගමන් කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. දැන් අපි දන්නවා, මේ පළාත් සභාව තව දින කිහිපයකින් විසුරුවා හැරෙයි. අපි ඉල්ලා සිටිනවා. මේ පළාත් සභාවේ අපි වාද විවාද ගොඩක් කළා. අපට බාධා කිරීම් ගොඩාක් තිබුණා. හැබැයි, ඒ අතරේ විශේෂයෙන් ආණ්ඩු පක්ෂය ඇතුළේ මේ විපක්ෂය ඇතුළේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කවදාද විසුරුවා අරින්නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඉදිරියේදී කියලා කිව්වේ. කාලයක් තිබෙනවා. කොහොමහරි නියමිත කාලයේදීවත් විසිරෙන්න එපැයි. හොඳයි. ඒ අතරේ තමන්ගේ දේශපාලන ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කරන මන්ත්‍රීවරු බොහෝ ගණනක් හිටියා. බොහෝ පිරිසක් හිටියා. මම හිතන්නේ බහුතරයක් හිටියා. දැන් අපේ ප්‍රාදේශීය සභා ව්‍යුහය, පළාත් පාලන ව්‍යුහයට සාපේක්ෂව සංසන්දනය කරන කොට ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභා මන්ත්‍රීවරු ටිකක් හොඳයි. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ. ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයේ බලය තිබෙද්දී, ඡන්දත් දිනන්න පුළුවන්කම තිබෙද්දී ඇයි මේ හොරු, මංකොල්ලකාරයෝ,

වංචාකාරයෝ, සල්ලාලයෝ මේ ලැයිස්තුවලට දාන්නේ. දැන් සභාපතිවරු ගොඩක් අහු වෙලා ඉන්නවා. ඔබතුමාම දන්නවා වළල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභාපති. අහුවුණේ ලක්ෂ පහළොවේ අල්ලසට තමයි. හැබැයි ඊට ඉස්සෙල්ලා කැරෙට්ටුව ගොඩාක් තිබුණා. ඔබතුමාම කියලා තිබෙනවා. කළුතර ප්‍රාදේශීය සභාවේ සභාපති අහු වුණා. අල්ලස ලක්ෂ 20 යි. හැබැයි, මේ අයට සල්ලි වියදම් කරලා, ඡන්ද දිනනවා කියලා පෙන්වලා, ඕනෑ නම් ආණ්ඩු පක්ෂයේ ටිකට් එක ගන්න පුළුවන්. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ අඩු තරමින් මේ තිබෙන දේශපාලන සදාචාරයවත් රැකෙන්න ඒ අයට නාම යෝජනා දෙන්න එපා. ජනතාවට පස්සේ කියන්න එපා අංක 01 ට කුඩු කාරයෝ කොළඹ දිස්ත්‍රික්කයෙන් ඕගොල්ලෝ තමයි පත් කරලා එව්වේ කියලා. ඕගොල්ලොන් තමයි අංක 02 ට කැසිනෝකාරයෝ එව්වේ කියලා එහෙම ජනතාවට කිව්වාට වැඩක් නැහැ. ඒ අය සල්ලිවලින් ජනමතය විකෘති කරනවා. ආණ්ඩු පක්ෂයට වගකීමක් තිබෙනවා. අඩු තරමින් මේ දේශපාලන සංස්කෘතිය ආරක්ෂා කර ගෙන යන්න.

ඒ වාගේම තමයි අපි කියන්නේ. කොපමණ සල්ලි වියදම් කරලා මොන මනාප ගත්තත් කුඩු ජාවාරම්කාරයන්ට ඇමතිකම් දෙන්න එපා. කුඩු ජාවාරම්කාරයන්ට ඇමතිකම්, මන්ත්‍රීකම් දුන්නාට පස්සේ දේශපාලන බලය අරගෙන, ජනමාධ්‍ය බලය පාවිච්චි කරලා මේ රට විනාශ කරනවා. දැන් ඉස්සරහාට අපට පෙනෙනවා මේ ඡන්ද රැල්ලෙන් පස්සේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමන්ලා වාගේ ගමේ ඡන්ද කරන අයට මේ දේශපාලනයේ ඉන්න ඉඩකඩක් හම්බ වෙන එකක් නැහැ. මේකට කැසිනෝ හල් අයිති, බාර් කිහිපයක් අයිති, ගණිකා මඩම් අයිති අය තමයි මේකේ දේශපාලන බලය ගන්නේ. ඒ අයට රූපවාහිනී නාලිකාත් අයිතියි. ඒ අයට එෆ්.එම්. චැනල් අයිතියි. ඒ අයට පත්තර අයිතියි. ජනමතය හසුරුවන්න පුළුවන් ඕවායින්. ඒ නිසා මේ යන සංස්කෘතිය, මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම සඳහා අපි සියලු දෙනාට වගකීමක් තිබෙනවා. මෙහෙම ගියොත් එහෙම ඒ දේශපාලන අවනීතියේ, දේශපාලන දුරාචාරයේ තුවක්කුව අපි සියලු දෙනාට එල්ල වන එක වළක්වන්න බැහැ. ඒ නිසා අපි කල්පනා කරන්නේ. අපි සියලු දෙනාට මේ වගකීම ඉෂ්ට කරන්න - පසුගිය අවුරුදු පහ ඇතුළතදී විවිධ අයුරින් අපේ කථාවලට උදව් කරපු, බාධා කරපු, විරෝධතා දක්වපු, ගරු මන්ත්‍රීවරු ඇමතිවරු සියලු දෙනාටම එතුමන්ලාගේ දේශපාලන අනාගතය සාර්ථක වෙන්නය කියලා ප්‍රාර්ථනා කරන ගමන්, විශේෂයෙන්ම මේ පළාත් සභාවේ කටයුතු සාර්ථක කර ගන්න උදව් වෙන්න අපේ සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය සහ අපේ පළාත් සභාවේ නිලධාරීන් සියලුම දෙනාට අපේ ස්තුතිය ප්‍රකාශ කරමින් විශේෂයෙන්ම විනාඩි පහක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [රංජිත් සෝමවංශ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 03.47]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, වසර පහක් ගෙවිලා මේ පළාත් සභාවේ කාලය අවසාන වන කොට, වර්ෂ අවසානයේදී මේ අවසාන කථාව කරන්න ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම එළඹෙන පළාත් සභාව මධ්‍යම රජයට අත දික් කරලා කිරි ඉල්ලලා අඩන පොඩි දරුවෝ වාගේ නොවී, ශක්තිමත් පළාත් සභාවක් විධියට දෙපයින් නැඟී සිටින්න පුළුවන් පළාත් සභාවක් පිහිටුවා ගන්න ලැබේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම මේ ගෙවෙන පළාත් සභාවේදී සිදු වුණු කාර්යභාරය දිහා බලද්දී වැදගත්ම අංශ කිහිපයක් මම හිතන්නේ අපේ අතින් සිද්ධ වුණා. ඒ පිළිබඳව මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අමාත්‍යාංශ උපදේශක කාරක සභා ශක්තිමත්ව ක්‍රියාත්මක වීම නිසා යම්කිසි කාර්යභාරයක්, මම හිතන්නේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ටත් සක්‍රිය දායකත්වයක් ලබා දීලා කටයුතු කරන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා ඒ උපදේශක කාරක සභා ක්‍රමය මේ පළාත් සභාවට හඳුන්වා දීම පිළිබඳවත් මම හිතන්නේ,

[ ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා]

අපි සන්තෝෂ වෙන්න ඕනෑ. ඒ වාගේම තමයි අද මේ අවස්ථාවේදී මේ ගෙවුණු දින හතර දිහා බලද්දී මේ සභාව ඇතුළේ සාරවත් කථා, සාරවත් අදහස්, උසුළු විසුළු ඒ වාගේම රසවත් කථා බොහෝ වශයෙන් තිබුණා. ඒ නිසා අපි කල්පනා කරන්න ඕනෑ. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු හැටියට මේ ලබා දීපු දායකත්වය දිහා. හැබැයි, මේ මුදල් ප්‍රකාශය ගැන සාකච්ඡා කරද්දී, විශේෂයෙන්ම මම හිතන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන පෙළේ මන්ත්‍රීවරු දීපු දායකත්වය ගැන අපේ ප්‍රශ්නයක් තිබෙනවා. වෙනදාට මේ සභාවට හරවත් යමක් ඉදිරිපත් කරන, දැනුම් තේරුම් තිබෙන පළපුරුදු ගරු මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් මේ දවස් හතර තුළ වචනයක්වත් කථා කළේ නැහැ. මම හිතන්නේ, ඒ කළ කිරීමේ ස්වභාවය අපි මේ සභාව ඇතුළේදී දැක්කා. විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන්. ඒ පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ඒ වාගේම සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා, නවුසර් ෆවුසි මන්ත්‍රීතුමා, මේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම එකක් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ. ඒක තමයි ඇත්ත. තමුන්නාන්සේ මේ සභාවේ දවස් හතරම හිටියා නම් මගෙත් එක්ක ගැටෙන්න එන්න එපා. හොඳට අවධානයෙන් බලාගෙන හිටියා නම් ඒක තමයි ඇත්ත. පසුපෙළේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කථා කළේ නැහැ. තමන්ගේ අදහස් දුන්නේ නැහැ. මේ සභාව පෝෂණය කළේ නැහැ. අලුත් අදහස් දුන්නේ නැහැ.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

බොරු කියන්න එපා. අපට කථා කරන්න වෙලාව මදි වුණා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

තමුන්නාන්සේ කථා කළා ඕනෑවටත් වැඩිය. මම කථා කරන්නේ මේ රංජිත් සෝමවංශ මැතිතුමා වාගේ කෘතහස්ත අය ගැනයි. ඒ පිළිබඳව මම මේ වෙලාවේ කථා කරන්න යන්නේ නැහැ. ඒ නිසා ඔවුන්ගේ දායකත්වය නොලැබීම මම හිතන්නේ මේ සභාව තුළ ඔවුන් ගත කළ කාලය තුළ ඇති වුණු කලකිරීමක් හැටියටයි මම විශ්වාස කරන්නේ.

විශේෂයෙන්ම මේ පළාත් සභාවේ මේ ගත කළ කාලයේදී තමුන්නාන්සේගේ දායකත්වය, අපට දීපු සහයෝගය ගැන අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමා, බොහෝ වෙලාවට ඔය පුටුවේ වාඩි වෙලා මේ සභාව නිවැරදි මාර්ගයේ ගෙනියන්න, නියම ආකාරයට ගෙනියන්න කටයුතු කළා. අපි එතුමාටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු, ඒ වාගේම ඇමති මණ්ඩලය, ඔය මොන ප්‍රශ්න තිබුණත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා සෑම අවස්ථාවකදීම අපට මේ සභාවේ මන්ත්‍රීවරුන් හැටියට ගරුත්වයෙන් කටයුතු කරන්න අවස්ථාව ලබා දුන්නා. ඒ ගැනත් මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමන්ලාට සහයෝගය දීපු නිලධාරී මණ්ඩලය, විශේෂයෙන්ම ප්‍රධාන ලේකම්තුමිය, සභා ලේකම්තුමා ඇතුළු මේ සියලුම කාර්ය මණ්ඩලයට මේ වෙලාවේ විපක්ෂය වෙනුවෙන් මගේ ස්තුතිය මම පුද කරන්නට ඕනෑ.

ඒ වාගේම මේ සභාවේ 104 දෙනා අතරේ තමයි මේ සියලු සාකච්ඡා යන්නේ. නමුත් මේක එළියේ ඉන්න කිසි කෙනෙක් දකින්නේ නැහැ. මේ ඉන්න මාධ්‍යවේදීන් නැත්නම්. බස්නාහිර පළාත් සභාව තමයි පාර්ලිමේන්තුවට පස්සේ තිබෙන ජනතාව නියෝජනය කරන ප්‍රධානම ආයතනය. මේ ජනතාවගේ හඬ එළියට දෙන්නේ ඒ මාධ්‍යවේදීන්. ඒ නිසා අපි එතුමන්ලාටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ නිසා අවසාන වශයෙන් මේ පළාත් සභාවේදී අපට කටයුතු කර ගන්න අවස්ථාව ලබා දීපු සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින්, ඉදිරි පළාත් සභා මැතිවරණයේදී ශක්තිමත් ආණ්ඩු පක්ෂයක් හැටියට එක්සත් ජාතික පක්ෂය නැගී සිටීමේ අවශ්‍යතාවය ජනතාවට පැහැදිලි කරමින්, සියලුම දෙනාට සුභ නත්තලක්, සුභ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.51]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මා විසින් ඉදිරිපත් කරන ලද 2014 මුදල් ප්‍රකාශය පිළිබඳව පසුගිය දින 04 ක් තිස්සේ ගරු මන්ත්‍රීතුමන්ලා දක්වපු අදහස් පිළිබඳව, ඒ ඒ වැය ශීර්ෂය පිළිබඳව දක්වපු අදහස් පිළිබඳව, ඒ යෝජනා පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු කරලා, ඉදිරි කාලයේදී ඒ බලතල සීමාව තුළ කටයුතු කිරීමට මමත් මගේ අමාත්‍ය මණ්ඩලයත් කටයුතු කරනවාය කියන කාරණාව මේ අවස්ථාවේ ප්‍රථමයෙන්ම මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මේ දින හතරක කාල සීමාව තුළ අපි දැකපු දෙයක් තමයි මේ අයවැය විවාදයේදී ආණ්ඩු පක්ෂයේ හා ප්‍රතිපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරද්දී අපට මේ ගෙනාපු වැඩ පිළිවෙළ පිළිබඳව අමාත්‍යාංශ මට්ටමෙන් ගොඩාක් මන්ත්‍රීවරුන්ගේ ප්‍රශංසා ලැබුණා. ඒ අයට කනගාටුවෙන් වුණත් පක්ෂ ප්‍රතිපත්තිය හැටියට අපට මේ අයවැයේදී සහයෝගය ලබා දෙන්න බැරි වුණත්, ඒ ගොඩක් දෙනෙක් ඡන්දය දීමෙන් වැළකිලා මේ ස්ථානයේ රැඳී සිටියේ නැහැ. ඒ අයගේ සහයෝගය ලබා දෙන්න කටයුතු කරන්න උවමනාව තිබුණත්, එහෙම දුන්නොත් පක්ෂයේ ප්‍රතිපත්තිවලට කටයුතු කෙරෙන්නේ නැති නිසා එය ලබා දෙන්න මේ ස්ථානයේ ඒ අය හිටියේ නැහැ. අපි දැක්කා ඒක. ගණන් කරලා බලන කොට 11 යි, 16 යි. 15 යි තමයි ප්‍රතිපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දය පාවිච්චි වුණේ. ඒ නිසා ඒ සියලු දෙනාටම මගේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මෙතුමන්ලාගේ කථාවලදී විශේෂයෙන්ම සරුදම් අරුණෑල්ල වැඩ සටහන ගැන සාකච්ඡා වුණා. එහිදී ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම වුණා, මේ වැඩ පිළිවෙළ තව තවත් ශක්තිමත්ව කර ගෙන යන්නය කියලා. ඒ නිසා ඒ වැඩ පිළිවෙළ ඉදිරියේදී ඉතාමත්ම ශක්තිමත්ව, ඊට වඩා ප්‍රායෝගික විධියට කරන්න අපි බලාපොරොත්තු වෙනවාය කියන කාරණාව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම පළාත් පාලන ආයතන පිළිබඳව මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ වුණා. පළාත් පාලන ආයතනවල අධීක්ෂණ කටයුතු පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා දිගින් දිගටම අදහස් ප්‍රකාශ කළා. එම ආයතනවල ධුරධාරීන්ද ජනතාවගේ ඡන්දයෙන් පත් වෙලා තිබෙන නිසා ගරු සභාපතිතුමනි, අපට කටයුතු කරන්න පුළුවන් නීති රාමුව තුළ කටයුතු කරන්න අපි කවදාවත් මැලිකමක් දක්වලා නැහැ. අපි හැම තිස්සේම පළාත් සභාව මොකක්ද? පළාත් පාලන ආයතන මොකක්ද? අපට වැඩ කරන්න පුළුවන් රාමුව මොකක්ද කියලා හඳුනාගෙන, ඒ අනුව කටයුතු කරන්න අපි හැම තිස්සේම කටයුතු කරලා තිබෙනවා. පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් යම් වැරදි වැඩ කරන කොට ඒ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරන්න, විශේෂයෙන් අපේ පක්ෂයේ අයට වුණත් විරුද්ධව කටයුතු කරන්නත් අපි පසුගිය කාලයේදී කටයුතු කළාය කියලා මතක් කරන්න ඕනෑ. ඒ වාගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කථා කරන කොට කිව්වා, අපේ නොවන අපේ පළාත් සභාව කියලා. අපි තේරුම් ගන්න ඕනෑ, අපේ ව්‍යවස්ථාව තුළ අපට කටයුතු කරන්න පුළුවන් කොයි ආකාරයටද කියන කාරණාව. ඒ නිසා මේ බස්නාහිර පළාත් සභාව හුදෙකලා කරලා කථා කරන්න බැහැ. උතුරට දෙන බලය දකුණට දෙන්න ඕනෑ. නැගෙනහිරට වැටෙන බලය බස්නාහිරට වැටෙන්න ඕනෑ. මේ නිසා රටක් හැටියට කටයුතු කිරීමේදී අපි කොයි ආකාරයටද කටයුතු කරන්න ඕනෑ කියන කාරණාව අපි බුද්ධිමත්ව හිතන්න ඕනෑ. මම හිතන්නේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා අපිත් එක්ක එකඟ වෙනවා ඇති.

අපි පළාත් ආදායම් ගැන කථා කළා. පළාත් ආදායම් ගැන කථා කරන කොට පසුගිය අවුරුදු දෙකේම මම මගේ පොදු සාකච්ඡාවේදීත් කිව්වා. අපි අයවැය ඉදිරිපත් කළාට වඩා වර්ෂ අවසානය වන කොට ප්‍රාග්ධන වියදම්වලට අපට වැඩි මුදලක් වෙන් කරන්න පුළුවන්කම ලැබුණා. ඒ හැම තිස්සේම රජයේ ප්‍රදාන ලබා ගෙන කටයුතු කිරීම නිසා අපි පළාත් සභාවේ වගකීම, ගෞරවය රැකගෙන ඒ කටයුතු කළා. අපි ඉඩම් බලතල ගැන කථා කරනවා. අවුරුදු 12 ක් අපට අපේ ඉඩම්වල අයිතිය, අපේ අවශ්‍ය අයට ලබා දෙන්න අපට පුළුවන්කමක් ඇති වුණේ නැහැ. නමුත් තමුන්නාන්සේලා අපි සියලු දෙනාම එකතු වෙලා, ඉඩම් ප්‍රඥප්තිය සංශෝධනය කර ගෙන, ඒ සංශෝධනය අනුව අපට අද ඒ කටයුත්ත කරන්න පුළුවන්කම ලැබුණා. ඉඩම් බලතල පළාත් සභාවට ඕනෑ කියලා කෑ ගගහා ඉන්නවාට වඩා ජනතා සේවයට ප්‍රමුඛතාවය දිය යුතුයි කියන විශ්වාසය මා තුළ තිබෙනවා. ඒ නිසා තමයි ඉඩම් බලතල සම්බන්ධව කටයුතු කරද්දී අපි ඒ ආකාරයට කටයුතු කළේ.

[ ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා]

ඒ වාගේම පළාත් ආදායම. පුනරාවර්ථන වියදම් පිළිබඳව අපි කථා කරනවා. අපට ලැබුණු ආදායම, පසුගිය කාලයේම අපේ පුනරාවර්ථන වියදම්වලටවත් ප්‍රමාණවත් වුණේ නැහැ. මීට වඩා භයානක තත්ත්වයක් අනෙක් පළාත්වල තිබෙනවා. ඒ නිසා පළාත් සභා ක්‍රමවේදය, මුදල් ආදායම ලබා ගෙන මේක ක්‍රියාත්මක කරලා, මේක වඩා ඵලදායී ආකාරයට ගෙන යන්නේ කොහොමද කියන එකයි අපි කල්පනා කළ යුත්තේ. ඒ නිසා පළාත් සභාව තුළ මධ්‍යම රජයේ ප්‍රතිපාදන ලබා ගෙන, විශේෂයෙන්ම නිමල් ලාන්සා ගරු ඇමතිතුමා පැහැදිලි කළා, අපි පළාත් මාර්ග පද්ධතිය ශක්තිමත් කරපු හැටි. පාසල් පද්ධතිය වඩා ප්‍රසන්න වූ පරිසරයක් නිර්මාණය කරන්න අපට රජයෙන් ලැබුණු දායකත්වය. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ උපදෙස් මත පළාත් සභා ක්‍රමය ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළ යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන්, බැසිල් රාජපක්ෂ මැතිතුමා යටතේ පාසල් පද්ධතියට විශාල මුදල් ප්‍රමාණයක් ලැබුණා. වැසිකිළි කැසිකිළි පද්ධතිය අපි සකස් කළා විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මිත්‍ර පාසල් සඳහා ලක්ෂ පහ ගණනේ ලබා ගන්න අපට පුළුවන්කම ලැබුණා. මේවා අපේ පළාත් සභාවේ අයවැයේ නැති වුණත් මධ්‍යම රජයේ ප්‍රතිපාදන මත ලබා ගත් දේවල්. ඒ නිසා අපි මේක මධ්‍යම රජයේද, පළාත් සභාවේද කියලා බලාගෙන ඉන්නේ නැතිව, වඩා ඵලදායී දේවල් කරන්න රජයත් එක්ක එක්කහු වෙලා යන වැඩ පිළිවෙළක් තුළ ඉඳගෙන තමයි පළාත් සභාව වශයෙන් කටයුතු කළේ, විශේෂයෙන් ජනතාවට හිතවාදී ආකාරයෙන් කියන කාරණාව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ නිසා මා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. කාලය පිළිබඳව ගැටළුවක් තිබෙන නිසා.

පසුගිය අවුරුදු පහේ කාල සීමාව තුළත්, විශේෂයෙන්ම පසුගිය දවස් හතරේ මේ අයවැයේදීත් මේ පළාත් සභාවේ කටයුතු කිරීමේදී, පළාත් සභාවේ ප්‍රධාන ඇමතිවරයා හැටියට මට සහයෝගය ලබා දුන් මගේ ගරු අමාත්‍ය මණ්ඩලයට, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මගේ ස්තූතිය මේ අවස්ථාවේදී පුද කරන්න ඕනෑ. ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු, අමාත්‍යාංශ ලේකම්වරුන්, සියලුම ආයතන ප්‍රධානීන් ඇතුළු පළාත් නිලධාරීන්ට මගේ ස්තූතිය පුද කරන අතර, ඒ නිලධාරීන් සම්බන්ධව ඉදිරි වර්ෂයේදීත් විශේෂ අවධානයක් යොමු කරලා, ඒ අයට වැඩි වරප්‍රසාද ලබා දීලා, පළාත් රාජ්‍ය සේවාවෙන් මධ්‍යම රජයට යන්න තිබෙන වුවමනාව නැති කරලා, පළාත් රාජ්‍ය සේවාව ශක්තිමත් කරන්න කටයුතු කරනවාය කියන කාරණාව ඒ අයට මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ සභාවේ කටයුතු කර ගෙන යෑමේදී අපට ලබා දීපු සහාය පිළිබඳව ගරු සභාපතිතුමා, සභා ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ටත්, ඒ වාගේම ජනමාධ්‍යවේදීන්ටත් මගේ ස්තූතිය පුද කරනවා. පසුගිය මැතිවරණ ප්‍රතිඵල දිහා බලපුවාම අපි දන්නවා වයඹ පළාතේ, මධ්‍යම පළාතේ 2/3 ක බලයක් අපට ලබා ගන්න පුළුවන් වුණා. ඊළඟ මැතිවරණයේදීත් ඒ ජයග්‍රහණය අපි ලබලා තමුන්නාන්සේලා සියලු දෙනාත් එක්ක මේ පළාත් සභාව තුළ කටයුතු කරන්න අපි සියලු දෙනා බලාපොරොත්තු වෙනවාය කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2014 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය කියන යෝජනාව පැයකට ආසන්න කාලයක් විවාද වුණා. ඒ පිළිබඳව සභාවේ එකඟතාවය.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 21 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 21 against and 0 decliners.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මෙම සභාව, පූර්ණ කාරක සභා තත්ත්වයෙන් මිදී පළාත් සභා තත්ත්වයට පත් වෙනවා."*

***ඊට අනුකූලව අ.භා. 04.01 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 04.01 p.m. the Provincial Council resolved itself into a committee of the whole Council.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රගතිය හා ස්තුතිය පුද කිරීමේ අවස්ථාව. ඊට පෙර ගරු සභානායකතුමාට මම ආරාධනා කරනවා, කාලය දීර්ඝ කරන ලෙස.

## රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, "අද දින සභාවේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කරන ලෙස මම යෝජනා කරනවා."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රගතිය සහ ස්තුතිය පුද කිරීමේ අවස්ථාව. ඉතාම වැදගත් අවස්ථාවක්. මම ඉතාමත් ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, මේ අවස්ථාවේ සභා ගර්භය තුළ රැඳී සිටින ලෙස. මොකද, මම හිතන්නේ අපි පස්වන පළාත් සභාවේ පැවැත්වෙන අවසාන රැස්වීම වෙන්න පුළුවන්. ඒ නිසා මේ අවස්ථාවේදී අපි හැමෝම රැස්වීම අවසානයේ සතුටින් විසිර යන්නට ඕනෑ.

2014 වසර වෙනුවෙන් පැවති අයවැය විවාදයේ අවසන් දවස වූයේ අද දිනයයි. ඒ අනුව අද පෙරවරුවේ පැවැත් වූයේ, මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අදාළ අංක 108, 124 සහ 125 වැය ශීර්ෂයන් පිළිබඳ විවාදයයි. එම විවාදය ඊයේ පස්වරුවේ ආරම්භ වී අද දවසේ උදය වරුවේ එකී වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය අවසන් වූ නිසා, ඒ පිළිබඳව බෙදීමක් ඇති වුයෙන් ඡන්ද විමසීමේදී වැය ශීර්ෂයට පක්ෂව ඡන්ද 53 කුත්, විපක්ෂව ඡන්ද 11 කුත්, ඡන්දය දීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරු කිසිවකුත් නැත. ඒ අනුව එම වැය ශීර්ෂය වැඩි ඡන්ද 42 කින් සභා සම්මත වූ බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

අනතුරුව පැවතියේ, කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ අංක 106, 120, 121, 126 වැය ශීර්ෂයන් පිළිබඳ විවාදයයි. එම විවාදය අවසානයේදී ද බෙදීමක් ඉල්ලූ බැවින් ඡන්ද විමසීමේදී වැය ශීර්ෂයට පක්ෂව ඡන්ද 61 කුත්, විපක්ෂව ඡන්ද 16 කුත්, ඡන්දය දීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරු කිසිවකුත් නැත. ඒ අනුව එම කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වැඩි ඡන්ද 45 කින් සභා සම්මත වූ බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය වෙනුවෙන් වූ යෝජනාව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, විවාදය ආරම්භ කර මීට මොහොතකට පෙර අවසන් වීමෙන් පසුව ඒ පිළිබඳව බෙදීමක් ඇති වූ නිසා ඡන්ද විමසීමේදී එම විසර්ජන ප්‍රඥප්තියට පක්ෂව ගරු මන්ත්‍රීවරුන් 67 කුත්, විපක්ෂව ගරු මන්ත්‍රීවරුන් 21 දෙනෙකුත් ඡන්දය පාවිච්චි කළා. ඡන්දය දීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරු කිසිවකුත් නැත. ඒ අනුව එම විසර්න ප්‍රඥප්තිය ඡන්ද 43 කින් සභා සම්මත වූ බව මේ අවස්ථාවේදී ඉතාම සතුටින් ප්‍රකාශ කර සිටිනවා.

දැන් අයවැය පැවැත්වීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් සහ නිලධාරීන්ට ස්තුතිය පළ කිරීමේ අවස්ථාව උදා වී තිබෙන්නේ. 2014 වසර වෙනුවෙන් පැවති අයවැය විවාදය 2013 දෙසැම්බර් මස 03,04,05 හා 06 යන දිනවල මෙම සභාවේ පැවැත්වුණා. ගරු ආණ්ඩුකාර අලෙවි මවුලානා මැතිතුමාගේ උපදෙස් පරිදි ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අයවැය ඉදිරිපත් කළා. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මගේ යුතුකමක් තිබෙනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ගරු අමාත්‍යවරුන්ට මේ අවස්ථාවේදී මගේ ගෞරවය, ස්තුතිය පුද කර සිටින්නට. අවුරුදු පහකට ආසන්න

[ ගරු සභාපතිතුමා]

කාලයක් මේ සභාවේ එතුමන්ලා මා වෙත දැක්වූ සහයෝගය පිළිබඳව. ඒ වාගේම විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු විපක්ෂයේ සියලුම මන්ත්‍රීතුමන්ලාටත් මේ අවස්ථාවේදී මගේ ස්තූතිය සහ ගෞරවය පුද කරන්නට ඕනෑ.

ඒ වාගේම විශේෂයෙන්ම මෙම විවාදය පැවැත්වෙන කාලය තුළ සහ මේ පසුගිය අවුරුදු පහකට ආසන්න කාලය තුළ මට ලබා දීපු සහයෝගය වෙනුවෙන් ගරු නියෝජ්‍ය සභාපති රංජිත් සෝමවංශ මැතිතුමාට මම විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙන්නට ඕනෑ. ඒ වාගේම සෑම අයවැයකදීම මූලාසනය වෙනුවෙන් කටයුතු කරපු ගරු මන්ත්‍රීවරුන් රාශියක් ඉන්නවා. සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය. ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා. ඇත්ත වශයෙන්ම මට විශාල සහායක් ලබා දුන්නා. මම මේ අවස්ථාවේදී එතුමන්ලාට මගේ ගෞරවය සහ ස්තූතිය පුද කර සිටිනවා. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මගේ බොහොම හිතවත්ම මිත්‍රයා. එතුමා මට විශාල සහායක් ලබා දුන්නා. විශේෂයෙන්ම මේ සභාවේ කටයුතුවලට බාහිරව. සභා කටයුතු කාරක සභාව, ඒ වාගේම ගෘහ කාරක සභාව ආදී කාරක සභාව පැවැත්වීමේදී එතුමා මට විශාල සහයෝගයක් ලබා දුන්නා. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා වශයෙන්. එතුමාව සහ ගරු සභානායකතුමාවත් සිහිපත් කරන්න ඕනෑ. එතුමාත් විශාල සහයෝගයක් ලබා දුන්නා මේ අවුරුදු පහකට ආසන්න කාලය තුළ.

ඒ වාගේම නිලධාරීන් වශයෙන් ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු එම කාර්ය මණ්ඩලය. ආණ්ඩුකාර ලේකම්තුමා ඇතුළු එම කාර්ය මණ්ඩලය. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු එම අමාත්‍යාංශවල කාර්ය මණ්ඩලයට ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම සභා ලේකම් හේමන්ත සමරකෝන් මහතා ඇතුළු සභා ලේකම් කාර්යාලයේ සියලුම දෙනා මම හිතන්නේ පුදුමාකාර මහන්සියක් ගත්තා. මෙම අයවැය විවාදයේදී විතරක් නොවෙයි. මෙම ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඒ සියලුම පහසුකම් ලබා දෙන්න. සියලුම වරප්‍රසාද, මන්ත්‍රීවරුන්ගේ දීමනා ඒ සියලුම කාර්යයන්වලදී සභා ලේකම් කාර්යාලය විශාල සේවාවක් ඉටු කළා. ඒ නිසා මේ අවස්ථාවේදී සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් සභා ලේකම්තුමා ඇතුළු සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට මගේ ස්තූතිය සහ ගෞරවය පුද කර සිටිනවා. ඒ වාගේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරී මණ්ඩලයට, පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, විශේෂයෙන් අපේ බන්දුල මහත්මයා, පුෂ්පකුමාර මහත්මයා නිරන්තරයෙන්ම මේ සභා ගර්භය තුළ රැඳී සිටියා. එතුමා ඇතුළු එතුමාගේ කාර්ය මණ්ඩලයටත් මගේ ස්තූතිය පුද කර සිටිනවා.

ඒ වාගේම සේවා ලබා දීමෙන් ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන්, අමාත්‍ය ආරක්ෂක අංශයේ නිලධාරීන්, MSD නිලධාරීන්, තලංගම පොලීසියේ නිලධාරීන්, පොලිස් නිලධාරීතුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට, පොලිස් නිලධාරීන්ට, බෝම්බ නිෂ්ක්‍රීය අංශයේ සියලුම නිලධාරීන්ට, බස්නාහිර පළාත් වෙස්කෝ ආරක්ෂක අංශයට, කඩුවෙල මහ නගර සභාවේ නගරාධිපති අපේ හිතවත් ජී.ඒ. බුද්ධදාස මැතිතුමා ප්‍රමුඛ නාගරික මන්ත්‍රීවරු ඇතුළු කාර්ය මණ්ඩලයට, ආහාර පාන හා සංග්‍රහ කටයුතු සැපයූ ආයතනයන්ට, පවිත්‍රතා කටයුතු සැපයූ ආයතනයන්ට මාගේ ස්තූතිය පුද කර සිටිනවා.

විශේෂයෙන්ම මේ දවස් හතර තුළ මේ සභාව තුළ විවාදයට, සංවාදයට භාජනය වූ සෑම කරුණක්ම විද්‍යුත් මාධ්‍යයෙන් සහ මුද්‍රිත මාධ්‍යයෙන් ජනතාවට අතට පත් කරපු මාධ්‍ය ක්ෂේත්‍රයේ සියලුම දෙනාටමත්, භාෂණ පරිවර්තන සේවා සැපයූ නිලධාරී මහත්ම මහත්මීන්ටත්, නොයෙකුත් අංශවලින් සහාය දැක්වූ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ඒ විද්‍යුත් මාධ්‍ය කණ්ඩායමට සහ අනෙකුත් සියලුම අපේ මාධ්‍ය කණ්ඩායම්වලට මගේ ගෞරවය සහ ප්‍රණාමය පුද කර සිටිනවා.

මම හිතන්නේ, අපි මේ අවුරුදු පහකට ආසන්න කාලය තුළ මම සතුටු වෙනවා. බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් ඔබත් එක්ක ඉතාමත් සුහදව, ළෙංගතුව මගේ ඒ සේවාවන් ලබා දුන්නා. මට විශ්වාසයක් තිබෙනවා. ඒ වාගේම ඔබතුමන්ලා මට ඒ සහාය ලබා දුන්නා. ඉතාමත් සුහදව තමයි අපි හැමදාම කටයුතු කළේ. ඒ නිසා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අවසාන කථාව වගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකත් කියන්න බැහැ. අවසාන කථාව වෙන්න පුළුවන්. හැමදාම මෙතැන ඉන්නත් අවශ්‍ය නැහැ නේ? නේද? ඒ නිසා මම ප්‍රාර්ථනා කරනවා මේ සභාව නියෝජනය කරපු හැම මන්ත්‍රීවරයෙකුටම ලබන මැතිවරණය, මම හිතන්නේ 2014 මාර්තු මාසය වන විට අනිවාර්යයෙන්ම පළාත් සභා මැතිවරණයක් පැවැත්වෙනවා. ඒ මැතිවරණයෙන් මේ පළාත් සභාව නියෝජනය කළ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ඇමතිවරුන්ටත්, අනෙකුත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ට 2014 වසරේ 6 වන බස්නාහිර පළාත් සභාව නියෝජනය කිරීමට වාසනාව ලැබේවායි කියලා මම එකසිතින්ම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම ලබන්නා වූ 2014 නව වසර ඔබ සැමට වාසනාවන්ත නව වසරක් වේවා. ඒ වාගේම විශේෂයෙන්ම කතෝලික ගරු මන්ත්‍රීතුමන්ලාට ලබන්නා වූ අසිරිමත් නත්තල සුභ නත්තලක් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. ඔබ සැමට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා. අද දවසට අදාළ න්‍යාය පත්‍රය මෙයින් අවසන් වෙනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 04.14 ට, 2014 ජනවාරි මස 07 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 04.14 p.m till 09.30 a.m, on 07.01.2014.*